# ප්‍රගති වාර්තාව
## முன்னேற்ற அறிக்கை
# Progress Report

අයවැය කාරක සභා අවස්ථාව
வரவுசெலவுத் திட்ட குழுநிலை
**Budget Debate Committee Stage** **2025**

වැය ශීර්ෂ අංක
செலவுத் தலைப்பு இலக்கம்
**Expenditure Head No** **118**

**කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය**
*கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சு*
**Ministry of Agriculture, Livestock, Lands and Irrigation**

**කෘෂිකර්ම සහ පශු සම්පත් අංශ**
*கமத்தொழில் மற்றும் கால்நடை வளங்கள் பிரிவு*
Agriculture and Livestock Divisions

# ප්‍රගති වාර්තාව

# අයවැය කාරක සභා අවස්ථාව 2025

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය

නො.80/5, ගොවිජන මන්දිරය, රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල

**ප්‍රගති වාර්තාව**

**අයවැය කාරක සභා අවස්ථාව 2025**

(2024.12.31 දක්වා කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයේ කෘෂිකර්ම සහ පශු සම්පත් අංශ මගින් සිදුකරන ලද සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය සහ 2025 වර්ෂයේ සංවර්ධන වැඩසටහන්වල ඉලක්ක ඇතුළත් ප්‍රගති වාර්තාව)

***අමාත්‍යංශයේ වැය ශීර්ෂය- අංක 118***

**කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය**

- *කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය - ගරු කේ. ඩී. ලාල් කාන්ත මැතිතුමා*
  - *කෘෂිකර්ම හා පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍ය - ගරු නාමල් කරුණාරත්න මැතිතුමා*
  - *ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍ය - ගරු සුසිල් රණසිංහ මැතිතුමා*
- *අමාත්‍යාංශ ලේකම් - ඩී. පී. වික්‍රමසිංහ මහතා*


| | |
|---|---|
| දුරකථන (පොදු) | 011-2034300 |
| ෆැක්ස් | 011-2868910 |
| විද්‍යුත් තැපැල | info@agrimin.gov.lk |
| වෙබ් අඩවිය | www.agrimin.gov.lk |

## අන්තර්ගතය


හැඳින්වීම ....................................................................................................................4

කෘෂිකර්ම අංශය සහ පශු සම්පත් අංශය ..........................................................................8

2024 වසර තුළ සිදුකරන ලද ප්‍රධාන සංවර්ධන වැඩසටහන් හා එහි මූල්‍ය ප්‍රගතිය (වැය ශීර්ෂ අංක 118 යටතේ කෘෂිකර්ම සහ පශු සම්පත් අංශවල, 2024.12.31 දින දක්වා) ........................................9

2025 වර්ෂයේ සංවර්ධන වැඩසටහන්වල මූල්‍ය හා භෞතික ඉලක්ක .............................................11

කෘෂිකර්ම අංශය ...........................................................................................................15

වැය ශීර්ෂ අංක 118 යටතේ සිදු කරන ලද ප්‍රධාන සංවර්ධන වැඩසටහන්වල මූල්‍ය සහ භෞතික ප්‍රගතිය ....................................................................................................................16

වැය ශීර්ෂ අංක 118 පුනරාවර්තන වියදම් යටතේ සිදුකරන ලද ප්‍රධාන වැඩසටහනෙහි ප්‍රගතිය ........20

කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කර ඇති විශේෂ ව්‍යාපෘති ...........................................21

2024 වර්ෂයේ විදේශ අරමුදල් මත ක්‍රියාත්මක කරනු ලැබූ ව්‍යාපෘතිවල ප්‍රගතිය .............................22

කෘෂිකර්ම අංශය යටතේ ඇති ආයතන මගින් ක්‍රියාත්මක වන ප්‍රධාන සංවර්ධන වැඩසටහන්වල මූල්‍ය හා භෞතික ප්‍රගතිය ......................................................................................................35

පශු සම්පත් අංශය .......................................................................................................105

වැය ශීර්ෂ අංක 118 යටතේ සිදු කරන ලද ප්‍රධාන සංවර්ධන වැඩසටහන්වල මූල්‍ය සහ භෞතික ප්‍රගතිය ..................................................................................................................106

2024 වර්ෂයේ විදේශ අරමුදල් මත ක්‍රියාත්මක කරනු ලැබූ ව්‍යාපෘතිවල ප්‍රගතිය ...........................111

පශු සම්පත් අංශය යටතේ ඇති ආයතන මගින් ක්‍රියාත්මක වන ප්‍රධාන සංවර්ධන වැඩසටහන්වල මූල්‍ය හා භෞතික ප්‍රගතිය ....................................................................................................112

## හැඳින්වීම

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය, 2024 නොවැම්බර් මස 25 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2412/08 අංක දරණ අති විශේෂ ගැසට් පත්‍රය මගින් ස්ථාපිත කර ඇත.

මෙම අමාත්‍යාංශය, 2023 ඔක්තෝම්බර් මස 23 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2355/10 අංක දරණ ගැසට් පත්‍රය මගින් ස්ථාපිත කරන ලද කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය ලෙස පැවති අතර, ඉන්පසු 2024 සැප්තැම්බර් 27 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2403/53 අංක දරණ අති විශේෂ ගැසට් පත්‍රය මගින් සංශෝධනය කර කෘෂිකර්ම, ඉඩම්, පශු සම්පත්, වාරිමාර්ග, ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය ස්ථාපිත කරන ලදි. පසුව 2412/08 අංක දරණ අති විශේෂ ගැසට් පත්‍රය මගින් ස්ථාපිත කරන ලද කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය, පරිපාලනයේ පහසුව උදෙසා කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග ලෙස අංශ හතරකට බෙදා ඇත.

ඒ අනුව, මෙම වාර්තාව තුළ කෘෂිකර්ම සහ පශු සම්පත් යන අංශ විසින් සහ එම අංශ යටතේ ඇති ආයතන විසින් සිදු කරන ලද සංවර්ධන වැඩසටහන්වල 2024.12.31 දින දක්වා මූල්‍ය හා භෞතික ප්‍රගතිය සහ 2025 වර්ෂයේ මූල්‍ය හා භෞතික ඉලක්ක ද ඇතුළත් කර ඇත. ඉඩම් සහ වාරිමාර්ග අංශ විසින් වෙන වෙනම තම ප්‍රගති වාර්තා සකස් කර ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබයි.

- **කෘෂිකර්ම සහ පශු සම්පත් අංශයට අදාළ කාර්යය හා කර්තව්‍යයන් (2024 නොවැම්බර් මස 25 වැනි දින අංක 2412/08 අංක දරණ අති විශේෂ ගැසට් පත්‍රය අනුව)**

1. රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග විෂයයන්ට සහ අදාළ දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, උපායමාර්ග, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසුවිපරම් කිරීම හා ඇගයීම
2. අමාත්‍යාංශ විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබා දීම
3. නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කළමනාකරණ ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියලුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම
4. රටේ ආහාර සුරක්ෂිතභාවය තහවුරු වන පරිදි ආහාර නිෂ්පාදනයේ කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම
5. ප්‍රමිතියෙන් යුත් කෘෂිකාර්මික නිෂ්පාදන තුළින් ආරක්ෂිත හා සෞඛ්‍ය සම්පන්න ආහාර ලබාදීම සහතික කිරීම
6. දේශීය වශයෙන් ඵලදායී ලෙස වගාකළ හැකි ආහාර නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම
7. ආනයනික භෝග සඳහා සුදුසු ආදේශක භෝග දේශීයව වගා කිරීම දිරිමත් කිරීම
8. අපනයන කෘෂි ගම්මාන ප්‍රවර්ධනය කිරීම
9. තත්කාලීන කෘෂිකර්ම දත්ත පද්ධතියක් ක්‍රියාත්මක කිරීම

10. තොග පවත්වා ගැනීම් හා සැපයුම් කටයුතු ක්‍රමවත් ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා නවීන තාක්ෂණය යොදාගැනීම
11. භෝග විවිධාංගීකරණය මත පදනම් වූ කෘෂිකාර්මික නිෂ්පාදන ඉහළ නැංවීම සඳහා අවශ්‍ය පියවර ගැනීම
12. දේශීය කෘෂි නිෂ්පාදනවල ගුණාත්මක අගය පාරිභෝගික ප්‍රජාව වෙත සහතික කිරීම සඳහා අවශ්‍ය ක්‍රමෝපායන් සකස් කිරීම
13. සම්ප්‍රදායික ගොවීන්, තරුණ පරපුර සහ ශිෂ්‍ය ශිෂ්‍යාවන් නවීන තාක්ෂණය සහිත කෘෂි අධ්‍යාපන අවස්ථා වෙත යොමු කිරීම
14. තරුණ කෘෂිකාර්මික ව්‍යවසායකයින් ගොඩනැගීම දිරි ගැන්වීම
15. රසායනික පලිබෝධ සහ වෙනත් රසායනික සංයෝග නිශ්චිත ප්‍රමිතියක් සහිතව යෙදීම නියාමනය කිරීම
16. කෘෂිකාර්මික කටයුතුවල යෙදෙන්නන් සඳහා වගා රක්ෂණ ක්‍රම හා ගොවි විශ්‍රාම ක්‍රමවේදයන් පුළුල් කිරීම
17. සැපයුම් දාමය ශක්තිමත් කිරීම මගින් ගොවීන්ගේ නිෂ්පාදන සඳහා සාධාරණ මිලක් සහතික කිරීම
18. දේශගුණික වෙනස්කම්, කාලගුණයේ දෛනික තොරතුරු, ගොවි ජනතාවට සන්නිවේදනය කිරීම මගින් ස්වභාවික ආපදාවන් අවම කර ගැනීම
19. ප්‍රමිතියෙන් යුතු බීජ හා පැළෑටි ගොවි ජනතාවට ලබා දීමේ ක්‍රමවේදයන් ක්‍රියාත්මක කිරීම
20. ජල කළමනාකරණය හා ගොවීන්ගේ වගා අවශ්‍යතා අනුව ජල සැපයුම කළමනාකරණය කිරීම
21. කෘෂිකාර්මික සංවර්ධන කලාප, කෘෂි ගම්මාන, ගොවි සමුපකාර සහ ගොවි සමාගම් (farmer-administered co-operatives and farmer companies) ප්‍රචලිත කිරීම
22. කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර හා සංවිධාන නගාසිටුවීම හා ප්‍රවර්ධනය සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
23. කාබනික පොහොර භාවිතය සහ වස විසෙන් තොර ආහාර නිෂ්පාදනය සඳහා ක්‍රමයෙන් නැඹුරු වීමේ වැඩසටහන් පුළුල් කිරීම හා දිරි ගැන්වීම
24. ගුණාත්මක තත්ත්වයේ පොහොර ආනයනය කිරීම හා බෙදාහැරීම රජයේ සහනාධාර ප්‍රතිපත්තිය තුළ කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම
25. නියමිත ප්‍රමිතියෙන් යුත් රසායනික පොහොර හා පරිසර හිතකාමී කාබනික පොහොර නිසි කලට බෙදා හැරීම සඳහා ක්‍රමවේද සැකසීම
26. දේශීය අමුද්‍රව්‍ය භාවිතයෙන් අන්තර්ජාතික ප්‍රමිතියට අනුගතව කාබනික පොහොර නිෂ්පාදනය දිරි ගැන්වීම
27. දේශීය ගොවියා සහ පාරිභෝගිකයා සෑහීමට පත්වන ආකාරයේ සාධාරණ මිල ප්‍රතිපත්තියක් සහ භෝග විවිධාංගීකරණ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම
28. අතිරික්ත නිෂ්පාදන ගබඩා කිරීම සඳහා විධිමත් වැඩපිළිවෙළක් සකස් කිරීම
29. කෘෂි නිෂ්පාදන අගය එකතු කර අපනයනය කිරීම සඳහා වැඩපිළිවෙළක් සකස් කිරීම
30. ජාත්‍යන්තර මට්ටමේ ගුණාත්මක බීජ නිෂ්පාදනය සඳහා දේශීය බීජ ප්‍රතිපත්තියක් හඳුන්වා දීම
31. ගුණාත්මක බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය සඳහා පෞද්ගලික අංශය දිරිමත් කිරීම
32. රජයේ ගොවිපොළවල් හා බීජ නිෂ්පාදන ගොවිපොළ සංවර්ධනය
33. දේශීය නිෂ්පාදනය වැඩිකිරීම තුළින් ආහාර භෝග ආනයනය අවම කිරීම
34. පශු සම්පත් අංශයේ නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය වන පහසුකම් සැපයීම

35. සත්ත්ව සුබසාධනය හා ඒ සම්බන්ධ කටයුතු
36. නවීන තාක්ෂණය යොදා ගනිමින් පශු සම්පත් සම්බන්ධ පර්යේෂණ අංශය පුළුල් කිරීම හා එහි ප්‍රතිඵල මත නිපැයුම් ක්ෂේත්‍රය ගුණාත්මකව හා ප්‍රමාණාත්මකව වර්ධනය සඳහා අවශ්‍ය පියවර ගැනීම
37. පශු ක්ෂේත්‍රයේ සත්ත්ව ගහනය වැඩි දියුණු කිරීම සඳහා විද්‍යාත්මක බෝ කිරීමේ ක්‍රම ප්‍රචලිත කිරීම සහ එම සතුන් රෝග වලින් ආරක්ෂා කිරීම හා නිරෝධායනය කටයුතු
38. විවිධ භූගෝලීය අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි කුඩා හා මධ්‍ය පරිමාණ ගොවිපොළ සංවර්ධනය දිරි ගැන්වීම
39. පශු සම්පත් ආශ්‍රිත නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම හා අපනයනය සඳහා දිරිගැන්වීම
40. මධ්‍යම හා මහා පරිමාණ ගව ගොවිපොළවල් ඉදිකිරීම සඳහා අවශ්‍ය ඉඩම් හා ආයෝජන පහසුකම් සැපයීම
41. කුඩා හා මධ්‍යම පරිමාණ නිෂ්පාදකයින් ප්‍රවර්ධනය කිරීමෙන් දේශීය නිෂ්පාදන හා පාරිභෝජන අවස්ථා පුළුල් කිරීම
42. ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ පරිපාලනය සහ පිරිස් කළමනාකරණය
43. සත්ත්ව ආහාර සඳහා අවශ්‍ය බඩඉරිඟු රට තුළ වගා කිරීම සඳහා කටයුතු කිරීම
44. ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවයේ පරිපාලනය සහ පිරිස් කළමණාකරණය
45. ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයන්ට අදාළ කටයුතු
46. සියලුම ආයතනයන් අධීක්ෂණය කිරීම

- **කෘෂිකර්ම සහ පශු සම්පත් අංශය යටතේ ඇති දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන සහ රාජ්‍ය සංස්ථා**

1. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
2. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
3. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
4. අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
5. ජාතික පසු අස්වනු කළමනාකරණ ආයතනය
6. කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය
7. වී අලෙවි මණ්ඩලය
8. හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු ආයතනය
9. ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව
10. ජාතික කෘෂිකාර්මික විවිධාංගීකරණය හා ජනාවාස අධිකාරිය (හදබිම අධිකාරිය)
11. ජාතික පොහොර ලේකම් කාර්යාලය
12. ස්ටේට් ෆර්ටිලයිසර් කම්පැනි ලිමිටඩ්
13. ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය (ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය)
14. ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය හා ආශ්‍රිත සමාගම්
15. මිල්කෝ (ප්‍රයිවට්) ලිමිටඩ්
16. සීමාසහිත මහවැලි සත්ත්ව ව්‍යාපාරික සමාගම

- **කෘෂිකර්ම සහ පශු සම්පත් අංශ මගින් ක්‍රියාත්මක කරන අණපනත්**

1. කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ පනත (1999 අංක 20 )
2. ගොවිජන සංවර්ධන පනත (2000 අංක 46)
3. ග්‍රාමෝදය මණ්ඩල පනත (1982 අංක 28)
4. ගස් හෙළීම (පාලන කිරීම) පනත (1951 අංක 9)
5. බීජ වී පනත (2003 අංක 22)
6. පස් සංරක්ෂණ පනත (1996 අංක 24)
7. වී අලෙවි මණ්ඩල පනත (1971 අංක 14)
8. ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු ආයතන පනත (1972 අංක 5)
9. කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්තිය සඳහා වන ශ්‍රී ලංකා සභාව පනත (1987 අංක 47)
10. රාජ්‍ය කෘෂිකාර්මික නීතිගත සංස්ථා පනත (1972 අංක11)
11. පළිබෝධ නාශක පාලනය කිරීමේ පනත (1980 අංක 33)
12. පැළෑටි ආරක්ෂා කිරීමේ පනත (1999 අංක 35)
13. පොහොර විධිමත් කිරීමේ පනත (1988 අංක 68)
14. ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර පනත (1973 අංක 18)
15. සත්ත්ව රෝග පනත (1992 අංක 59)
16. සත්ත්ව ආහාර පනත (1986 අංක 15)
17. සත්ත්ව පනත (1958 අංක 29)
18. පශු වෛද්‍ය වෘත්තික පනත (1956 අංක 46)
19. අපනයන කෘෂිකර්මාන්තය ප්‍රවර්ධනය පනත (1992 අංක 46)
20. වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන්

## කෘෂිකර්ම අංශය සහ පශු සම්පත් අංශය

- **දැක්ම**

ආහාර සුරක්ෂිතතාවය හා ජාතික සමෘද්ධිය උදෙසා කාර්යක්ෂම, ඵලදායී හා ශක්තිමත් කෘෂිකාර්මික අංශයක්

- **මෙහෙවර**

ස්වභාවික සම්පත් තිරසාර කළමනාකරණය තුළින් සමාජීය වශයෙන් පිළිගත් නව්‍ය හා වාණිජමය නැඹුරුවකින් යුතුව, ගෝලීය තරඟකාරී නිෂ්පාදනයන් බිහිකරන ව්‍යවසායකත්ව කෘෂිකර්මාන්තයක් සාක්ෂාත් කර ගැනීම.

- **අරමුණු**

1. ආහාර හා ආශ්‍රිත කෘෂි භෝග විෂයයෙහි ප්‍රතිපත්තිමය සහාය සැපයීම
2. ආහාර හා පෝෂණ සුරක්ෂිතතාවය තහවුරු කිරීම
3. කෘෂි නිෂ්පාදන සඳහා ස්ථාවර මිලක් පවත්වා ගැනීම
4. වී මිල දී ගැනීමේ හා වෙළෙඳපොල වැඩසටහන් කාර්යක්ෂම කළමනාකරණය
5. ව්‍යාපෘති නිසි කලට ක්‍රියාත්මක කිරීම
6. තෝරාගත් භෝගවල නිෂ්පාදනය ඉහළ නැංවීම
7. කඩිනම් ආහාර නිෂ්පාදන වැඩසටහන කාර්යක්ෂමව හා ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීම
8. විදේශ අරමුදල් කාර්යක්ෂමව හා ඵලදායි ලෙස යෙදවීම
9. සේවාලාභීන්ට මිත්‍රශීලී හා ප්‍රතිඵල අරමුණු කරගත් පරිපාලන ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම
10. සමස්ත රාජ්‍ය අංශය තුළ ඵලදායි කළමනාකරණයක් ඇති කිරීම

- **අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කළ යුතු තිරසාර සංවර්ධන අරමුණු**

1. අරමුණ 2 - සාගිනි නිමවා, ආහාර සුරක්ෂිතතාව හා ඉහළ පෝෂණ තත්වයක් සාක්ෂාත් කර ගැනීම සඳහා තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම.
2. අරමුණ 5 - ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සාක්ෂාත් කර ගැනීම සහ සියලුම කාන්තාවන් සහ ගැහැණු ළමයින් සවිබල ගැන්වීම.
3. අරමුණ 12 - තිරසර පරිභෝජන සහ නිෂ්පාදන රටාවන් සහතික කිරීම.

## 2024 වසර තුළ සිදුකරන ලද ප්‍රධාන සංවර්ධන වැඩසටහන් හා එහි මූල්‍ය ප්‍රගතිය (වැය ශීර්ෂ අංක 118 යටතේ කෘෂිකර්ම සහ පශු සම්පත් අංශවල, 2024.12.31 දින දක්වා)

| අ/අ | වැඩසටහන | වෙන් කළ ප්‍රතිපාදන (රු.මි) | සංශෝධිත ප්‍රතිපාදන (රු.මි.) | වියදම් කළ මුදල (රු.මි) | මූල්‍ය ප්‍රගතිය % |
|---|---|---|---|---|---|
| 1 | ප්‍රාග්ධන | 37,712.67 | 37,914.22 | 23,932.56 | 63 |
| 2 | පුනරාවර්තන | 48,389.80 | 52,909.08 | 51,657.33 | 98 |
| | සමස්ත අයවැය | 86,102.47 | 90,823.30 | 75,589.89 | 83 |

**කෘෂිකර්ම අංශය - වැය ශීර්ෂ අංක 118 යටතේ සිදුකරන ලද ප්‍රධාන සංවර්ධන වැඩසටහන්වල මූල්‍ය ප්‍රගතිය**

| අ/අ | වැඩසටහන | වෙන් කළ ප්‍රතිපාදන (රු.මි) | සංශෝධිත ප්‍රතිපාදන (රු.මි.) | වියදම් කළ මුදල (රු.මි) | මූල්‍ය ප්‍රගතිය % |
|---|---|---|---|---|---|
| | පුනරාවර්තන | | | | |
| | පොහොර සහනාධාර වැඩසටහන | 36,050.00 | 39,584.00 | 39,579.41 | 100 |
| | ප්‍රාග්ධන | | | | |
| 1. | ආහාර සුරක්ෂිතතාව සහ තාක්ෂණික ප්‍රවර්ධන විශේෂ වැඩසටහන | 300.00 | 300.00 | 221.51 | 74 |
| 2. | කෘෂිකර්ම හා ධීවර නවීකරණ වැඩසටහන | 2,500.00 | 2,500.00 | 668.51 | 27 |
| 3. | අතිරේක බෝග වගා වැඩසටහන | 150.00 | 150.00 | 149.80 | 100 |
| 4. | එළු පාලන ව්‍යාපෘතිය | 200.00 | 200.00 | 170.32 | 85 |
| 5. | විශ්ව විද්‍යාල සමඟ ජාතික කෘෂිකර්ම ප්‍රතිපත්තිය සකස් කිරීම | 20.00 | 20.00 | 14.76 | 74 |
| 6. | ගොවීන් සඳහා දායකත්ව රක්ෂණ ක්‍රමයක් හඳුන්වා දීම | 1,000.00 | 1,000.00 | 1,000.00 | 100 |
| | ***උප එකතුව - i*** | ***4,170.00*** | ***4,170.00*** | ***2,224.90*** | |
| | විදේශාධාර ව්‍යාපෘති | | | | |
| 1. | *දේශගුණික සුහුරු වාරිකෘෂි ව්‍යාපෘතිය (CSIAP) ලෝක බැංකු ණය | 11,800.00 | 11,350.00 | 6,002.26 | 53 |
| 2. | කුඩා පරිමාණ කෘෂිව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන (SAPP) - IFAD | 7,024.00 | 7,024.00 | 4,777.39 | 68 |
| 3. | කෘෂිකාර්මික අංශය නවීකරණ ව්‍යාපෘතිය (ASMP) - ලෝක බැංකු ණය | 7,250.00 | 7,700.00 | 6,937.09 | 90 |
| 4. | කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සඳහා ඇති වන අහිතකර බලපෑම් ඉවත් කිරීමේ ව්‍යාපෘතිය (SARP) | 2,836.00 | 979.50 | 447.02 | 46 |
| 5. | කොළඹ-කටුනායක ජාතික ශාක නිරෝධායන සේවයේ උපකරණ අලුත් වැඩියාව හා ප්‍රතිස්ථාපනය කිරීම (JICA) | 14.17 | 14.17 | 7.93 | 56 |
| 6. | ජාතික ශාක නිරෝධායන සේවයේ පර්යේෂණ පහසුකම් වැඩි දියුණු කිරීම (KOICA) | 22.50 | 28.20 | 28.03 | 100 |
| | ***උප එකතුව - ii*** | ***28,946.67*** | ***27,095.87*** | ***18199.72*** | |
| | අමාත්‍යාංශයේ විෂය පථයට අයත් ආයතන | | | | |
| 1. | හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය | 30.00 | 30.00 | 23.53 | 78 |
| 2. | පසු අස්වනු තාක්ෂණ ආයතනය | 35.00 | 35.00 | 25.30 | 72 |

| අ/ අ | වැඩසටහන | වෙන් කළ ප්‍රතිපාදන (රු.මි) | සංශෝධිත ප්‍රතිපාදන (රු.මි.) | වියදම් කළ මුදල (රු.මි) | මූල්‍ය ප්‍රගතිය % |
|---|---|---|---|---|---|
| 3. | ශ්‍රී ලංකා හදබිම අධිකාරිය | 220.00 | 220.00 | 220.71 | 100 |
| 4. | ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව | 30.00 | 30.00 | 21.18 | 71 |
| 5. | විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන සංවර්ධන කටයුතු | 50.00 | 50.00 | 7.05 | 14 |
| 6. | ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියට පහසුකම් සැලසීම | 143.59 | 143.59 | 126.99 | 88 |
| | *උප එකතුව - iii* | ***508.59*** | ***508.59*** | ***424.76*** | |
| | මුළු එකතුව - (i+ii+iii) | **33,625.26** | **31,774.46** | **20,849.38** | |

**පශු සම්පත් අංශය - වැය ශීර්ෂ අංක 118 යටතේ සිදුකරන ලද ප්‍රධාන සංවර්ධන වැඩසටහන්වල මූල්‍ය ප්‍රගතිය**

| අ/ අ | වැඩසටහන | වෙන් කළ මුදල (රු.මි) | වියදම් කළ මුදල (රු.මි) | මූල්‍ය ප්‍රගතිය % | වෙනත් කරුණු |
|---|---|---|---|---|---|
| 1. | සත්ත්ව අභිජනන සහ ගොවිපොළ සංවර්ධනය | 50.00 | 21.45 | 43 | 2025 සඳහා මූල්‍ය බැඳීම් ලෙස රු.මි. 6.43ක් ගෙවීමට ඇත |
| 2. | කුඩා හා මධ්‍ය පරිමාණ පශු සම්පත් සංවර්ධනය (යටිතල පහසුකම් සංවර්ධනය) | 150.00 | 27.46 | 18 | 2025 සඳහා මූල්‍ය බැඳීම් ලෙස රු.මි. 13.90ක් ගෙවීමට ඇත. |
| 3. | කුඩා හා මධ්‍ය පරිමාණ පශු සම්පත් සංවර්ධනය (සංවර්ධන සහාය) | 100.00 | 82.96 | 83 | 2025 සඳහා මූල්‍ය බැඳීම් ලෙස රු.මි. 2.49ක් ගෙවීමට ඇත. |
| | *උප එකතුව - i* | ***300.00*** | ***131.87*** | | |
| 1. | කුඩා පරිමාණ කිරි නිෂ්පාදන සමූපකාර සමිති සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය (ප්‍රංශ ආධාර) | 10.00 | 0.60 | 6 | |
| | *උප එකතුව - ii* | ***10.00*** | ***0.60*** | | |
| | මුළු එකතුව - (i+ii) | **310.00** | **132.47** | | |

## 2025 වර්ෂයේ සංවර්ධන වැඩසටහන්වල මූල්‍ය හා භෞතික ඉලක්ක

- **කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයේ 2025 වර්ෂයේ මූල්‍ය ඉලක්ක**

| අ/අ | ප්‍රධාන සංවර්ධන වැඩසටහන | ඇස්තමේන්තු මුදල (රු.මි.) |
|---|---|---|
| 1 | ප්‍රාග්ධන වියදම් | **112,119.91** |
| | කෘෂිකර්ම හා පශු සම්පත් අංශය | 33,206.17 |
| | වාරිමාර්ග අංශය | 72,877.05 |
| | ඉඩම් අංශය | 6,036.69 |
| | | |
| 2 | පුනරාවර්තන වියදම් | **72,083.21** |
| | කෘෂිකර්ම හා පශු සම්පත් අංශය | 65,936.08 |
| | වාරිමාර්ග අංශය | 5,553.91 |
| | ඉඩම් අංශය | 593.22 |

## 01. කෘෂිකර්ම අංශය

- **2025 වර්ෂයේ මූල්‍ය ඉලක්ක**

| අ/අ | වැඩසටහන | ප්‍රතිපාදන අවශ්‍යතාවය (රු.මි.) |
|---|---|---|
| 1 | ආහාර සුරක්ෂිතතාව හා තාක්ෂණය පිළිබඳ විශේෂ වැඩසටහන | 3,600.00 |
| 2 | කෘෂි නවීකරණය හා තරුණ කෘෂි ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන | 3,050.00 |
| 3 | බෝග රක්ෂණය සඳහා රජයේ දායකත්වය | 2,200.00 |
| 4 | ජාතික කෘෂි පර්යේෂණ සැලැස්ම ක්‍රියාත්මක කිරීම | 118.00 |
| 5 | අතිරේක බෝග වගා වැඩසටහන | 150.00 |
| 6 | එළු පාලනය තුළින් ජීවනෝපාය සංවර්ධනය | 200.00 |
| | **එකතුව** | **9,318.00** |

- **ආහාර සුරක්ෂිතතාව හා තාක්ෂණය පිළිබඳ විශේෂ වැඩසටහන**

| # | අරමුණ | ව්‍යාපෘතිය | ප්‍රතිපාදනය (රු.මි.) | |
|---|---|---|---|---|
| | | | වැය විෂයය 118-2-03-020-2202 (සහනාධාරමය) | වැය විෂයය 118-2-03-020-2509 (සහනාධාරමය නොවන) |
| 1 | තෝරා ගත් බෝග 05 ක ජාතික අවශ්‍යතාව පරිපූර්ණ කිරීම. | විශේෂිත බෝගවල නිෂ්පාදන ඵලදායීතාව ඉහළ නැංවීම හා නිෂ්පාදනය ඉහළ නැංවීම (අර්තාපල්, මිරිස්, මුං, තෝරාගත් එළවළු සහ පළතුරු, දේශීය අල බෝග) | 75.00 | 150.00 |

| # | අරමුණ | ව්‍යාපෘතිය | ප්‍රතිපාදනය (රු.මි.) | |
|---|---|---|---|---|
| | | | වැය විෂයය 118-2-03-020-2202 (සහනාධාරමය) | වැය විෂයය 118-2-03-020-2509 (සහනාධාරමය නොවන) |
| 2 | කෘෂිකර්මය සඳහා නවීන තාක්ෂණ ක්‍රම භාවිතා කිරීම. | උසස් තාක්ෂණය භාවිතය ප්‍රවර්ධනය මගින් නිෂ්පාදන ඵලදායීතාවය ඉහළ නැංවීම (Irrigation Solar pump, Poly tunnel, Hydroponics, Shade net, Fertility management, Development of Post-harvest technoplogies, Agro wells) | 100.00 | 100.00 |
| 3 | කෘෂි පාදක අපනයනය ආදායම 5% කින් ප්‍රවර්ධනය කිරීම | කෘෂිපාදක අපනයන කර්මාන්ත ප්‍රවර්ධනය හා ව්‍යවසායකත්ව සංවර්ධනය (Post- harvest management, Value chain management, Mashroom, Bee keeping) | 175.00 | - |
| 4 | වන සත්ත්ව හානිය 5% කින් අඩුකිරීම | බෝග ආරක්ෂණය (ජෛවීය හා අජෛවීය සාධක හේතුවෙන් බෝගවලට සිදුවන හානි අවම කිරීම, වන සත්ව හානි, සේනා දළඹු හානි අවම කිරීම) | 75.00 | 100.00 |
| 5 | තරුණයින් ව්‍යවසායකයින් බවට පත් කිරීම. | තරුණ කෘෂි ව්‍යවසායකත්ව ගම්මාන වැඩසටහන (ගම්මාන 200) | 2,000.00 | - |
| 6 | ස්වාභාවික විපත් සඳහා  පූර්ව සූදානම් වීම. | බෝග නිෂ්පාදනය සඳහා දේශගුණික විපර්යාස වලින් ඇති වියහැකි අවදානම්කළමනාකරණය කිරීම | 25.00 | 50.00 |
| 7 | පරිසර හිතකාමී පුනර්ජනනීය බලශක්ති භාවිතයට යොමු කිරීම | කෘෂිකර්මාන්තයේ දී පුනර්ජනනීය බලශක්තිය සහ වෙනත් පරිසර හිතකාමී තාක්ෂණයන් භාවිතය ප්‍රවර්ධනය කිරීම | 50.00 | 358.00 |
| 8 | කාන්තාවන්ට ශක්තිමත් ආර්ථිකයක් හිමි කර දීම. | කෘෂි ව්‍යවසායකත්ව සංවර්ධනය තුළින් කාන්තාවන් ආර්ථික වශයෙන් සවිබලගැන්වීම | 25.00 | - |
| 9 | නවීන තාක්ෂණ භාවිතය | කාර්යක්ෂම කෘෂි යාන්ත්‍රීකරණය ප්‍රවර්ධනය | 75.00 | 150.00 |
| 10 | නව පහසු ශිල්ප ක්‍රම හඳුනා ගැනීම | කෘෂි නවෝත්පාදනය දිරිගැන්වීම | - | 5.00 |
| 11 | නවීන කෘෂි තාකෂණික ක්‍රම ප්‍රචාරණය කිරීම | කෘෂිකර්ම ව්‍යාප්තිය, නව තාක්ෂණ ප්‍රචාරණය තුළින් නිෂ්පාදන ඵලදායීතාවය ඉහළ නැංවීම, ගොවි හමුව ආදර්ශන සහිතව දිස්ත්‍රික් මට්ටමින් පැවැත්වීම | - | 50.00 |
| 12 | ජනගත කරන ලද කෘෂි පර්යේෂණ ප්‍රතිඵල බෝග වගාවට අනුගත කිරීම. | ව්‍යාපෘති පසු විපරම, අධීක්ෂණය සහ ඇගයීම (ජනගත කරන ලද කෘෂි තාක්ෂණයන් ඇගයීම) | - | 25.00 |

| # | අරමුණ | ව්‍යාපෘතිය | ප්‍රතිපාදනය (රු.මි.) | |
|---|---|---|---|---|
| | | | වැය විෂයය 118-2-03-020-2202 (සහනාධාරමය) | වැය විෂයය 118-2-03-020-2509 (සහනාධාරමය නොවන) |
| 13 | දිස්ත්‍රික් ව්‍යාපෘති සඳහා සෘජු පසු විපරම | දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටු රැස්වීම් | - | 5.00 |
| 14 | විභවතාව පදනම්ව නිසි කලට බෝග වගා කිරීම | වාර්ෂික බෝග නිෂ්පාදන සැලැස්ම | - | 2.00 |
| 15 | පොහොර කළමනාකරණය කාර්යක්ෂම කිරීම. | ජාතික පොහොර තොරතුරු කළමනාකරණ පද්ධතිය | - | 5.00 |
| | | **එකතුව** | **2,600.00** | **1,000.00** |

- **අතිරේක බෝග වගා වැඩසටහන (උඳු/මුං)**

| වැඩසටහන | මිනුම ඒකකය | ඉලක්කය | ඒකක පිරිවැය | මුළු පිරිවැය (රු.මි.) |
|---|---|---|---|---|
| භෝග වගා ව්‍යාපෘතිය | ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව | 20,000 | ප්‍රතිලාභී පවුලක් සඳහා අක්කර 01ට උපරිම - රු.13,000/- | 150.00 |
| | වගා කරන ලද ඉඩම් ප්‍රමාණය - හෙක්ටයාර | 4,000 | | |
| | අස්වැන්න මෙ.ටො. | 3,100 | | |

- **එළු පාලනය තුලින් ජීවනෝපාය සංවර්ධනය**

| වැඩසටහන | මිනුම ඒකකය | ඉලක්කය | ඒකක පිරිවැය | මුළු පිරිවැය (රු.මි.) |
|---|---|---|---|---|
| එළු පාලන ව්‍යාපෘතිය | ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව | 1,280 | ප්‍රතිලාභී පවුලක් සඳහා එළුවන් පස්දෙනෙකුට රු.150,000/- බැගින් | 200.00 |
| | එළුවන් සංඛ්‍යාව | 6,400 | | |

## 02. පශු සම්පත් අංශය

- **2025 වර්ෂයේ මූල්‍ය ඉලක්ක (ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන්)**

| අ/අ | වැය ශීර්ෂය | ප්‍රධාන සංවර්ධන වැඩසටහන | ඇස්තමේන්තු මුදල (රු.මි.) |
|---|---|---|---|
| 01 | 118-2-03-078-2507 | **සත්ත්ව අභිජනන සහ ගොවිපොළ සංවර්ධනය** | **100.00** |
| 02 | 118-2-03-079-2506 | **කුඩා හා මධ්‍ය පරිමාණ පශු සම්පත් සංවර්ධනය (යටිතල පහසුකම් සංවර්ධනය)** | **150.00** |
| | | පශු සම්පත් සංවර්ධන මධ්‍යකාලීන වැඩසටහන | 40.00 |
| | | කිරි ගව පාලන ක්ෂේත්‍රය | 100.00 |
| | | ධාරිතා සංවර්ධන වැඩසටහන | 10.00 |
| 03 | 118-2-03-079-2202 | **කුඩා හා මධ්‍ය පරිමාණ පශු සම්පත් සංවර්ධනය (සංවර්ධන සහාය)** | **310.00** |
| | | කිරි ගව පාලන ක්ෂේත්‍රය | 200.00 |
| | | කුකුළු පාලන ක්ෂේත්‍රය | 50.00 |
| | | එළු පාලන ක්ෂේත්‍රය | 35.00 |
| | | සූකර පාලන ක්ෂේත්‍රය | 25.00 |
| 04 | 118-2-03-056-2506 | **කුඩා පරිමාණ කිරි සැකසුම් මධ්‍යස්ථාන ස්ථාපනය කිරීම** | **5.00** |
| **එකතුව** | | | **565.00** |

# කෘෂිකර්ම අංශය

## වැය ශීර්ෂ අංක 118 යටතේ සිදු කරන ලද ප්‍රධාන සංවර්ධන වැඩසටහන්වල මූල්‍ය සහ භෞතික ප්‍රගතිය

### 01. ආහාර සුරක්ෂිතතාව සහ තාක්ෂණික ප්‍රවර්ධන විශේෂ වැඩසටහන - වැය ශීර්ෂ අංක 118-2-03-020-2509/2202

2024 වර්ෂය සඳහා ආහාර සුරක්ෂිතතාව සහ තාක්ෂණය වැඩසටහන යටතේ අයවැය මඟින් රු.මි. 300.00 ක් වෙන් කරන ලදි. එම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ මූලික අරමුණු පහත පරිදි වේ.

i.) ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම සහ තාක්ෂණික ප්‍රවර්ධනය.
ii.) ආහාර උද්ධමනය අවම කිරීම.
iii.) විදේශ විනිමය ඉතිරි කර ගැනීම.
iv.) තරුණ ප්‍රජාව කෘෂිකර්මාන්තය වෙත ආකර්ෂණය කර ගැනීම.
v.) නව තාක්ෂණය වෙත ගොවි ජනතාව නැඹුරු කිරීම.

මෙම අරමුණු ඉටු කරගැනීම සඳහා හඳුනාගත් විශේෂිත බෝගවල (ක්ෂේත්‍ර බෝග, අල බෝග, එළවළු බෝග) නිෂ්පාදන ඵලදායීතාව ඉහළ නැංවීම, කෘෂිකර්මය සඳහා උසස් තාක්ෂණය භාවිතය ප්‍රවර්ධනය කිරීම, කෘෂි පාදක කර්මාන්ත ප්‍රවර්ධනය හා ව්‍යවසායකත්ව සංවර්ධනය, ජල කළමනාකරණය, දේශගුණ විපර්යාස අවම කිරීම සඳහා වන බෝග ආරක්ෂණ වැඩ පිළිවෙල, කෘෂිකර්ම ව්‍යාප්ති කටයුතු, කෘෂිකර්ම නවෝත්පාදනය සහ පසු අස්වනු කළමනාකරණය යන ක්ෂේත්‍ර යටතේ ව්‍යාපෘති ක්‍රියාත්මක වේ.

මෙම වැඩසටහන යටතේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම කෘෂිකර්ම අමාත්‍යාංශය, දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාල, විශේෂ ව්‍යාපෘති සඳහා පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාල සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ජාතික පසු අස්වනු කළමනාකරණ ආයතනය මඟින් සිදු කරනු ලබයි. ව්‍යාපෘතියේ ප්‍රගති පාලන කටයුතු කෘෂිකර්ම අමාත්‍යාංශය මඟින් සිදු කරනු ලැබේ.

මේ යටතේ වූ ක්‍රියාකාරකම්හි ප්‍රගතිය පහත පරිදි වේ.

| අ.අ | ව්‍යාපෘති ක්‍රියාත්මක කළ ආයතනය | ව්‍යාපෘති සංඛ්‍යාව | වෙන් කළ මුදල (රු.මි.) | ප්‍රගතිය | |
|---|---|---|---|---|---|
| | | | | මූල්‍ය (රු.මි.) | භෞතික (%) |
| 1 | කෘෂිකර්ම අමාත්‍යාංශය | 11 | 52.20 | 221.51 | 96 |
| 2 | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 19 | 108.21 | | |
| 3 | දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාල (18ක් මඟින්) | 34 | 91.26 | | |
| 4 | ජාතික පසු අස්වනු කළමනාකරණ ආයතනය | 5 | 32.70 | | |
| 5 | පළාත් සභා (ඌව, බස්නාහිර) | 2 | 4.15 | | |
| 6 | ජාතික පොහොර ලේකම් කාර්යාලය | 1 | 3.49 | | |
| 7 | වී අලෙවි මණ්ඩලය | 1 | 4.02 | | |
| | **එකතුව** | 73 | 296.03 | | |

ඡායාරූප අංක 01 - 03

## 02. කෘෂිකර්ම නවීකරණ වැඩසටහන - වැය ශීර්ෂ අංක 118-2-03-088-2509

2024 අයවැය කතාවේ යෝජනා අංක 36 යටතේ කෘෂි හා ධීවර නවීකරණ මණ්ඩල ශක්තිමත් කිරීම සඳහා රු.මි. 2,500.00 ක් වෙන් කර ඇත. ඒ අනුව, ජනාධිපති ලේකම් කාර්යාලයේ පිහිටුවා තිබූ "කෘෂිකර්ම නවීකරණ කේන්ද්‍රස්ථානය" හරහා (Agriculture Modernization Hub) මෙහි නියමු ව්‍යාපෘති ආරම්භ කරන ලදි. වැඩසටහන යටතේ දිස්ත්‍රික්ක 25 ක් තුළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 26 ක් හා ආයතන 05 ක් මගින් ජනාධිපති කාර්යාලය වෙත ඉදිරිපත් කර අනුමැතිය ලද ව්‍යාපෘති යෝජනා ඉදිරි කටයුතු සඳහා අමාත්‍යාංශය වෙත යොමු කරන ලදි. පසුව එම ව්‍යාපෘති යෝජනා දිස්ත්‍රික් ලේකම් කාර්යාල මගින් ක්‍රියාත්මක කරන ලදි.

මෙම වැඩසටහන පහත සඳහන් ප්‍රධාන සංරචක 03 ක් යටතේ ක්‍රියාත්මක විය.

### i.) ණය යෝජනා ක්‍රමය

ජනාධිපති ලේකම්ගේ 2024.07.22 දිනැති PS/APL/Circular/6/2024 චක්‍රලේඛය මගින් දක්වා ඇති කෘෂිකර්ම නවීකරණ වැඩසටහනෙහි පොළී රහිත ණය යෝජනා ක්‍රමය ලංකා බැංකුව, මහජන බැංකුව සහ ප්‍රාදේශීය සංවර්ධන බැංකුව යන බැංකු හරහා ව්‍යාපෘති බලප්‍රදේශය තුළ ක්‍රියාත්මක කරන ලද අතර ප්‍රගතිය පහත වගුවේ දැක්වේ.

| බැංකුව | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | නිදහස් කර ඇති ණය මුදල (රු.මි.) |
|---|---|---|
| ලංකා බැංකුව | 151 | 91.30 |
| ප්‍රාදේශීය සංවර්ධන බැංකුව | 71 | 70.33 |
| මහජන බැංකුව | 12 | 7.44 |
| **එකතුව** | **234** | **169.07** |

### ii.) ආයතන මගින් ක්‍රියාත්මක වූ වැඩසටහන

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය යන ආයතන මගින් එක් එක් ආයතනය සඳහා රු.මි. 35.00 බැගින් ප්‍රතිපාදන ලබා දී ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදි.

| ආයතනය | ව්‍යාපෘති සාරාංශය | වෙන් කළ මුදල (රු.මි.) | ප්‍රගතිය | |
|---|---|---|---|---|
| | | | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | භෞතික ප්‍රගතිය (%) |
| කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | වී වගාවේ ඵලදායීතාවය ඉහළ නැංවීම අනුරාධපුර දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක විය. | 13.28 | 10.15 | 100 |
| | යල කන්නයේ බඩ ඉරිඟු නිෂ්පාදනය සඳහා කුඹුරු ඉඩම් විවිධාංගීකරණය කිරීම හම්බන්තොට, පොළොන්නරුව දිස්ත්‍රික්ක තුළ ක්‍රියාත්මක විය. | 21.60 | 21.58 | 100 |
| අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | පසු අස්වනු උපකරණ භාවිතය ප්‍රචලිත කිරීම මගින් අපනයන කෘෂි බෝගවල ගුණාත්මකභාවය ඉහළ නැංවීම | 10.60 | 6.62 | 85 |

| ආයතනය | ව්‍යාපෘති සාරාංශය | වෙන් කළ මුදල (රු.මි.) | ප්‍රගතිය | |
|---|---|---|---|---|
| | | | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | භෞතික ප්‍රගතිය (%) |
| සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | නව තාක්ෂණය හඳුන්වාදීම තුළින් කුඩා පරිමාණ කිරි නිෂ්පාදකයන් බිහි කිරීම | 35.00 | 27.10 | 90 |
| කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව | ලාංකීය සත්‍ය කුරුඳු නඟා සිටුවීමේ බහු දිශා ප්‍රවේශය | 35.00 | 31.76 | 95 |
| ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය | දැනට පවතින විසිතුරු මත්ස්‍ය ගොවිපළ සඳහා නව තාක්ෂණය සහ දැනුවත් කිරීම හඳුන්වා දෙමින් විසිතුරු මත්ස්‍ය නිෂ්පාදනය ඉහළ නැංවීම | 35.00 | 34.65 | 100 |

**iii.) තරුණ කෘෂි ව්‍යවසායකත්ව ගම්මාන වැඩසටහන**

කෘෂිකර්මාන්තය වෙත තරුණ ප්‍රජාවගේ ආකර්ෂණය ලබා ගනිමින් ඔවුන්ගේ ආර්ථික තත්ත්වය වර්ධනය කිරීම උදෙසා ප්‍රධාන ආදායම් මාර්ග බිහි කරමින් තරුණ කෘෂි ව්‍යවසායක ප්‍රජාවක් බිහි කිරීම මෙම සංරචකය මගින් අපේක්ෂා කරන ලදි.

2024 වසරේ පවත්නා ප්‍රතිපාදන ප්‍රශස්ත ලෙස උපයෝගී කර ගනිමින් මෙම වැඩසටහන තෝරාගත් ගම්මාන 160 ක් තුළ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලදි. ඒ අනුව, රු.මි. 367.58 ක් වැය කර, ගම්මාන 118 ක ව්‍යාපෘති 520 ක් ක්‍රියාත්මක කරන ලදි.

ඡායාරූප අංක 04 - 08

## 03. අතිරේක බෝග වගා වැඩසටහන - වැය ශීර්ෂ අංක 118-2-03-071-2202

2024 වසරේ අනුමත ප්‍රතිපාදන රු.මි. 150.00 කි. එම ප්‍රතිපාදන යොදවා ප්‍රතිලාභීන් 18,345 ක ප්‍රමාණයක් සඳහා හෙක්ටයාර 4,504 ක උඳු සහ මුං භෝග වගා කටයුතු සිදු කර ඇත. මෙමගින් මෙ.ටො. 2,200 ක පමණ අස්වැන්න ප්‍රමාණයක් අපේක්ෂිත අතර වර්ෂය තුළ පැවති අයහපත් කාලගුණික තත්ත්වය හේතුවෙන් අස්වැන්නෙහි අඩුවීමක් පවතින බව නිරීක්ෂණය වී ඇත. ව්‍යාපෘතියෙහි මූල්‍ය ප්‍රගතිය 98% ක් වන අතර භෞතික ප්‍රගතිය 90% ක් වේ. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම දිස්ත්‍රික් ලේකම්ගේ මෙහෙයවීම යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සම්බන්ධීකරණය තුළින් දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ මගින් සිදු කර ඇත. දැනට යල කන්නයේ අස්වැන්න ලබාගෙන ඇති අතර මහ කන්නයේ අස්වැන්න ලැබෙමින් පවතී.

**උඳු භෝග වගාව**

යාපනය, කිලිනොච්චි, වවුනියාව, මුලතිව්, කුරුණෑගල, පොළොන්නරුව, ත්‍රිකුණාමලය, මඩකලපුව, අම්පාර, සහ අනුරාධපුරය යන දිස්ත්‍රික්ක සඳහා රු.මි. 56.00 ක් වෙන් කර ඇත. මේ යටතේ ප්‍රතිලාභීන් 7,686 ක් සඳහා බීජ කි.ග්‍රෑ. 43,407 ක ප්‍රමාණයක් ඉඩම් හෙක්ටයාර් 1,736 ක වගා කර ඇත.

**මුං භෝග වගාව**

යාපනය, කිලිනොච්චි, වවුනියාව, මන්නාරම, මුලතිව්, කුරුණෑගල, පොළොන්නරුව, ත්‍රිකුණාමලය, මඩකලපුව, අම්පාර, මොනරාගල, අනුරාධපුරය සහ හම්බන්තොට යන දිස්ත්‍රික්ක සඳහා රු.මි. 94.00 ක් වෙන් කර ඇත. මේ යටතේ ප්‍රතිලාභීන් 10,659 ක් සඳහා බීජ කි.ග්‍රෑ. 69,201 ක ප්‍රමාණයක් ලබා දී ඉඩම් හෙක්ටයාර් 2,768 ක් වගා කර ඇත.

ඡායාරූප අංක 09

## 04. එළු පාලන ව්‍යාපෘතිය - වැය ශීර්ෂ අංක 118-2-03-080-2202

2024 වසරේ අනුමත ප්‍රතිපාදන රු.මි. 200.00 කි. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම දිස්ත්‍රික්ක 18 ක දිස්ත්‍රික් ලේකම්ගේ අධීක්ෂණය යටතේ ප්‍රාදේශීය ලේකම්/පශු වෛද්‍ය නිලධාරී මහින්ද මහනුවර, නුවරඑළිය සහ මාතලේ දිස්ත්‍රික්ක මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම්ගේ අධීක්ෂණය යටතේද පශු වෛද්‍ය නිලධාරීන් මගින් සිදු කරන ලදි. ප්‍රතිලාභී පවුලකට එළුවන් තිදෙනෙකු මිලදී ගැනීම සඳහා රු. 85,000.00 ක මුදලක් මෙම වැඩසටහන මගින් වෙන් කරන ලදි. ඒ අනුව, මෙම වැඩසටහන මගින් දිස්ත්‍රික්ක 21 ක් තුළ ප්‍රතිලාභී පවුල් 2025 ක් සඳහා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර ඇත. ව්‍යාපෘතියෙහි මූල්‍ය ප්‍රගතිය 65% ක් වන අතර භෞතික ප්‍රගතිය 70% ක් පමණ වේ.

ඡායාරූප අංක 10

## 05. විශ්ව විද්‍යාල සමග ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලැස්ම සකස් කිරීම - වැය ශීර්ෂ අංක 118-2-03-026-2507 (SLCARP)

ආයතනය යටතේ දක්වා ඇත.

## 06. ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව - වැය ශීර්ෂ අංක 118-2-03-065-2201

ආයතනය යටතේ දක්වා ඇත.

## 07. ගොවීන් සඳහා දායකත්ව රක්ෂණ ක්‍රමයක් හඳුන්වා දීම - වැය ශීර්ෂ අංක 118-2-03-043-2202

ආයතනය යටතේ දක්වා ඇත.

## වැය ශීර්ෂ අංක 118 පුනරාවර්තන වියදම් යටතේ සිදුකරන ලද ප්‍රධාන වැඩසටහනෙහි ප්‍රගතිය

### 1. පොහොර සහනාධාර වැඩසටහන

2024 වර්ෂය සඳහා 118-02-03-2-021-1504 වැය ශීර්ෂය යටතේ රු. මි. 36,050 ක් වෙන් වී ඇති අතර අමතර ප්‍රතිපාදන ලෙස රු.මි. 3,533.60 ක් ලබා දී ඇත. ඒ අනුව 2024 වර්ෂය සඳහා ලබා දී ඇති මුළු ප්‍රතිපාදන ප්‍රමාණය රු.මි. 39,583.60 කි.

1. කුඹුරු ඉඩම්වල වගා කරන ගොවීන් සඳහා මූල්‍ය සහනාධාරය ලබාදීම

| කන්නය | සහනාධාර මුදල | ගෙවූ මුදල (රු.මි.) | හෙක්ටයාර ප්‍රමාණය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 2023/24 මහ කන්නය | හෙක්ටයාර දෙකක උපරිමයකට යටත්ව හෙක්ටයාර එකක් සඳහා රු.15,000 ක මූල්‍ය සහනාධාර ලබාදීම | 23,506 | 740,223.01 | 1,602,347 |
| 2024 යල කන්නය | හෙක්ටයාර දෙකක උපරිමයකට යටත්ව හෙක්ටයාර එකක් සඳහා රු.15,000 ක මූල්‍ය සහනාධාර ලබාදීම | | 454,048.21 | 964,082 |
| 2024/25 මහ කන්නය (2024.12.31 දිනට) | හෙක්ටයාර දෙකක උපරිමයකට යටත්ව හෙක්ටයාර එකක් සඳහා වී වගා කරන ගොවීන් හට රු.25,000 ක මූල්‍ය සහනාධාර ලබාදීම | | 497,306.10 | 682,194 |

2. ලෝක ආහාර වැඩසටහන යටතේ ලෝක ආහාර වැඩසටහන යටතේ මියුරියේට් ඔෆ් පොටෑෂ් (MOP) පොහොර නොමිලේ බෙදාහැරීම.

   2.1. ලෝක ආහාර වැඩසටහන යටතේ ලෝක ආහාර වැඩසටහන යටතේ මියුරියේට් ඔෆ් පොටෑෂ් (MOP) පොහොර මෙ.ටො. 54,930.68 ක ප්‍රමාණයක් 2024.12.11 දින ශ්‍රී ලංකා වරාය වෙත පැමිණි අතර මෙ.ටො. 23,127 ක ප්‍රමාණයක් ගොවිජන සේවා මධ්‍යස්ථාන මගින් ඍජු පොහොර ලෙස බෙදාහරින ලදී. ඉතිරි පොහොර ප්‍රමාණය මිශ්‍ර පොහොර ලෙස 2025 වර්ෂයේදී පොල් වගාකරුවන් සඳහා බෙදා දීමට සැලසුම් කර ඇත.

   2.2. ලෝක ආහාර වැඩසටහන යටතේ ලෝක ආහාර වැඩසටහන යටතේ මියුරියේට් ඔෆ් පොටෑෂ් (MOP) ආනයනය කිරීම සඳහා ගෙවා ඇති එකතු කළ අගය මත බදු මුදල රු.මි. 1,283.60 කි.

3. ලංකා පොහොර සමාගම හා කොළඹ කොමර්ෂල් පොහොර සමාගම විසින් ආනයනය කරන ලද පොහොර සඳහා මහජන බැංකුව විසින් විවෘත කරන ලද ණයවර ලිපි සඳහා ගෙවියයුතු මුදල දිගු කාලීන ණය බවට පරිවර්තනය වීම හේතුවෙන් 2024 වර්ෂය තුළ මාසික වාරික හා පොළී ලෙස රු. මි. 14,512.50 මුදලක් ගෙවීම් සිදු කර ඇත.

4. ජාතික පොහොර ලේකම් කාර්යාලයේ පොහොර නියැදි පරීක්ෂාව සඳහා රු.මි. 0.69 ක් ගෙවා ඇත.

5. පෙර වර්ෂවල බැදීම් හා බැරකම් ලෙස රු.මි. 276.33 ක මුදලක් ගෙවීම් කර ඇත.

## කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කර ඇති විශේෂ ව්‍යාපෘති

### 1. "ජාතික කෘෂිකාර්මික ප්‍රතිපත්තිය" සකස් කිරීම

රාජ්‍ය ප්‍රතිපත්ති ප්‍රකාශයේ අරමුණුවලට අනුව ආහාර සුරක්ෂිතතාවය, කෘෂි ව්‍යවසායකත්වය, කෘෂි අපනයන දිරි ගැන්වීම අරමුණු කරගනිමින් ජාතික කෘෂිකර්ම ප්‍රතිපත්තිය සකස් කර ඇත. එමගින් ආහාර පද්ධති තිරසාර ලෙස සුරක්ෂිත කිරීම, හරිත කෘෂිකර්මාන්තය ප්‍රචලිත කිරීම, රසායනික පොහොර භාවිතය අවම කිරීම, පසු අස්වනු තාක්ෂණය ප්‍රචලිත කිරීම ආදිය කෙරෙහි විශේෂයෙන් අවධානයට යොමු කර ඇත.

- **භෞතික ප්‍රගතිය**

තේමා 10ක් යටතේ ඉලක්ක 13ක් සපුරාගැනීම සඳහා සකස් කරන ලද "ජාතික කෘෂිකාර්මික ප්‍රතිපත්තිය" අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගැනීම සඳහා අවශ්‍ය කටයුතු සඳහා ඉදිරිපත් කර ඇත.

# 2024 වර්ෂයේ විදේශ අරමුදල් මත ක්‍රියාත්මක කරනු ලැබූ ව්‍යාපෘතිවල ප්‍රගතිය

## 01. කෘෂිකාර්මික අංශය නවීකරණ ව්‍යාපෘතිය (ASMP)

**1.1. අපේක්ෂිත අරමුණු**

i.) නවීන තාක්ෂණය භාවිතයෙන් තරඟකාරී සහ අලෙවි කළ හැකි භාණ්ඩ නිෂ්පාදනය කිරීම ක්‍රම (ඵලදායිතා වැඩි දියුණු කිරීම)
ii.) වඩා හොඳ වෙළඳපල අවස්ථා වලට ප්‍රතිචාර දැක්වීමට ඔවුන්ගේ හැකියාවන් වැඩිදියුණු කිරීම (නිෂ්පාදන සහ වෙළඳපල විවිධාංගීකරණය)
iii.) කෘෂිකාර්මික වාණිජකරණය දෙසට ගමන් කිරීම (කෘෂිකර්මය ව්‍යාපාරයක් ලෙස)

**1.2. ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය -** කෘෂිකර්ම අමාත්‍යාංශය

**1.3. ඇස්තමේන්තුගත මුළු අයවැය පිරිවැය -** USD 63.64 + Euro Mn 23.13

**1.4. ව්‍යාපෘති කාල සීමාව -** 2017.01.17 සිට 2024.12.31 දක්වා

**1.5. 2025 වර්ෂයේ මූල්‍ය ඉලක්ක**

| අ/අ | සංවර්ධන වැඩසටහන | ඇස්තමේන්තු මුදල (රු.මි) | | |
|---|---|---|---|---|
| | | ලෝක බැංකුව | යුරෝපා සංගමය | ශ්‍රී ලංකා රජය |
| 1 | ප්‍රාග්ධන වියදම් | 600.00 | 600.00 | 60.00 |

**1.6. 2025 වර්ෂයේ භෞතික ඉලක්ක**

| අ/අ | සංවර්ධන වැඩසටහන | මිනුම් ඒකකය | ඉලක්කය | ඒකක පිරිවැය (රු.මි.) | මුළු පිරිවැය (රු.මි.) |
|---|---|---|---|---|---|
| 1 | ලෝක බැංකුව | % | - | - | - |
| 2 | යුරෝපා සංගමය | % | - | - | - |

**1.7. මූල්‍ය ප්‍රගතිය (2024.12.31 දින දක්වා)**

| අ/අ | වැඩසටහන | 2024 වර්ෂය සඳහා වෙන් කළ මුදල (රු.මි) | 2024.12.31 දක්වා වියදම් කළ මුදල (රු.මි) | මූල්‍ය ප්‍රගතිය % |
|---|---|---|---|---|
| 1 | ලෝක බැංකුව | 4,370 | 4,300.51 | 98.41 |
| 2 | යුරෝපා සංගමය | 3,300 | 3,271.87 | 99.75 |

## 1.8. 2024 වර්ෂයේ අවසානය වන විට ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය

ව්‍යාපෘතිය වෙනුවෙන් 2024 වර්ෂය සඳහා රු. මි. 7,670 ක ප්‍රතිපාදන සලසා තිබූ අතර 2024 දෙසැම්බර් 31 දින වන විට මින් රු. මි. 7,572.38 ක් වැය කර තිබුණි. එය ප්‍රතිශතයක් ලෙස 98.72% කි.

ව්‍යාපෘති දිස්ත්‍රික්ක 12 ක වගා පොකුරු 72 ක් සාර්ථකව ස්ථාපිත කර ඇත. අද වන විට මෙම ව්‍යාපෘතිය මගින් පුද්ගලයන් 35,152 දෙනෙකුට ප්‍රතිලාභ ලබා දී ඇති අතර ලැයිස්තුගත නොකළ සමාගම් 60ක් (PUC) ස්ථාපිත කර ඇත. 2024 වර්ෂයේ දී ව්‍යාපෘතිය අවසාන කරනු ඇත.

## 1.9. ප්‍රධාන වගා පොකුරුවල සාරාංශය

| වගා පොකුර | දිස්ත්‍රික්කය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | වෙන් කළ මුදල (රු.මි.) | වගාවන් සිදුකළ භූමිය (හෙක්ටයාර්) | ලබා ගත් අස්වැන්න (මෙ.ටො) | වටිනාකම (රු.මි.) |
|---|---|---|---|---|---|---|
| කැවෙන්ඩිෂ් කෙසෙල් | මොනරාගල | 650 | 450. 00 | 131.58 | 287 | 31.57 |
| TEJC අඹ | මොනරාගල | 240 | 400. 00 | 56.68 | 91 | 18.20 |
| වැල් දොඩම් | මොනරාගල | 175 | 106.17 | 35.43 | 995 | 107.50 |
| මිරිස් | බදුල්ල | 300 | 240. 00 | 60.73 | 123 | 64.40 |
| බීජ අර්තාපල් | බදුල්ල | 400 | 147. 00 | 121.46 | 4,000 | 980.00 |
| දෙළුම් | මඩකලපුව | 205 | 307.13 | 41.5 | 16 | 176.20 |
| රටකජු | මඩකලපුව | 262 | 299.03 | 106.7 | 3,022 | 1,215.93 |
| කොල පිපිඤ්ඤා | මඩකලපුව | 500 | 311.77 | 202.43 | 14,872 | 487.88 |
| ජම්බෝ රටකජු | අම්පාර | 600 | 276.54 | 242.91 | 2,210 | 330.08 |
| මිරිස් | අම්පාර | 270 | 455.16 | 54.66 | 3,650 | 817.26 |
| TEJC අඹ | මාතලේ | 430 | 227.37 | 176.92 | 88 | 47.92 |
| පේර | මාතලේ | 200 | 164.01 | 40.48 | 11 | 0.93 |
| වැල් දොඩම් | මාතලේ | 100 | 60.62 | 20.24 | 366 | 374.15 |
| ඇඹුල් කෙසෙල් | අනුරාධපුර | 500 | 268.32 | 127.53 | 3,195 | 287.55 |
| මිරිස් | අනුරාධපුර | 420 | 265.95 | 82.02 | 3,955 | 988. 00 |
| පේර | අනුරාධපුර | 300 | 185.66 | 60.72 | 29 | 10.33 |
| මිරිස් | පොලොන්නරුව | 380 | 234.04 | 76.92 | 107 | 26.75 |
| TEJC අඹ | යාපනය | 378 | 241.19 | 67 | 334 | 148.30 |
| මිරිස් | යාපනය | 170 | 265.06 | 30 | 66 | 11.88 |
| වැල් දොඩම් | කිලිනොච්චිය | 200 | 169.76 | 40 | 488 | 154.35 |
| ජම්බෝ රටකජු | කිලිනොච්චිය | 530 | 149.71 | 60 | 103 | 122.95 |

| වගා පොකුර | දිස්ත්‍රික්කය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | වෙන් කළ මුදල (රු.මි.) | වගාවන් සිදුකළ භූමිය (හෙක්ටයාර්) | ලබා ගත් අස්වැන්න (මෙ.ටො) | වටිනාකම (රු.මි.) |
|---|---|---|---|---|---|---|
| රටකජු | මුලතිව් | 300 | 263.56 | 80 | 1,205 | 286.04 |
| කෝලිකුට්ටු කෙසෙල් | මුලතිව් | 120 | 30.12 | 24 | 70 | 16.45 |
| බඩ ඉරිඟු බීජ | වවුනියාව | 74 | 49.50 | 40 | 41 | 54.70 |
| මිරිස් | වවුනියාව | 300 | 354.36 | 30 | 1,555 | 371.25 |

ඡායාරූප අංක 11 - 13

## 02. දේශගුණ සුහුරු වාරි කෘෂි ව්‍යාපෘතිය (CSIAP)

### 2.1. හැඳින්වීම

දේශගුණික අවදානමට ලක්වූ ශ්‍රී ලංකාවේ තෝරාගන්නා ප්‍රදේශවල සිටින කුඩා පරිමාණ ගොවි ප්‍රජාවගේ දේශගුණික විපර්යාසයන්ට ඔරොත්තු දීමේ හැකියාව සහ වාරි කෘෂිකාර්මික ඵලදායිතාව වැඩිදියුණු කිරීමේ ප්‍රධාන අරමුණින්, ලෝක බැංකු මූල්‍ය සහයෝගීතාව (ඇ.ඩො.මි. 125.00 ක) ඇතිව දේශගුණ සුහුරු වාරි කෘෂි ව්‍යාපෘතිය, 2019 වසරේ සිට ක්‍රියාත්මක කරනු ලබයි. දේශගුණයට ඔරොත්තු දෙන කෘෂි පිළිවෙත් සහ තාක්ෂණය භාවිත කරමින් කෘෂිකාර්මික ඵලදායිතාව වැඩිදියුණු කිරීම සහ ඉලක්කගත කුඩා පරිමාණ ගොවි ප්‍රජාව සඳහා වෙළඳපොල ප්‍රවේශය වැඩි දියුණු කිරීම තුළින් මෙම අරමුණ සාක්ෂාත් කරගනු ඇත. ශ්‍රී ලංකාවේ උතුරු පළාත (කිලිනොච්චිය සහ මුලතිව්), නැගෙනහිර පළාත (මඩකළපුව, අම්පාර සහ ත්‍රිකුණාමලය), උතුරුමැද පළාත (අනුරාධපුර සහ පොළොන්නරුව), වයඹ පළාත (කුරුණෑගල සහ පුත්තලම), දකුණු පළාත (හම්බන්තොට) සහ ඌව පළාත (මොණරාගල) යන පළාත් 06 ආවරණය වන පරිදි පරිපාලන දිස්ත්‍රික්ක 11ක තෝරාගත් ප්‍රදේශවල දේශගුණික විපර්යාසයන්හි බලපෑම නිසා අවධානමට ලක්වන කුඩා පරිමාණ ගොවීන් (වගා බිම් ප්‍රමාණය හෙක්. 2ට අඩු) 350,000කට අධික ප්‍රමාණයකට සහ ගොවි පවුල් 60,000කට පමණ සෘජු ප්‍රතිලාභ සලසමින් හෙක්ටයාර් 375,000ක වගා බිම් ප්‍රමාණයක් ආවරණය කිරීම ව්‍යාපෘතිය මඟින් සිදු කෙරේ. ලෝක ආහාර වැඩසටහන, ජාත්‍යන්තර ජල කළමනාකරණ ආයතනය සහ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ඒකාබද්ධව සිදු කරන ලද සහයෝගීතා අධ්‍යයනයක් මඟින් දේශගුණ විපර්යාසයන්හි තීව්‍ර විචල්‍යයන්ට ලක්වන ප්‍රදේශ පදනම් කරගෙන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන ග්‍රාමනිලධාරී වසම් තෝරාගෙන ඇත. දේශගුණික සුහුරු වාරි කෘෂිකාර්මික පිළිවෙත් අනුගමනය කිරීම සහ කාර්යක්ෂම ජල කළමනාකරණය තුළින් විශ්වාසනීයව වාරි ජල සැපයුම තහවුරු කිරීම ව්‍යාපෘතියේ දැක්මයි.

### 2.2. 2025 වර්ෂයේ මූල්‍ය ඉලක්ක

| අ/අ | ප්‍රධාන සංවර්ධන වැඩසටහන | ඇස්තමේන්තු මුදල (රු.මි.) |
|---|---|---|
| 1 | ප්‍රාග්ධන වියදම් | 8,250.00 |

## 2.3. 2025 වර්ෂයේ භෞතික ඉලක්ක (ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් හා ව්‍යාපෘති)

| අ/අ | වැඩසටහන | මිනුම් ඒකකය | ඉලක්කය | ඒකක පිරිවැය (රු.මි.) | මුළු පිරිවැය (රු.මි.) |
|---|---|---|---|---|---|
| **1** | **ව්‍යාපෘති සංරචක - 1: කෘෂිකාර්මික නිෂ්පාදනය හා අලෙවිකරණය** | | | | **1,382.27** |
| 1.1 | කෘෂි නිෂ්පාදනය | ගොවීන් ගණන | 42,000 | ** | 1,144.68 |
| 1.2 | කෘෂි අලෙවිකරණය | ගොවීන් ගණන | 18,000 | | 237.59 |
| **2** | **ව්‍යාපෘති සංරචක - 2: කෘෂිකර්මාන්තය සඳහා ජලය** | | | | **6,992.53** |
| 2.1 | වාරි පද්ධති ප්‍රතිසංස්කරණය | වාරි පද්ධති | 205 | ** | 6,128.74 |
| 2.2 | වාරි පද්ධති මෙහෙයුම් සහ නඩත්තුව | වාරි පද්ධති | 205 | | 863.79 |
| **3** | **ව්‍යාපෘති සංරචක - 3: ව්‍යාපෘති කළමනාකරණය** | **-** | **-** | **-** | **1,225.20** |
| | මුළු එකතුව (රු.මි.) | | | | **9,600.00** |

***ඒකක පිරිවැය අයිතම අනුව වෙනස් වේ.**

**සටහන:** 2024 වර්ෂයට වෙන්වූ දේශීය අරමුදල්වලින් රු.මි. 1,250.00 ක් 2025 වසර දක්වා ඉදිරියට ගෙන යාමට ව්‍යාපෘතිය, අයවැය දෙපාර්තමේන්තුවෙන් කළ ඉල්ලීමට අවසර ලැබුණු පසු 2025 සඳහා අදාළ පිරිවැය රු.මි. 8,750.00 ක් වේ. ඊට අමතර ව, 2024 වර්ෂයෙන් ඉතිරිවන මූල්‍ය ප්‍රතිපාදනය වූ රු.මි. 850.00 සමඟ 2025 වර්ෂය සඳහා අදාළ මුළු ප්‍රතිපාදනය රු.මි. 9,600.00 ක් වේ.

## 2.4. 2024.12.31 දිනට ආයතනයේ වැඩසටහන්වල මූල්‍ය ප්‍රගතිය

| අ/අ | වැඩසටහන | **2024 වර්ෂය සඳහා වෙන්කළ මුදල (රු.මි.)** | **2024.12.31දක්වා වියදම් කළ මුදල (රු.මි.)** | **මූල්‍ය ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| 1 | දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය | 11,800.00 | 6,008.82 | 51 |

## 2.5. 2024.12.31 දිනට සංවර්ධන වැඩසටහන්වල භෞතික ප්‍රගතිය

1. 2024 සඳහා වෙන්කළ රු.මි.11,800.00 ක් වන අතර, එම මුදලින් රු.මි. 1,520.00 ක් පසුගිය වසරේ වියදම් පියවීම සඳහා ලබාගත් නිසා 2024 සඳහා ව්‍යාපෘතිය සඳහා වෙන් කරන ලද මුදල රු.මි. 10,280ක් ලෙස වාර්ෂික සැලැස්ම පිළියෙල කර ඇත. 2024 දෙසැම්බර් මස අවසන් වනවිට රු.මි.6,008.82ක් වැය කර ඇත. ඒ අනුව සමස්ත ව්‍යාපෘති මූල්‍ය වෙන්කිරීම වූ රු.මි. 37,014.00 න් (ඩොලරයේ සාමාන්‍ය අගය රුපියල් 300/= ක් ලෙස සලකා) රු.මි. 24,115.14 ක් වැයකර ඇත එය ප්‍රතිශතයක් ලෙස 65 % වේ.
2. අවසානයේදී ව්‍යාපෘතියේ සමස්ත භෞතික ප්‍රගතිය 76%ක් විය.
3. දේශගුණ සුහුරු කෘෂි පිළිවෙත් පිළිබඳ පුහුණු වැඩසටහන් තුළින් ප්‍රතිලාභ ලබාගත් ගොවීන් ගණන 53,058 කි. කෘෂි යෙදවුම් හා උපකරණ ලබා ගෙවතු වගා වැඩසටහන සඳහා යොමු වූ සමස්ත ප්‍රතිලාභීන් සංඛ්‍යාව 66,039 ක් වේ. යල සහ මහ වගාකන්න පිළිවෙලින් හෙක්. 12,840 ක් හා 20,027 ක් වගාකර ඇති අතර, අතරමැදි කන්න වගාවට ගොවීන් යොමුකිරීමෙන් හෙක්. 5,033ක වෙනත් ක්ෂේත්‍ර බෝග වගාව සාර්ථකව සිදු කර ඇත.

4. දේශගුණ සුහුරු ගොවි පුහුණු පාසලේ වැඩසටහන් 97කින් ගොවීන් 2,163 ක් පුහුණු වී ඇති අතර එම දැනුම ඔවුන් තම අසල්වැසි ගොවි ප්‍රජාව වෙත ව්‍යාප්ත කිරීම අපේක්ෂා කෙරේ. ගොවි ව්‍යාපාර පාසල් පිළිබඳ මොඩියුල 12කින් යුත් පැකේජයක් සකස්කර, කෘෂි උපදේශකවරුන් 113ක් සහ කෘෂි පහසුකාරවරුන් 46 ක් පුහුණුකරුවන් ලෙස පුහුණුකර, ඔවුන් මඟින් ගොවීන් 22,000 ක් පුහුණු කිරීම අරඹා ඇත. දැනට ගොවීන් 6,365 ක් එම පුහුණුව ලබමින් ඇති අතර 7,047 ක් පුහුණුව නිමකර ඇත.
5. කෘෂි නිෂ්පාදන සමිති 572 ක් සහ සරිලන පරිදි එම සමිති එකතුකර නිෂ්පාදන සමාගම් 45 ක් පිහිටුවා එම සාමාජිකයින් වෙත පුහුණුව ලබා දී ඇත. අස්වනු අලෙවිය හා තරඟකාරී වෙළඳපොළ මිල අරමුණුගතව, මෙම නිෂ්පාදන සමාගම්, ප්‍රධාන ව්‍යාපාරික සමාගම් සමඟ ව්‍යාපාර සම්බන්ධතා ස්ථාපිත කිරීමට යොමුකර ඇති අතර මේ වනවිට නිෂ්පාදන සමාගම් සමග ගොඩනඟාගෙන ඇති අලෙවි සබඳතා සංඛ්‍යාව 16 කි. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ද ඇතුළුව plenty foods, Golden Foods, CW Mackie, Cargills, CBL, Prima වැනි ප්‍රධාන ව්‍යාපාරික සමාගම් මේ සඳහා ඇතුළත් වේ.
6. වී සහ ධාන්‍ය ගබඩා කිරීමේ අරමුණින් පුද්ගල ගබඩා පහසුකම් 12 ක් සහ උතුරු පළාත සඳහා පොදු ගබඩා පහසුකමක් (මෙ.ටො.1,000 ක පමණ) ගොඩනංවා ඇත.
7. කාර්යක්ෂම වාරි ජල භාවිතය අරමුණු කරගත් ලේසර් තාක්ෂණය යොදා ගෙන කුඹුරු මට්ටම් කිරීම මූලික වශයෙන් හෙක්ටයාර 25ක් ආවරණය කිරීමට සැලසුම් කර ඇති අතර, මේ වන විට උතුරු මැද සහ උතුරු පළාත් ගොවීන් දැනුවත්ව එම වැඩසටහන ක්‍රියාත්මක කර ඇත. නැගෙනහිර සහ වයඹ පළාත් මේ පිළිබඳව දැනුවත් කර ඇති අතර වැඩසටහන ක්‍රියාත්මක කිරීම ආරම්භ කර ඇත.
8. නිෂ්පාදන සැකසුම් ගම්මාන ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති අතර මූලික දැනුවත් කිරීම් සිදු කෙරෙමින් පවතී.
9. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන පළාත් 06 තුළ ඇති ගොවිජන සේවා මධ්‍යස්ථාන 47 ක් වෙත කෘෂි යන්ත්‍රෝපකරණ හා යෙදවුම් ලබා දී ඇත. ව්‍යාපෘතිය ආරම්භයේදීම සියලුම සේවා මධ්‍යස්ථාන නවීකරණය කරන ලදී.
10. කි.මී.57 ක කෘෂි-මාවත් ප්‍රතිසංස්කරණය කර ගොවීන් හට වෙළඳපොළ කරා යොමු වීමට පහසුකම් සලසා ඇත.
11. කෘෂි ළිං 1,149 ක් ප්‍රතිසංස්කරණය කර ඒ යටතේ වගාවන් සිදුකෙරේ. මේ යටතේ ප්‍රධාන වශයෙන් එළවළු සහ පළාවර්ග වගා කෙරේ. සූර්යබල ජල පොම්පකරණය හඳුන්වාදීම මගින් ගොවීන් 212 ක් මේ වන විට එමගින් ජලය ලබා ගනිමින් තම වගාවන් සාර්ථකව පවත්වාගෙන යති. හෙක්. 207 ක් පමණ මේ යටතේ වගා කෙරේ.
12. ප්‍රතිලාභී පවුල් හා වගාවන්ගේ සුරක්ෂිතතාව පිණිස වගා ආරක්ෂිත විදුලිවැට දිගින් කි.මී. 1,100 ක් නිම කර ඇති අතර ගොවි ඉල්ලීම් අනුව තවත් කි.මී. 400 ක් ආවරණය කිරීම සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදුවෙමින් පවතී.
13. සිදු කරනු ලබන සියලුම ව්‍යාපෘති ඉදිකිරීම්වලට අදාළව සමාජ විගණන කමිටු 518 ක් ස්ථාපිත කර ඇත.
14. වාරි කෘෂි සංවර්ධනය පිණිස එල්ලංගා පද්ධති 72ක් තුළ ප්‍රතිසංස්කරණයට නියමිතව ඇති වැව් 476 කි. එම වැව් අතරින් වැව් 451ක ප්‍රතිසංස්කරණ කටයුතු නිමකර ඇත. ඉතිරි 25 හි ප්‍රතිසංස්කරණ කටයුතු කඩිනමින් නිම කිරීමට සැලසුම් කර ඇත. මේ අතරින් 50% ඉක්මවා නිම කර ඇති වාරි පද්ධති 23 කි.

15. ව්‍යාපෘති කාලසීමාව මාස 18කින් දීර්ඝ කිරීමත්, ව්‍යාපෘති අරමුදලින් මුලින් කපා හැර තිබූ ඇ.ඩො.මි. 25.00 ක් නැවත ව්‍යාපෘතියට ලබා දීම අනුව, මූලික අධ්‍යයන නිම කර ඇති වාරිමාර්ග පද්ධති (වැව්) 205ක් ප්‍රතිසංස්කරණය කිරීමට සැලසුම් කර ඇත. එම වැව් 205 න් 104 ක ප්‍රසම්පාදන කටයුතු මේවන විට සිදු කෙරෙමින් පවතී. ඉතිරි වැව් 24 ලෝක බැංකු ප්‍රසම්පාදන ක්‍රියාවලියට අනුව එකඟතාව ලබා ගැනීමට යොමු කර ඇත. ඒ අනුව අළුතින් වාරිමාර්ග පද්ධති 128 ක් ක්‍රියාත්මක කිරීමේ කටයුතු ආරම්භ කර ඇත.
16. මේ අනුව ව්‍යාපෘතිය මගින් ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කිරීමට අපේක්ෂිත මුළු වාරිමාර්ග පද්ධති ගණන පවත්නා ප්‍රතිපාදන අනුව 604 ක් දක්වා වැඩි කර ඇත. මෙම ප්‍රතිසංස්කරණ කටයුතු 2025.12.31 වන විට නිම කිරීමට අපේක්ෂිතය.
17. මෙහෙයුම් කළමනාකරණය හා තිරසාර පැවැත්ම අරමුණු කර එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු 61 ක් ව්‍යාපෘති පළාත් තුළ පිහිටුවා ඇත. පළාත් 06 තුළ පාර්ශවකරුවන් සහභාගිත්වයෙන් හරස්කඩ චාරිකා (Exposure Visit) සිදුකර සකස් කළ එල්ලංගා පද්ධති පැතිකඩ අනුව පිළියෙල කිරීමට නියමිත එල්ලංගා පද්ධති කළමනාකරණ සැලසුම් 61 කින් මේ වන විට 29 ක් නිමකර ඇත. එම සැලසුම්වලින් 11 ක ප්‍රමුඛතාගත ක්‍රියාකාරකම් ක්‍රියාත්මක වෙමින් පවතී.
18. පාරිසරික සහ සමාජ ආරක්ෂණය යටතේ, ශක්‍යතා අධ්‍යයන වාර්තා 175 ක් මූලික අදියරේ දී සහ 170 ක් දෙවන අදියරේ දී සකසා ඇත. ජලපෝෂක ප්‍රදේශ කළමනාකරණය ඉලක්ක කරගත් රුක් රෝපන වැඩසටහන තුළින් නැවත වන සංරක්ෂණය, කෘෂි වන සංරක්ෂණය, සුළං බාධක ස්ථාපනය, කට්ටකඩුව සංවර්ධනය, වන්දි ගස් සිටුවීම යනාදී ලෙස මේ වනවිට පැල 18,000 ක් පමණ රෝපනය කිරීමට කටයුතු කර ඇත.
19. ව්‍යාපෘතියේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය සම්බන්ධ වැඩසටහන් ක්‍රියාත්මක අතර ව්‍යාපෘතිය මගින් 40% ක ස්ත්‍රී සහභාගිත්වයක් ළඟා කරගෙන තිබේ.
20. ප්‍රතිලාභීන්ගෙන් ඉදිරිපත්වන දුක් ගැනවිලි සඳහා විසඳුම් ලබාදීමේ යාන්ත්‍රණය තුළින් ඉදිරිපත් වී ඇති ගැටළුකාරී අවස්ථා 279 න් 263 ක් සඳහා විසඳුම් ලබා දී ඇත.
21. ව්‍යාපෘති මැදිහත්වීම් පිළිබඳ දැනුවත් කිරීමේ සහ සන්නිවේදන කිරීමේ වැඩසටහන් 2,100 ක් මේ වන විට පවත්වා ඇත.

ඡායාරූප අංක 14 - 15

## 03. කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර හවුල්කාරිත්ව වැඩසටහන (SAPP)

### 3.1. හැඳින්වීම

දිවයින පුරා කුඩා පරිමාණ කෘෂිකාර්මික ප්‍රතිලාභීන් 57,500 කගේ ආදායම සහ ගුණාත්මකභාවය තිරසාර ලෙස ඉහළ නැංවීම ප්‍රධාන අරමුණුකොට ගත් කුඩා පරිමාණ කෘෂිව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන (SAPP) සඳහා ශ්‍රී ලංකා රජය (GOSL) සහ කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල (IFAD) ඒකාබද්ධව අරමුදල් සපයනු ලැබේ. රාජ්‍ය, පුද්ගලික, නිෂ්පාදක හා හවුල්කාරිත්වය යන 4P ප්‍රවේශය හරහා කුඩා පරිමාණ කෘෂිකාර්මික ප්‍රතිලාභීන් වෙත සහනදායී පොලී අනුපාත යටතේ ප්‍රදාන සහ ණය ලබා දීම සිදුකෙරේ. SAPP මගින් කුඩා පරිමාණ ගොවීන්ට ඔවුන්ගේ ගොවි සංවිධාන ශක්තිමත් කිරීම සඳහා පුහුණුව සහ තාක්ෂණික දැනුම ලබා දීම සහ කෘෂිකර්ම මාර්ග, අමුණු ආදි යටිතල පහසුකම් ව්‍යුහය වැඩිදියුණු කිරීම හා හිතකර ප්‍රතිපත්තිමය පරිසරයක් ඇති කිරීම සඳහා ද සහාය වේ.

### 3.2. 2025 වර්ෂයේ මූල්‍ය ඉලක්ක

| අ/අ | ප්‍රධාන සංවර්ධන වැඩසටහන | ඇස්තමේන්තු මුදල - (රු.මි.) |
|---|---|---|
| 1 | ප්‍රාග්ධන වියදම් | 3,556.00 |

### 3.3. 2025 වර්ෂයේ භෞතික ඉලක්ක (ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් හා ව්‍යාපෘති)

| අ/අ | වැඩ සටහන | මිනුම් ඒකකය | ඉලක්කය | ඒකක පිරිවැය (රු.මි.) | මුළු පිරිවැය (රු.මි.) |
|---|---|---|---|---|---|
| 1 | වාණිජ හවුල්කාරිත්වය සඳහා ප්‍රවේශය (4P ව්‍යාපෘති හරහා) | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 3,725 | 0.41 | 1,159.00 |
| 2 | ග්‍රාමීය මූල්‍ය වෙත ප්‍රවේශය (4P ව්‍යාපෘති, තරුණ සහ ආදායම් උත්පාදන ණය හරහා) | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 3,294 | 0.29 | 1,821.00 |
| 3 | ගොවිපලින් බැහැර පහසුකම් සංවර්ධනය | ව්‍යාපෘති සංඛ්‍යාව | 14 | 4.85 | 79.00 |
| 4 | තරුණ ව්‍යවසායක සංවර්ධනය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 300 | 0.28 | 195.00 |

### 3.4. 2024.12.31 දිනට ආයතනයේ වැඩසටහන්වල මූල්‍ය ප්‍රගතිය

| අ/අ | වැඩ සටහන | 2024 වර්ෂය සඳහා වෙන් කළ මුදල (රු. මි.) | 2024.12.31 දක්වා වියදම් කළ මුදල (රු. මි.) | මූල්‍ය ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| 1 | සංවර්ධන වැඩසටහන් | 5,000.00 | 2,960.00 | 59 |
| 2 | ක්ෂුද්‍ර මූල්‍ය වැඩසටහන් | 2,024.00 | 2,012.00 | 99 |
| | **එකතුව** | **7,024.00** | **4,972.00** | **71** |

### 3.5. 2024.12.31 දිනට සංවර්ධන වැඩසටහන්වල භෞතික ප්‍රගතිය

කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගිත්ව වැඩසටහන (SAPP) ඇ.ඩො.මි. 105.00 ක මුළු පිරිවැයක් සහිත වසර හයක ව්‍යාපෘතියක් ලෙස 2017 දී ආරම්භ කරන ලදී. ශ්‍රී ලංකා රජය (GOSL), කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල (IFAD), පෞද්ගලික අංශය (කෘෂි ව්‍යාපාර සමාගම්), කුඩා වතු හිමියන්, සහභාගීත්ව මූල්‍ය ආයතන (PFIs) ඒකාබද්ධව දියත් වන මෙම වැඩසටහනේ ප්‍රධාන අරමුණු වන්නේ කුඩා කෘෂි ව්‍යවසායකයින් 57,500 ක් වෙළඳපොල වෙත සම්බන්ධ කිරීමෙන් ඔවුන්ගේ ආදායම ඉහළ නැංවීමත් ඒ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධන වැඩිදියුණු කිරීමත්වේ. මෙම පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා රාජ්‍ය සහ පෞද්ගලික සබැඳියාව සමඟ කෘෂි ව්‍යවසායකයින් සඳහා ලබා දෙන අඛණ්ඩ පුහුණුව තුළින් කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ සහ තාක්ෂණික දැනුම ලබා දීමෙන් වඩා යහපත් වෙළඳපොළක් හඳුන්වා දීමට SAPP ප්‍රධාන වශයෙන් අවධානය යොමු කර ඇත.

වැඩසටහන ආරම්භයේ සිට පුද්ගලික කෘෂි ව්‍යාපාරික ආයතන සහ ගොවි නිෂ්පාදක සංවිධානවල සහයෝගීතාවයෙන් කිරි නිෂ්පාදන, කුළුබඩු, ධාන්‍ය සහ රනිල කුලයට අයත් බෝග, තේ, මල් වගාව

සහ එළවළු වැනි ප්‍රධාන කෘෂිකාර්මික අංශ ආවරණය කරමින් 4P (රාජ්‍ය, පුද්ගලික, නිෂ්පාදක. හවුල්කාරිත්ව) ව්‍යාපෘති 39 ක් ස්ථාපිත කිරීමට SAPP සමත් වී ඇත.

මෑතකාලීන ආර්ථික අර්බුදය හමුවේ SAPP මඟින් ග්‍රාමීය කෘෂි ව්‍යවසායකයින් සඳහා ඇ.ඩො.මි. 10.00 ක විශේෂ බඩඉරිඟු ව්‍යාපෘතියක් හඳුන්වා දෙන ලදී. මෙම ව්‍යාපෘතිය මඟින් තෝරාගත් බඩඉරිඟු ගොවීන් සඳහා උසස් තත්ත්වයේ දෙමුහුන් බීජ, රසායනික පොහොර, ඉඩම් සකස් කිරීමේ පහසුකම් සහ මූල්‍ය පහසුකම් ලබා දී ඇත. මෙහිදී බඩඉරිඟු ව්‍යාපෘතියේ ප්‍රසම්පාදන කටයුතු අවසන් කිරීමෙන් අනතුරුව බීජ හා පොහොර බෙදා හැරීම ආරම්භ කරන ලදි. මෙම බඩඉරිඟු ව්‍යාපෘතිය සඳහා ඉලක්කගත ප්‍රතිලාභීන් සංඛ්‍යාව 40,000 ක් වන අතර  මේ වන විට හෙක්ටයාර් 15,905 ක වගා බිම් ආවරණය වන පරිදි ප්‍රතිලාභීන් 39,156 දෙනෙකුට බීජ ලබා දී ඇත. ප්‍රතිලාභීන් 38,962 කට මූලික පොහොර (Basal fertilizer) ද 38,638 කට මතුපිට පොහොර (Top dressing fertilizer)  ද 38,076 කට බිම් සැකසුම් (Land preparation)  ද ලෙස ප්‍රදානයන් ලබා දී මෙම බඩඉරිඟු ව්‍යාපෘතිය අවසන් කර ඇත.

කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩ සටහන (SAPP) යටතේ 2024 දෙසැම්බර් 31 දිනට 4P අගයදාම, තරුණ සහ ආදායම් උත්පාදන ණය යටතේ ප්‍රතිලාභීන් 46,759 ක් ප්‍රතිලාභ ලබා ඇත. මෙය සමස්ත ව්‍යාපෘති ඉලක්කය වන කෘෂි ව්‍යවසායකයින් 57,500 න් සියයට 81.32 ක ප්‍රතිශතයක්වේ.

2024 දෙසැම්බර් වන විට වැඩසටහන මඟින් 4P ආකෘතිය දැනට ඉලක්ක කර ඇති ප්‍රතිලාභීන් 43,000 කින් 36,671 දෙනෙකුට ප්‍රතිලාභ ලැබී ඇත. තරුණ කෘෂි ව්‍යවසායකයින් නඟා සිටුවීමේ (YED) වැඩසටහන යටතේ SAPP තරුණ ප්‍රතිලාභීන්  3,452 දෙනෙකුට ද ආදායම් උත්පාදන ණය යෝජනා ක්‍රමය (IG) හරහා ප්‍රතිලාභීන්  6,904 දෙනෙකුට ප්‍රතිලාභ ලබා දී ඇත.

තවද, SAPP විසින් අදාළ ආයතනවල සහය ඇතිව ඇළ සහ කෘෂි මාර්ග ප්‍රතිසංස්කරණය වැනි ගොවිපලින්  බැහැර කෘෂි යටිතල පහසුකම් සංවර්ධන කටයුතු සඳහා සැලසුම් කර ඇති ව්‍යාපෘති 98 න් 2024 දෙසැම්බර් වන විට ව්‍යාපෘතීන් 58 ක් සාර්ථකව අවසන්කර ඇති අතර මේ වනවිට මේ සඳහා රු. මි. 195.50 ක් ආයෝජනය කර ඇත.

මීට අමතරව ගොවි නිෂ්පාදක සංවිධාන වඩාත් තිරසාර ව්‍යාපාරික ආයතන බවට පත් කිරීම සඳහා SAPP මඟින් සපයනු ලබන ආයතනික ශක්තිමත් කිරීමේ (IS) සේවා යටතේ මේ වන විට ක්‍රියාකාරකම් 07 ක් අවශ්‍ය ප්‍රතිදානයන් සහිතව සම්පූර්ණ කර ඇති අතර 2024 වසර තුළ ක්‍රියාත්මක වෙමින් පවතින තවත් එවැනි IS සේවා 13 ක් 2024 වර්ෂය තුළ අවසන් කිරීමට නියමිත අතර දැනට මෙම සංරචකය යටතේ රු. මි. 133.00 කට වැඩි ප්‍රගතියක් ලබාගෙන ඇත.

සමස්ත SAPP වැඩසටහන සඳහා IFAD ප්‍රතිපාදන ඉලක්කය වන මිලියන 54.40 න් මිලියන  37.80 ක් ආයෝජනය කර 69% මූල්‍ය ප්‍රගතියක් සාක්ෂාත් කර ගෙන ඇත. ප්‍රතිලාභීන් සහ ප්‍රවර්ධකයින්ගෙන් වැඩසටහන සඳහා තවදුරටත් දායකත්වය මිලියන 13.62 කි. GoSL, IFAD සහ දායකත්ව ඉලක්කය වන රු.මි. 105.00 න් 2024 දෙසැම්බර් වන විට රු.මි. 68.18 (65%) ක් වැය වී ඇත.

ඡායාරූප අංක 16 – 18

## 04. කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සඳහා වන අහිතකර බලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය (SARP)

### 4.1. හැඳින්වීම

මෙම ව්‍යාපෘතිය ශ්‍රී ලංකාවේ පුත්තලම, කුරුණෑගල, මාතලේ, අනුරාධපුර, වවුනියාව සහ මන්නාරම යන වියළි කලාපීය දිස්ත්‍රික්ක 06 ද එම දිස්ත්‍රික්ක අයත්වන මල්වතු ඔය, දැදුරු ඔය සහ මී ඔය යන ගංගාවල පෝෂක ප්‍රදේශවල පිහිටි එල්ලංගා පද්ධතිද පදනම් කර ගනිමින් ක්‍රියාත්මක වේ. ගොවිපළ වාණිජකරණය ප්‍රවර්ධනය කරන අතරම, කුඩා පරිමාණ ගොවි පවුල් 40,000ක් හෝ පුද්ගලයන් 180,000ක් සඳහා දේශගුණික විපර්යාස මගින් ඇති කරන ලද අභියෝගවලට තිරසර විසඳුම් ලබා දීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වේ.

ව්‍යාපෘතියේ ප්‍රධාන සංරචක වන්නේ දේශගුණික විපර්යාස සඳහා ඔරොත්තු දීමේ හැකියාව වැඩිදියුණු කිරීම සඳහා සේවා සපයනු ලබන ආයතනවල හා ව්‍යාපෘති ප්‍රතිලාභීන්ගේ හැකියා සංවර්ධනය සහ තෝරාගත් යටිතල පහසුකම් අළුතින් ඉදිකිරීම හා වැඩිදියුණු කිරීම සඳහා ආයෝජනය කිරීමයි. කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර අරමුදල (IFAD) ශ්‍රී ලංකා රජය මඟින් අරමුදල් සපයනු ලබන මෙම ව්‍යාපෘතිය මගින් ඇ.ඩො.මි. 82.00 ක් ආයෝජනය කිරීමට සැලසුම් කර ඇති අතර ව්‍යාපෘති කාලසීමාව වසර 06 වේ. මෙම ව්‍යාපෘතිය 2022.01.20 දින ආරම්භ කරන ලදී.

### 4.2. 2025 වර්ෂයේ මූල්‍ය ඉලක්ක

| අ/අ | ප්‍රධාන සංවර්ධන වැඩසටහන | ඇස්තමේන්තු මුදල (රු.මි.) |
|---|---|---|
| 1 | ප්‍රාග්ධන වියදම් | 5,670.00 |

### 4.3. 2025 වර්ෂයේ භෞතික ඉලක්ක (ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් හා ව්‍යාපෘති)

| අ/අ | වැඩසටහන | මිනුම් ඒකකය | ඉලක්කය | ඒකක පිරිවැය (රු.මි.) | මුළු පිරිවැය (රු.මි.) |
|---|---|---|---|---|---|
| 1 | දේශගුණික විපර්යාස සඳහා සේවා සපයන්නන්ගේ සහ ගොවීන්ගේ ඔරොත්තුදීමේ හැකියාව වර්ධනය කිරීම | වැඩසටහන් | 1,771 | 0.16 | 285.32 |
| 2 | කෘෂිකර්මය ආශ්‍රිත අගයදාම සංවර්ධන කටයුතු සඳහා යොමු වීමට අවශ්‍ය ධාරිතා ශක්තිමත් කිරීම | වැඩසටහන් | 41 | 0.60 | 24.56 |
| 3 | දේශගුණ විපර්යාස සඳහා ඔරොත්තු දෙන නිෂ්පාදන සහ යටිතල පහසුකම් සඳහා ආයෝජනය | ගෘහ ඒකක | 10,930 | 0.32 | 3,404.26 |
| 4 | අගයදාම සංවර්ධනය සඳහා ආයෝජනය | ගෘහ ඒකක | 586 | 5.68 | 3,332.60 |

### 4.4. 2024.12.31 දිනට ආයතනයේ වැඩසටහන්වල මූල්‍ය ප්‍රගතිය

| වැඩසටහන | 2024 වර්ෂය සඳහා අයවැය මගින් වෙන් කළ ප්‍රතිපාදනය (රු.මි.) | සංශෝධිත ප්‍රතිපාදනය | 2024.12.31 වියදම් කළ මුදල (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සඳහා වන අහිතකර බලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය(SARP) ප්‍රාග්ධන වියදම් | 2,836.00 | 979.53 | 505.50 | 51.61 |

- **වැව් ප්‍රතිසංස්කරණ කටයුතු**

මෙම ව්‍යාපෘතිය මගින් වැව් 173 ක් ප්‍රතිසංස්කරණ කිරීමට සැලසුම් කර ඇති අතර වැව් 42 ක කටයුතු ආරම්භ කර ඇත. ඒ සඳහා ඇස්තමේන්තුගත පිරිවැය රු. මි. 521.00 වූ අතර වියදම රු. මි. 205.00 ක් වේ. ඒ අතරින් කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ වැව් 14 ක ඉදි කිරීම් කටයුතු ආරම්භ කර එහි භෞතික ප්‍රගතිය 95% පමණ වේ. වව්නියාව දිස්ත්‍රික්කයේ වැව් 16ක ඉදිකිරීම් කටයුතු ආරම්භ කර ඇති අතර ඉන් 12ක ප්‍රගතිය 79%කි. සහ අනුරාධපුර දිස්ත්‍රික්කයේ වැව් 07 ක ඉදි කිරීම් ආරම්භ කර ඇති අතර එහි භෞතික ප්‍රගතිය 80% කි. මන්නාරම් දිස්ත්‍රික්කයේ වැව් 05 ක් ඉදි කිරීම් කටයුතු මෙම වසරේ සැප්තැම්බර් මාසයේ ආරම්භ කර ඇත.

ඡායාරූප අංක 19

- **ජල පෝෂක ප්‍රදේශ තුළ නැවත වන වගා කිරීම**

මෙම ව්‍යාපෘතිය මඟින් ප්‍රතිසංස්කරණය කරනු ලබන වැව් වලට අයත් හෙක්ටයාර් 562 ක් ආවරණය වන පරිදි ජල පෝෂක ප්‍රදේශ වල නැවත වන වගා ස්ථාපනය කිරීම යටතේ මී, කුඹුක්, කළුවර සහ කරඳ යන ශාක වර්ග රෝපණය කිරීම සඳහා රු. මි. 13.53 ක මුදලක් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ලබා දී එම දෙපාර්තමේන්තුව මඟින් මෙම ශාක වර්ග රෝපණය කිරීමේ කටයුතු සිදු කරමින් පවතී. තවද ප්‍රතිසංස්කරණය කරනු ලැබූ වැව්වල කට්ටකාඩුව ආවරණය වන පරිදි වානිජමය වටිනාකමකින් යුතු පුවක් පැල රෝපණය කිරීම ව්‍යාපෘති ප්‍රතිලාභීන් හා කාර්යය සහයෝගයෙන් සිදු කරනු ලබයි. මේ යටතේ ඉදිකිරීම් අවසන් වූ වැව් 19 ක පුවක් පැල 3500 ක් රෝපණය කර ඇත.

ඡායාරූප අංක 20

- **මිරිදිය මත්ස්‍ය වගාව**

ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන ප්‍රදේශවල ජනතාවගේ පෝෂණ අවශ්‍යතා සපුරාලීම සඳහා මිරිදිය මත්ස්‍ය වගාව ව්‍යාප්ත කිරීමට අවශ්‍ය මිරිදිය මත්ස්‍ය වගාව වැව් 72 ආවරණය වන සිදු කරමින් පවතින අතර වැව් 20 ක් සඳහා මිරිදිය මත්ස්‍යයින් හඳුන්වා දීම සිදු කර අවසන්ය. එහි මත්ස්‍ය අස්වැන්න නෙලීමේ කටයුතු මේ වන විට ආරම්භ කර ඇත. මෙම වැව් වව්නියාව, පුත්තලම, කුරුණෑගල සහ අනුරාධපුරය යන දිස්ත්‍රික්කවල පිහිටා ඇත. මෙය ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ සහයෝගයෙන් සිදු කරන අතර ඒ සඳහා මේ වන විට රු. මි. 5.00 ක මුදලක් වැය කොට ඇත.

ඡායාරූප අංක 21

- **උදු වගා ව්‍යාපෘතිය**

වව්නියාව දිස්ත්‍රික්කය කේන්ද්‍ර කර ගනිමින් ගොවීන් 600 දෙනෙක් සඳහා උදු වගා ව්‍යාපෘතියක් ආරම්භ කර ඇත. ඒ යටතේ ගොවීන්ට අවශ්‍ය බීජ සහ ගොවි ක්ෂේත්‍ර පාසල් හරහා අවශ්‍ය ප්‍රායෝගික පුහුණුව සහ උදු අස්වැන්න සඳහා අගය එකතු කළ නිෂ්පාදන වෙළඳපොළට හඳුන්වාදීමට වැඩපිළිවෙලක් සකස් කර ඇත. මෙම ව්‍යාපෘතිය සඳහා වියදම් වූ මුදල් ප්‍රමාණය රු. මි. 7.50 කි.

- **මුං ඇට වගා ව්යාපෘතිය**

කුරුණෑගල, පුත්තලම දිස්ත්‍රික්ක තුළ මුං ඇට වගා කරන ගොවීන්ගේ ආදායම ඉහල නැංවීම සහ ආහාර සුරක්ෂිතභාවය තහවුරු කිරීම මෙන්ම එම ප්‍රදේශ වල ජීවත් වන දිළිඳු ජනතාවගේ පෝෂණ මට්ටම ඉහළ නැංවීම අරමුණින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර ඇත. මෙම දිස්ත්‍රික්ක දෙකෙහි ගොවීන් 750 ක් හා අක්කර 391.50 ක් ආවරණය වන පරිදි මෙම ව්‍යාපෘතිය ක්‍රියාවට නංවන ලදී. එමගින් පුත්තලම දිස්ත්‍රික්කයේ කි. ග්‍රෑ. 13,400 ක අස්වැන්නක් සහ කුරුණෑගල දිස්ත්‍රික්කයේ කි. ග්‍රෑ. 32,615 ක අස්වැන්නක් 2024 යල කන්නයේදී ලබාගැනීමට හැකියාව ලැබුණි.

ඡායාරූප අංක 22

- **ගර්කින් වගා ව්‍යාපෘතිය**

අපනයන වෙළඳපොළ වෙත අගය එකතු කළ ගර්කින් නිෂ්පාදන සැපයීම සඳහා පෞද්ගලික අංශය සමඟ සම්බන්ධ වෙමින් අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. මේ සඳහා කුරුණෑගල දිස්ත්‍රික්කයේ තෝරාගත් ග්‍රාම නිලධාරී වසම් තුළ ගොවීන් 209 ක් තෝරා ගනිමින් බීජ සහ බිංදු ජල සම්පාදන පද්ධති ලබා දී ඇත.

ඡායාරූප අංක 23

- **රට කජු වගා ව්‍යාපෘතිය**

පුත්තලම, කුරුණෑගල, වව්නියාව, මන්නාරම සහ අනුරාධපුරය යන දිස්ත්‍රික්ක කේන්ද්‍ර කර ගනිමින් ගොවීන් 1500 දෙනෙක් සඳහා අක්කර 750 ක රට කජු වගා ව්‍යාපෘතියක් ආරම්භ කර ඇත. ඒ යටතේ ගොවීන්ට අවශ්‍ය බීජ සහ ගොවි ක්ෂේත්‍ර පාසල් හරහා අවශ්‍ය ප්‍රායෝගික පුහුණුව ලබා දීමට කටයුතු කර ඇත. තවද රට කජු සඳහා අගය එකතු කළ නිෂ්පාදන වෙළඳපොළට හඳුන්වාදීමට වැඩපිළිවෙලක් සකස් කර ඇත. මෙම ව්‍යාපෘතිය සඳහා වියදම් කර ඇති මුදල් ප්‍රමාණය රු. මි. 25.00 කි. බීජ කි. ග්‍රෑ. 30,000 බෙදා දුන් අතර ගොවින් අතර බෙදා දුන් අතර එම ගොවින් සියලුදෙනාම රටකජු වගාව ආරම්භ කර ඇත. මේ වන විට ආරම්භ කර ඇති මෙම රටකජු වගාවෙන් 2024 - 25 මහ කන්නයේදී අක්කරයට කි. ග්‍රෑ. 800.00 ක අස්වැන්නක් බලාපොරොත්තු වේ.

ඡායාරූප අංක 24

- **නිදැළි කුකුළු පාලනය**

මෙම ව්යාපෘතිය වව්නියාව, පුත්තලම, කුරුණෑගල. අනුරාධපුරය, මන්නාරම සහ මාතලේ දිස්ත්‍රික්ක කේන්ද්‍ර කර ගනිමින් ක්‍රියාවට නැංවේ. මේ යටතේ තෝරා ගත් ගොවි පවුල් 550 ක් වෙත කුකුළු පැටවුන් සහ කුකුළු කූඩු ඇතුළු අවශ්‍ය ද්‍රව්‍ය ලබා දීමට සැලසුම් කර ඇත. මෙම ව්‍යාපෘතිය අඩු

ආදායම්ලාභීන් කාන්තාවන් ඉලක්ක ගත කර ඇති අතර පවුල් වන පෝෂණ අවශ්‍යතා සහ පවුලේ ආදායම ඉහල නැංවීම අරමුණු කර ඇත. මෙම ව්‍යාපෘතිය සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන මුදල රු. මි. 47.00 කි. මේ වන විට ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ කටයුතු ආරම්භ කර ඇත.

- **වී වගාව සඳහා නියදි ක්ෂේත්‍ර ස්ථාපනය**

මෙම ව්‍යාපෘතිය වව්නියාව, පුත්තලම, කුරුණෑගල, අනුරාධපුරය, මන්නාරම සහ මාතලේ දිස්ත්‍රික්ක කේන්ද්‍ර කර ගනිමින් ක්‍රියාවට නැංවේ. මේ යටතේ නියදි ක්ෂේත්‍ර 17 ස්ථාපනය කරන ලදී. නියදි ක්ෂේත්‍ර තුළ දේශගුණික විපර්යාස සඳහා ඔරොත්තු දීමේ හැකියාවෙන් යුත් වී ප්‍රභේදයන් වන බීජී 374, බීජී 366, බීජී 409, බීජී 310, බීජී 369 සහ ඒටී 362 වගාව සඳහා යොදා ගන්නා ලදී. එමඟින් මෙම ප්‍රදේශ සඳහා වඩාත් යෝග්‍ය වැඩි දියුණු කරන ලද උපරිම අස්වැන්නක් ලබා ගත හැකි වී ප්‍රභේද ගොවීන් වෙත හඳුන්වා දෙන ලදී. මේ යටතේ බීජ මිලදී ගැනීම සඳහා රු. මි. 0.60 ක මුදලක් වැය කරන ලදී.

## 05. කොළඹ - කටුනායක ජාතික ශාක නිරෝධායන සේවයේ උපකරණ අලුත් වැඩියාව හා ප්‍රතිසංස්කරණය (JICA) – වැය ශීර්ෂ අංක 118-2-03-041-2507

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කටුනායක ජාතික ශාක නිරෝධායන මධ්‍යස්ථානය මගින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබේ. ශ්‍රී ලංකාව ජාත්‍යන්තර ශාක ආරක්ෂණ සම්මුතියට ඇතුළත්ව ඇත. ඒ අනුව ශාක, ශාකමය කොටස් හෝ කෘෂි නිෂ්පාදන නියමිත ප්‍රමිතීන්ට අනුගතව ආනයනය හා අපනයනය කිරිමට කටයුතු කිරීම ශ්‍රී ලංකාවේ ශාක නිරෝධායන විෂය පථයට ඇතුළත් වේ. එසේම ගොවීන්ගේ දරිද්‍රතාවය අවම කිරීම, විදේශ මුදල් ඉපයීම ඉහළ දැමීම වැනි පරමාර්ථ පදනම් කර වඩාත් නිවැරදිව හා ඉහළ කාර්යක්ෂමතාවයක් පවත්වා ගනිමින් ශාක නිරෝධායන කාර්ය ඉටුකිරීමත්, ආනයන හෝ අපනයන ජාත්‍යන්තර වෙළඳපල සමග සම්බන්ධීකරණයේදී භාණ්ඩවල ප්‍රමිතීන් වඩාත් නිවැරදිව හඳුනා ගැනිමට ඇති අවස්ථාවන් වැඩි දියුණු කිරීමට ශාක නිරෝධායන සේවයේ පවතින උපකරණ අලුත් වැඩියාව සහ ප්‍රතිස්ථාපනය සඳහා රු.මි. 259.60 ක ආධාර මුදලක් ජපන් රජය (JICA) මගින් 2017 වර්ෂයේදී ලබාදී මෙම ව්‍යාපාතිය ආරම්භ කර ඇත. 2024 වර්ෂයේදී ව්‍යාපෘතිය අවසන් වන අතර, මේ වන විට වියදම් කර ඇති මුදල රු.මි. 253.36 වේ. 2024 වර්ෂය සඳහා වෙන් කළ මුදල රු.මි. 14.17 ක් වන අතර වියදම් කළ මුදල රු.මි. 7.93 කි.

| අනු අංකය | වැඩසටහන | 2024 වර්ෂය සඳහා වෙන් කළ මුදල (රු.මි.) | 2024.12.31 දක්වා වියදම් කළ මුදල (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස (%) |
|---|---|---|---|---|
| 1. | ජාතික ශාක නිරෝධායන සේවයේ උපකරණ අලුත්වැඩියාව හා ප්‍රතිස්ථාපනය (JICA) | 14.17 | 8.04 | 57 |

## 06. ජාතික ශාක නිරෝධායන සේවයේ පර්යේෂණ පහසුකම් වැඩි දියුණු කිරිම (KOICA) – වැය ශීර්ෂ අංක 118-2-03-046-2509

මෙම ව්‍යාපෘතිය සඳහා මූල්‍ය පහසුකම් KOICA ආයතනය මගින් ඉටුකරනු ලැබේ. භාණ්ඩ ආනයනය සඳහා වන බදු ගෙවීම් සහ ශ්‍රී ලංකාවේ බල පවත්වන විධිවිධාන අනුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිමට අවශ්‍ය පසුබිම නිර්මණය කිරීම ජාතික ශාක නිරෝධායන ආයතනය මගින් ඉටුකරනු ලබයි. කොරියානු රජය යටතේ මෙම ව්‍යාපෘතිය සඳහා ඇ.ඩො.මි. 7.20 ලැබී ඇති අතර, ශ්‍රී ලංකා රජය විසින් රු.මි. 74.61 ක් වියදම් කර ඇත. වසර 03 කට සැලසුම් කර තිබූ මෙම ව්‍යාපෘතිය මේ වන විට අවසන් වී ඇත. කොළඹ වරාය පරිශ්‍රයේ ශාක නිරෝධායන මධ්‍යස්ථානයට අවශ්‍ය ගොඩනැගිල්ලක් ඉදිකිරිම හා තාක්ෂණ උපකරණ ලබාදීම මගින් ශාක නිරෝධායන ධාරිතාවය වැඩි කිරිම මේ මඟින් සිදු වේ. කොළඹ වරාය කෙන්ද්‍ර කර ගනිමින් සිදුකරන ආනයන හා අපනයන ක්‍රියාවලිය විධිමත් හා කාර්යක්ෂම කිරීම මේ මගින් ඉටු වේ.

| අනු අංකය | වැඩසටහන | 2024 වර්ෂය සඳහා වෙන් කළ මුදල (රු.මි.) | 2024.12.31 දක්වා වියදම් කළ මුදල (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස (%) |
|---|---|---|---|---|
| 1. | ජාතික ශාක නිරෝධයන සේවයේ පර්යේෂණ පහසුකම් වැඩි දියුණු කිරීම (KOICA). | 28.20 | 28.03 | 99 % |

# කෘෂිකර්ම අංශය යටතේ ඇති ආයතන මගින් ක්‍රියාත්මක වන ප්‍රධාන සංවර්ධන වැඩසටහන්වල මූල්‍ය හා භෞතික ප්‍රගතිය

# 01. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව (DOA)

## 1.1. ඉදිරි දැක්ම

“ජාතික සමෘද්ධිය සඳහා කෘෂිකර්මාන්තයේ විශිෂ්ටත්වය ළඟා කර ගැනීම”.

## 1.2. මෙහෙවර

“සමානාත්මතාවයෙන් හා තිරසාර කෘෂිකාර්මික සංවර්ධනයක් අත්කර ගැනීම, වැඩිදියුණු කළ කෘෂිකාර්මික තාක්‍ෂණය සංවර්ධනය කිරීම හා ව්‍යාප්ත කිරීම තුළින් ජාතීන්ට ආහාර හා පෝෂණ සුරක්ෂිතතාව සහතික කිරීම සහ ගොවීන්ට වැඩි අවධානයක් යොමු කරමින් සියලු පාර්ශවකරුවන්ට අදාළ සේවාවන් සැපයීම”.

## 1.3. අරමුණු

ගොවියාගේ ආදායම හා ජීවන තත්ත්වය ඉහළ නැංවීම සහ පාරිභෝගිකයාට දැරිය හැකි මිලකට ආහාර ලබා දීම සඳහා ආහාර බෝග අංශයේ ඵලදායිතාව සහ නිෂ්පාදනය පවත්වාගෙන යාම සහ වැඩි කිරීම.

## 1.4. කාර්යයන්

- කෘෂිකාර්මික පර්යේෂණ හා සංවර්ධන
- කෘෂි තාක්ෂණ ව්‍යාප්ති හා පුහුණු
- බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය හා බෙදා හැරීම
- බීජ සහතික කිරීම හා ශාක ආරක්ෂණය
- නියාමන සේවා

## 1.5. 2025 වර්ෂයේ මූල්‍ය ඉලක්ක

| අ/අ | ප්‍රධාන සංවර්ධන වැඩසටහන | ඇස්තමේන්තු මුදල (රු.මි.) |
|---|---|---|
| 1 | ප්‍රාග්ධන වියදම | 1,333.70 |
| 2 | පුනරාවර්තන වියදම | 6,909.27 |

## 1.6. 2025 වර්ෂයේ භෞතික ඉලක්ක (කෘෂිකර්ම දෙපාර්තමේන්තු වැය ශීර්ෂය යටතේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් හා ව්‍යාපෘති)

| අ/අ | වැඩසටහන | මිනුම් ඒකකය | ඉලක්කය | ඒකක පිරිවැය | මුළු පිරිවැය (රු.මි.) |
|---|---|---|---|---|---|
| | **I. කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන** | | | | |
| | ***a. පවත්වාගෙන යන ව්‍යාපෘති*** | | | | |
| 1 | ජාතික කෘෂිකර්ම පර්යේෂණ සැලසුම ක්‍රියාත්මක කිරීම (NARP) | පර්යේෂණ සංඛ්‍යාව | 30 | - | 115.00 |

| අ/අ | වැඩසටහන | මිනුම් ඒකකය | ඉලක්කය | ඒකක පිරිවැය | මුළු පිරිවැය (රු.මි.) |
|---|---|---|---|---|---|
| 2 | සුළු පරිමාණ පර්යේෂණ ව්‍යාපෘති | පර්යේෂණ සංඛ්‍යාව | 17 | - | 125.00 |
| 3 | JICA | පුහුණු හා ක්ෂේත්‍ර චාරිකා සංඛ්‍යාව | පුහුණු - 20<br>ක්ෂේත්‍ර චාරිකා - 25 | - | 15.50 |
| 4 | පාංශු සංරක්ෂණ පනත ක්‍රියාත්මක කිරීම | පළාත් සංඛ්‍යාව | 03 | - | 5.00 |
| 5 | නව දෙමුහුම් හා විවෘත පරාගිත මිරිස්, බඩඉරිඟු හා ළූණු ප්‍රභේද බිහි කිරීම හා බීජ නිෂ්පාදනය | පර්යේෂණ සංඛ්‍යාව | නව විවෘත පරාගිත සහ දෙමුහුම් ප්‍රභේද වැඩිදියුණු කිරීමේ පර්යේෂණ 69ක් (ක්ෂේත්‍ර බෝග - 12, එළවළු - 21, පලතුරු -30, වී - 06) | - | 150.00 |
| 6 | ශ්‍රී ලංකාවේ ආහාර සුරක්ෂිතතාව සහතික කරමින් ආහාර බෝග නිෂ්පාදනය සඳහා දේශගුණයට ඔරොත්තු දෙන හරිත තාක්ෂණික වැඩිදියුණු කිරීම | පර්යේෂණ සංඛ්‍යාව | දේශගුණික විපර්යාසවලට ඔරොත්තු දෙන ප්‍රභේද නිෂ්පාදනයට අදාළ පර්යේෂණ 42ක් (ක්ෂේත්‍ර බෝග - 06, එළවළු - 18, පලතුරු -10, වී - 08) | - | 62.00 |
| | ***b. අපේක්ෂිත නව ව්‍යාපෘති*** | | | | |
| 7 | ඉහළ අස්වැන්නක් ලබා දෙන ප්‍රත්‍යාස්ථ ප්‍රභේද සහ නව්‍ය තාක්ෂණය තුළින් තිරසාර එළවළු නිෂ්පාදනයක් ළඟා කර ගැනීම | ප්‍රතිශතය/ සංඛ්‍යාව | නිෂ්පාදන ඵලදායිතාවය 15% සිට 30% දක්වාද අපනයනය 3% කින්ද ඉහළ නැංවීම හා තාක්ෂණික පැකේජ 4ක් සංවර්ධනය | - | 100.00 |
| 8 | තිරසාර එළවළු අගය දාමයන් සඳහා ආහාර සැකසුම් මධ්‍යස්ථාන හරහා තාක්ෂණය ව්‍යාප්ත කිරීම සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සවිබල ගැන්වීම | සංඛ්‍යාව | ලියාපදිංචි කරනු ලබන ව්‍යවසායකයන් -20, පර්යේෂණ ව්‍යාපෘති -12, ප්‍රකාශන -10 | - | 23.20 |
| 9 | දත්ත මත පදනම් වූ කෘෂිකර්මාන්තයක් සඳහා ක්‍රමානුකූල බෝග අස්වනු පරීක්ෂණ සිදු කිරීමෙන් වෙනත් ක්ෂේත්‍ර බෝග අස්වැන්න ඇස්තමේන්තු කිරීම | සංඛ්‍යාව | අස්වනු සමීක්ෂණ -2000 | - | 8.00 |
| | **II. ව්‍යාප්ති හා පුහුණු** | | | | |
| | ***a. පවත්වාගෙන යන ව්‍යාපෘති*** | | | | |
| 10 | කෘෂිකර්ම විද්‍යාල වැඩිදියුණු කිරීම | කෘෂි විද්‍යාල සංඛ්‍යාව | කෘෂිකර්ම විද්‍යාල 11 ක යටිතල පහසුකම් සංවර්ධනය කිරීම | - | 420.00 |

| අ/අ | වැඩසටහන | මිනුම් ඒකකය | ඉලක්කය | ඒකක පිරිවැය | මුළු පිරිවැය (රු.මි.) |
|---|---|---|---|---|---|
| 11 | මාධ්‍ය වැඩසටහන | රූපවාහිනි හා ගුවන් විදුලි වැඩසටහන් සංඛ්‍යාව | වැඩසටහන් 1604ක් නිෂ්පාදනය (ගුවන් විදුලි - 1452 රූපවාහිනී - 152 කෘෂි රූපවාහිනී තාක්ෂණික කෙටි පණිවිඩ, වාණිජ කෙටි පණිවිඩ සහ 1920 ගොවි ගැටළු පාදක කෙටි පණිවිඩ) | - | 66.00 |
| 12 | කෘෂිකර්ම දෙපාර්තමේන්තු වාර්ෂික සම්මේලනය (ASDA) | සම්මේලනය සංඛ්‍යාව | කෘෂිකර්ම දෙපාර්තමේන්තු වාර්ෂික සම්මේලනයක් (ASDA) පැවැත්වීම | - | 7.50 |
| 13 | කෘෂි තාක්ෂණික උද්‍යාන නඩත්තුව | කෘෂි තාක්ෂණ උද්‍යාන සංඛ්‍යාව | ගන්නෝරුව, බටඅත හා දියගම කෘෂි තාක්ෂණ උද්‍යාන 3 ආදර්ශන ලෙස පවත්වාගෙන යාම | - | 12.00 |
| 14 | පාංශු සාරවත්බව පරීක්ෂා කිරීමේ පහසුකම් වැඩිදියුණු කිරීම | පාංශු සෞඛ්‍ය කාඩ් පත් සංඛ්‍යාව | 15,000 | - | 30.00 |
| 15 | යහපත් කෘෂිකාර්මික පිළිවෙත් (GAP) හා ව්‍යවසායකත්ව සංවර්ධනය තුළින් වස විස නැති ආහාර නිෂ්පාදනයට සහාය වීම | GAP සහතික සංඛ්‍යාව, දැනුවත් කිරීමේ වැඩසටහන් | GAP සහතිකලත් ගොවිපල - 2500 | - | 60.00 |
| | ***b. අපේක්ෂිත නව ව්‍යාපෘති*** | | | | |
| 16 | වී සහ වෙනත් ක්ෂේත්‍ර බෝග සංවර්ධන වැඩසටහන | ප්‍රතිශතය | වී ඇතුළු අතිරේක ආහාර බෝගවල නිෂ්පාදන ඵලදායීතාවය 20% කින් ඉහළ නැංවීම | - | 1,000.00 |
| 17 | ආහාර බෝගවල කෘෂිකාර්මික තාක්ෂණ ව්‍යාප්තිය ශක්තිමත් කිරීම | හෙක්ටයාර් | නිෂ්පාදන ඵළදායිතාවය ඉහල නංවන වපසරිය 200,000 | - | 545.00 |
| 18 | ගොවිපළේ සිට වෙළෙඳපොළ දක්වා ශ්‍රී ලංකාවේ පලතුරු අගය දාමය ශක්තිමත් කිරීම | සංඛ්‍යාව | සහතික කරන ලද රෝපණ ද්‍රව්‍ය බෙදා හැරීම- 1,500,000, ආදර්ශන -100, ව්‍යවසායකයින් -2000 | - | 130.00 |
| 19 | කෘෂිකාර්මික තොරතුරු බෙදා හැරීම සඳහා පැය 24x7 කැප වූ peo TV රූපවාහිනී නාලිකාවක් පිහිටුවීම | නාලිකා ගණන | Peo TV රූපවාහිනී නාලිකාවක් | - | 32.50 |
| | **III. බීජ සහතික කිරීම හා ශාක ආරක්ෂණය** | | | | |
| | ***a. පවත්වාගෙන යන ව්‍යාපෘති*** | | | | |
| 20 | බීජ නිෂ්පාදනය හා මිලදී ගැනීමේ වැඩසටහන | ලියාපදිංචි සහ සහතික කළ බීජ ප්‍රමාණය | වෙනත් ක්ෂේත්‍ර බෝග බීජ මෙට්‍රික් ටොන් 700ක්ද, වී බීජ බුසල් 40,000ක්ද, සහ එළවළු බීජ මෙට්‍රික් ටොන් 50 | - | 1,250.00 |

| අ/අ | වැඩසටහන | මිනුම් ඒකකය | ඉලක්කය | ඒකක පිරිවැය | මුළු පිරිවැය (රු.මි.) |
|---|---|---|---|---|---|
| 21 | බීජ පනත ක්‍රියාත්මත කිරිම | සංඛ්‍යාව | බීජ පනත පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් - 60ක්, ස්ථානීය පරීක්ෂා කිරීම් - 3200ක් හා නව ලියාපදිංචි කිරීම් 1600ක් සිදු කිරීම | - | 40.00 |
| 22 | කඩිනම් බීජ ගොවිපළ සංවර්ධන වැඩසටහන | බීජ ගොවිපළ සංඛ්‍යාව | බීජ ගොවිපල් 29ක යටිතල පහසුකම් සංවර්ධනය | - | 625.00 |
| 23 | බීජ සහතික කිරීමේ කටයුතු සවිබල ගැන්වීම | සංඛ්‍යාව | මහඉලුප්පල්ලම බීජ පරීක්ෂණාගාර පහසුකම් සංවර්ධනය කිරීම, ගන්නොරුව බීජ සෞඛ්‍ය පරීක්ෂණ ඒකකයේ පැළ ගෘහයක් ස්ථාපිත කිරීම | - | 120.00 |
| 24 | කෘෂි රසායන වලින් ඇතිවිය හැකි අහිතකර බලපෑම් අවම කිරීම | සංඛ්‍යාව | ASTA පුහුණු පන්ති, රාජසන්තක කළ පලිබෝධනාශක විනාශ කිරීම හා බැර ලෝහ සඳහා සාම්පල විශ්ලේෂණය | - | 35.00 |
| 25 | දේශීය බීජ අර්තාපල් නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම | සංඛ්‍යාව | බීජ අර්තාපල් ගොවිපල 3ක යටිතල පහසුකම් සංවර්ධනය | - | 40.00 |
| 26 | පැළැටි ජාන සම්පත් මධ්‍යස්ථානයේ වත්මන් ශාක ජාන සම්පත් බැංකුව අලුත්වැඩියා කිරීම සහ නඩත්තු කිරීම | සංඛ්‍යාව | ජාන සම්පත් බැංකුව අළුත්වැඩියා කිරීම | - | 8.00 |
| 27 | ආනයන හා අපනයන කටයුතුවලදී ශාක ස්වස්ථතා ආරක්ෂාව තහවුරු කිරීම සඳහා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව ගුවන් තොටුපල නිරෝධායන ඇතුල්වීමේ ස්ථානයේ පහසුකම් වැඩිදියුණු කිරීම | සංඛ්‍යාව | ගුවන් තොටුපල ශාක නිරෝධායන ස්ථානයේ පහසුකම් වැඩිදියුණු කිරීම | - | 30.00 |
| | ***b. අපේක්ෂිත නව ව්‍යාපෘති*** | | | | |
| 28 | ගුණාත්මක බීජ හා රෝපණ ද්‍රව්‍ය අලෙවි හා බෙදාහැරීමේ ජාලය ශක්තිමත් කිරීම | සංඛ්‍යාව | සංවර්ධනය කරන අලෙවිසැල් - 2, නව අලෙවිසැල් -1, | - | 76.50 |
| 29 | ශ්‍රී ලංකාව පුරා ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම සඳහා තිරසාර ක්‍රියාකාරකම් හරහා ශාක ආරක්ෂණ වැඩසටහන ශක්තිමත් කිරීම | සංඛ්‍යාව | ජෛව කාරකයන් -25, ආදර්ශන -15, බලයලත් නිලධාරීන් -150, දැනුවත් කිරීමේ වැඩසටහන් -50 | - | 20.00 |
| 30 | ජෛව ආරක්ෂණ සහ ශාක ස්වස්ථතා අවශ්‍යතාවලට | සංඛ්‍යාව | ශාක ස්වස්ථතා සහතික - 100,000, ශාක හා ශාක | - | 30.00 |

| අ/අ | වැඩසටහන | මිනුම් ඒකකය | ඉලක්කය | ඒකක පිරිවැය | මුළු පිරිවැය (රු.මි.) |
|---|---|---|---|---|---|
| | අනුකූලව ශ්‍රී ලංකාවේ ශාක හා ශාක නිෂ්පාදන පිවිසුම්පල හරහා වෙළෙඳාම ශක්තිමත් කිරීම | | නිෂ්පාදන අපනයන සහ ආනයන තොග පරීක්ෂාව - සාම්පල 98,000 | | |

## 1.7. 2024.12.31 දිනට සංවර්ධන වැඩසටහන්වල මූල්‍ය ප්‍රගතිය

| අ/අ | වැඩසටහන | 2024 වර්ෂය සඳහා වෙන් කළ මුදල (රු.මි.) | 2024.12.31 දක්වා වියදම් කළ මුදල (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| 1 | පුනරාවර්තන වියදම් | 6,566.32 | 6,210.17 | 95 |
| 2 | ප්‍රාග්ධන වියදම් | 732.83 | 651.22 | 89 |
| 3 | **කෘෂිකර්ම දෙපාර්තමේන්තු වැය ශීර්ෂ යටතේ ඇති විශේෂ ව්‍යාපෘති** | | | |
| | කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන | 138.0 | 122.22 | 89 |
| | ව්‍යාප්ති හා පුහුණු | 432.0 | 329.19 | 76 |
| | බීජ සහතික කිරීම හා පැළෑටි සංරක්ෂණ | 2,000 | 1,902.04 | 95 |
| 3.2 | ජාතික කෘෂිකර්ම පර්යේෂණ ව්‍යාපෘති | 75.0 | 59.01 | 79 |
| 3.3 | සුළු පරිමාණ ව්‍යාපෘති | 113.0 | 103.92 | 92 |
| | **ප්‍රාග්ධන උප එකතුව** | **3,490.83** | **3,167.6** | **91** |
| 4 | කෘෂිකර්ම අමාත්‍යාංශ වැය ශීර්ෂ යටතේ ඇති විශේෂ ව්‍යාපෘති | 146.762 | 121.274 | 84 |
| | මුළු එකතුව | **10,203.91** | **9,499.04** | **93** |

## 1.8. කෘෂිකර්ම දෙපාර්තමේන්තු (285) වැය ශීර්ෂය යටතේ ඇති විශේෂ ව්‍යාපෘතිවල 2024.12.31 දිනට භෞතික ප්‍රගතිය - සමස්ත වැඩසටහන් වල සංක්ෂිප්තය

<u>පර්යේෂණ හා සංවර්ධන</u>

### 1. මිරිස්, බඩඉරිඟු, ළූණු, එළවළු, පලතුරු වල නව දෙමුහුම් සහ විවෘත පරාගිත ප්‍රභේද සංවර්ධනය කිරීම සහ බීජ නිෂ්පාදනය

**ක්ෂේත්‍ර බෝග**

- මිරිස්, බඩ ඉරිඟු සහ ළූණු වල නව විවෘත පරාගිත සහ දෙමුහුම් ප්‍රභේද වැඩිදියුණු කිරීම අරමුණු කරගත් ක්ෂේත්‍ර මට්ටමින් පරීක්ෂණ සිදුකිරීම සහ නව මුහුම් සංයෝග හඳුන්වාදීම සිදු කරන ලදී.
- මෙම බෝග සඳහා ප්‍රධාන පළිබෝධ සහ රෝග වලට ප්‍රතිරෝධය තක්සේරු කිරීම සඳහා ඇගයීම් සිදු කරමින් පවතී. මුල් අවධියේදී ළූණු ඇන්ත්‍රැක්නෝස් සහ දිළීර බල්බ කුණුවීම පාලනය කිරීම සඳහා ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය, මහඉලුප්පල්ලම විසින් වැඩිදියුණු

කරන ලද ට්‍රයිකොඩර්මා අභිජනන ජෛව-පළිබෝධනාශක භාවිතයෙන් අන්තර් සමෝදානිත රෝග කළමනාකරණ තාක්ෂණය හඳුන්වාදෙන ලදී.

- ඵැණු අස්වැන්න නෙළීම සහ අනෙකුත් ක්ෂේත්‍ර බෝග බීජ වැපිරීම සඳහා සුදුසු උපකරණ හඳුනා ගැනීම සහ ප්‍රචලිත කිරීම සඳහා ගොවිපල යන්ත්‍රෝපකරණ පිළිබඳ පර්යේෂණ සිදු කරනු ලැබේ. මූලික සැලසුම අවසන් කර ඇත. බීජ පැළ ඒකකයේ සැලසුම යාවත්කාලීන කර පැළ නිෂ්පාදනය සිදුවෙමින් පවතී.

**වී**

- ඉහළ අස්වැන්නක් සහිත ලවණතාව, යකඩ විෂ වීම, නියඟය, ජලයෙන් යටවීමට ඔරොත්තු දීම වැනි විශේෂිත ලක්ෂණ සහිත මාස 4-4 ½, 3 ½, 3 සහ 2 ½ වයස් කාණ්ඩවල නව වී ප්‍රභේද/උසස් අභිජනන ආර හඳුන්වා දීම සහ BPH (දුඹුරු පැලැටි කීඩෑවා), RGM (ගොක් මැස්සා), කොළ පාළුව සහ බැක්ටීරියා පත්‍ර අංගමාරය (BLB) සඳහා ප්‍රධාන පළිබෝධ සහ රෝග ප්‍රතිරෝධය ඇගයීම අරමුණු කරගනිමින් විවිධත්ව සංවර්ධන පර්යේෂණ වැඩසටහන පවත්වන ලදී.
- NCRVT (ජාතික සම්බන්ධීකරණ වී ප්‍රභේද පරීක්ෂාව), PYT (ප්‍රාථමික අස්වැන්න අත්හදා බැලීම්), MYT (ප්‍රධාන අස්වැන්න අත්හදා බැලීම්) සහ OYT (නිරීක්ෂණ අස්වැන්න අත්හදා බැලීම්) ඇතුළු විවිධ පරීක්ෂණ තත්වයන් යටතේ ප්‍රභේද 200 ක සහ අභිජනන ආර වල භෞතික හා භෞත රසායනික ලක්ෂණ තක්සේරු කර ඇත.
- තවද, නිර්දේශිත වී වර්ග හතළිහක් සඳහා අභිජනන බීජ නිෂ්පාදනය සිදු කරන ලදී.
- මාස 3 ½ ක වයස් කාණ්ඩයේ නව වී ප්‍රභේදයක් "Bg 382 Fr" (සුවඳ කැකුළු) ලෙස නිකුත් කරන ලදී. එය හෙක්ටයාරයකට ටොන් 4.6 ක සාමාන්‍ය අස්වැන්නක් සහිත සුවඳක් සහිත දිගු, සුදු, මධ්‍යම ප්‍රමාණයේ වී ප්‍රභේදයකි.
- දෙමුහුම් වී අභිජනන වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක වන අතර, ප්‍රාථමික අස්වැන්න අත්හදා බැලීම් වලදී සාර්ථක දෙමුහුම් ආර (F1) හතක් දැනට පරීක්ෂණයට ලක් කෙරේ. ඊට අමතරව, නිරීක්ෂණ ක්ෂේත්‍ර අත්හදා බැලීම් වලදී ඒවායේ අස්වැන්න සහ අනෙකුත් කෘෂි විද්‍යාත්මක ලක්ෂණ තීරණය කිරීම සඳහා තවත් F1 ආර හතක් පරීක්ෂණයට ලක්කරමින් පවතී. පසු මුහුම් ක්‍රමය (Back cross ක්‍රමය) භාවිතා කරමින් දෛශික රාශි වලින් ඇතිවන පුං වන්ධ්‍යතාවය (CMS) සිදුකරමින් පවතින අතර එය තුන්ව පසු දෙමුහුම් පරම්පරාවට (BC3 පරම්පරාවට) ළඟා වී ඇත.

**එළවළු**

- දිවයින පුරා ගොවීන්ගේ වගාව සඳහා නව එළවළු ප්‍රභේද 2ක් නිකුත් කරන ලදී (HORDI Brinjal Hybrid - 4 සහ HORDI Cucumber-4). එළවළු බෝග 14ක් සඳහා මූලික ගහන නිපදවීමේ කටයුතු සිදු කරන ලද අතර, නව ජාන ප්ලාස්මා 52ක් සමඟ ජාන ප්ලාස්මා එකතු කිරීම, පරාගනය කිරීම සහ ක්ෂේත්‍ර ඇගයීමේ අත්හදා බැලීම් සිදු කරන ලදී.
- නව ප්‍රභේද නිපදවීමේ ක්‍රියාවලියේ නව අභිජනන ආර 250ක් සහ සාර්ථක ආර ක්ෂේත්‍ර ඇගයීමට ලක් කර, කාර්ය සාධන දත්ත රැස් කර, විශ්ලේෂණය කර, වත්මන් කන්නය තුළද අඛණ්ඩව පවත්වාගෙන යන ලදී.
- ප්‍රභේද මුදා හැරීමේ ක්‍රියාවලියේදී අත්හදා බැලීම් 24ක් සහිත සාර්ථක ආර 13ක් සඳහා බහු ස්ථානීය අත්හදා බැලීම් සිදු කරන ලදී (NCVT, VAT))
- එළවළු වර්ග 25 ක් සඳහා අභිජනන බීජ සහ න්‍යෂ්ටික බීජ නිෂ්පාදනය කිරීම සහ ගොවීන්, රාජ්‍ය සහ පෞද්ගලික අංශය සමඟ එක්ව එළවළු සඳහා බීජ නිෂ්පාදන තාක්‍ෂණ ව්‍යාප්තිය සිදු කරන ලදී.

- තෝරාගත් එළවළු බෝග සඳහා පාංශු පෝෂක කළමනාකරණය සහ නව පොහොර යෙදීමේ අත්හදා බැලීම් සිදු කරන ලදී.
- තිරසාර පළිබෝධ සහ රෝග කළමනාකරණ තාක්ෂණයන් (බද්ධ කිරීම, ප්‍රතිරෝධී අභිජනනය සහ රසායනික අත්හදා බැලීම්) හඳුන්වාදීම සඳහා අත්හදා බැලීම් සිදු කරන ලදී.
- එළවළු සඳහා තත්ත්ව ඇගයීම, සැකසුම් තාක්ෂණ සංවර්ධනය සහ ආහාර දූෂක පරීක්ෂණ කටයුතු (අගය එකතු කළ නිෂ්පාදන පරීක්ෂාව සහ බැර ලෝහ දූෂක විශ්ලේෂණය) සිදු කරන ලදී.

**පලතුරු**

- පලතුරු බෝග 14 ක් සඳහා සාර්ථක අභිජනන ආර හඳුන්වාදීම හා ඇගයීම, ගහණය වැඩිදියුණු කිරීම සහ ඉහළ අස්වැන්නක් සහිත, ගුණාත්මක පලතුරු වර්ග හෝ දෙමුහුම් තෝරා ගැනීම අරමුණු කරගත් ස්ථානීය සහ බහු-ස්ථානීය අත්හදා බැලීම් හරහා අඛණ්ඩව සිදු කෙරේ. 2024 දී ප්‍රභේද නිදහස් කිරීම් කමිටුවේදී සාර්ථක කොස් ප්‍රභේදයක් වන 'හොරණ කොස් 01' සහ සැපෝටා ප්‍රභේදයක් වන 'ගන්නෝරුව සැපෝටා 01' හඳුන්වා දෙන ලදි. හොරණ පැපොල් F1 දෙමුහුම් 01 මව් බීජ, හොරණ ගෝල්ඩ් පැෂන් ෆෘට් බීජ, මුදා හරින ලද ප්‍රභේදවල අංකුර සහ බද්ධ කරන ලද ශාක 5930 ක්, ලේයර් කරන ලද දෙළුම් පැළ 2150 ක් සහ පටක රෝපිත කෙසෙල් පැළ 6,000 ක් නිෂ්පාදනය කරන ලදී. හොරණ සහ කුණ්ඩසාලේ යන ප්‍රදේශවල පලතුරු ජාන ප්ලාස්ම උද්‍යාන දෙකක් ස්ථාපිත කර ඇති අතර, එක් එක් උද්‍යානවල මව් ශාක 150-200 ක් බැගින් ස්ථාපිත කර ඇත.

## 2. ශ්‍රී ලංකාවේ ආහාර සුරක්ෂිතතාව සහතික කරමින් ආහාර බෝග නිෂ්පාදනය සඳහා දේශගුණයට ඔරොත්තු දෙන හරිත තාක්ෂණික වැඩිදියුණු කිරීම

**වී**

- අජීවී ආතතීන්ට ඔරොත්තු දෙන වී ආර හඳුන්වාදීමේ වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක වේ.
- ජලයෙන් යටවීමේ තත්වයන්ට ඔරොත්තුදෙන සහ ගංවතුරට අනුවර්තනය වීමේ හැකියාව සහිත වී ආර දක්වා වැඩි දියුණු කිරීම කෙරෙහි අවධානය යොමුවී ඇත.
- නියඟයට, තාපයට, නිර්වායු ප්‍රරෝහණය, අයන විෂ වීම සහ ලවණතාවයට ඔරොත්තුදෙන වී ආර හඳුනා ගැනීම සඳහා වැඩිදුර පරීක්ෂණ සිදු කෙරෙමින් පවතී.
- ඊට අමතරව, දුඹුරු පැල මැක්කන්, ගොක් මැස්සා සහ පැළ මැක්කන්ට ප්‍රතිරෝධය දක්වන පළිබෝධ ප්‍රතිරෝධී වී ප්‍රභේද හඳුන්වාදීම සඳහා පර්යේෂණ සිදු කෙරෙමින් පවතී.

**ක්ෂේත්‍ර බෝග**

- නියඟයට ඔරොත්තු දෙන රටකජු එකතුන් 20 ක්, මුං එකතුන් 15 ක් සහ තෝර පරිප්පු එකතුන් 10 ක් හඳුන්වාදීම සඳහා අනෙකුත් ක්ෂේත්‍ර බෝග වල කෘෂිකාර්මික භාවිතයන් සහ නියඟයට ඔරොත්තු දීමේ හැකියාව වැඩිදියුණු කිරීම කෙරෙහි අඛණ්ඩ පර්යේෂණ අවධානය යොමු කරයි.
- විශාල බීජ සහිත රටකජු ප්‍රභේද සඳහා පෝෂක කළමනාකරණ උපාය මාර්ග සැකසීම සහ තල හා කුරක්කන්වල බීජ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීමට තාක්ෂණික පැකේජ වලංගු කිරීම සඳහා පර්යේෂණ සහ ගොවි ක්ෂේත්‍ර යන දෙකෙහිම අත්හදා බැලීම් සිදු කරනු ලැබේ.
- ඊට අමතරව, රනිල සඳහා විභව ආදේශක ලෙස සාර්ථකව භාවිතා කළ හැකි තෝර පරිප්පු ප්‍රභේද තුනක් පරීක්ෂණයට ලක්කරමින් පවතී.

- රනිල කුලයට අයත් බෝග සහ තෙල් බෝග වලට පසෙන් බෝවන රෝග කාරක වලට එරෙහිව ජෛව පාලන කාරක භාවිතය මෙන්ම නියඟයට ඔරොත්තු දෙන තෝර පරිප්පුවලට අදාලව භෞතික විද්‍යාත්මක හා රූප විද්‍යාත්මක ප්‍රතිචාර අධ්‍යයනය කිරීම ද පර්යේෂණයට ඇතුළත් වේ.
- සෝයා බෝංචි ප්‍රභේද 5ක් නියඟයට ඔරොත්තු දීම සම්බන්ධයෙන් පරීක්ෂාවට භාජනය කරමින් පවතින අතර, කාලගුණික සාධකවලට සාපේක්ෂව මිරිස් ප්‍රභේදවලට *Scirtothrips dorsalis* පළිබෝධකයාගේ බලපෑම ද පරීක්ෂණයට ලක් කෙරේ.

එළවළු

- තක්කාලි, මාළු මිරිස්, බටු, බෝංචි, ගෝවා සහ ඩයස්කෝරියා විශේෂ සම්බන්ධයෙන් ඵලදායිතාව සහ අස්වැන්නේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සඳහා ක්ෂේත්‍ර හා හරිතාගාර වගා තාක්ෂණයන් හඳුනා ගැනීමට අධ්‍යයනයන් සිදු කරන ලදී.
- හරිතාගාරවල වගාකරනු ලබන තක්කාලි සහ වැටකොළු බීජ නිෂ්පාදනය සඳහා වූ කෘෂි විද්‍යාත්මක පැකේජ වැඩිදියුණු කරන ලදී .
- ක්ෂේත්‍රයේ ප්‍රධාන ගැටළු විසඳීම සඳහා බද්ධ බීජ පැල නිපදවීමේ තාක්ෂණයක් හඳුන්වාදෙන ලදී.
- දේශීය බීජ භාවිතා කරමින් ක්ෂුද්‍ර හරිත නිෂ්පාදනය හඳුන්වා දෙන ලදී. අහිතකර දේශගුණයට අනුවර්තනය වූ වම්බටු දර්ශ තෝරාගෙන බෝංචි ඇගයීමට ලක් කරන ලදී.
- එළවළු සඳහා පෝෂණ කළමනාකරණ පැකේජ ඇගයීමට ලක් කරන ලදී.
- වෙනස් වන දේශගුණ තත්ත්ව යටතේ නව ආහාර බෝග, නව ආහාර නිෂ්පාදන සහ අගය එකතු කිරීමේ තාක්ෂණය භාවිතය සහ හඳුන්වාදීම සිදුකරන ලදී.
- ආහාර සැකසුම්කරුවන් වෙනුවෙන් නව සැකසුම් ක්‍රම හඳුන්වාදෙන ලද අතර තත්ත්ව විශ්ලේෂණ 127ක් සිදු කරන ලදී.
- වම්බටු, බෝංචි, තක්කාලි සහ ගෝවා වල රසායනික පාලනය සහ කප්පාදු කිරීම ඇතුළු රෝග කළමනාකරණ ක්‍රම සිදු කරන ලද අතර මුකුණුවැන්න ශාකයේ දුඹුරු පැහැ ලප සහ සුදු මලකඩ පාලනය කිරීම සඳහා පැකේජ හඳුන්වා දෙන ලදී .
- නෙමටෝඩාවන් සහ සුදු කම්බිලි පණුවන් පාලන ක්‍රම හඳුන්වා දෙන ලදී.

පලතුරු

- විවිධ කෘෂි-පාරිසරික කලාප හරහා අජෛව ආතතිනට ඔරොත්තු දීමේ හැකියාව තක්සේරු කිරීම සඳහා, අඹ ප්‍රභේද කිහිපයක්, අන්නාසි ප්‍රභේද 2ක්, රඹුටන් ප්‍රභේද 11ක්, දූරියන් ප්‍රභේද 8ක්, මැංගුස් සහ අලිගැට පේර ප්‍රභේද 7ක් ඇතුළු විවිධ පලතුරු බෝග ඇගයීම කෙරෙහි පර්යේෂණ අවධානය යොමු කරන ලදී .
- විවිධ කෘෂි පාරිසරික කලාපවල අඹ එකතුන් 2ක් සහ එක් අඹ ප්‍රභේදයක් (අඹ GN 01) සිටුවන කරන ලදී.
- උෂ්ණත්වයට ඔරොත්තු දෙන වගා ප්‍රභේද හඳුනා ගැනීම සඳහා අන්නාසි, රඹුටන්, දූරියන් සහ මැංගුස් වගා ප්‍රභේද, මදුරුකැටිය ප්‍රදේශයේ ක්ෂේත්‍රවල සිටුවන ලදී.
- ඉහළ ඝනත්වයක් සහිත අලිගැට පේර වගාව සිදු කිරීම සඳහා කෘෂි විද්‍යාත්මක පැකේජයක් හඳුන්වා දීමට (පරතර දෙකක් සහිත - මීටර් 5x5 සහ මීටර් 7x7) බණ්ඩාරවෙල ප්‍රාදේශීය කෘෂිකර්ම පර්යේෂණ මධ්‍යස්ථානයේ අලිගැට පේර ප්‍රභේද දෙකකින් ලබාගත් (හැස් සහ ටවර් ටු ) පැළ 70ක් ක්ෂේත්‍රයේ සිටුවන ලදී.
- අස්වනු දර්ශක හඳුනා ගැනීම සඳහා මිල්ලෑව සුවදැල් ක්ෂේත්‍රයේ සිටුවන ලද අතර ශාක එල දරණ තත්වයේ පවතී.

- කොස් වල නියඟයට අනුවර්තනය වීමේ හැකියාව පරීක්ෂා කිරීම සඳහා, හොරණ පලතුරු පර්යේෂණ හා සංවර්ධන ආයතනය ආශ්‍රිත ක්ෂේත්‍රයේ සහ අඟුණකොළපැලැස්ස තෙල් හා මාෂ බෝග පර්යේෂණ මධ්‍යස්ථානයේ ක්ෂේත්‍රයන්හි කොස් ශාක එකතුන් 2ක් (ශාක 40) සිටුවන ලද අතර, අස්වැන්න සහ ගුණාත්මක දත්ත රැස් කිරීම සිදු කරන ලදී.

**3. පාංශු සංරක්ෂණ පනත**

- පාංශු සංරක්ෂණය තුළින් ගොවිබිම් වල තිරසාර ඵලදායිතාව පවත්වා ගැනීම සඳහා, ඌව, මධ්‍යම සහ සබරගමුව පළාත්වල ක්ෂේත්‍ර දර්ශන 82 ක් සිදුකරන ලදී .
- මොණරාගල, කෑගල්ල, නුවරඑළිය සහ මාතලේ දිස්ත්‍රික්කවල කෘෂිකර්ම උපදේශකයින් සඳහා GPS සහ GIS තාක්ෂණය භාවිතයෙන් පාංශු සංරක්ෂණය සහ ඉඩම් සංවර්ධනය , ක්ෂේත්‍ර දත්ත අධීක්ෂණය සහ දත්ත පද්ධති කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩසටහන් පවත්වන ලදී.

**කෘෂි ව්‍යාප්තිය සහ පුහුණුව**

**4. කෘෂිකර්ම විද්‍යාල සංවර්ධනය**

- කෘෂිකර්ම විද්‍යාල 11 ක (පැල්වෙහෙර, කුණ්ඩසාලේ, වවුනියාව, අඟුණකොළපැලැස්ස, කරපිංච, අනුරාධපුරය, බිබිල, වාරියපොල, ලබුදූව, පාලමුනේ සහ පරන්තන්) යටිතල පහසුකම් සංවර්ධනය සහ අධ්‍යයන කටයුතු සඳහා උපකරණ මිලදී ගැනීම සිදු කරන ලදී.
- අඟුණකොළපැලැස්ස කෘෂිකර්ම විද්‍යාලයේ විශේෂයෙන් නිල නිවාස ප්‍රතිසංස්කරණය කිරීම, නල ළිඳක් සහ පටක රෝපණ රසායනාගාරයක් ඉදිකිරීම සහ සත්ව පාලන ඒකකය ප්‍රතිසංස්කරණය කිරීම සිදු කරන ලදී.
- තවද ලබුදූව කෘෂිකර්ම විද්‍යාලයේ නව කාන්තා නේවාසිකාගාරයේ බිම් මහල, හතු නිෂ්පාදන ඒකකය සහ ගොවිපල කාර්යාලය ප්‍රතිසංස්කරණය කිරීම ද නිම කරන ලදී.
- වාරියපොළ කෘෂිකර්ම විද්‍යාලයේ විදුහල්පති කාර්යාල කාමරය සහ පරිපාලන ශාඛාව අලුත්වැඩියා කිරීම සහ ආරක්ෂිත වැටක් ඉදිකිරීම සිදු කරන ලදී.
- කුණ්ඩසාලේ කෘෂිකර්ම විද්‍යාලයේ අබේවර්ධන නේවාසිකාගාරයේ වැසිකිළි සංකීර්ණය අලුත්වැඩියා කිරීම, ආහාර විද්‍යා විද්‍යාගාරයේ වහලය සහ ප්‍රධාන අලුත්වැඩියාවන් ද නිම කරන ලදී.

**5. කෘෂිකර්ම විද්‍යාල ගොවිපල සංවර්ධනය**

- ඩිප්ලෝමා සිසුන් සඳහා ප්‍රායෝගික පුහුණු ධාරිතාව ඉහළ නැංවීම සඳහා කෘෂිකර්ම විද්‍යාල 11 ක (පැල්වෙහෙර, කුණ්ඩසාලේ, වවුනියාව, අඟුණකොළපැලැස්ස, කරපිංච, අනුරාධපුර, බිබිල, වාරියපොළ, ලබුදූව, පාලමුනේ සහ පරන්තන්) ගොවිපල පහසුකම් සංවර්ධනය කිරීම සිදු කර ඇත. සියලුම ක්‍රියාකාරකම් දැනටමත් අවසන් කර ඇත.
- විද්‍යාලයේ ගොවිපල වටා වැටවල් විශේෂයෙන් වැඩිදියුණු කිරීම, විද්‍යාගාර උපකරණ මිලදී ගැනීම සහ වවුනියාව කෘෂිකර්ම විද්‍යාලයේ ජීව විද්‍යා හා රසායන විද්‍යාගාරවල රසායනාගාර පහසුකම් වැඩිදියුණු කිරීම අවසන් කරන ලදී.
- තවද ලබුදූව සහ වාරියපොළ කෘෂිකර්ම විද්‍යාලවල නේවාසිකාගාර සඳහා පරිගණක, බහුමාධ්‍ය ප්‍රක්ෂේපක, ගොවිපල උපකරණ සහ ගෘහ භාණ්ඩ මි ලදී ගන්නා ලදී.

**6. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වාර්ෂික සම්මන්ත්‍රණය (ASDA)**

- කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වාර්ෂික සම්මන්ත්‍රණය 2024 සැප්තැම්බර් 13 වන දින සාර්ථකව පැවැත්විණි.

**7. මාධ්‍ය වැඩසටහන්**

- ගුවන්විදුලි වැඩසටහන් 1,554ක් (කොළඹ - 650, රජරට - 206, කඳුරට - 284, රුහුණු - 362, යාපනය - 52, කෙටි පණිවුඩ - 988) විකාශනය කිරීම සහ රූපවාහිනී වැඩසටහන් 147ක් විකාශය කිරීම (ගොවිබිමට අරුණළු - 56, මිහිකත දිනුවෝ - 46, උයරුම් උලවුම් - 51) සම්පූර්ණ කරන ලදී.
- කෘෂි රූපවාහිනී තාක්ෂණික කෙටි පණිවිඩ 156 ක්, වාණිජ කෙටි පණිවිඩ 26 ක් සහ 1920 ගොවි ගැටළු පාදක කෙටි පණිවිඩ 130 ක් නිෂ්පාදනය කරන ලදී.
- මුළු නරඹන්නන් සංඛ්‍යාව මිහිකත දිනුවෝ - 33,629, ගොවිබිමට අරුණළු - 57,160, උයරුම් උලවුම් - 27,858, යූ ටියුබ් - 113,899 සහ ෆේස්බුක් - 472,902.
- කෘෂිකර්ම ප්‍රකාශන ඒකකය මගින් පොත් 32,436 ක් සහ පත්‍රිකා 128,846 ක් මුද්‍රණය කෙරිණ. ප්‍රකාශන අලෙවියෙන් ලද ආදායම රු. 2,438,542.00 කි.

**8. කෘෂි තාක්ෂණ උද්‍යාන පවත්වාගෙන යාම**

- ප්‍රජාව අතර නිසි කෘෂිකාර්මික තාක්ෂණ ප්‍රචලිත කිරීම සඳහා ගන්නොරුව, බටඅත සහ දියගම යන ස්ථානවල පිහිටි කෘෂි තාක්ෂණ උද්‍යාන ආදර්ශන ලෙස පවත්වාගෙන යාම අඛණ්ඩව සිදු කෙරේ. ගන්නොරුවට පැමිණි අමුත්තන්ගේ මුළු සංඛ්‍යාව 60,564 කි. (දේශීය - 59,892, විදේශිය- 672) වන අතර බටඅතට පැමිණි අමුත්තන්ගේ මුළු සංඛ්‍යාව 58,185 (දේශීය - 57616, විදේශිය - 569
- ගන්නොරුවෙන් රුපියල් 2,682,580.00 ක ආදායමක් ද, බටඅත මගින් රුපියල් 6,428,316.99 ක ආදායමක් ද උපයා ඇත. (ප්‍රවේශපත්‍ර/ ගොවිපල නිෂ්පාදන/ මත්ස්‍ය චිකිත්සාව)

**9. පසේ සරුබව පරීක්ෂා කිරීමේ පහසුකම් සංවර්ධනය කිරීම**

- වී වගාකරන ඉඩම්වලට පාංශු පරීක්ෂාව මත පදනම් වූ පොහොර නිර්දේශ හඳුන්වාදීම සඳහා පස් සාම්පල 2,650 ක් ලබාගෙන ඇති අතර, සාම්පල විශ්ලේෂණය කිරීම සඳහා රසායනික ද්‍රව්‍ය මිලදී ගන්නා ලදී.

**10. යහපත් කෘෂිකාර්මික පිළිවෙත් (GAP) සහ ව්‍යවසායකත්ව සංවර්ධනය තුළින් විෂ රහිත ආහාර නිෂ්පාදනය සඳහා ගොවීන්ට සහාය වීම**

- "යහපත් කෘෂිකාර්මික පිළිවෙත්" (GAP) සහල් වගා වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා ගොවීන් වෙනුවෙන් ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහනක් පවත්වන ලදී.
- යහපත් කෘෂිකාර්මික පිළිවෙත් සහතික 513 ක් නිකුත් කර ඇත.

**11. ආහාර බෝග නිෂ්පාදනය සහ ඵලදායිතාව වැඩි දියුණු කිරීම**

නව ප්‍රභේද, ඉහළ අස්වැන්නක් ලබා දෙන පැකේජ සහ අනෙකුත් නව බීජ නිෂ්පාදන තාක්ෂණය හඳුන්වාදීම මගින් වී, බඩ ඉරිඟු, මිරිස්, ළූණු, මුං ඇට, උඳු, කව්පි, රටකජු, සෝයා බෝංචි, කුරහන්, තල, පළතුරු සහ එළවළුවල ගුණාත්මක බීජ නිෂ්පාදනය වැඩි කිරීම සිදු කෙරේ.

- **වී -** ස්වයං බීජ වී නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම සඳහා අක්කර ¼ ආදර්ශ වගා 1,800 ක් පැවත්වූ අතර ලියාපදිංචි බීජ කිලෝග්‍රෑම් 4,731 ක් සහ පැරෂූට් තැටි 180,000 ක් ලබා දෙන ලදී.

- **බඩ ඉරිඟු -** දේශීය දෙමුහුම් බඩ ඉරිඟු ප්‍රභේද ප්‍රවර්ධනය කිරීම සඳහා, මාපිය බීජ ලබා දෙමින් හෙක්ටයාර 100 ක භූමි ප්‍රමාණයක දේශීය දෙමුහුම් බඩ ඉරිඟු බීජ නිෂ්පාදනය කරන ලදී. ගොවි කණ්ඩායම් සමඟ එක්ව රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්ව වැඩසටහනක් ලෙස අක්කර 1 ආදර්ශ වගා 2,380 ක් පවත්වන ලදී.

- **ලොකු ළූණු -** ලොකු ළූණු නිෂ්පාදනය සහ ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා, ඉහළ අස්වැන්නක් ලබා දෙන තාක්ෂණික පැකේජයක් ගොවීන්ට හඳුන්වා දෙන ලදී. ඒ යටතේ අක්කර ¼ ආදර්ශ වගා 270 ක් පවත්වාගෙන යමින් ජල සම්පාදන ඒකක 82 ක් සහ පාත්ති සැකසීම සඳහා සහනාධාර ලබා දෙන ලදී. නව ගොවීන් 240 ක් හඳුනාගෙන තාක්ෂණික පැකේජයක් සමඟ ලොකු ළූණු වගාව ප්‍රවර්ධනය කිරීම සඳහා සහනාධාර ලබා දෙන ලදී.
  - 2025 යල කන්නයේ සත්‍ය බීජ නිෂ්පාදනය සඳහා අවශ්‍ය මව් බල්බ සැපයීම සඳහා කිලෝග්‍රෑම් 85,000 ක මව් බල්බ ගබඩා කිරීමට ගොවීන් දිරිමත් කරන ලදී. ඒ සඳහා සහනාධාර ලබා දෙන ලදී.
  - බීජ නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම සඳහා ස්ථිර වැසි ආවරණ 6ක් ඉදිකර ඇති අතර, පාර ජම්බුල කිරණවලින් ආරක්ෂිත පොලිතින් සහ අනෙකුත් ද්‍රව්‍ය ලබා දෙමින් ස්ථිර වැසි ආවරණ 20ක් ප්‍රතිසංස්කරණය කරන ලදී. තාවකාලික වැසි ආවරණ ඉදිකිරීම සඳහා ගොවීන් 740 දෙනෙකුට පොලිතින් ලබා දෙන ලදී.

- **රතු ළූණු -** රතු ළූණු නිෂ්පාදනය සහ ඵලදායිතාව වැඩි දියුණු කිරීම සඳහා, සත්‍ය බීජ නිෂ්පාදනය සහ බීජ බල්බ නිෂ්පාදන වැඩසටහන් ගොවීන් 514ක් සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පුහුණු මධ්‍යස්ථාන 10ක් සමඟ එක්ව වර්ග මීටර් 1000 ආදර්ශන වගා බිම්වල පවත්වාගෙන යනු ලැබේ. ජල භාවිතයේ කාර්යක්ෂමතාව වැඩි කිරීම සඳහා විසිරි ජල සම්පාදන ඒකක 15ක් සහ ගබඩා කිරීමේ හැකියාව වැඩි කිරීම සඳහා මව් බල්බ ගබඩා ඒකක 07ක් ලබා දෙන ලදී.

- **මිරිස් -** ශ්‍රී ලංකාවේ මිරිස් අවශ්‍යතාවය සපුරාලීම සඳහා සහ වියළි මිරිස් නිෂ්පාදනය ගෘහ මට්ටමින් ප්‍රවර්ධනය කිරීම සඳහා විවෘත පරාගිත ප්‍රභේදවල (OPV) මිරිස් බීජ කිලෝග්‍රෑම් 10,000 ක්, දෙමුහුම් මිරිස් බීජ කිලෝග්‍රෑම් 2,000 ක් සහ වගා බෑග 150,000 ක් ලබා දෙන ලදී.

- **මුං -** බීජ කිලෝග්‍රෑම් 5,885 ක් සහ අනෙකුත් යෙදවුම් ද්‍රව්‍ය ලබා දීම මගින් ස්වයං බීජ නිෂ්පාදනය හෙක්ටයාර 360 ක භූමි ප්‍රමාණයක ප්‍රවර්ධනය කරන ලදි.

- **රටකජු -** බීජ නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම සඳහා හෙක්ටයාර 52 ක සහතික කළ බීජ නිෂ්පාදනය සඳහා ලියාපදිංචි බීජ කිලෝග්‍රෑම් 3,540 ක් ලබා දෙන ලද අතර කරදියනාරු පර්යේෂණ මධ්‍යස්ථානයේ අභිජනන බීජ නිෂ්පාදනය සඳහා විසිරි ජල සම්පාදන ඒකකයක් සවි කරන ලදී.

- **තල -** සහතික කළ සහ ස්වයං බීජ නිෂ්පාදනය සඳහා ලියාපදිංචි බීජ කිලෝග්‍රෑම් 1573.75 ක් බෙදා දෙන ලදී.

- **උඳු -** බීජ නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම සඳහා හෙක්ටයාර 220 ක භූමි ප්‍රමාණයක් වගා කරන ලද අතර ව්‍යාපෘති ක්‍රියාත්මක වන ප්‍රදේශ සඳහා රෝලර් බීජ පැල සිටුවන යන්ත්‍ර 45ක් මිලදී ගෙන

බෙදා දෙන ලදී. වෙනත් ක්ෂේත්‍ර බෝග නිෂ්පාදනය කරන ගොවි සංවිධාන 10 ක් පිහිටුවන ලද අතර ගොවීන් අතර බෙදා දීම සඳහා බහු කායී ආවරණ ද්‍රව්‍ය (ටාපෝලින්) 20 ක් සහ ප්ලාස්ටික් කෑන් 200 ක් මිලදී ගන්නා ලදී.

- **සෝයා බෝංචි** - බීජ නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම සඳහා අක්කර 1 ආදර්ශ වගා 440 ක් සඳහා ලියාපදිංචි බීජ කිලෝග්‍රෑම් 8,796 ක් බෙදා දෙන ලදී.
- **කුරහන්** - ස්වයං බීජ නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම සඳහා හෙක්ටයාර 32 ක සහතික කළ/ලියාපදිංචි බීජ බෙදා හැරීම දැනට සිදු කෙරේ.
- **කව්පි** - හෙක්ටයාර 100 ක බීජ නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම සඳහා ලියාපදිංචි බීජ කිලෝග්‍රෑම් 2,042 ක් ලබා දුන් අතර කව්පි මඩින යන්ත්‍ර 30 ක් බෙදා දෙන ලදී.
- **පළතුරු** - අලුතින් නිකුත් කරන ලද ප්‍රභේදවල රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය ශක්තිමත් කිරීම සඳහා පවතින පළතුරු වතුවල මව් ශාක 3,500 ක් නඩත්තු කිරීම සිදු කෙරෙන අතර නිරූපණ පළතුරු වතු පිහිටුවීම සඳහා වතු 45 ක් තෝරාගෙන ඇත.
- **එළවළු බෝග** - අලුතින් නිකුත් කරන ලද එළවළු වල බීජ නිෂ්පාදනය වැඩි කිරීම සඳහා, බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය (SPMDC) වෙත කැකුලු අභිජනන බීජ කිලෝග්‍රෑම් 75 ක් සහ උද්‍යාන බෝග පර්යේෂණ සහ සංවර්ධන ආයතනය මගින් පොකුරු අභිජනන බීජ කිලෝග්‍රෑම් 53.5ක් සාර්ථකව නිෂ්පාදනය කර ඉදිරිපත් කරන ලදී.
  - අනාගත වැඩිදියුණු කිරීම් සඳහා බෝල රාබු බීජ ග්‍රෑම් 100 ක් සංශුද්ධ කිරීම ඉලක්ක කරමින් රාබු බීජ නිෂ්පාදනය සීතාඑළිය කෘෂිකර්ම පර්යේෂණ ස්ථානයෙහි ස්ථාපිත කර ඇත.
  - මෑ (A9) අභිජනන බීජ කිලෝග්‍රෑම් 50 ක් නිෂ්පාදනය කිරීමේ ඉලක්කයක් සහිතව මෑ බීජ නිෂ්පාදනය සිදු කෙරේ. A-9 මෑ අභිජනන බීජ කිලෝග්‍රෑම් 5 ක් බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය (SPMDC) වෙත ඉදිරිපත් කරන ලදී.
  - දෙමුහුම් බීජ නිෂ්පාදනය සඳහා මාපිය ද්‍රව්‍ය සැපයීම සඳහා එක් එක් මාපිය පෙළපතෙන් (Ok-11, Ok-45, සහ Ok-12) බණ්ඩක්කා අභිජනන බීජ කිලෝග්‍රෑම් 20 ක් නිෂ්පාදනය කිරීම සිදු කෙරේ.

**බීජ සහතික කිරීම සහ ශාක ආරක්ෂණය**

**12. ජාතික බීජ නිෂ්පාදන සහ මිලදී ගැනීමේ වැඩසටහන**

- ගොවීන් අතර ගුණාත්මක බීජ ලබා ගැනීමේ හැකියාව වැඩි කිරීම සඳහා කොන්ත්‍රාත් පදනම යටතේ වගා කරන ලද (ලියාපදිංචි සහ සහතික කළ) වෙනත් ක්ෂේත්‍ර බෝග බීජ මෙට්‍රික් ටොන් 832 ක්ද, කොන්ත්‍රාත් පදනම යටතේ වගා කරන ලද ලියාපදිංචි සහ සහතික කළ වී බීජ බුසල් 31,712 ක්ද, සහ කොන්ත්‍රාත් පදනම යටතේ වගා කරන ලද සම්මත එළවළු බීජ කිලෝග්‍රෑම් 51,415 ක්ද මිලදී ගන්නා ලදී.
- බීජ ගබඩා කිරීම සහ ප්‍රවාහනය සඳහා ස්ටිකර්, රසායනික ද්‍රව්‍ය සහ ධූමකරණ කටයුතු සම්බන්ධ මිල දී ගැනීම් සිදු කර ඇත.

## 13. කඩිනම් බීජ ගොවිපල සංවර්ධන වැඩසටහන

- ඉඟිනිමිටියේ කෘෂි ළිං ඉදිකිරීම, බටඅත සහ කරඳියනාරු වැව් ප්රතිසංස්කරණය කිරීම, මල්වත්ත, පොළොන්නරුව, වල්පිට සහ සීතාඑළිය යන ස්ථානවල විසිරි ජල සම්පාදන පද්ධති ස්ථාපනය කිරීම සහ කඳපොල සහ මල්වත්ත යන ස්ථාන සඳහා අධි ධාරිතා ජල පොම්ප මිලදී ගැනීම, වාරිමාර්ග පද්ධති සඳහා අවශ්‍ය උපකරණ සහ ද්‍රව්‍ය මිලදී ගැනීම් මේ වන විටත් සිදු කර ඇත.
- අඹේපුස්ස සහ වීරපාන යන ස්ථානවල වැසි ආවරණ ඉදිකිරීම, වල්පිට, පස්යාල සහ අඹේපුස්ස යන ස්ථානවල වැසි ආවරණ සහ දැල් නිවාස ප්‍රතිසංස්කරණය කිරීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීම, මිද්දෙණියේ සැකසුම් ඒකකය ප්‍රතිසංස්කරණය කිරීම, කහගොල්ලේ කාර්යාල ගොඩනැගිල්ලක් ඉදිකිරීම සහ මහඉලුප්පල්ලම ප්‍රාදේශීය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාල ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම සිදු කර ඇත.
- අඹේපුස්ස, අලුත්තරම, බටඅත, මිද්දෙණිය, වීරපාන, පැල්වෙහෙර යන ස්ථානවල අවශ්‍ය භූමි සංවර්ධන කටයුතු සහ සීතාඑළිය, බටඅත සහ පොළොන්නරුව යන ස්ථානවල අවශ්‍ය මාර්ග සංවර්ධන කටයුතු සිදු කර ඇත.
- මුරුන්කන් සහ වවුනියාව යන ස්ථානවල සූර්ය බලශක්ති උත්පාදන පද්ධති ස්ථාපනය කිරීම, පොළොන්නරුව, නිකවැරටිය, එළුවන්කුලම, ඉඟිනිමිටිය, කරඳියනාරු, නුවරඑළිය යන ප්‍රදේශවල සූර්ය වීදි ලාම්පු සවි කිරීම, පොළොන්නරුව බීජ නිෂ්පාදන ගොවිපල සඳහා සංයුක්ත අස්වනු නෙළන යන්ත්‍ර සහ රොටවේටර් මිලදී ගැනීම සහ අවශ්‍ය ගොවිපල යන්ත්‍රෝපකරණ, මෙවලම්, උපකරණ, සූර්ය බලශක්ති පද්ධති මිලදී ගැනීම සහ පවතින ගොවිපල යන්ත්‍රෝපකරණ අලුත්වැඩියා කිරීම මේ වන විටත් සිදු කර ඇත.

## 14. දේශීය අල බීජ නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම

- සීතාඑළිය හරිතාගාර සංකීර්ණයේ පැරණි පැළ ගෘහ සහ දැල් ගෘහ ප්‍රතිසංස්කරණය කිරීම, උපකරණ මිලදී ගැනීම සහ අලුත්වැඩියා කිරීම, පැළ ද්‍රව්‍ය නිෂ්පාදනය සඳහා අවශ්‍ය රසායනික ද්‍රව්‍ය මිලදී ගැනීම, සීතාඑළිය පර්යේෂණ ස්ථානයේ පටක රෝපණ විද්‍යාගාරයක්, දැල් නිවාස සහ සිසිල් කාමරයක් සංවර්ධනය කිරීම සහ බණ්ඩාරවෙල පර්යේෂණ මධ්‍යස්ථානයේ අල මුල් ඇද්දූ කඳ කැබලි පැළ නිෂ්පාදන පද්ධතියක්, දැල් නිවසක්, රසායනික ද්‍රව්‍ය, පොහොර සහ දෛනික නඩත්තු විද්‍යාගාරයක් සංවර්ධනය කිරීම මේ වන විටත් සම්පූර්ණ කර ඇත.

## 15. බීජ සහතික කිරීමේ කටයුතු ශක්තිමත් කිරීම

- මහඉලුප්පල්ලම බීජ පරීක්ෂණාගාර පහසුකම් සංවර්ධනය කිරීමේ කටයුතු වලින් 80% ක් සම්පූර්ණ කර ඇත.
- ගන්නොරුව බීජ සෞඛ්‍ය පරීක්ෂණ ඒකකයේ පැළ නිවසක් සහ බටඅත බීජ පරීක්ෂණාගාරයේ තවාන් මඩුව ඉදිකිරීම් සම්පූර්ණ කර ඇත.

## 16. බීජ පනත ක්‍රියාත්මක කිරීම තුළින් බීජ සහ රෝපණ ද්‍රව්‍යවල ගුණාත්මකභාවය සහතික කිරීම

- බීජ පනත යටතේ සහතික 2,401 ක් නිකුත් කර ඇත, (බීජ හසුරුවන්නන් 1,285 ක් ලියාපදිංචි කර ඇති අතර බීජ හසුරුවන්නන්ගේ ලියාපදිංචි කිරීම් 1,116 ක් අලුත් කර ඇත).

- බීජ ලේබල් 1,765 ක් අනුමත කර ඇති අතර බීජ හසුරුවන්නන්ගේ පරිශ්‍ර 1,181 ක් අහඹු ලෙස පරීක්ෂාවට ලක් කරන ලදී.
- බීජ සහතික කිරීම සිදුකර වී බීජ මෙට්‍රික් ටොන් 11,877.17 ක්, වෙනත් ක්ෂේත්‍ර බෝග බීජ මෙට්‍රික් ටොන් 558.15 ක්, එළවළු බීජ මෙට්‍රික් ටොන් 64.5 ක් සහ අල බීජ මෙට්‍රික් ටොන් 484.24 ක් කුඩා අල 2,168,077 ක් සමග සහතික කරන ලදී. ඒ අනුව වී බීජ හෙක්ටයාර 6,539.67 ක්, වෙනත් ක්ෂේත්‍ර බෝග බීජ හෙක්ටයාර 1,370.85 ක්, එළවළු බීජ හෙක්ටයාර 164.37 ක් සහ අල බීජ හෙක්ටයාර 80.04 ක් සහතික කරන ලදී.
- රසායනාගාර පරීක්ෂණ සහ විශ්ලේෂණ 13,660 ක් සහ පශ්චාත් පාලන බීජ පරීක්ෂණ 1,978 ක් පවත්වන ලදී.
- මව් ශාක 687 ක්, තවාන් 316 ක් ලියාපදිංචි කිරීමෙන් සහ පළතුරු පැල 827,364 ක් සහතික කිරීමෙන් පළතුරු පැල සහතික කිරීම සිදු කරන ලදී.
- සියලුම පාර්ශවකරුවන් අතර දැනුවත්භාවය ඇති කිරීම සඳහා පුහුණු කිරීම් සහ දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී.

**17. කෘෂි රසායන මගින් මිනිස් සෞඛ්‍යයට සහ පරිසරයට ඇති විය හැකි අහිතකර බලපෑම් අවම කිරීම**

- යල කන්නය සඳහා මැ වල තෝරාගත් පළිබෝධනාශකවල උපරිම අවශේෂ මට්ටම (MRL) සහ අස්වැන්න නෙළීමට පෙර කාල සීමාව (PHI) තක්සේරු කිරීම (පළිබෝධනාශක 8 ක් ඇගයීමට ලක් කර සාම්පල 26 ක් විශ්ලේෂණය කරන ලදී).
- පළිබෝධනාශක අවශේෂ මට්ටම තක්සේරු කිරීම සඳහා ජලය, පලතුරු සහ එළවළු (පළතුරු/එළවළු සාම්පල 195 ක් සහ ජල සාම්පල 88 ක්) සහ බැර ලෝහ 17 ක අන්තර්ගතය පිළිබඳව (පළතුරු/එළවළු 139 ක් සහ ජලය 80 ක්) සහ පළිබෝධනාශක 203 ක් සඳහා අහඹු ලෙස විශ්ලේෂණය කිරීම් සිදුකරන ලදී.
- ISO17025:2017 ප්‍රමිතියට අනුව රසායනාගාර පහසුකම් ශක්තිමත් කිරීම සඳහා සේවා ගිවිසුම, පුහුණුවීම් සහ උපකරණ ක්‍රමාංකනය ඇතුළු රසායනාගාර ක්‍රියාකාරකම් සිදුකරන ලදී (විගණන දිනය 2024.04.24/25/26 සහ මුළු පිරිවැය රුපියල් 2,227,910.80 කි).
- රාජසන්තක කරන ලද පළිබෝධනාශක මෙට්‍රික් ටොන් 4.06 ක් පුළුස්සා දමන ලදී.
- මහාඉලුප්පල්ලමේ රාජසන්තක කරන ලද පළිබෝධනාශක ගබඩාවේ වැට වෙනස් කිරීම සහ අලුත්වැඩියා කිරීම සිදු කරන ලදී.
- දිවයින පුරා කෘෂි රසායනික අලෙවි සහ තාක්ෂණික සහායකයින් සඳහා පුහුණු වැඩසටහන් 14 ක් පවත්වන ලදී.

**11. සැපයුම් දාම ව්‍යුහය ශක්තිමත් කිරීම තුළින් කුඩා හා මධ්‍ය පරිමාණ කෘෂි නිෂ්පාදකයින්ගේ ජීවනෝපාය වැඩි දියුණු කිරීම (JICA)**

- වෙළඳපොළ ඉලක්ක කරගත් නිෂ්පාදන තුළින් කුඩා හා මධ්‍ය පරිමාණ කෘෂිකාර්මික නිෂ්පාදකයින්ගේ ආදායම් මට්ටම ඉහළ නැංවීම සඳහා පුහුණුකරුවන් පුහුණු කිරීමේ (TOT) වැඩසටහන්, ගොවි පුහුණු වැඩසටහන්, කෘෂි උපදේශක සහ තාක්ෂණික සහායකවරුන් සඳහා වැඩමුළු, නිලධාරී මට්ටමේ දැනුවත් කිරීමේ වැඩසටහන්, අන්තර්ක්‍රියාකාරී වැඩමුළු, මූලික

සමීක්ෂණ සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් සහ වෙළඳපල සමීක්ෂණ පවත්වන ලද අතර ක්ෂේත්‍ර චාරිකා 70 ක්ද පවත්වන ලදී.

### 1.9. ආහාර සුරක්ෂිතතාව සහ තාක්ෂණික ප්‍රවර්ධන විශේෂ වැඩසටහන යටතේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක වන ව්‍යාපෘති

- **2024.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය**

| අ/අ | ප්‍රධාන සංවර්ධන වැඩසටහන | වෙන් කළ මුදල (රු.මි.) | 2024.12.31 දක්වා වියදම් කළ මුදල (රු.මි.) | ප්‍රගතිය (ප්‍රතිශතයක් ලෙස) |
|---|---|---|---|---|
| | **වැය ශීර්ෂය - 118-02-03-020-2202** | | | |
| 1 | විභව ප්‍රදේශවල මී මැසි කර්මාන්තය ප්‍රචලිත කරමින් මී පැණි නිෂ්පාදනය වැඩි කිරීම - 1 කොටස | 5.00 | 4.28 | 86 |
| | **වැය ශීර්ෂය - 118-02-03-020-2509** | | | |
| 2 | විභව ප්‍රදේශවල මී මැසි කර්මාන්තය ප්‍රචලිත කරමින් මී පැණි නිෂ්පාදනය වැඩි කිරීම - 2 කොටස | 7.00 | 6.16 | 96 |
| 3 | ශ්‍රී ලංකාව තුළ තෝරාගත් පලතුරු බෝග නිෂ්පාදනය, ඵලදායිතාව සහ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා වැඩිදියුණු කළ තාක්ෂණය ආදර්ශනය කිරීම සහ ප්‍රචලිත කිරීම. | 10.00 | 4.77 | 48 |
| 4 | පලතුරු නිෂ්පාදන වාණිජ උද්‍යාන පිහිටුවීම සඳහා මෑතකදී නිර්දේශිත ප්‍රභේද උපයෝගී කර ගනිමින් ඇපල්, අඹ සහ පැඟිරි බෝගවල පරිභාහිර ක්ෂේත්‍ර ජාන බැංකු සංවර්ධනය කිරීම සහ පුළුල් කිරීම. | 5.00 | 4.62 | 92 |
| 5 | තිරසාර කෘෂිකර්මාන්තය ප්‍රවර්ධනය සඳහා විද්‍යාගාර පහසුකම් වැඩිදියුණු කිරීම සහ අඩු වියදම් ශාක පෝෂණ කලමණාකරණ ක්‍රමවේද අත්හදා බැලීම. අදියර 111 | 15.00 | 14.96 | 100 |
| 6 | පාරිසරික වශයෙන් යහපත් දේශගුණික-සුහුරු කෘෂිකාර්මික තාක්ෂණය ප්‍රචලිත කිරීම. | 7.00 | 5.39 | 77 |
| 7 | ආහාර බෝග ක්ෂේත්‍රයේ පළිබෝධ හා රෝග පාලනය කිරීම, අනෙකුත් ක්ෂේත්‍ර ගැටළු විසඳීම සහ තාක්ෂණය ප්‍රචාරණය වැඩි දියුණු කිරීම | 10.00 | 7.19 | 72 |
| 8 | කෘෂිකාර්මික දැනුම ව්‍යාප්ත කිරීම හා ප්‍රවර්ධනය කිරීම සඳහා ගන්නෝරුව කෘෂි තාක්ෂණ උද්‍යානයේ පහසුකම් ශක්තිමත් කිරීම. | 9.50 | 7.80 | 91 |
| 9 | කෘෂිකාර්මක දැනුම ව්‍යාප්ත කිරීම හා ප්‍රවර්ධනය කිරීම සඳහා බටඅත කෘෂි තාක්ෂණ උද්‍යානයේ පහසුකම් ශක්තිමත් කිරීම. | 9.50 | 5.10 | 54 |
| 10 | කෘෂි සංචාරක ව්‍යාපාරය ප්‍රචලිත කිරීම සහ කෘෂිකාර්මික දැනුම ව්‍යාප්ත කිරීම සඳහා දියගම පරිසර හිතකාමී කෘෂි තාක්ෂණ උද්‍යානයේ පහසුකම් ශක්තිමත් කිරීම. | 3.50 | 1.75 | 50 |
| 11 | කෘෂිකර්ම, ඉඩම්, පශු සම්පත්, වාරිමාර්ග, ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශයේ නාගරික කෘෂිකර්ම ආදර්ශනයක් පිහිටුවීම | 3.50 | 1.02 | 29 |
| 12 | නැකතට පැළයක් ජාතික රුක් රෝපණ වැඩසටහන | 0.86 | 0.86 | 100 |
| 13 | 'වසත් සිරිය' ජාතික අලුත් අවුරුදු උත්සවය | 0.44 | 0.44 | 100 |

| අ/අ | ප්‍රධාන සංවර්ධන වැඩසටහන | වෙන් කළ මුදල (රු.මි.) | 2024.12.31 දක්වා වියදම් කළ මුදල (රු.මි.) | ප්‍රගතිය (ප්‍රතිශතයක් ලෙස) |
|---|---|---|---|---|
| 14 | හම්බන්තොට දිස්ත්‍රික්කයේ අපනයන ඉලක්ක කරගත් කෙසෙල් වගාවේ නියැලෙන ගොවීන් සඳහා ඇඹුල් කෙසෙල් ඇසුරුම් ඒකකයක් ස්ථාපිත කිරීම | 0.19 | 0.12 | 61 |
| 15 | විවිධ පාර්ශවකරුවන්ගේ සහාය ඇතිව නව නිපැයුම්කරුවන් සාර්ථක ව්‍යවසායකයින් බවට පත් කිරීම (විශේෂඥ නිර්දේශයන්ට අනුව තෝරාගත් නවෝත්පාදන සංවර්ධනය කිරීම). | 1.91 | 1.67 | 87 |
| | **උප එකතුව** | **88.41** | **66.09** | **76** |
| | **වැය ශීර්ෂය - 118-02-03-088-2509** | | | |
| 16 | 2024 යල කන්නයේ මහා වාරි ප්‍රදේශවල වී වගාවේ ඵලදායිතාව ඉහළ නැංවීම | 13.28 | 10.15 | 76 |
| 17 | 2024 යල කන්නයේ බඩඉරිඟු නිෂ්පාදනය සඳහා කුඹුරු විවිධාංගීකරණය | 21.60 | 21.57 | 100 |
| | **උප එකතුව** | **34.88** | **31.71** | 91 |
| | **වැය ශීර්ෂය - 118-01-02-001-2509** | | | |
| 18 | ලෝක ආහාර සංවිධානය ( FAO) මඟින් පවත්වන ලද 37 වැනි ආසියා ශාන්තිකර සමුළුවට සහභාගිවන නියෝජිතයන්ගේ ක්ෂේත්‍ර චාරිකාව සඳහා පහසුකම් සැලසීම සඳහා බටඅත කෘෂිකාර්මික තාක්ෂණ උද්‍යානයේ යටිතල පහසුකම් ශක්තිමත් කිරීම සහ ප්‍රදර්ශන භූමිය සැකසීම | 11.49 | 11.49 | 100 |
| 19 | නව කෘෂි තාක්ෂණයන් ප්‍රචාරණය සඳහා ආයතනික සහ පර්යේෂණ ක්ෂේත්‍ර පහසුකම් වැඩිදියුණු කිරීම | 2.16 | 2.16 | 100 |
| 20 | ලෝක ආහාර සංවිධානය ( FAO) මඟින් පවත්වන ලද 37 වැනි ආසියා ශාන්තිකර කලාපීය සමුළුවේ නියෝජිතයින්ගේ සංචාරයට සමගාමීව යෝජිත ක්ෂේත්‍ර දින වැඩසටහන - (2024 පෙබරවාරි 22 දින බටඅත කෘෂි තාක්ෂණ උද්‍යානයේ දී) | 9.57 | 9.57 | 100 |
| 21 | ලෝක ආහාර සංවිධානය ( FAO) මඟින් පවත්වන ලද 37 වැනි ආසියා පැසිෆික් කලාපීය සමුළුව සඳහා ආහාර බෝග මඟින් භූමි අලංකරණය මඟින් ස්ථානය සකස් කිරීම. | 0.25 | 0.25 | 100 |
| | **උප එකතුව** | **23.47** | **23.47** | **100** |
| | **එකතුව** | **146.76** | **121.27** | **84** |

- **2024.12.31 දිනට භෞතික ප්‍රගතිය**

| ව්‍යාපෘතිය | ප්‍රගතිය | ක්‍රියාත්මක ප්‍රදේශ | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|
| 01. විභව ප්‍රදේශවල මී මැසි කර්මාන්තය ප්‍රචලිත කරමින් මී පැණි නිෂ්පාදනය වැඩි කිරීම - 1 කොටස | • ගුණාත්මක මී පැණි නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම සඳහා තෝරාගත් විභව ප්‍රදේශ 12ක ගොවීන් 330 දෙනෙකුට 50% සහනාධාරයක් යටතේ මී මැසි පෙට්ටි, මී මැසි ජනපද සහ අනෙකුත් උපකරණ බෙදා දෙන ලදී.<br>• මී පැණි එකතු කිරීමේ හා සැකසීමේ ඒකක හතරක් ස්ථාපිත කිරීම සඳහා බිඳුණුවැව ප්‍රදේශයේ ගොවීන් 8 දෙනෙකුට 50% සහනාධාරයක් යටතේ ජල ස්නාන පද්ධතිය, ගබඩා ටැංකි සහ උපකරණ බෙදා දෙන ලදී.<br>ඡායාරූප අංක 25 | මහනුවර, නුවරඑළිය, මාතලේ, කුරුණෑගල, කෑගල්ල, රත්නපුර, බදුල්ල, මොණරාගල, කළුතර, ගම්පහ, කොළඹ දිස්ත්‍රික්ක සහ අන්තර් පළාත්. | ගොවීන් 338 |
| 02. විභව ප්‍රදේශවල මී මැසි කර්මාන්තය ප්‍රචලිත කරමින් මී පැණි නිෂ්පාදනය වැඩි කිරීම - 2 කොටස | • බිඳුණුවැව සහ වාරියපොළ මී මැසි පාලන ඒකක සඳහා උපකරණ ලබා දීමෙන් පුහුණු පහසුකම් වැඩි දියුණු කරන ලදී.<br>• වාරියපොළ මී මැසි පාලන ඒකකයේ මී මැසි පාලන ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීම.<br>• ගොවීන් අතර මී මැසි පාලන කර්මාන්තය පිළිබඳ දැනුවත්භාවය වැඩි කිරීම සඳහා ලෝක මී මැසි දිනයට අදාළ උප වැඩසටහන් 22 ක්, පුහුණු වැඩසටහන් 18 ක් සහ නිරීක්ෂණ චාරිකා 8 ක් පවත්වා ඇති අතර පොත් පිංච 2000 ක් සහ අත් පත්‍රිකා 24000 ක් ලබා දී ඇත.<br>ඡායාරූප අංක 26 - 27 | දිවයින පුරා (පළාත් සහ අන්තර් පළාත්), වාරියපොළ සහ බිඳුණුවැව මී මැසි පාලන ඒකක | ගොවීන්, පාසල් සහ විශ්ව විද්‍යාල සිසුන්, නිලධාරීන්, ව්‍යවසායකයින් |
| 03. ශ්‍රී ලංකාව තුළ තෝරාගත් පලතුරු බෝග නිෂ්පාදනය, ඵලදායිතාව සහ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා වැඩිදියුණු කළ තාක්ෂණයන් ආදර්ශනය කිරීම සහ ප්‍රචලිත කිරීම | • පළතුරු උද්‍යාන 50ක් ස්ථාපනය කිරීම සඳහා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම අවසන් කර ඇත. ක්ෂේත්‍ර 2ක් ස්ථාපිත කර ඇත. තවත් ක්ෂේත්‍ර 20 ක් සකස් කරමින් පවතී.<br>• මව් පළතුරු බෝග පැළ නඩත්තු කරනු ලබන අතර රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය සඳහා යොදා ගනු ලැබේ.<br>• පවතින පළතුරු උද්‍යානවල තාක්ෂණික ගැටළු විසඳීම සහ පසු විපරම් පරීක්ෂණ සිදු කරනු ලැබේ. පරීක්ෂා කිරීම, සහ පසු විපරම් ක්‍රියාකාරකම් 30ක් සිදු කර ඇත.<br>• කෘෂිකර්ම උපදේශකයින් 550ක්, ගොවීන් සහ අපනයනකරුවන් 60ක් සඳහා පුහුණුව ලබා දී ඇත.<br>ඡායාරූප අංක 28 - 29 | හම්බන්තොට, අනුරාධපුර, පුත්තලම, කුරුණෑගල, යාපනය, කිලිනොච්චි, නුවරඑළිය, කළුතර, ගම්පහ, මොනරාගල, බදුල්ල, කෑගල්ල | |
| 04. පලතුරු නිෂ්පාදන වාණිජ උද්‍යාන පිහිටුවීම සඳහා මෑතකදී නිර්දේශිත ප්‍රභේද උපයෝගී කර ගනිමින් ඇපල්, අඹ සහ පැහිරි බෝගවල පරිභාහිර ක්ෂේත්‍ර ජාන බැංකු සංවර්ධනය කිරීම සහ පුළුල් කිරීම | • දිවුල්, අඹ සහ පැහිරි ක්ෂේත්‍ර ජාන බැංකු පුළුල් කිරීම සඳහා හෙක්ටයාර 10 ක භූමියක් සාර්ථකව හෙලි පෙහෙළි කිරීම සහ සංවර්ධනය කිරීම සහ අලුතින් සංවර්ධනය කරන ලද හෙක්ටයාර 10 ක භූමියේ බද්ධ කරන ලද පළතුරු පැල සිටුවීම.<br>• යටිතල පහසුකම් සංවර්ධනය යටතේ කටු කම්බි වැටවල් ඉදිකිරීම සහ ජල සම්පාදන පද්ධතිය පුළුල් කිරීම සිදු කර ඇත.<br>• ක්ෂේත්‍ර නඩත්තුව, ශෂ්‍ය විද්‍යාත්මක ක්‍රම, ඇගයීම් සහ දිවුල්, අඹ සහ පැහිරි ජෛව විවිධත්වය ඇගයීම අඛණ්ඩව සිදු කෙරේ.<br>• බද්ධ පැල 8000ක් නිෂ්පාදනය කිරීම සම්පූර්ණ කරන ලදී (දිවුල් 3000, අඹ 2500, පැහිරි 2500). | තෙල් හා මාෂ බෝග පර්යේෂණ සහ සංවර්ධණ මධ්‍යස්ථානය, අගුණකොළපැළැස්ස, ක්ෂේත්‍ර බෝග පර්යේෂණ සහ සංවර්ධණ ආයතනය | පලතුරු වගාකරන ගොවීන් |

| ව්‍යාපෘතිය | ප්‍රගතිය | ක්‍රියාත්මක ප්‍රදේශ | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|
| | • වාණිජ පර්යේෂණ හා නිරූපණය සඳහා හෙක්ටයාර 5ක ඉඩමක භූමි සංවර්ධනය හා ක්ෂේත්‍ර ස්ථාපනය කිරීම සිදු කර ඇත..<br>• පැරණි ජල බවුසර් ටැංකිය අලුත්වැඩියා කිරීම සහ ක්ෂේත්‍ර ජාන බැංකු සඳහා අතිරේක ජල සම්පාදන භාවිතය සිදු කරන ලදී.<br>ඡායාරූප අංක 30 - 32 | | |
| 05. තිරසාර කෘෂිකර්මාන්තය ප්‍රවර්ධනය සඳහා විද්‍යාගාර පහසුකම් වැඩිදියුණු කිරීම සහ අඩු වියදම් ශාක පෝෂණ කලමණාකරණ ක්‍රමවේද අත්හදා බැලීම - අදියර 111 | • පාංශු රසායන විද්‍යාගාරයේ ඉහළ මහල නිම කිරීම සහ රසායනාගාරයේ වැඩ කිරීමේ පහසුකම් වැඩිදියුණු කිරීම - වැඩතල, ජල සැපයුම, වායු සමීකරණ යන්ත්‍ර අළුත්වැඩියා කිරීම ඇතුළුව පහසුකම් සංවර්ධනය කර ඇත.<br>• පස සහ විකල්ප පෝෂක ප්‍රභවයන්, වර්ධන මාධ්‍යවල ගුණාත්මකභාවය විශ්ලේෂණය කිරීම සහ ආරක්ෂිත පාරිසරික තත්ත්වයන් යටතේ පරීක්ෂා කිරීම.<br>• පස, කාබනික පොහොර, ශාක විශ්ලේෂණය සහ ක්ෂුද්‍රජීව විද්‍යාත්මක ඇගයීම් සඳහා භාවිතා කරන රසායනාගාර උපකරණ අලුත්වැඩියා කිරීම.<br>• ජෛව පොහොර සංවර්ධනය කිරීම සඳහා ස්වභාවික වාසස්ථානවලින් (හඳුනාගත් ශාකවල රයිසෝස්පියරයෙන්) N සවි කරන, P ද්‍රාවණය කරන සහ K ද්‍රාවණය කරන ප්‍රයෝජනවත් ක්ෂුද්‍ර ජීවීන් හුදකලා කිරීම.<br>• රතු ලූනු සහ බඩ ඉරිඟු සඳහා රසායනික ද්‍රව්‍ය භාවිතය අවම කිරීම සඳහා පරිසර හිතකාමී විකල්ප මූලාශ්‍ර භාවිතා කරමින්, පරිසර හිතකාමී පෝෂක කළමනාකරණ පැකේජ ඇති කිරීම.<br>ඡායාරූප අංක 33 – 35 | තිරසර කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය, මාකඳුර, කුරුණෑගල සහ ගම්පහ දිස්ත්‍රික්ක | කෘෂිකාර්මික අංශ 05ක ගොවීන්ට සෘජු ප්‍රතිලාභ ලැබෙන අතර තෙත් සහ අතරමැදි කලාපවල ගොවි ක්ෂේත්‍රවල ගොවීන්ට වක්‍ර ප්‍රතිලාභ ලැබෙනු ඇත |
| 06. පාරිසරික වශයෙන් යහපත් දේශගුණික-සුහුරු කෘෂිකාර්මික තාක්ෂණයන් ප්‍රචලිත කිරීම | • තිරසාර ගෙවතු වගා සැකසීම, කාබනික පොහොර නිෂ්පාදනය, කොම්පෝස්ට් නිෂ්පාදනය සහ හතු නිෂ්පාදනය පිළිබඳව පුහුණු කිරීම් 86ක් පවත්වා 3824ක් පුහුණු කර ඇත.<br>• ඉඩම් සංවර්ධනය සම්පූර්ණ කර ඇති අතර බෝග ස්ථාපනය කිරීම සිදු කරමින් පවතී.<br>• හතු පර්යේෂණ ඒකකයේ වගා නිවස අලුත්වැඩියා කර ඇත.<br>• නව කොම්පෝස්ට් අංගනය සංවර්ධනය කර ඇත.<br>• ගැඩවිලි පොහොර නිෂ්පාදනාගාරය අලුත්වැඩියාව කර ඇත.<br>• පළාත් 5ක දත්ත රැස්කිරීම් කර ඇති අතර අනෙකුත් පළාත් සඳහා දත්ත රැස්කිරීම් සිදු කරමින් පවතී.<br>ඡායාරූප අංක 36 - 38 | තිරසාර කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය, මාකඳුර, සහ සියලු පළාත්වල පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තු | 3,824 |

| ව්‍යාපෘතිය | ප්‍රගතිය | ක්‍රියාත්මක ප්‍රදේශ | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|
| 07. ආහාර බෝගවල පළිබෝධ සහ රෝග පාලනය කිරීම, වෙනත් ක්ෂේත්‍ර ගැටලු විසඳීම සහ තාක්ෂණ ව්‍යාප්තිය වැඩිදියුණු කිරීම | • ක්ෂේත්‍ර ගැටළු පිළිබඳ ගොවි පුහුණු කිරීම් 100 ක් සහ වැඩසටහන් 15 ක් පවත්වන ලදී. දැනුවත්භාවය වැඩි කිරීම සඳහා පත්‍රිකා 38,000 ක් මුද්‍රණය කරන ලදී.<br>• පළිබෝධ සහ රෝග පාලනය පිළිබඳ ආදර්ශ 400 ක් පවත්වන ලදී.<br>• අන්තර් පළාත් 6 ක අලුතින් නිකුත් කරන ලද ප්‍රභේද පිළිබඳව දැනුවත් කිරීම සඳහා ආදර්ශ පවත්වන ලද අතර දෙමුහුම් එළවළු බීජ පැකට් 1650 ක් සහ කෘමි විකර්ශක කහ බල්බ කට්ටල 27 ක් බෙදා දී ඇත.<br>ඡායාරූප අංක 39 | පළාත් 9 සහ අන්තර් පළාත් 6 ක්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පුහුණු ආයතන සහ පර්යේෂණ ආයතන | සියලුම ගොවි ජනතාව |
| 08. කෘෂිකාර්මික දැනුම ව්‍යාප්තිය ප්‍රවර්ධනය කිරීම සඳහා ගන්නොරුවේ පිහිටි කෘෂි තාක්ෂණ උද්‍යානයේ පහසුකම් ශක්තිමත් කිරීම | • පාංශු සංරක්ෂණ ඒකකයට ආසන්නව වැසිකිළි සංකීර්ණයක් ඉදිකිරීම අර්ධ වශයෙන් නිම කර ඇත.<br>• කෘෂිකාර්මික උද්‍යානයේ තොරතුරු පුවරු අලුත්වැඩියා කිරීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගෙන පුවරු සකස් කර ඇත.<br>• පවතින කෞතුකාගාරය නවීකරණය කිරීම සහ අලුත්වැඩියා කිරීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය (ටයිල් කිරීම, සිවිලිං සකස් කිරීම, ප්ලාස්ටර් කිරීම, විදුලි වැඩ) මිලදී ගෙන ඇත.<br>• කෞතුකාගාරයේ බිතුසිතුවම් ආරක්ෂා කිරීම සඳහා ලී අත් වැටක් ඉදිකිරීම.<br>• කෞතුකාගාර ශ්‍රවණාගාරය සඳහා සම්මන්ත්‍රණ පුටු මිලදී ගැනීම සිදු කර ඇත.<br>• කෞතුකාගාරයේ ප්‍රදර්ශන භාණ්ඩ සහ ආදර්ශ සඳහා ස්වයං-ඉගෙනුම් සහායක පද්ධතිය 05 ක් ස්ථාපිත කිරීම.<br>• කෞතුකාගාරයේ කෘෂි උපදේශන කාමරය අලුත්වැඩියා කිරීම සිදු කර ඇත.<br>ඡායාරූප අංක 40 - 41 | ගන්නෝරුව | කෘෂි තාක්ෂණ උද්‍යානය මගින් දැනුම ලබා ගන්නා සියළු දෙනා |
| 09. කෘෂිකාර්මික දැනුම ව්‍යාප්තිය ප්‍රවර්ධනය කිරීම සඳහා බටඅත පිහිටි කෘෂි තාක්ෂණ උද්‍යානයේ පහසුකම් ශක්තිමත් කිරීම | • දැනුවත් කිරීමේ වැඩසටහන සඳහා අත් පත්‍රිකා 10,000 ක් මුද්‍රණය කිරීම සිදුකරන ලදී.<br>• තොරතුරු පුවරු සහ ප්‍රදර්ශන ඒකකය අලුත්වැඩියා කිරීම සිදු කරන ලදී.<br>• සනීපාරක්ෂක පානීය ජලය ලබා ගැනීම සඳහා කාර්මික ජල පෙරහනයක් මිලදී ගෙන සවි කර ඇත.<br>• රසායනික ද්‍රව්‍ය මිලදී ගෙන ඇති අතර අනෙකුත් යෙදවුම් ද්‍රව්‍ය මිලදී ගැනීම ද සම්පූර්ණ කරන ලදී.<br>• ජල සම්පාදන පද්ධති වැඩිදියුණු කිරීම් සිදු කරන ලදී.<br>• පසු අස්වනු තාක්ෂණ ඒකකය සංවර්ධනය කිරීම අර්ධ වශයෙන් නිම කර ඇත.<br>• අධිවේගී මාර්ග පිටවීම අසල දැන්වීම් පුවරු සවි කිරීම් සිදු කරන ලදී.<br>ඡායාරූප අංක 42 - 44 | බටඅත | කෘෂි තාක්ෂණ උද්‍යානය මගින් දැනුම ලබා ගන්නා සියළු දෙනා |

| ව්‍යාපෘතිය | ප්‍රගතිය | ක්‍රියාත්මක ප්‍රදේශ | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|
| 10. කෘෂි සංචාරක ව්‍යාපාරය සහ කෘෂිකාර්මික දැනුම ව්‍යාප්තිය ප්‍රවර්ධනය කිරීම සඳහා පරිසර හිතකාමී කෘෂි තාක්ෂණ උද්‍යානයේ පහසුකම් ශක්තිමත් කිරීම | • දියගම ප්‍රදේශයේ කෘෂි සංචාරක ව්‍යාපාරය සහ කෘෂිකාර්මික දැනුම ව්‍යාප්තිය ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රදේශයක් සංවර්ධනය කරන ලදී. | දියගම | කෘෂි තාක්ෂණ උද්‍යානය මගින් දැනුම ලබා ගන්නා සියළු දෙනා |
| 11. කෘෂිකර්ම, ඉඩම්, පශු සම්පත්, වාරිමාර්ග, ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශයේ නාගරික කෘෂිකර්ම ආදර්ශයක් ස්ථාපිත කිරීම | • එළවළු බිම් නැවත වගා කිරීම, භූමි අලංකරණ සැලසුම් කිරීම, උයන් කුටි අලුත්වැඩියා කිරීම සහ ජල සම්පාදන පද්ධතියක් සවි කිරීම සිදු කරන ලදී. | කෘෂිකර්ම අමාත්‍යාංශ පරිශ්‍රය | |
| 12. නැකතට පැළයක් ජාතික රුක් රෝපණ වැඩසටහන | • අඹතැන්න බීජ ගොවිපල මගින් අනෝදා (බීජ පැළ) 200 ක්, පේර (බීජ පැළ) 200 ක් සහ කතුරු මුරුංගා පැළ 600 ක් කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත සපයා ඇත.<br>• තෙලිජ්ජවිල බීජ ගොවිපල මගින් කැලමැන්සි 3550 ක් සහ කොස් (බද්ධ පැළ) 200ක් ගොවිජන සේවා මධ්‍යස්ථාන (රත්ගම, යක්කලමුල්ල), ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය වෙත සපයා ඇත.<br>• බට අත බීජ ගොවිපල මගින් අධි ශ්‍රේණියේ බද්ධ පැල 100 ක් කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත සපයා ඇත.<br>• පැල්වෙහෙර බීජ ගොවිපල මගින් කතුරු මුරුංගා පැළ 200 ක්, නෙල්ලි (බීජ පැළ) 450 ක්, කොස් (බද්ධ පැළ) 50 ක්, දෙළුම් පැළ 100 ක් ලෙමන් පැළ 200 ක් වාරියපොල කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍ය කාර්යාලය වෙත සපයා ඇත.<br>• කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් කැලමැන්සි 792ක් නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (බීජ), කොළඹ කාර්යාලය වෙත සපයා ඇත.<br>• සපයා ඇති සමස්ත පලතුරු පැල සංඛ්‍යාව 6,642කි. | | කෘෂිකර්ම අමාත්‍යාංශය, ගොවිජන සේවා මධ්‍යස්ථාන (රත්ගම, යක්කලමුල්ල), ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය, කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍ය කාර්යාලය, වාරියපොල |
| 13. 'වසත් සිරිය' ජාතික අලුත් අවුරුදු උත්සවය සඳහා කඩමණ්ඩිය ඉදිකිරීම | • 2024 කොළඹ වසන්ත සිරිය ජාතික අලුත් අවුරුදු උත්සවය සඳහා සාම්ප්‍රදායික කඩමණ්ඩියක් ඉදිකිරීමට අදාළ සියලු කටයුතු සිදු කරන ලදී.<br><br>ඡායාරූප අංක 45 | කොළඹ | |
| 14. 2024 යල කන්නයේ මහා වාරි ප්‍රදේශවල වී වගාවේ ඵලදායිතාව ඉහළ නැංවීම | • ඉඩම් සකස් කිරීම සහ ක්ෂේත්‍ර ස්ථාපනය : අක්කර 525 ක් සම්පූර්ණ කරන ලදී (පොළොන්නරුව අන්තර් පළාත: අක්කර 153, හම්බන්තොට පළාත: අක්කර 72, අම්පාර අන්තර් පළාත: අක්කර 300).<br>• පැරෂුට් තැටි: 38,000 ක් මිලදී ගන්නා ලදී; පොළොන්නරුව අන්තර් පළාතට 14,000 ක් සහ අනුරාධපුරයට 24,000 ක් බෙදා දෙන ලදී.<br>• කර දහයියා : මෙට්‍රික් ටොන් 137.5 ක් යොදන ලදී | පොළොන්නරුව/ අම්පාර/හම්බන් තොට අන්තර් පළාත් සහ පළාත් | ගොවි ප්‍රජාව |

| ව්‍යාපෘතිය | ප්‍රගතිය | ක්‍රියාත්මක ප්‍රදේශ | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|
| | (පොළොන්නරුව අන්තර් පළාතට මෙට්‍රික් ටොන් 38.25 යි, හම්බන්තොටට මෙට්‍රික් ටොන් 24.25, අම්පාර අන්තර් පළාතට මෙට්‍රික් ටොන් 75).<br>• බිත්තර වී බීජ: කිලෝග්‍රෑම් 6,804 ක් ලබා දෙන ලදී.<br>• පත්‍ර වර්ණ දර්ශක: 300 ක් බෙදා දෙන ලදී.<br>• ගොවි ක්ෂේත්‍ර පාසල්: 170 ක් පවත්වන ලදී.<br>• බෝග අස්වනු සමීක්ෂණ: 225 ක් පවත්වන ලදී.<br>ඡායාරූප අංක 46 - 48 | | |
| 15. යල කන්නයේ බඩඉරිඟු නිෂ්පාදනය සඳහා කුඹුරු විවිධාංගීකරණය - 2024 | අධි ඝනත්ව ආදර්ශ:<br>• අක්කර 100 ක් (මහා පරිමාණ) සම්පූර්ණ කරන ලදී.<br>• අක්කර 879 (කුඩා පරිමාණ) සම්පූර්ණ කරන ලදී, අධික වර්ෂාපතනය හේතුවෙන් කුඹුරුවලට බලපෑම් ඇති වූ නිසා උස් බිම් භාවිතා කරන ලදී.<br>• අධි ඝනත්ව බඩ ඉරිඟු ඵලදායිතා ඉහළ නැංවීම සඳහා අක්කර ½ ක ආදර්ශයක් ස්ථාපිත කරන ලදී.<br>• යටිතල පහසුකම්: බඩ ඉරිඟු වියළන කොන්ක්‍රීට් කමත සකස් කිරීම සිදු කරන ලදී.<br>• දැනුවත් කිරීමේ වැඩසටහන්: වැඩසටහන් 50 ක් පවත්වන ලදී; අත් පත්‍රිකා 10,000 ක් මුද්‍රණය කරන ලදී.<br>• බෝග අස්වනු සමීක්ෂණ: 25 ක් සිදු කරන ලදී.<br>ඡායාරූප අංක 49 - 51 | අනුරාධපුර, හම්බන්තොට | ගොවි ප්‍රජාව (650) |
| 16. ආහාර හා කෘෂිකාර්ම සංවිධානය විසින් සංවිධානය කරන ලද 37 වන ආසියා පැසිෆික් සමුළුවේ සාමාජිකයින්ගේ ක්ෂේත්‍ර චාරිකාව සඳහා පහසුකම් සැලසීම සඳහා බටඅත කෘෂි තාක්ෂණ උද්‍යානයේ යටිතල පහසුකම් සහ ආදර්ශන බිම් ශක්තිමත් කිරීම. | • පොදු වැසිකිළි පද්ධතිය, ශ්‍රවණාගාරය, පොදු පහසුකම් ප්‍රදේශය, ස්ථිර බෝග සායන ගොඩනැගිල්ල සහ ඉදිරිපස වැට අලුත්වැඩියා කර ඇත.<br>• අභ්‍යන්තර මාර්ග සංවර්ධනය කර ඇත.<br>• අමුත්තන් පිළිගැනීම , අමුත්තන් සඳහා ප්‍රවාහන පහසුකම්, සංස්කෘතික අංගයන් සහ අමුත්තන් හා නිලධාරීන්ට ආහාරපාන සැපයීම සිදු කර ඇත<br>ඡායාරූප අංක 52 - 54 | බටඅත | කෘෂි තාක්ෂණ උද්‍යානයෙහි 'Agro tech 2024' ප්‍රදර්ශනය නැරඹීමට පැමිණි මහජනතාව, ගොවීන් |
| 17. නව තාක්ෂණයන් බෙදා හැරීම සඳහා ආයතනික සහ පර්යේෂණ ක්ෂේත්‍ර පහසුකම් වැඩිදියුණු කිරීම | • පර්යේෂණ ක්ෂේත්‍ර ප්‍රවේශ මාර්ග වැඩිදියුණු කිරීම සහ ක්ෂේත්‍ර ප්‍රදර්ශන පුවරු සකස් කර සවි කිරීම සිදු කර ඇත.<br>• ප්‍රධාන ගොඩනැගිල්ලේ ඉදිරිපස පෙනුම වැඩි දියුණු කිරීම සහ වැසිකිළි පහසුකම් වැඩිදියුණු කිරීම සිදු කර ඇත.<br>• තාක්ෂණය ව්‍යාප්ත කිරීම සඳහා කුටියක් සකස් කිරීම සහ කාර්යාල පරිශ්‍රය සකස් කිරීම සිදු කර ඇත. | තෙල් හා මාශ බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය, අඟුණකොළපැළැස්ස | |
| 18. ආහාර හා කෘෂිකාර්ම සංවිධානය හි 37 | "Agri tech 2024" ප්‍රදර්ශනයට සමගාමීව පහත සඳහන් ක්‍රියාකාරකම් සිදු කරන ලදී.<br>• ප්‍රදර්ශන කුටි 50ක් සපයා සවි කිරීම සිදු කරන ලදී. | බටඅත | Agri-Tech 2024 ප්‍රදර්ශනය |

| ව්‍යාපෘතිය | ප්‍රගතිය | ක්‍රියාත්මක ප්‍රදේශ | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|
| වන ආසියා පැසිෆික් කලාපීය සමුළුවේ නියෝජිතයින්ගේ සංචාරයට සමගාමීව යෝජිත ක්ෂේත්‍ර දින වැඩසටහන - 2024 පෙබරවාරි 22 වන දින බටඅත කෘෂි තාක්ෂණ උද්‍යානයේ දී | • පිළිගැනීමේ කටයුතු, මහජන ඇමතුම් පද්ධති කුලියට ගැනීම, සංස්කෘතික අංගයන් පැවැත්වීම සිදු කරන ලදී.<br>• දැනුවත් කිරීම, අපද්‍රව්‍ය බැහැර කිරීම සහ ජංගම වැසිකිළි සහ පානීය ජල ටැංකි සවි කිරීම සිදු කරන ලදී.<br>ඡායාරූප අංක 55 | | මගින් දැනුම ලබා ගත් සියලු දෙනා |
| 19. ආහාර හා කෘෂිකාර්ම සංවිධානයෙහි 37 වන ආසියා පැසිෆික් කලාපීය සමුළුව සඳහා ආහාර බෝගවලින් භූමි අලංකරණය සිදු කිරීම | කොළඹ හිල්ටන් හෝටලයේ පැවති 37 වන ආසියා පැසිෆික් සමුළුව සඳහා ආකර්ශණීය ස්ථාන පිරිසැලසුමක් ගොඩනැගීම සඳහා පහත ක්‍රියාකාරකම් සිදු කරන ලදී.<br>• සැරසිලි සඳහා එළවළු පැල සකස් කිරීම, චලනය කළ හැකි පැල රාක්කයක් සෑදීම සහ පැල රාක්කයේ පැති බිත්ති සඳහා ස්ටිකරයක් සකස් කිරීම සිදු කර ඇත. | හිල්ටන් හෝටලය, කොළඹ | Agri-Tech 2024 ප්‍රදර්ශනය තුළින් දැනුම ලබා ගත් සියලු දෙනා |

## 02. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව

### 2.1. දෙපාර්තමේන්තුව පිළිබඳ කෙටි හැඳින්වීම

ශ්‍රී ලාංකීය ගොවිජනතාවට අවශ්‍ය පහසුකම් සැපයීමේ අරමුණින් 1957 ඔක්තෝම්බර් 01 වන දින ගොවිජන සේවා දෙපාර්තමේන්තුව ආරම්භ කරන ලද්දේ එතෙක් පැවති ආහාර දෙපාර්තමේන්තුව අහෝසි කරමිනි. 1958 අංක 01 දරණ කුඹුරු ඉඩම් පනතින් බල ගන්වන ලද මෙම දෙපාර්තමේන්තුව මේ වන විට 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනත හා එහි සංශෝධනයන් අනුව ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව නමින් ක්‍රියාත්මක වේ.

### 2.2. 2025 වර්ෂයේ මූල්‍ය ඉලක්ක

| අ/අ | ප්‍රධාන සංවර්ධන වැඩසටහන | ඇස්තමේන්තු මුදල (රු.මි.) |
|---|---|---|
| 1 | ප්‍රාග්ධන වියදම් | 6,829.03 |
| 2 | පුනරාවර්තන වියදම් | 11,528.88 |

### 2.3. 2025 වර්ෂයේ භෞතික ඉලක්ක (ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් හා ව්‍යාපෘති)

| අ/අ | වැඩසටහන | මිනුම් ඒකකය | ඉලක්කය | මුළු පිරිවැය (රු.) |
|---|---|---|---|---|
| 1 | සුළු වාරි මාර්ග සංවර්ධනය හා පුරන් කුඹුරු අස්වැද්දීම (ඉඩම් හා ඉඩම් සංවර්ධනය) | | | |
| | ඌන භාවිත හා භාවිතයට නොගන්නා කෘෂිකාර්මික ඉඩම්වල ඵලදායිතාවය ඉහළ නැංවීම | අක්කර ප්‍රමාණය | අක්කර 1,500 | 32.00 |

| අ/අ | වැඩසටහන | මිනුම් ඒකකය | ඉලක්කය | මුළු පිරිවැය (රු.) |
|---|---|---|---|---|
| | අත්හැර දමනු ලැබූ වැව් ප්‍රතිසංස්කරණ වැඩසටහන | වැව් සංඛ්‍යාව | ව්‍යාපෘති 27 | 511.00 |
| | සුළු වාරිමාර්ග සුළු ප්‍රතිසංස්කරණ වැඩසටහන (Kick Start) | ව්‍යාපෘති සංඛ්‍යාව | ව්‍යාපෘති 1190 | 545.75 |
| | ගංවතුර හානි ප්‍රතිසංස්කරණය | ව්‍යාපෘති සංඛ්‍යාව | ව්‍යාපෘති 344 | 801.78 |
| | වැව් හා අමුණු ප්‍රතිසංස්කරණ වැඩසටහන | ව්‍යාපෘති සංඛ්‍යාව | ව්‍යාපෘති 455 | 1,189.92 |
| | කෘෂි මාර්ග අළුත්වැඩියාව | ව්‍යාපෘති සංඛ්‍යාව | ව්‍යාපෘති 412 | 922.88 |
| | කෘෂි ළිං අළුත්වැඩියාව | ව්‍යාපෘති සංඛ්‍යාව | ව්‍යාපෘති 233 | 168.20 |
| | සෘතුමය වගා වැට ඉදිකිරීම | ව්‍යාපෘති සංඛ්‍යාව | ව්‍යාපෘති 108 | 184.00 |
| | සෝලා වාරි පද්ධති හා ජලජ ශාක ඉවත්කිරීම | | ඒකක 5 වැව් 5 | 4.50 |
| | ගෙවතු සඳහා බිංදු ජල පද්ධති ක්‍රමය හඳුන්වාදීම | | ව්‍යාපෘති 50 | 10.75 |
| | **එකතුව** | | | **4,370.78** |
| 2 | ප්‍රධාන කාර්යාලය හා දිස්ත්‍රික් කාර්යාලය අළුත්වැඩියාව | ව්‍යාපෘති සංඛ්‍යාව | ව්‍යාපෘති 33 | 254.00 |
| 3 | වාහන අළුත්වැඩියාව | වාහන සංඛ්‍යාව | අවශ්‍යතාව අනුව | 25.00 |
| 4 | ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ (ප්‍රධාන කාර්යාලය) | ඒකක සංඛ්‍යාව | අවශ්‍යතාව අනුව | 14.00 |
| 5 | පුහුණු හා හැකියා වර්ධනය | වැඩසටහන් සංඛ්‍යාව | වැඩසටහන් 16 | 20.00 |
| 6 | ගොවිජන සේවා මධ්‍යස්ථාන හා පොහොර ගබඩා අළුත්වැඩියාව | ව්‍යාපෘති සංඛ්‍යාව | ව්‍යාපෘති 323 | 998.70 |
| 7 | යන්ත්‍ර පුනරුත්ථාපනය | යන්ත්‍ර සංඛ්‍යාව | යන්ත්‍ර 38 | 72.00 |
| 8 | වාහන අළුත්වැඩියාව | වාහන සංඛ්‍යාව | අවශ්‍යතාව අනුව | 38.00 |
| 9 | ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ (දිස්ත්‍රික් කාර්යාල) | ඒකක සංඛ්‍යාව | අවශ්‍යතාව අනුව | 97.50 |
| 10 | යන්ත්‍ර අත්පත් කර ගැනීම | යන්ත්‍ර සංඛ්‍යාව | මිනි එක්ස්කැවේටර් 2 | 30.00 |
| 11 | ගොඩනැගිලි නව ඉදිකිරීම | ව්‍යාපෘති සංඛ්‍යාව | ව්‍යාපෘති 33 | 598.05 |
| 12 | ගොඩනැගිලි නව ඉදිකිරීම (පොහොර ගබඩා) | ව්‍යාපෘති සංඛ්‍යාව | ව්‍යාපෘති 40 | 261.00 |
| 13 | බෝග විවිධාංගීකරණය (Sensor Based Automated Irrigation Facility to Green house) | වැඩසටහන් සංඛ්‍යාව | වැඩසටහන් 4 | 50.00 |

## 2.4. 2024.12.31 දිනට ආයතනයේ වැඩසටහන්වල මූල්‍ය හා භෞතික ප්‍රගතිය

| අ/අ | වැඩසටහන | 2024 වර්ෂය සඳහා වෙන් කළ මුදල (රු.මි.) | 2024.12.31 දක්වා වියදම් කළ මුදල (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| 1 | ප්‍රාග්ධන වියදම් | 3,855.36 | 2,930.04 | 76 |
| 2 | පුනරාවර්තන වියදම් | 11,116.47 | 10,864.44 | 98 |

| ක්‍රියාකාරකම | 2024 වර්ෂය සඳහා වෙන් කළ මුදල (රු.මි.) | 2024.12.31 දක්වා වියදම් කළ මුදල (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|
| • සුළු වාරි මාර්ග ප්‍රතිසංස්කරණය හා පුරන් කුඹුරු අස්වැද්දීම | | | | |
| ඌන භාවිත හා භාවිතයට නොගන්නා කෘෂිකාර්මික ඉඩම්වල ඵලදායිතාවය ඉහළ නැංවීම. | 12.50 | 10.21 | 80 | කුඹුරු ඉඩම් වල අතිරේක බෝග වගා කිරීම මේ යටතේ සිදු කෙරේ. මේ යටතේ මන්නාරම / ත්‍රිකුණාමලය / අනුරාධපුරය /පොළොන්නරුව/ රත්නපුර යන දිස්ත්‍රික්කවල කුඹුරු ඉඩම් වල අතිරේක බෝග ලෙස මුං, කව්පි, උඳු හා රටකජු අක්කර 600ක් වගා කිරීම මේ යටතේ සිදු කෙරින |
| ගෙවතු වගා ප්‍රවර්ධනය | 188.00 | 118.60 | 63 | වාණිජ ගෙවතු ලක්ෂයක් සකස් කිරීමට සැලසුම් කෙරිනි, දැනට වාණිජ ගෙවතු 77,137ක් ක්‍රියාත්මක කිරීමේ කටයුතු සිදු කෙරෙමින් පවතී. |
| අත්හැරදමන ලද වැව් ප්‍රතිසංස්කරණය. | 76.00 | 57.51 | 75 | ව්‍යාපෘති 10ක් ක්‍රියාත්මක කර ඇත. එයින් ව්‍යාපෘති 5ක් වැඩ අවසන් ඉතිරි ව්‍යාපෘති ක්‍රියාත්මක කරමින් පවතී. |
| ක්‍රියාකාරි සුළුවාරිමාර්ග වල සුළු අලුත්වැඩියා සිදු කිරිම. (Kickstart) | 345.00 | 335.51 | 97 | ව්‍යාපෘති 950ක් ක්‍රියාත්මක කර ඇත. ව්‍යාපෘති 939ක් වැඩ අවසන් කර ඇත. |
| ගංවතුරෙන් හානියට පත් සුළුවාරි මාර්ග වල යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය හා විශේෂ ගංවතුර හානි ව්‍යාපෘතිය | 228.50 | 217.67 | 95 | ව්‍යාපෘති 144ක් ක්‍රියාත්මක කර ඇත. ව්‍යාපෘති 131ක් වැඩ අවසන් කර ඇත. ඉතිරි ව්‍යාපෘති ක්‍රියාත්මක කරමින් පවතී. |
| සුළු වාරිමාර්ග වැව් සහ අමුණු ප්‍රතිසංස්කරණය | 915.00 | 838.28 | 90 | ව්‍යාපෘති 346ක් ක්‍රියාත්මක කර ඇත. ව්‍යාපෘති 341ක් වැඩ අවසන් කර ඇත. ඉතිරි ව්‍යාපෘති ක්‍රියාත්මක කරමින් පවතී |
| තෝරාගත් සුළුවාරි මාර්ග වැව් සඳහා | 20.00 | 16.30 | 80 | දැනට කිළිනොච්චි / මඩකලපුව / ත්‍රිකුණාමලය / පුත්තලම / වව්නියාව / |

| ක්‍රියාකාරකම | 2024 වර්ෂය සඳහා වෙන් කළ මුදල (රු.මි.) | 2024.12.31 දක්වා වියදම් කළ මුදල (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|
| නඩත්තු අරමුදලක් පිහිටුවීම. | | | | හම්බන්තොට / කුරුණෑගල / මොණරාගල / අනුරාධපුරය යන දිස්ත්‍රික්ක වලට වැව් 167ක් ප්‍රතිපාදන ලබාදී ඇත |
| කෘෂිමාර්ග ප්‍රතිසංස්කරණය | 175.00 | 162.75 | 93 | ව්‍යාපෘති 92ක් ක්‍රියාත්මක කර ඇත. ව්‍යාපෘති සියල්ල වැඩ අවසන් කර ඇත. |
| කෘෂි ළිං ප්‍රතිසංස්කරණය | 15.50 | 13.54 | 90 | ව්‍යාපෘති 62ක් ක්‍රියාත්මක කර ඇත. ව්‍යාපෘති 54ක් වැඩ අවසන් කර ඇත. ඉතිරි ව්‍යාපෘති ක්‍රියාත්මක කරමින් පවතී |
| සුහුරු ආදර්ශ ගම්මාන සංවර්ධනය | 335.00 | 67.05 | 20 | සියළු ව්‍යාපෘති ක්‍රියාත්මක තත්ත්වයේ පවතී |
| ඩිජිටල් කෘෂිකාර්මික ඉඩම් ලේඛණ සකස් කිරිම | 30.00 | 25.06 | 83 | මැනුම් කරන ලද කුඹුරු කැබලි 130,247ක් සඳහා ගෙවීම් සිදු කර ඇත |
| Water Management Activity | 87.35 | 61.72 | 70 | වියලි කලාපයේ ආදර්ශ වැව් ව්‍යාපෘතිය, කෘෂිකාලගුණික දත්ත හා වර්ෂාමාන දත්ත රැස්කිරීම හා වෙල්විදාන පුහුණුකිරීම සහ 2023 වර්ෂයේ බැඳීම් ව්‍යාපෘති |
| පැරෂුට් වගාව ප්‍රවර්ධනය | 236.00 | 63.05 | 30 | දිස්ත්‍රික්ක වෙත පැරෂුට් තැටි 3,980,977ක් බෙදා අවසන් කර ඇත |
| කැපුම් මල් වගා ව්‍යාපෘතිය නුවරඑළිය දිස්ත්‍රික්කය | 30.00 | 31.44 | 100 | හරිතාගාර ඉදිකිරීම් කටයුතු 75%ක් වැඩ අවසන් කර ඇත |
| සෘතුමය වගා ආරක්ෂිත වැට ඉදිකිරීම | 25.00 | 24.55 | 98 | වැඩ අවසන් කර ඇත |
| ඉතිරි ප්‍රතිපාදන | 28.65 | 0.00 | 0 | |
| 2023 වර්ෂයේ අතැතිබිල් පියවීම | 131.50 | 125.30 | 95 | අතැතිබිල් පියවා අවසන් කර ඇත. |
| 2023 වර්ෂයේ බැඳීම් ව්‍යාපෘති | 65.00 | 57.19 | 88 | කෘෂි මාර්ග 9ක්, සුළු වාරි 6ක් හා අත්හැරදමන ලද වැව් 5ක් වැඩ අවසන් කර ඇත |
| ව්‍යාපෘති ආධාරක පිරිවැය | 56.00 | 40.31 | 72 | |
| **එකතුව** | **3,000.00** | **2266.76** | | |
| | | | | |
| ප්‍රධාන කාර්යාලය හා දිස්ත්‍රික් කාර්යාලය අළුත්වැඩියාව | 20.00 | 19.24 | 96 | ව්‍යාපෘති 18ක් වැඩ අවසන් කර ඇත |

| ක්‍රියාකාරකම | 2024 වර්ෂය සඳහා වෙන් කළ මුදල (රු.මි.) | 2024.12.31 දක්වා වියදම් කළ මුදල (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|
| වාහන අළුත්වැඩියාව | 32.00 | 17.89 | 55 | අවශ්‍යතා අනුව අළුත්වැඩියා කටයුතු සිදු කර ඇත. |
| ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ (ප්‍රධාන කාර්යාලය) | 8.00 | 7.43 | 92 | අවශ්‍යතා අනුව මිලදී ගැනීම් සිදු කිරීම |
| වාහන ලීසිං වාරික ගෙවීම | 3.86 | 3.86 | 100 | වාහන 21ක ලීසිං වාරික ගෙවා අවසන් කර ඇත. |
| පුහුණු හා හැකියා වර්ධනය | 10.00 | 2.40 | 25 | නිලධාරීන් පුහුණු කිරීම් හා අවශ්‍ය පහසුකම් සැපයීම් කටයුතු සිදු කර ඇත. |
| ගොවිජන සේවා මධ්‍යස්ථාන හා පොහොර ගබඩා අළුත්වැඩියාව | 600.00 | 523.04 | 87 | ප්‍රධාන කාර්යාලය ඇතුලුව ගොවිජන සේවා මධ්‍යස්ථාන හා පොහොර ගබඩා 204ක් |
| යන්ත්‍ර පුනරුත්ථාපනය | 71.50 | 30.79 | 43 | අවශ්‍යතා අනුව අළුත්වැඩියා කටයුතු සිදු කර ඇත. |
| වාහන අළුත්වැඩියාව | 35.00 | 3.71 | 10 | අවශ්‍යතා අනුව අළුත්වැඩියා කටයුතු සිදු කර ඇත. |
| ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ (දිස්ත්‍රික් කාර්යාල) | 10.00 | 6.29 | 62 | අවශ්‍යතා අනුව මිලදී ගැනීම් සිදු කිරීම |
| යන්ත්‍ර අත්පත් කර ගැනීම | 5.00 | 0.00 | 0 | වැඩසටහන ක්‍රියාත්මක කර නැත. |
| ගොඩනැගිලි නව ඉදිකිරීම | 10.00 | 4.65 | 46 | එක් ව්‍යාපෘතියක් වැඩ අවසන් කර ඉතිරි ව්‍යාපෘතිය ක්‍රියාත්මක වෙමින් පවතී |
| බෝග විවිධාංගීකරණය (Sensor Based Automated Irrigation Facility to Green house) | 50.00 | 43.98 | 87 | නුවරඑළිය, කිළිනොච්චි, මඩකලපුව, පුත්තලම දිස්ත්‍රික්ක වල ආදර්ශ වැව් 4ක් නිර්මාණය කිරීම හා නුවරඑළිය දිස්ත්‍රික්කයේ ස්ට්‍රෝබෙරි ආදර්ශ වගා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම |

ඡායාරූප අංක 56 - 58

# 03. අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

## 3.1. හැඳින්වීම

1971 ජාතික කෘෂිකාර්මික ප්‍රතිපත්තිය මඟින් ද පසුව 1972 දී අමාත්‍ය මණ්ඩල සන්දේශයක් තුළින් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයට අනුබද්ධිතව සුළු අපනයන බෝග දෙපාර්තමේන්තුව ස්ථාපිත කරන ලදි. 1975 වර්ෂයේ දී මෙම දෙපාර්තමේන්තුව කෘෂිකර්ම අමාත්‍යාංශය යටතට ගෙන එන ලදි. ලෝක ආහාර වැඩසටහන (WFP)සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) මඟින් මූලාරම්භ කරන ලද බෝග විවිධාංගීකරණ සංවර්ධන වැඩසටහනේ කාර්යයන්වල කොටසක් දෙපාර්තමේන්තුවට පැවරීමත් සමඟ අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව කුළුබඩු ආශ්‍රිත බෝග සංවර්ධනය මත පදනම් වූ අපනයන සංවර්ධනයේ නියමුවා විය.

1992 අංක 46 දරණ පාර්ලිමේන්තු පනතින් මෙම දෙපාර්තමේන්තුව අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යනුවෙන් නැවත නම් කරන ලදි. එමඟින් කුළුබඩු සහ වෙනත් කෘෂිකාර්මික බෝග අපනයනයට අදාළව නෛතික අධිකාරී බලය දෙපාර්තමේන්තුව වෙත පවරන ලදි.

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ප්‍රධාන වශයෙන් ඉලක්ක කරන්නේ කුරුඳු, ගම්මිරිස්,කරාබු, සාදික්කා,කරදමුංගු,කෝපි, කොකෝවා, බුලත්, පුවක් ,වැනිලා, පැඟිරි, සේර, ගොරකා, ඉඟුරු හා කහ ආදී කුළුබඩු බෝග පානීය භෝග සහ උත්තේජක භෝග අපනයනය ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීමයි. මෙහි දී දෙපාර්තමේන්තුවේ වගකීම වනුයේ අපනයන කෘෂි බෝග වගා වපසරිය වැඩි කිරීම, පවත්නා වගාවල ඵලදායීතා කටයුතු, පසු අස්වනු තාක්ෂණ ප්‍රවර්ධන වැනි සංවර්ධන කටයුතු හා නව ප්‍රභේද හඳුන්වා දීම, නව තාක්ෂණික දැනුම සහ නවෝත්පාදන අපනයන කෘෂි බෝග ක්ෂේත්‍රයට හඳුන්වා දීමයි.

## 3.2. 2025 වර්ෂයේ මූල්‍ය ඉලක්ක

| අ/අ | ප්‍රධාන සංවර්ධන වැඩසටහන | ඇස්තමේන්තු මුදල (රු.මි.) |
|---|---|---|
| 01. | ප්‍රාග්ධන වියදම් | 1,449.00 |
| 02. | පුනරාවර්තන වියදම් | 1,164.60 |

## 3.3. 2025 වර්ෂයේ භෞතික ඉලක්ක (ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් හා ව්‍යාපෘති)

| අ/අ | වැඩසටහන | මිනුම් ඒකකය | ඉලක්කය | මුළු පිරිවැය (රු. මි.) |
|---|---|---|---|---|
| 1 | වගා වපසරිය පුළුල් කිරීම | හෙක්ටයාර් / පැළ | හෙක්ටයාර් - 10,500<br>පැළ - 500,000 | 624.00 |
| 2 | මධ්‍යම පැළ තවාන් සංවර්ධනය කිරීම | කිලෝග්‍රෑම් /බීජ / කියුබ් | කිලෝග්‍රෑම් - 9,000<br>බීජ - 250,000<br>කියුබ් - 600 | 36.00 |
| 3 | අපනයන කෘෂි බෝග ඉඩම් ඵලදායිතාවය වැඩි කිරීම | හෙක්ටයාර්/ ඒකක | හෙක්ටයාර්-4,000 ඒකක - 250 | 150.00 |
| 4 | බෝග අගය දාම සංවර්ධන වැඩසටහන | ඒකක | ඒකක -450 | 85.00 |

| අ/අ | වැඩසටහන | මිනුම් ඒකකය | ඉලක්කය | මූළ පිරිවැය (රු. මි.) |
|---|---|---|---|---|
| 5 | ජනමාධ්‍ය සහ සන්නිවේදනය | වැඩසටහන්/ ඒකක | වැඩසටහන් - 300 ඒකක - 600,000 | 40.00 |
| 6 | ධාරිතා සංවර්ධන වැඩසටහන | වැඩසටහන් | වැඩසටහන්- 2,200 | 35.00 |
| 7 | පරිපාලන වියදම් | | | 30.00 |
| 8 | ගොඩනැගිලි අළුත්වැඩියාවන් 2001 | ගොඩනැගිලි | 44 | 50.00 |
| 9 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ අළුත්වැඩියා කිරීම 2002 | යන්ත්‍ර උපකරණ (ගොවිපල, කාර්යාල, විද්‍යාගාර) | 22 | 12.00 |
| 10 | වාහන අළුත්වැඩියාව 2003 | වාහන | 42 | 20.00 |
| 11 | කාර්යාලීය උපකරණ මිලදී ගැනීම 2102 | කාර්යාලීය උපකරණ | 54 | 22.00 |
| 12 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම 2103 | උපකරණ (විද්‍යාගාර, කාර්යාල) | 18 | 13.00 |
| 13 | නව ගොඩනැගිලි ඉදිකිරීම් 2104 | ගොඩනැගිලි (නව) | 13 | 60.00 |
| 14 | ඉඩම් සහ ඉඩම් සංවර්ධනය 2105 | සංවර්ධනය කරනු ලබන ඉඩම් | 24 | 210.00 |
| 15 | කාර්ය මණ්ඩල පුහුණු 2401 | පුහුණු වැඩසටහන් | 21 | 3.00 |
| 16 | යටිතල පහසුකම් සංවර්ධනය 2506 | සංවර්ධනය කරනු ලබන යටිතල පහසුකම් | 27 | 34.00 |
| 17 | පර්යේෂණ හා සංවර්ධන 2507 | පර්යේෂණ හා සංවර්ධන කටයුතු සඳහා කරනු ලබන මිලදී ගැනීම් | 45 | 25.00 |

### 3.4. 2024.12.31 දිනට ආයතනයේ සංවර්ධන වැඩසටහන්වල මූල්‍ය ප්‍රගතිය

| අ/අ | වැඩසටහන | 2024 වර්ෂය සඳහා වෙන් කළ මුදල (රු.මි.) | 2024.12.31 දක්වා වියදම් කළ මුදල (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| 1 | ප්‍රාග්ධන වියදම් | 517.00 | 470.71 | 91 |
| 2 | පුනරාවර්තන වියදම් | 1,036.49 | 932.61 | 90 |
| | | | | |
| | **සංවර්ධන වැඩසටහන්** | | | |
| 1 | අපනයන කෘෂිබෝග සංවර්ධන වැඩසටහන | 400.00 | 369.93 | 93 |
| 2 | අපනයන කෘෂි භෝග පර්යේෂණ හා සමෝධානික රෝග පළිබෝධ / පාලන ව්‍යාපෘතිය | 18.00 | 13.173 | 73 |
| 3 | වෙනත් ( 2001, 2104, 2105, 2506, 2002, 2003, 2102, 2103 සහ 2401 වැය විෂයන් සඳහා ) | 99.00 | 87.607 | 89 |

### 3.5. 2024.12.31 දිනට ආයතනයේ සංවර්ධන වැඩසටහන්වල භෞතික ප්‍රගතිය

දෙපාර්තමේන්තුවට අදාළව ක්‍රියාත්මක කරනු ලැබූ සංවර්ධන වැඩසටහන් සඳහා රු.මි. 517.00ක ප්‍රතිපාදන ප්‍රමාණයක් 2024 වර්ෂය සඳහා වෙන් කර තිබූ අතර එම ප්‍රතිපාදන වලින් රු.මි. 470.715ක මූල්‍ය වියදමක් ලඟාකර ගැනීමට 2024 වර්ෂය තුළදී දෙපාර්තමේන්තුවට හැකිවිය.

එම වැඩසටහන් මහනුවර, නුවරඑළිය, බදුල්ල, ගම්පහ, කොළඹ, කළුතර, හම්බන්තොට, මාතලේ, මාතර, පොළොන්නරුව, අම්පාර, අනුරාධපුර, රත්නපුර, මොණරාගල, කෑගල්ල, ගාල්ල සහ කුරුණෑගල දිස්ත්‍රික්ක ආශ්‍රිතව සිදුකරන ලද අතර සමස්තයක් ලෙස මෙම සංවර්ධන වැඩසටහන් සඳහා ප්‍රතිලාභීන් 354,709ක් සම්බන්ධ වී ඇත.

දෙපාර්තමේන්තුවට අදාළව සමස්ත සංවර්ධන වැඩසටහන් සඳහා වෙන් වෙන් වශයෙන් වෙන්කළ ප්‍රතිපාදන, මූල්‍ය ප්‍රගතිය හා භෞතික ප්‍රගතිය පහත පරිදි වේ.

- **අපනයන කෘෂිභෝග සංවර්ධන වැඩසටහනේ 2024.12.31 දිනට ප්‍රගතිය**

| වැඩසටහන / ව්‍යාපෘතිය | වෙන් කළ මුදල (රු.මි.) | වැය කළ මුදල (රු.මි.) | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|
| **01.** අපනයන කෘෂි බෝග සංවර්ධන වැඩසටහන | | | |
| 1.1 අපනයන කෘෂිබෝග නව වගා ප්‍රවර්ධන වැඩසටහන | 104.30 | 95.64 | ගම්මිරිස් හෙක්ටයාර 444.03, කොකෝවා හෙක්ටයාර 109.93, කරාබු හෙක්ටයාර 45.30, සාදික්කා හෙක්ටයාර 48.12, පැඟිරි හෙක්ටයාර 2.0, ලෙමන්ග්‍රාස් හෙක්ටයාර 0.2, ගොරකා හෙක්ටයාර 1.40, ඇරබිකා කෝපි හෙක්ටයාර 396.35, රොබස්ටා කෝපි හෙක්ටයාර 58.05, කරදමුංගු හෙක්ටයාර 66.71, වැනිලා හෙක්ටයාර 35.4, කහ හෙක්ටයාර 56.23 ක් හා ඉඟුරු හෙක්ටයාර 57.85 වගා කර ඇත.<br><br>(සම්පූර්ණ හෙක්ටයාර 1321.59 වගා කර ඇත.) |
| 1.2කුඩා පරිමාණ වගා ප්‍රවර්ධන වැඩසටහන | 42.53 | 36.68 | ගම්මිරිස් පැළ 380,727, කොකෝවා පැළ 15,182, කරාබු පැළ 10,989, සාදික්කා පැළ 7,663, බුලත් පැළ 56,826, ගොරකා පැළ 16,080, ලෙමන්ග්‍රාස් පැළ 5,500, ඇරබිකා කෝපි පැළ 96,596, රොබස්ටා කෝපි පැළ 77,035, කරදමුංගු පැළ 108,459 ක් හා වැනිලා පැළ 124,053, කහ පැළ 665 ක් නිකුත් කර ඇත.<br><br>(සම්පූර්ණ පැළ 899,775 නිකුත් කර ඇත.) |
| 1.3 අපනයන කෘෂිබෝග ප්‍රවර්ධන වැඩසටහන | 4.39 | | නැත |
| 1.4 පුවක් වගා ප්‍රවර්ධන වැඩසටහන | 41.60 | 46.20 | පුවක් පැළ 1,532,525 ක් නිකුත් කර ඇත. |

| වැඩසටහන / ව්‍යාපෘතිය | වෙන් කළ මුදල (රු.මි.) | වැය කළ මුදල (රු.මි.) | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|
| **02. අපනයන කෘෂි බෝග සංවර්ධන වැඩසටහන** | | | |
| 2.1 බීජ සහ රෝපණ ද්‍රව්‍ය ලබා ගැනීම | 1.00 | 0.89 | පුවක් පැළ 136,500 ක් සාදික්කා පැළ 12,390 ක් මිල දී ගෙන ඇත.<br><br>කෝපි බීජ කි.ග්‍රෑ 18.75 මිල දී ගෙන ඇත. |
| 2.2 පැළ නිෂ්පාදනය සඳහා යෙදවුම් මිළදී ගැනීම. | 6.00 | 5.92 | 5*8බෑග් 900,000 ක් මිළදී ගෙන ඇත. බඳුන් මාධ්‍යය 275 (කියුබ්) මිල දී ගෙන ඇත. |
| 2.3 දැල් ගෘහ, ජල සම්පාදන හා අනෙකුත් පහසුකම් සංවර්ධනය | 3.00 | 1.14 | -<br>ගස්නාව මධ්‍යම පැළ තවානට ළිදක් සහ මිද්දෙණිය අපනයන කෘෂි බෝග උද්‍යානයේ පිරවුම් මඩුවක් සකස් කර ඇත. |
| 2.4 ගොවිබිම් කළමනාකරණය සඳහා යෙදවුම් මිළදී ගැනීම. | 2.50 | 0.22 | උපකරණ 161 ක් මිල දී ගෙන ඇත |
| **03. භූමි ඵලදායිතාව ඉහළ නැංවීමේ වැඩසටහන** | | | |
| 3.1 භූමි ඵලදායිතාව ඉහළ නැංවීමේ වැඩසටහන | 23.72 | 7.66 | ගම්මිරිස් හෙක්ටයාර 467.72, කොකෝවා හෙක්ටයාර 11.6, කරාබු හෙක්ටයාර 4.8, සාදික්කා හෙක්ටයාර 3.4, ඇරබිකා කෝපි හෙක්ටයාර 9.10, රොබස්ටා කෝපි හෙක්ටයාර 4.5 , වැනිලා හෙක්ටයාර 2.5ක් වගා කර ඇත.<br><br>ගම්මිරිස් හෙක්ටයාර 2636.14, කොකෝවා හෙක්ටයාර 200.9, ඇරබිකා කෝපි හෙක්ටයාර 600.11, රොබස්ටා කෝපි හෙක්ටයාර 60.42, සාදික්කා හෙක්ටයාර 59.24, කරාබු හෙක්ටයාර 43.49, වෙනත් හෙක්ටයාර 2.00 පුහුණු වැඩසටහන යටතේ ආවරණය කර ඇත. (සම්පූර්ණ හෙක්ටයාර 4,105.91 වගා කර ඇත.) |
| 3.2 පළිබෝධ හා වගා හානි වැළැක්වීමේ උපාංග/පද්ධති ලබා දීමේ වැඩසටහන | 3.00 | 0.58465 | පද්ධති 13 ක් සම්පූර්ණ කර ඇත. |
| 3.3 ක්ෂුද්‍ර ජල සම්පාදන පද්ධති ස්ථාපනය කිරිමේ වැඩසටහන | 3.00 | 1.33 | පද්ධති 18 ක් සම්පූර්ණ කර ඇත. |
| 3.4ශාක ආරක්ෂණ වැඩසටහන | 18.00 | 6.86 | දිලීර නාශක 1650kg , පළිබෝධනාශක 50L , ඉසින යන්ත්‍ර 20ක් මිල දී ගෙන ඇත |
| **04. යහපත් කෘෂිකාර්මික පිළිවෙත් ක්‍රියාත්මක කිරිම / සහතිකරණය** | | | |

| වැඩසටහන / ව්‍යාපෘතිය | වෙන් කළ මුදල (රු.මි.) | වැය කළ මුදල (රු.මි.) | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|
| 4.1 කාබනික සහ කෘෂි කාර්මික පිළිවෙත්(GAP) කෘෂි ප්‍රමිති සහතිකලත් වගාවන් ප්‍රවර්ධන වැඩසටහන | 0.30 | 0.02 | සහතික 03ක් ලබා දී ඇති අතර, වැඩසටහන් 03 ක් පවත්වා ඇත. |
| 4.2 උචිත තාක්ෂණය භාවිතයෙන් අපනයන කෘෂි බෝග ගුණාත්මය වැඩි දියුණු කිරිම | 20.00 | 30.30 | ඒකක 144 ක් හා මධ්‍යස්ථාන 02ක් සම්පූර්ණ කර ඇත |
| 4.3 අලෙවි ප්‍රවර්ධන වැඩසටහන | 20.00 | 11.72 | එක් වැඩසටහනක් පවත්වා ඇත |
| 4.4 යහපත් කෘෂිකාර්මික පිළිවෙත් ක්‍රියාත්මක කිරිම / සහතිකරණය | 1.00 | 0 | සහතික 02ක් ලබා දී ඇත. |
| 4.5පාර්ශ්වකරුවන් ලියාපදිංචි කිරීමේ වැඩසටහන | - | - | - |
| | - | - | 745ක් ලියාපදිංචි වී ඇත. |
| 4.6ව්‍යවසායකත්ව සහ ව්‍යාපාර සංවර්ධන වැඩසටහන | 0.50 | 0.11 | දැනුවත් කිරීමේ වැඩමුළු 02 ක් පවත්වන ලදී |
| | - | - | - |
| | 2.00 | - | - |
| **05. අපනයන කෘෂිබෝග ප්‍රවර්ධනය** | | | |
| 5.0 ජනමාධ්‍ය හා ප්‍රදර්ශන හරහා අපනයන කෘෂිබෝග ප්‍රවර්ධනය | 20.00 | 20.52 | රූපවාහිනි වැඩසටහන් 51 ක් හා ගුවන් විදුලි වැඩසටහන් 111, විකාශය කර ඇත. වෙනත් වැඩසටහන් 45 ක් සම්පූර්ණ කර ඇත. ප්‍රදර්ශන 08 ක් පවත්වා ඇත. අත්පත්‍රිකා 500 ක්, පෝස්ටර් සහ බැනර් 197 මුද්‍රණය කර ඇත. වෙළඳ දැන්වීම් 03ක් විකාශය කර ඇත. |
| **06. අපනයන කෘෂිකාර්මික භෝග පාර්ශ්වකරුවන්ගේ නිපුණතා සංවර්ධනය කිරීමේ වැඩසටහන** | | | |
| 6.1. අපනයන කෘෂිකාර්මික භෝග පාර්ශ්වකරුවන්ගේ නිපුණතා සංවර්ධනය කිරීමේ වැඩසටහන | 5.00 | 3.74 | ගොවි පුහුණු වැඩසටහන් 2,230 ක් පවත්වා ඇත. ක්ෂේත්‍ර දින වැඩසටහන් 234 ක් පවත්වා ඇත. (ප්‍රතිලාභීන් 56,161 ක් සහභාගී වී ඇත). |
| 6.2. සේවා සංස්කරණ පුහුණු වැඩසටහන් | 2.00 | 1.14 | නිලධාරි පුහුණු වැඩසටහන් 18 ක් හා වෙනත් පුහුණු කිරීම් 16 ක් පවත්වා ඇත. ගොවි පුහුණු 01 ක්, සම්මන්ත්‍රණ හා වැඩමුළු 03 ක් පවත්වා ඇත. |
| 6.3. ඩිජිටල් ව්‍යාප්ති වැඩසටහන් සඳහා පහසුකම් සැලසීම සහ ක්‍රියාත්මක කිරීම. | 1.00 | 0 | - |
| | - | - | වැඩසටහන් 21 ක් පවත්වා ඇත. |

| වැඩසටහන / ව්‍යාපෘතිය | වෙන් කළ මුදල (රු.මි.) | වැය කළ මුදල (රු.මි.) | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|
| 6.4. කුරුඳු වගා ප්‍රවර්ධන වැඩසටන | 63.16 | 85.27 | කුරුඳු හෙක්ටයාර 458.53 ක් සඳහා පැළ නිකුත් කර ඇත |

- **අපනයන කෘෂිභෝග සංවර්ධන වැඩසටහනේ සහ අපනයන කෘෂි භෝග පර්යේෂණ හා සමෝධානික රෝග / පළිබෝධ පාලන ව්‍යාපෘතියේ ( 2001, 2104, 2105, 2506, 2002, 2003, 2102, 2103 සහ 2401 වැය ශීර්ෂයන්ට අදාළව) 2024.12.31 දිනට ප්‍රගතිය**

| වැඩසටහන / ව්‍යාපෘතිය | වෙන් කළ මුදල (රු.මි.) | වැය කළ මුදල (රු.මි.) | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ අළුත්වැඩියා කිරීම | 4.00 | 1.21 | ඡායා පිටපත් යන්ත්‍ර 11, පරිඝනක 11 ක් හා UPS 05 ක්, ලැප්ටොප් 02ක්, වීදුරු කපන යන්ත්‍ර 01ක්, වතුර මෝටර් 02ක් අළුත්වැඩියා කර ඇත. |
| | 1.00 | 0.82 | අළුත්වැඩියා කිරීම් 05 ක් සිදුකර ඇත. |
| වාහන අළුත්වැඩියාව | 9.00 | 6.64 | වාහන 57 ක් අළුත්වැඩියා කර සහ ටයර් මිල දී ගෙන ඇත |
| | 3.00 | 4.72 | වාහන අළුත්වැඩියාවන් 34 ක් සිදුකර ඇත. |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ මිල දී ගැනීම | 4.00 | 3.86 | UPS 01, උණු වතුර කරාම 01, ජල පිරිපහදු යන්ත්‍ර 01 ක් හා විදුලි පංකා 15, ෆැක්ස් යන්ත්‍ර 04, ඩිජිටල් තිර 02, මුද්‍රණ යන්ත්‍ර 04, ඡායා පිටපත් යන්ත්‍ර 03, ජෙනරේටර් බැටරි 01, PA system 01ක්, මොනිටර් 02ක්, තරාදි 01ක්, ගෑස් කුකර් පද්ධති 01, ලැප්ටොප් 02ක් මිළදී ගෙන ඇත. |
| | 1.00 | 0.66 | මිල දී ගැනීම් 10 ක් සිදුකර ඇත. |
| කාර්යාලයීය උපකරණ මිල දී ගැනීම | 3.50 | 3.13 | UPS 06, කාර්යාල ලිපිගොනු කබඩ් 01, විධායක මේස 02, විධායක පුටු 01 ක් හා අමුත්තන්ගේ පුටු 02, මොනිටර් 02ක් ලැප්ටොප් පරිගනක 05, ඩෙස්ක්ටොප් පරිගනක 07 ක් හා දෘඩ තැටි 01 ක් මිල දී ගෙන ඇත. |
| | 1.50 | 1.50 | මිල දී ගැනීම් 18 ක් සිදුකර ඇත. |
| කුසලතා සංවර්ධන හා පුහුණු වැඩසටහන | 1.00 | 0.48 | නිලධාරීන් 669 ක් සඳහා පුහුණුව ලබාදී ඇත. |
| අපනයන කෘෂි භෝග පර්යේෂණ හා සමෝධානික රෝග / පළිබෝධ පාලන ව්‍යාපෘතිය | | | |
| පර්යේෂණ හා සංවර්ධන සහාය වැඩසටහන් | 18.00 | 13.17 | පර්යේෂණ අවශ්‍යතාවයන් 49 ක් මිලදී ගෙන ඇත |

- ඉදිකිරීම් හා අළුත්වැඩියාවන්ට අදාළව 2001, 2104, 2105 සහ 2506 වැය ශීර්ෂයන් යටතේ ව්‍යාපෘති 70ක් ක්‍රියාත්මක කර ඇති අතර භෞතික සහ මූල්‍ය ප්‍රගතිය 100%ක් වාර්තා කර ඇත.

ඡායාරූප අංක 59 - 60

## 04. ජාතික පසු අස්වනු කළමනාකරණ ආයතනය

වර්ෂ 1972 අංක 11 දරණ රාජ්‍ය කෘෂිකාර්මික ව්‍යවස්ථා පනතෙහි ප්‍රතිපාදනයන් යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1137/10 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනය මඟින් 2000 වර්ෂයේ ජූනි 19 වැනි දින පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය පිහිටුවන ලදී. 2018.10.27 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2093/26 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනය මඟින් ආයතනයේ නම ජාතික පසු අස්වනු කළමනාකරණ ආයතනය ලෙස වෙනස් කරන ලදී.

වසර 2025 වන විට කෘෂි බෝගවල පසු අස්වනු හානිය, කල් තබා ගත හැකි බෝගවල 5% දක්වාත් කල් තබා ගත නොහැකි බෝගවල 25% දක්වාත් අවම කිරීම හා කෘෂි ආශ්‍රිත කර්මාන්ත ස්ථාපිත කිරීම/ සංවර්ධනය කිරීම ආයතනයේ ප්‍රධාන අරමුණු වන අතර ඒ සඳහා අවශ්‍ය පර්යේෂණ හා සංවර්ධන කටයුතු, තාක්ෂණ ප්‍රචාරණ කටයුතු, තාක්ෂණික උපදේශක සේවා හා රසායනාගාර සේවා සිදු කිරීම ආයතනයේ ප්‍රධාන කාර්යභාරය වේ.

### 4.1. 2025 වර්ෂයේ මූල්‍ය ඉලක්ක

| අ/අ | ප්‍රධාන සංවර්ධන වැඩසටහන | ඇස්තමේන්තු මුදල (රු.මි.) |
|---|---|---|
| 1 | ප්‍රාග්ධන වියදම් | 33.05 |
| 2 | පුනරාවර්තන වියදම් | 187.95 |

### 4.2. 2025 වර්ෂයේ භෞතික ඉලක්ක

| අ/අ | වැඩසටහන | මිනුම් ඒකකය | ඉලක්කය | මුළු පිරිවැය (රු.මි.) |
|---|---|---|---|---|
| 1 | පර්යේෂණ | පසු අස්වනු ක්ෂේත්‍රයේ ගැටළු විසඳීම සඳහා හඳුනා ගන්නා නව තාක්ෂණයන් | පර්යේෂණ ව්‍යාපෘති 15ක් ක්‍රියාත්මක කිරීම හා නව තාක්ෂණ හඳුනා ගැනීම | 11.23 |
| 2 | සංවර්ධන ව්‍යාපෘති | ක්ෂේත්‍රයේ ස්ථාපිත කළ නිවැරදි පසු අස්වනු තාක්ෂණයන් | | |
| 2.1 | එළවළු පලතුරු ප්‍රවාහනයේදී සිදුවන පසු අස්වනු හානිය අවම කිරීම සඳහා සුරක්ෂිත ඇසුරුම් හඳුන්වා දීම | | සැපයුම් දාම පාර්ශවකරුවන් වෙත සුරක්ෂිත ඇසුරුම් 29000ක් ලබා දීම (වර්ග 2කින්), | 67.62 |

| අ/අ | වැඩසටහන | මිනුම් ඒකකය | ඉලක්කය | මුළු පිරිවැය (රු.මි.) |
|---|---|---|---|---|
| 2.2 | ග්‍රාමීය මට්ටමේ සහල් සැනසුම් කර්මාන්ත ඇතිකිරීම | ප්‍රමාණය හා පසු අස්වනු හානිය අවම කළ ප්‍රතිශතය | දිවයින පුරා තෝරා ගත් ප්‍රදේශවල, ගෘහස්ථ මට්ටමේ සහල් සැකසුම් ඒකක 75ක් ස්ථාපිත කිරීම | 5.92 |
| 2.3 | ග්‍රාමීය මට්ටමේ කුළුබඩු සැකසීමේ ක්ෂුද්‍ර ව්‍යවසායකයින් හඳුන්වාදීම | | කුළුබඩු සැකසීමේ ඒකක 10ක් ස්ථාපිත කිරීම | 1.71 |
| 2.4 | භූ ගෝලීය පසුබිම මත පදනම්ව අස්වනු සැකසුම් ඒකක ස්ථාපිත කිරීම | | වෙනත් පසු අස්වනු සැකසුම් ඒකක 10 ස්ථාපිත කිරීම, | 2.50 |
| 2.5 | ගොවීන්ගේ ආදායම් ඉහළ නැංවීම සඳහා සහල් බඩඉරිඟු හා ධාන්‍ය වර්ග ගබඩාකිරීමට ගෘහස්ථ ගබඩා වැඩිදියුණු කිරීම | | ධාන්‍ය වර්ග ගබඩාකිරීමට ගෘහස්ථ ගබඩා 100 ක් වැඩිදියුණු කිරීම | 5.05 |

### 4.3. 2024.12.31 දිනට ආයතනයේ වැඩසටහන් වල මූල්‍ය ප්‍රගතිය

| අ/අ | වැඩසටහන | 2024 වර්ෂය සඳහා වෙන් කළ මුදල (රු.මි.) | 2024.12.31 දක්වා වියදම් කළ මුදල (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| 1 | ප්‍රාග්ධන වියදම් | 35.00 | 25.30 | 72 |
| 2 | පුනරාවර්තන වියදම් | 171.38 | 139.95 | 82 |
| | | | | |
| | සංවර්ධන වැඩසටහන් | 32.70 | 26.45 | 81 |

### 4.4. 2024.12.31 දිනට සංවර්ධන වැඩසටහන්වල භෞතික ප්‍රගතිය

| ව්‍යාපෘතිය | අරමුණ | ප්‍රගතිය | | | | ක්‍රියාත්මක වූ දිස්ත්‍රික්ක |
|---|---|---|---|---|---|---|
| | | මූල්‍ය ඉලක්කය | මූල්‍ය ප්‍රගතිය | භෞතික ඉලක්කය | භෞතික ප්‍රගතිය | |
| වැය විෂය -118-02-03-083-2506 යටතේ ක්‍රියාත්මක කළ සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය | | | | | | |
| 1. ග්‍රාමීයව ගෘහස්ථ මට්ටමේ සහල් සැකසුම් කර්මාන්ත ඇති කිරීම. | ගොවියා සිය වී අස්වැන්න අලෙවි නොකර ඒ සඳහා අගය එකතු කිරීමක් කොට සහල් ලෙස වෙළඳ පලට එක් කිරීම මඟින් ඔහුගේ ආර්ථිකය සවිමත් කිරීම | රු.මි. 4.96 | රු.මි. 4.51 | සහල් සැකසුම් ඒකක 83ක් ස්ථාපිත කිරීම. | ප්‍රතිලාභීන් 83ක් සඳහා සහල් සැකසුම් ඒකක ස්ථාපිත කරන ලදී | අනුරාධපුර, කුරුණෑගල, පුත්තලම, අම්පාර, මහනුවර, නුවරඑළිය සහ මුලතිව් |

| ව්‍යාපෘතිය | අරමුණ | ප්‍රගතිය | | | | ක්‍රියාත්මක වූ දිස්ත්‍රික්ක |
|---|---|---|---|---|---|---|
| | | මූල්‍ය ඉලක්කය | මූල්‍ය ප්‍රගතිය | භෞතික ඉලක්කය | භෞතික ප්‍රගතිය | |
| 2. ගොවීන්ගේ ආදායම් ඉහල නැංවීම සඳහා සහල් බඩඉරිඟු හා ධාන්‍ය වර්ග ගබඩාකිරීම ට ගෘහස්ථ ගබඩා වැඩිදියුණු කිරීම. | සමස්ථ ධාන්‍ය පසු අස්වනු වානිය 10-12%ත් අර අගයක් ගන්නා අතර එයින් 6%ක්ම සිදු වන්නේ ගබඩාකරණ යේ දී වන පසු අස්වනු හානිය අවම කිරීම. | රු.මි. 5.15 | රු.මි. 4.84 | ගෘහස්ථ ගබඩා 105 ක් වැඩිදියුණු කිරීම | ගබඩා 105ක් වැඩි දියුණු කොට ඇත. | අනුරාධපුර, අම්පාර, මුලතිව්, මහනුවර, කුරුණෑගල හා හම්බන්තොට |
| 3. ග්‍රාමීය මට්ටමේ කුළුබඩු සැකසීමේ ක්ෂුද්‍ර ව්‍යවසායකයි න් හඳුන්වා දීම | කුඩා/මධ්‍යම මට්ටමේ කුළුබඩු සැකසීමේ තාක්ෂණය ව්‍යාප්ත කිරීම තුලින් ග්‍රාමීය මට්ටමේ කුළුබඩු සැකසීමේ ක්ෂුද්‍ර ව්‍යවසායකයි න් බිහිකිරීම. | රු.මි. 1.74 | රු.මි. 1.33 | කුළුබඩු සැකසීමේ ඒකක 14 | කුළුබඩු සැකසීමේ ඒකක 14 ස්ථාපිත කොට ඇත | අනුරාධපුර ය, කුරුණෑගල, අම්පාර, මහනුවර, හම්බන්තොට, නුවර එළිය සහ මුලතිව් |
| 4. පලතුරු සැපයුම්දාම යේ පාර්ශ්වකරු වන් සවිබල ගැන්වීම සඳහා පලතුරු සැකසුම් මධ්‍යස්ථාන යක් ස්ථාපිත කිරීම | හම්බන්තොට දිස්ත්‍රික්කයේ පලතුරු පල්ප සැකසීමේ මධ්‍යස්ථානය ක් පිහිටුවන ලද අතර එමඟින් එම ප්‍රදේශයේ වගා කෙරෙන අඹ, සියඹලා, දිවුල් , පැෂන් ෆෘට් වැනි පලතුරු බෝග වල පල්ප සකසා දේශීය මෙන්ම විදේශීය වෙළඳපලට ඉදිරිපත් | රු.මි. 18.35 | රු.මි. 13.34 | | මෙම මධ්‍යස්ථානය මඟින් මේ වන විට පල්ප අපනයනය සිදු කිරීම අරඹා ඇත. | හම්බන්තොට |

| ව්‍යාපෘතිය | අරමුණ | ප්‍රගතිය | | | | ක්‍රියාත්මක වූ දිස්ත්‍රික්ක |
|---|---|---|---|---|---|---|
| | | මූල්‍ය ඉලක්කය | මූල්‍ය ප්‍රගතිය | භෞතික ඉලක්කය | භෞතික ප්‍රගතිය | |
| | කිරීම තුලින් ආදායම් උත්පාදනය. | | | | | |
| 5. කෘෂි සැපයුම් දාමයේ පාර්ශ්වකරු වන් සවිබල ගැන්වීම සඳහා දිවයිනේ එක් එක් ප්‍රදේශ වල විභවය පදනම් කොට ගත් පසු අස්වනු සැකසුම් මධ්‍යස්ථාන පිහිටුවීම | එක් එක් පෙදෙස් වල වැවෙන බෝග හා ඒ පෙදෙස් වල පවතින වෙළඳපල විභවය අධ්‍යයනය කොට නව ව්‍යවසායකයි න් බිහිකිරීම. | 2.50 | 2.23 | සැකසුම් ඒකක 7 | පසු අස්වනු සැකසුම් ඒකක 8ක් ස්ථාපිත කරන ලදී. මේ අනුව පලතුරු සැකසුම් ඒකක 3ක්, පලතුරු එළවළු වියලන ඒකක 2ක්. සහල් ආශ්‍රිත අයිස් ක්‍රීම් නිෂ්පාදන ඒකක 01ක්ද කුළුබඩු ආශ්‍රිත නිෂ්පාදන ඒකක 2ක් ද දිවයිනේ දිස්ත්‍රික්ක 7ක පිහිටුවා ඇත. | හම්බන්තොට, අනුරාධපුර, කුරුණෑගල, මොනරාගල, මහනුවර, නුවරඑළිය, ගම්පහ, යාපනය, අම්පාර, පුත්තලම. |
| **පුනරාවර්ථන වියදම් (වැය විෂය - 118-02-03-073-1509) යටතේ ක්‍රියාත්මක කළ වැඩසටහන්වල ප්‍රගතිය** | | | | | | |
| පසු අස්වනු තාක්ෂණය ප්‍රචලිත කිරීම සඳහා පුහුණු වැඩසටහන් | නිවැරදි සහ යෝග්‍ය පසු අස්වනු තාක්ෂණයන් ක්ෂේත්‍රයේ භාවිතය සඳහා හඳුන්වා දීම සහ ඒ සඳහා සැපයුම් හා අගයදාම පාර්ශ්වකරුව න් පුහුණු කිරීම තාක්ෂණ ප්‍රචාරණ කටයුතු හරහා සිදු කිරීම | | | නිවැරදි පසු අස්වනු තාක්ෂණය භාවිතය පිළිබඳ පුහුණු පාඨමාලා (නේවාසික හා ක්ෂේත්‍ර වැඩසටහන් ලෙස) 100ක් පැවැත්වීම හරහා ප්‍රතිලාභීන් 2000ක් පුහුණු කිරීම, පසු අස්වනු ක්ෂේත්‍රය සඳහා නව ව්‍යවසායක යින් බිහි කිරීම | නේවාසික හා ක්ෂේත්‍ර පුහුණු වැඩසටහන් 160ක් පවත්වා පුද්ගලයින් 3470 දෙනෙක් (ගොවීන්, ගෙවිලියන් සහ ගොවි සංවිධාන සාමාජිකයින්ද, කුඩා හා මධ්‍ය පරිමාණ කෘෂි නිෂ්පාදන එක්රැස් කරන්නන්ද, ප්‍රවාහනය කරන්නන් සහ වෙළෙන්දන් ද ව්‍යවසායකයින්, කෘෂි නිෂ්පාදන සකස් කරන්නන් රාජ්‍ය, සමුපකාර, පෞද්ගලික සහ රාජ්‍ය නොවන සංවිධාන ව්‍යාප්ති නිලධාරින් ද වශයෙන්) නිවැරදි පසු අස්වනු | |

| ව්‍යාපෘතිය | අරමුණ | ප්‍රගතිය | | | | ක්‍රියාත්මක වූ දිස්ත්‍රික්ක |
|---|---|---|---|---|---|---|
| | | මූල්‍ය ඉලක්කය | මූල්‍ය ප්‍රගතිය | භෞතික ඉලක්කය | භෞතික ප්‍රගතිය | |
| | | | | | ක්‍රියාකාරකම් පිළිබඳව පුහුණු කොට ඇත. නව ව්‍යවසායකයින් 15ක් බිහි කොට ඇත. | |

ඡායාරූප අංක 61 - 62

## 05. හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය (HARTI)

### 5.1. හැඳින්වීම

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය (HARTI) 1972 අංක 05 දරණ පාර්ලිමේන්තු පනතින් ස්ථාපනය කරන ලදි. ගොවි කටයුතු සහ ග්‍රාමීය සංවර්ධනයට අදාළ සමාජ ආර්ථික පර්යේෂණ සිදුකිරීම සහ එම පර්යේෂණයන්හි සොයා ගැනීම්, ප්‍රතිපත්තිමය තීරණ ගැනීම පිණිස ප්‍රතිපත්ති සම්පාදකයින් වෙත යොමු කිරීම ආයතනයේ ප්‍රධාන කාර්යභාරයකි. සමාජ ආර්ථික හා ග්‍රාමීය සංවර්ධනයේ කෘෂිකාර්මික පැතිකඩ පිළිබඳ විමර්ශනය කිරීමට බලය පැවරී ඇති එකම ආයතනය ද වේ.

### 5.2. දැක්ම

තිරසාර ගොවිජන හා ග්‍රාමීය සංවර්ධනය සඳහා දැනුම ජනනය කර බෙදාහැරීමේ ප්‍රමුඛයා වීම.

### 5.3. මෙහෙවර

පර්යේෂණ හා පුහුණු කිරීම් තුළින් ගොවිජන හා ග්‍රාමීය ක්ෂේත්‍රය ශක්තිමත් කිරීම.

### 5.4. 2025 වර්ෂයේ මූල්‍ය ඉලක්ක

| අ/අ | ප්‍රධාන සංවර්ධන වැඩසටහන | ඇස්තමේන්තු මුදල (රු.මි.) |
|---|---|---|
| 1 | පුනරාවර්තන වියදම් | 330.15 |
| 2 | ප්‍රාග්ධන වියදම් | 38.00 |

### 5.5. 2025 වර්ෂයේ භෞතික ඉලක්ක (ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් හා ව්‍යාපෘති)

| අ/අ | වැඩසටහන | මිනුම් ඒකකය | ඉලක්ක | මුළු පිරිවැය (රු.මි.) |
|---|---|---|---|---|
| 1. | ගොවිජන සහ ග්‍රාමීය ක්ෂේත්‍රය ආවරණය වන පරිදි පර්යේෂණ පැවැත්වීම (අදාළ ක්ෂේත්‍ර හඳුනා ගනිමින් මේ වන විට සැලසුම් සකස් කරමින් පවතී). | පර්යේෂණ වාර්තා | 100 | 23.00 |
| 2. | අධ්‍යාපන හා පුහුණු | පුහුණු වැඩසටහන් සංඛ්‍යාව | 100 | 5.00 |

| අ/අ | වැඩසටහන | මිනුම් ඒකකය | ඉලක්ක | මුළු පිරිවැය (රු.මි.) |
|---|---|---|---|---|
| 3. | තොරතුරු සහ සංනිවේදනය | | 100 | 5.00 |
| 4. | පර්යේෂණ පුහුණු කටයුතු සඳහා සම්පත් | | 100 | 5.00 |
| | එකතුව | | | **38.00** |

## 5.6. 2024.12.31 දිනට ආයතනයේ වැඩසටහන්වල මූල්‍ය ප්‍රගතිය

| අ/ආ | වැඩසටහන | 2024 වර්ෂයට වෙන් කල මුදල (රු.මි) | 2024.12.31 දක්වා වියදම් කළ මුදල (රු.මි) | මූල්‍ය ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| 1 | පුනරාවර්තන වියදම් | 207.30 | 189.5 | 91 |
| 2 | ප්‍රාග්ධන වියදම් | 30.00 | 24.47 | 81 |
| | බාහිර අරමුදල් ඇති **ව්‍යාපෘති** | | | |
| 1 | ගොවීන් සහ එකතුකරන්නන් අතර වන ගිවිසුම් යටතේ අඹ අස්වනු හානිය තක්සේරු කිරීම සඳහා වන අධ්‍යනය (UoP) | 1.00 | 0.72 | 72 |
| 2 | ද්විත්ව වෙබ් අඩවි ස්ථාපනය සහ නඩත්තු කිරීම(Govimina Agri Hub.lk & Govimina Agri Hub.Com (DevPro Guaranty Ltd) | 1.09 | 0.70 | 70 |
| 3 | ගුණාත්මක බීජ සහ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය, තත්ත්ව සහතිකකරණය සහ අලෙවිකරණ පද්ධතිය ශක්තිමත් කිරීම පිළිබඳ ව්‍යාපෘතිය (FAO) | 7.52 | 2.01 | 27 |
| 4 | FRESH අරමුණු (International Food Policy Research Institute) | 3.67 | 1.02 | 28 |
| 5 | ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික නිෂ්පාදනවල වියදම් හා ලාභාංශය (unique land use GmbH) | 2.20 | 2.20 | 100 |

පර්යේෂණ අධ්‍යයන සහ පුහුණු වැඩසටහන් ලැයිස්තුව සහ එහි ප්‍රගතිය 5.7 සහ 5.8 වගුවල දක්වා තිබේ.

## 5.7. පර්යේෂණ අධ්‍යයන

| අ/අ | ව්‍යාපෘතිය | මූල්‍ය (රු.මි.) | | භෞතික (%) | |
|---|---|---|---|---|---|
| | | ඉලක්ක | ප්‍රගතිය | ඉලක්ක | ප්‍රගතිය |
| 1 | ශ්‍රී ලංකාවේ තිරසාර ජීවනෝපාය ඉහළ නැංවීම සඳහා කෘෂි-සංචාරක කර්මාන්තය යොදාගැනීම | 1.20 | 1.29 | 100 | 75 |
| 2 | නවක කෘෂි ව්‍යාපාරයන්හි ප්‍රගමනය: තිරසාර ව්‍යවසායකත්නව සඳහා ඵලදායී මැදිහත්වීම් සැලසුම් කිරීම | 1.68 | 1.75 | 100 | 75 |
| 3 | ශ්‍රී ලංකාවේ නාගරික අංශයේ පාසල් ළමුන්ගේ ආහාර පරිභෝජන රටාව: සෞඛ්‍ය සම්පන්න ආහාර පුරුදු සඳහා පවතින බාධක, බලපෑම හා විභවතා පිළිබඳ අධ්‍යයනය | 1.10 | 1.15 | 100 | 75 |

| අ/අ | ව්‍යාපෘතිය | මූල්‍ය (රු.මි.) | | භෞතික (%) | |
|---|---|---|---|---|---|
| | | ඉලක්ක | ප්‍රගතිය | ඉලක්ක | ප්‍රගතිය |
| 4 | අඹ සහ අන්නාසි අගය දාමවල ගොවීන් සහ එකතුකරන්නන් අතර වන ගිවිසුම් පිළිබඳ අධ්‍යනය | 1.50 | 1.10 | 100 | 75 |
| 5 | ශ්‍රී ලංකාවේ විශේෂිත ආර්ථික මධ්‍යස්ථානවල ක්‍රියාකාරිත්වය හා තිරසරභාවය පිළිබඳ අධ්‍යයනය | 2.09 | 1.50 | 55 | 50 |
| 6 | පොහොරවලින් ඔබ්බට: ඉහල වී නිෂ්පාදනයක් සඳහා තිරසර පෝෂක කළමනාකරණය පිලිබඳ අධ්‍යනය | 1.52 | 1.31 | 100 | 75 |
| 7 | ශ්‍රී ලංකාවේ වී ගොවිතැන කෙරෙහි දේශගුණික තත්ත්වයන්හි ඔරොත්තු දීමේ හැකියාවන් සඳහා වන පුරෝකථනයන්ට ගොවීන්ගේ අනුගත වීම අධ්‍යනය | 1.20 | 1.10 | 100 | 75 |
| 8 | පෝෂක ආහාර මෙනු සඳහා වියදම් සහ ඉවසිය හැකිභාවය: පෝෂණ තත්ත්ව විශ්ලේෂණය සහ බහු-මාර්ගික ප්‍රතිපත්ති හා පද්ධති වෙනස්කම්වල දෙසට පියවර ගැනීමේ තීරණ කිරීම ශක්තිමත් කිරීමට විවේචනාත්මක ආකාරය. | - | - | 100 | 75 |
| 9 | පහත රට තෙත් කලාපයේ සහල් මූලික පාරිසරික පද්ධතියේ සහභාගී සංරක්ෂණය සහ නිෂ්පාදන ශක්තිමත් කිරීම | 0.50 | 0.33 | 100 | 70 |
| 10 | වර්මි කොම්පෝස්ට් සහ කාබනික ද්‍රව පොහොර නිෂ්පාදනය සහ ගොවිතැනේ යෙදීම ප්‍රවර්ධනය කිරීම | 0.80 | 0.74 | 100 | 100 |
| 11 | පළතුරු සහ එළවළු සැපයුම් දාමවල ප්ලාස්ටික් කූඩ භාවිතය: එහි කාර්යක්ෂමතාවය ඇගයීම | 0.93 | 0.85 | 100 | 60 |
| 12 | ඩිජිටල් විභවය අගුළු හැරීම: ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අංශයේ ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති ප්‍රගතිය සඳහා වන අභියෝග සහ උපායමාර්ග | 0.80 | 4.90 | 70 | 60 |

## 5.8. 2024 වර්ෂය සඳහා පුහුණු වැඩටහන්

| | පුහුණු වැඩටහන් | මූල්‍ය (රු.මි.) | | භෞතික (%) | |
|---|---|---|---|---|---|
| | | ඉලක්ක | ප්‍රගතිය | ඉලක්ක | ප්‍රගතිය |
| 1 | කෘෂි ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන (පළමු අදියර)<br>කෘෂි ව්‍යවසායකත්ව ගොඩනැඟීම සඳහා තරුණ ප්‍රජාව සවිබල ගැන්වීමේ තෙදින පුහුණු වැඩසටහන | 1.4 | 1.17 | 100 | 100 |
| 2 | ගෘහ ඒකකයන්හි ආහාර සුරක්ෂිතතාවය පවත්වාගෙන යාම | 1.4 | 1.59 | 100 | 100 |
| 3 | ගොවි සංවිධාන ශක්තිමත් කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන | 2.2 | 1.71 | 100 | 100 |

**5.9. 2024.12.31 දිනට සංවර්ධන වැඩසටහන්වල භෞතික ප්‍රගතිය**

2024 දී ගොවිජන අංශයේ විවිධ අංශ ඉලක්ක කර ගනිමින් අයවැය ප්‍රතිපාදන යොදා ගනිමින් පර්යේෂණ අධ්‍යයන එකොළහක් ආරම්භ කරන ලදී. මෙම අධ්‍යයනයන් ග්‍රාමීය සංවර්ධනය සහ තිරසාර කෘෂිකර්මාන්තය කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් මාතෘකා කිහිපයක් යටතේ ක්‍රියත්මක විය.

**ග්‍රාමීය අංශ සංවර්ධනය:** ග්‍රාමීය ආර්ථිකය තුළ නැගී එන අංශ ගවේෂණය කිරීම සඳහා අධ්‍යයන දෙකක් දියත් කරන ලදී - කෘෂි සංචාරක ව්‍යාපාරය සහ නවක කෘෂි ව්‍යාපාරයන්හි ප්‍රගමනය; තිරසාර ව්‍යවසායකත්වය සඳහා ඵලදායී මැදිහත්වීම් සැලසුම් කිරීම. 2024 දෙසැම්බර් අවසානය වන විට, අධ්‍යයනයන් 75% භෞතික ප්‍රගතියක් ලබා ඇත.

**ආහාර සහ පෝෂණ සුරක්ෂිතතාව:** ශ්‍රී ලංකාව ඇතුළු බොහෝ රටවල් මුහුණ දෙන අභියෝගයක් වන ආහාර සහ පෝෂණ සුරක්ෂිතතාව සහතික කිරීම ආර්ථික සැලසුම් වල මූලික අරමුණකි. මෙකී අංශය ඉලක්ක කර ගනිමින් ප්‍රතිපත්ති නිර්දේශ සැපයීම සඳහා, අධ්‍යයන දෙකක් 2024 දී ආරම්භ කරන ලදී. පළමුවැන්න, අනාගත ආහාර ඉල්ලුම හැඩගැස්වීමේ තීරණාත්මක ජන විකාශයක් වන නාගරික යෞවනයන් අතර ආහාර පරිභෝජන රටා සහ හැසිරීම් පරීක්ෂා කරයි. දෙවන අධ්‍යනයෙන් අවධානය යොමු කරන්නේ තිරසාර ආහාර ප්‍රතිපත්ති නිර්මාණය කිරීම සඳහා අත්‍යවශ්‍යය පෝෂ්‍යදායී ආහාරවල පිරිවැය සහ දැරිය හැකි මිල ගණන් කිරීම කෙරෙහි ය. මෙම අධ්‍යයනවල භෞතික ප්‍රගතිය 75% ක් වේ.

**දේශගුණික සුහුරු කෘෂිකර්මාන්තය:** දේශගුණික සුහුරු කෘෂිකාර්මික විසඳුම් ක්‍රියාවට නැංවීම අරමුණු කරගනිමින් අධ්‍යයන හතරකට 2024 දී ප්‍රමුඛත්වය දී ඇත. මෙම අධ්‍යයනයන් දේශගුණික විපර්යාසවලට ගොවීන් අනුවර්තනය වීම, තිරසාර පෝෂක කළමනාකරණය සහ පරිසර හිතකාමීත්වය අවබෝධ කර ගැනීම කෙරෙහි අවධානය යොමු කරයි.

1. **ශ්‍රී ලංකාවේ වී ගොවිතැන කෙරෙහි දේශගුණික තත්ත්වයන්හි ඔරොත්තු දීමේ හැකියාවන් සඳහා වන පුරෝකථනයන්ට ගොවීන්ගේ අනුගත වීම අධ්‍යයනය -** පූර්ව කාලගුණ අනාවැකි භාවිතා කරමින් ගොවීන් දේශගුණය ආශ්‍රිත වෙනස්කම් වලට අනුගත වන ආකාරය විමර්ශනය කරන මෙම අධ්‍යයනය 75% අවසන් කර ඇත.

2. **ඉහල වී නිෂ්පාදනයක් සඳහා තිරසර පෝෂක කළමනාකරණය පිලිබඳ අධ්‍යයනය-**පෝෂක කළමනාකරණය සඳහා පුළුල් ප්‍රවේශයක් වන මෙම අධ්‍යයනය පාරිසරික සමතුලිතතාවය ප්‍රවර්ධනය කරන අතරම සහල් ඵලදායිතාව වැඩි දියුණු කිරීම අරමුණු කරයි. එය එහි භෞතික ප්‍රගතිය ඉලක්කයෙන් 75%ක් සපුරා ඇත.

3. **පහත රට තෙත් කලාපයේ සහල් මූලික පාරිසරික පද්ධතියේ සහභාගී සංරක්ෂණය සහ නිෂ්පාදන ශක්තිමත් කිරීම-** වී පරිසර පද්ධති සංරක්ෂණය කිරීම සහ ඒවායේ ඵලදායිතාව ඉහළ නැංවීම කෙරෙහි අවධානය යොමු කර ඇති මෙම අධ්‍යනයෙන් 70%ක භෞතික ප්‍රගතියක් ලබා ඇත.

4. **වර්මි කොම්පෝස්ට් සහ කාබනික දියර පොහොර නිෂ්පාදනය සහ ගොවිතැනේ යෙදීම ප්‍රවර්ධනය කිරීම -** කාබනික පොහොර භාවිතය ප්‍රවර්ධනය කිරීම අරමුණු කරගත් මෙම අධ්‍යයනය පරිසර

හිතකාමී කෘෂිකාර්මික පිළිවෙත් වෙත මාරු වීමට සහාය වේ. 2024 දෙසැම්බර් අවසානය වන විට එය එහි භෞතික ඉලක්කවලින් 100% සපුරා ගෙන ඇත.

**වට්නාකම් දාම අධ්‍යයනයන්**: අඹ සහ අන්නාසි අගය දාමවල ගිවිසුම්ගත ගිවිසුම් ගවේෂණය කිරීම සඳහා මෙන් ම ශ්‍රී ලංකාවේ විශේෂ ආර්ථික මධ්‍යස්ථානවල ක්‍රියාකාරීත්වය සහ තිරසාරභාවය පරීක්ෂා කිරීම සඳහා අධ්‍යයන දෙකක් දියත් කරන ලදී. මෙම අධ්‍යයනයන් පිළිවෙලින් 75% සහ 50% භෞතික ප්‍රගතියක් ලබා ඇත.

**වෙළඳපොළ තොරතුරු එක්රැස් කිරීමේ හා බෙදාහැරීමේ ව්‍යාපෘතිය-** කෘෂිකාර්මික වෙළඳපල තොරතුරු, විශේෂයෙන් ආහාර ද්‍රව්‍ය මිල ගණන් එකතු කිරීම, සම්පාදනය කිරීම සහ බෙදා හැරීම, එම කාල සීමාව තුළ එහි 100%ක භෞතික ප්‍රගතියක් වාර්තා විය. සතිපතා ආහාරද්‍රව්‍ය විවරණිකා (සිංහල හා ඉංග්‍රීසි) මාසික තොරතුරු විවරණිකා (ඉංග්‍රීසි) ප්‍රකාශයට පත් විය.

**පුහුණු වැඩටහන්-2024**

2024 වර්ෂය සඳහා පුහුණු වැඩසටහන් හතරක් පැවැත්වීමට සැලසුම් කර තිබූ අතර, මේ වන විට සැසි 43ක් අවසන් කර ඇත. මන්නාරම, වව්නියාව සහ මඩකලපුව යන ප්‍රදේශවල පවත්වන ලද ආහාර සුරක්ෂිතතාව පිළිබඳ එක්දින පුහුණු වැඩසටහන් 19 ක් ඊට ඇතුළත් වන අතර පුහුණු ලාභීන් 753 ක් සහභාගි වී ඇත. ගොවි සංවිධාන ශක්තිමත් කිරීම කෙරෙහි අවධානය යොමු කරන ලද එක්දින දැනුවත් කිරීමේ වැඩසටහන් 20 ක් හම්බන්තොට හා කුරුණෑගල දී පැවත්වූ අතර ඒ සඳහා ගොවීන් 927 ක් සහභාගී විය. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහනේ දෙවන අදියර සඳහා ව්‍යාපාර ආරම්භ කළ පුහුණුලාභීන් 105 දෙනෙකු සහභාගී විය. අමතර ව කෘෂි ව්‍යවසායකයින් ගොඩනැඟීම සඳහා තරුණ ප්‍රජාව සවිබල ගැන්වීම සඳහා පුහුණු වැඩසටහන් ගම්පහ, රත්නපුර සහ මහනුවර පැවැත් වූ අතර තරුණ ප්‍රජාව 73 මෙයට සහභාගී විය.සමස්තයක් වශයෙන්, මෙම පුහුණු වැඩසටහන් 2024 දී සහභාගිවන්නන් 1858 දෙනෙකු පුහුණු කර ඇත.

**2024 සඳහා ප්‍රකාශන:** ආයතනය මේ වසරේ මේ දක්වා පර්යේෂණ වාර්තා තුනක් සහ ප්‍රතිපත්ති සංක්ෂිප්ත නවයක් ප්‍රකාශයට පත් කර ඇත. මීට අමතරව, *Sri Lanka Journal of Agrarian Studies* සඟරාවේ (වෙළුම 20, අංක 1 සහ 2) සහ ගොවි කටයුතු අධ්‍යයනය (වෙළුම 14, අංක 1) නිකුත් කරන ලදී. ‘‘ගොවිජනතා’’ සිංහල සඟරාවේ කලාප දෙකක් (වෙළුම 26, අංක 1-2 සහ 3) මෙන් ම ජාතික අලුත් සහල් මංගල්‍යය 2024 සඳහා විශේෂ ප්‍රකාශනයක් ද පළ විය. මානව-වනජීවී ගැටුම සහ දේශගුණික විපර්යාස පිළිබඳ සිංහල පොත් පිංච වසර තුළ නිකුත් කරන ලදී. තවද, ආයතනය කෙටි වාර්තා චිත්‍රපට 39 ක් (සිංහලෙන් 33 ක් සහ දෙමළෙන් 6 ක් ඇතුළුව) නිෂ්පාදනය කරමින් සිය දැනුම ව්‍යාප්ත කිරීමේ උත්සාහයන් පුළුල් කළේය. ශ්‍රී ලාංකිකයින්ට නවතම පුවත් සහ කෘෂිකාර්මික තාක්ෂණයන් වෙත ප්‍රවේශය ලබාදෙමින් "ගොවිමිණ" වෙබ් අඩවිය දියත් කරන ලදී.

ඡායාරූප අංක 63 - 65

## 06. වී අලෙවි මණ්ඩලය (PMB)

### 6.1. විධිනියෝග අනුව කාර්යයන් වන්නේ

වී ගොවීන්ගේ අලෙවි මිල සහතික කිරීම සඳහා සහතික මිලට වී මිලදී ගැනීම, වී සහ සහල් වෙළඳපොළ මිල ස්ථාවරව පවත්වා ගැනීම, ශ්‍රී ලාංකිකයන් සඳහා ආහාර සුරක්ෂිතතාවය ඇති කිරීම, වී තොග හා සහල් තොග පවත්වා ගැනීම යි.

### 6.2. අරමුණු:

වී සඳහා වෙළඳපොළෙහි ස්ථාවර ඉහළ මිලක් ලබා දීම, සාධාරණ මිලකට සහල් ලබාදීම, සහල් කෙටීම හා ගබඩා කිරීම විධිමත් කිරීම, ගබඩා ධාරිතාව වැඩි කිරීම, භාවිතා නොකරන ලද ගබඩා නැවත ප්‍රතිසංස්කරණය කිරීම, විද්‍යාත්මකව වී ගබඩා කල හැකි නවීන තාක්ෂණයෙන් යුත් ගබඩා ඉදි කර ගැනීම, ආරක්ෂිත තොගය සුරක්ෂිතව තැන්පත් කිරීමට සුදුසු ගබඩා බවට පත් කිරීම යි.

### 6.3. 2025 වර්ෂයේ සංවර්ධන ව්‍යාපෘති

1. වී තොග රැස්කිරීමේ නියාමන කටයුතු
2. සහල් සැකසීමේ කටයුතු නියාමන
3. වී මිලදී ගැනීම, සංරක්ෂණ තොග පවත්වාගෙන යාම හා අලෙවිය

### 6.4. මූල්‍ය හා භෞතික ප්‍රගතිය

- **මූල්‍ය ප්‍රගතිය**

| විස්තරය | වෙන්කළ මුදල (රු.මි ) | වියදම් කළ මුදල (රු.මි) | මූල්‍ය ප්‍රගතියේ ප්‍රතිශතය |
|---|---|---|---|
| ප්‍රාග්ධන | - | - | 0 |
| පුනරාවර්ථන | 184.6 | 174.6 | 95 |
| හිමිකම් දායකත්වය | 2813.67 | 2,813.67 | 100 |

- **භෞතික ප්‍රගතිය**

2023/24 මහ කන්නයේ මහා භාණ්ඩාගාර ප්‍රතිපාදනවලින් කි.ග්‍රෑ. 2,637,826 ක් වී මිල දී ගෙන ඒවා අලෙවි කර මහා භාණ්ඩාගාරයෙන් ලබා ගත් ප්‍රතිපාදන පියවා ඇත.

2024 යල කන්නයේ මහා භාණ්ඩාගාර ප්‍රතිපාදන මත මිලදී ගත් කීරි සම්බා කි.ගෑ. 119, 699 ක තොග අලෙවි කිරීම සඳහා කටයුතු සිදු කරමින් පවතී.

## 07. කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය (AAIB)

### 7.1. පනතට අනුව ආයතනය ;-

හදිසි ආපදා තත්ත්වයන් හමුවේ දේශීය කෘෂිකර්මාන්තය හා කෘෂිකාර්මිකයා සුරක්ෂිත කිරීමෙහිලා රජය වෙත පැවරී ඇති වගකීම ඉටුකිරීම සඳහා 1973 අංක 27 දරණ කෘෂිකර්ම රක්‍ෂණ පනත මඟින් කෘෂිකාර්මික රක්‍ෂණය වෙනුවෙන්ම වූ එකම රාජ්‍ය රක්‍ෂණ ආයතනය වශයෙන් කෘෂිකර්ම රක්‍ෂණ මණ්ඩලය පිහිටුවා ඇත. 1999 අංක 20 දරණ කෘෂිකාර්මික හා ගොවිජන රක්‍ෂණ පනත මඟින් කෘෂිකර්ම රක්‍ෂණ මණ්ඩලය, කෘෂිකාර්මික හා ගොවිජන රක්‍ෂණ මණ්ඩලය ලෙස නැවත ස්ථාපිත කරන ලදී.

### 7.2. කාර්යයන්:-

### 7.2.1. කෘෂිකාර්මික අවදානම් කළමනාකරණය

අවදානම් කළමනාකරණ ක්‍රමවේදයක් වශයෙන් ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ක්‍ෂේත්‍රයට බෝග, පශු, හා සාමාන්‍ය රක්‍ෂණ යන අංශ යටතේ කෘෂි රක්ෂණ ක්‍රමවේද හඳුන්වා දීම මගින් කෘෂිකාර්මික අවදානම් කළමනාකරණ සඳහා දායක වීම, හදිසි ආපදාවකදී ගොවි ජනතාවට සිදුවන ආර්ථික බිඳවැටීම් අවම කරගැනීම සඳහා සහය වීම හා කෘෂිකාර්මික ණය ලබාදෙන මූල්‍ය ආයතනවලට සිය මූල්‍ය ස්ථාවරත්වය වර්ධනය කර ගැනීම සඳහා උපකාරී වීම. මේ යටතේ වගා රක්‍ෂණ යෝජනා ක්‍රම (වී හා අනෙකුත් බෝග), පශු සම්පත් රක්‍ෂණ යෝජනා ක්‍රම, ජීවිත රක්ෂණ යෝජනා ක්‍රම, කෘෂි උපකරණ රක්‍ෂණ යෝජනා ක්‍රමය, ගබඩා රක්‍ෂණ යෝජනා ක්‍රමය, රෝද 2, රෝද 4 ට්‍රැක්ටර් සහ අනෙකුත් තෙවන පාර්ශවීය රක්‍ෂණ යෝජනා ක්‍රම පවතී.

### 7.2.2. සමාජ සුභසාධනය

සමාජ ආරක්ෂණ ක්‍රමවේද හඳුන්වා දීම මඟින්, ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ක්ෂේත්‍රය හා සම්බන්ධව සිටින ගොවීන්ගේ විශ්‍රාමික දිවිය සුරක්ෂිත කිරීමට දායක වීම හා වෛද්‍යාධාර යෝජනා ක්‍රම හරහා රෝහල් ගත වීමකදී ගොවීන් හට මූල්‍යමය සහනයක් ලබා දීම සිදුවේ. මේ යටතේ ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය, ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය, සුවසෙත සෞඛ්‍ය රක්‍ෂණ යෝජනා ක්‍රමය, හදිසි අනතුරු රක්‍ෂණ යෝජනා ක්‍රමය පවතී.

### 7.3. 2025 වර්ෂයේ මූල්‍ය ඉලක්කය

| අ/අා | ප්‍රධාන සංවර්ධන වැඩසටහන | ඇස්තමේන්තු මුදල (රු.මි) |
|---|---|---|
| පුනරාවර්තන | | |
| 01. | ගොවි හා ධීවර විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා (118-02-03-049-1509) | 5,634.40 |
| ප්‍රාග්ධන | | |
| 02. | ප්‍රාග්ධන වියදම (118-02-03-049-2201) | 20.00 |
| 03. | අනිවාර්ය රක්‍ෂණ (118-02-03-43-2202) | 4,516.58 |

**7.4. 2024.12.31 දිනට ආයතනයේ වැඩසටහන් වල මූල්‍ය ප්‍රගතිය**

| අ/අ | වැඩසටහන | 2024 වර්ෂය සඳහා වෙන් කළ මුදල (රු.මි.) | 2024.12.31 දක්වා වියදම් කළ මුදල (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| 1 | ප්‍රාග්ධන | | | |
| | අනිවාර්ය රක්ෂණ (118-02-03-43-2202) | 1,000.00 | 1,000.00 | 100% |
| 2 | පුනරාවර්තන වියදම | | | |
| | ගොවි හා ධීවර විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා (118-02-03-049-1509) | 5,386.00 | 5,011.63 | 93% |

**7.5. 2024.12.31 දිනට සංවර්ධන වැඩසටහන් වල භෞතික ප්‍රගතිය**

**i. ගොවි/ ධීවර විශ්‍රාම වැටුප් හා සාමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම.**

ආර්ථික හා සමාජයීය වශයෙන් තෘප්තිමත් ගොවි හා ධීවර ප්‍රජාවක් ගොඩනැගීම යන අරමුණින් ගොවි/ධීවර විශ්‍රාම වැටුප් හා සාමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමවේදය ක්‍රියාත්මක වේ. ඒ අනුව 2024 වර්ෂයේ දෙසැම්බර් 31 වන විට ධීවර හා ගොවි විශ්‍රාම වැටුප් ලාභීන් 185,438 ක් සඳහා විශ්‍රාම වැටුප් රු. මි. 5,011.63 ක් ගෙවා ඇත.

ඡායාරූප අංක 66

**ii. බෝග 6ක් සඳහා ගොවීන් හට නොමිලේ ක්‍රියාත්මක අනිවාර්ය වගා රක්ෂණ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම**

ශ්‍රී ලංකාව තුළ ප්‍රශස්ත කෘෂි අවදානම් කළමණාකරණ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීමේ අරමුණින්, රාජ්‍ය දායකත්වය යටතේ මූලික බෝග 06ක් (වී, බඩ ඉරිඟු, ලොකු ලූණු, මිරිස්, අර්තාපල්, හා සෝයා) සඳහා ගොවීන් හට නොමිලේ ක්‍රියාත්මක අනිවාර්ය වගා රක්ෂණ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කරනු ලැබේ. 2024 වර්ෂයේ, මුළු දිවයිනම ආවරණය වන පරිදි, 2023/24 මහ කන්නයට හා 2024 යල කන්නයට අදාළව ගොවීන් 78,887 ක ගේ අක්කර 133,852ක් සඳහා රු. මි. 1,790.00 ක වන්දි මුදලක් ලබා දී ඇති අතර මේ සඳහා රජයේ ප්‍රතිපාදන ලෙස රු. මි. 1000.00 ක මුදලක් ලබා දෙන ලදී.

ඡායාරූප අංක 67

## 08. ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව (SLCARP)

### 8.1. හැඳින්වීම

1987 අංක 47 දරන ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභා පනත බලාත්මක කිරීමත් සමඟ කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ 1987 දෙසැම්බර් 22 වන දින ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවපිහිටුවන ලදී. ජාතික කෘෂිකාර්මික පර්යේෂණ පද්ධතිය තුළ හිතකර පරිසරයක් නිර්මාණය කිරීම මඟින් කෘෂිකාර්මික අංශයේ පර්යේෂණ හා සංවර්ධනය ශක්තිමත් කිරීම සඳහා ප්‍රතිපත්ති හා උපාය මාර්ග සංවර්ධනය කිරීම ආයතනයේ පැවරුම් කාර්යභාරය වේ. ප්‍රතිපත්ති සභාවේ ප්‍රධාන කාර්යයන් වනුයේ පර්යේෂණ ප්‍රමුඛතා ක්ෂේත්‍ර හඳුනාගැනීම, අදාළ ක්ෂේත්‍ර පිළිබඳ තොරතුරු හුවමාරු කරගැනීම තුළින් අන්තර්-ක්‍රියාකාරිත්වයට පහසුකම් සැලසීම, පර්යේෂණ සිදු කිරීමේදී ඇති වියහැකි බාධක නිරාකරණය කිරීම සහ අදාළ කම්ටුවල ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීම ආදියයි.

### 8.2. 2025 වර්ෂයේ මූල්‍ය ඉලක්ක

| අ/අ | ප්‍රධාන සංවර්ධන වැඩසටහන | ඇස්තමේන්තු මුදල (රු.මි.) |
|---|---|---|
| 1 | ප්‍රාග්ධන වියදම් | 77.65 |
| 2 | පුනරාවර්තන විදයම් | 93.50 |
| 3 | ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලැස්ම | 56.12 |

### 8.3. 2025 වර්ෂයේ පර්යේෂණ වැඩසටහන්වල භෞතික ඉලක්ක (ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් හා ව්‍යාපෘති)

| අ/අ | වැඩසටහන | මිනුම් ඒකකය | ඉලක්කය | ඒකක පිරිවැය (රු.මි.) | මුළු පිරිවැය (රු.මි.) |
|---|---|---|---|---|---|
| 01 | 2025 සඳහා ජාතික කෘෂිකාර්මික පර්යේෂණ පද්ධතිය සඳහා ආයතනවලින් පර්යේෂණ ක්‍රියාකාරී සැලසුම් එකතු කිරීම සහ කෙටි හා මධ්‍යකාලීන පර්යේෂණ ප්‍රමුඛතා මත පදනම්ව ක්‍රියාකාරී සැලසුම් විශ්ලේෂණය කිරීම | ආයතන වල ක්‍රියාකාරී සැලසුම් | 25 | 0.008 | 0.20 |
| | රජයට නිර්දේශ කිරීමට සහ උපදෙස් දීමට | ප්‍රතිපත්ති වාර්තා | 2 | 0.25 | 0.50 |
| | ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලසුම/ අන්තර්-ආයතනයික සහ බහුවිෂයාත්මක පර්යේෂණ ප්‍රදාන යෝජනා ක්‍රම සංකල්ප පත්‍ර ඇගයීම | සංකල්ප පත්‍ර | 100 | 0.005 | 0.50 |
| 02 | ජාතික කෘෂිපර්යේෂණ ප්‍රතිපත්ති සහ ප්‍රමුඛතා සැකසීම | වාර්තා | 06 | 0.10 | 0.60 |
| | ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලසුම/ අන්තර්-ආයතනයික සහ බහුවිෂයාත්මක පර්යේෂණ ප්‍රදාන යෝජනා ක්‍රමඇගයීම | සංකල්ප පත්‍ර | 100 | 0.004 | 0.40 |
| 03 | පර්යේෂණ පරතරය විශ්ලේෂණය/පර්යේෂණ ප්‍රතිදාන සමීක්ෂණය (වැඩමුළු/සමීක්ෂණ) | වැඩමුළු | 1 | 1.00 | 1.00 |
| 04 | "කෘෂිකාර්මික පර්යේෂණ කළමනාකරුවන් සඳහා තොරතුරු"දත්තසමුදායකළමනාකරණය | දත්ත සමුදායන් | 30 | 0.03 | 1.00 |

| අ/අ | වැඩසටහන | මිනුම් ඒකකය | ඉලක්කය | ඒකක පිරිවැය (රු.මි.) | මුළු පිරිවැය (රු.මි.) |
|---|---|---|---|---|---|
| 05 | ආයතනවල බාහිර සමාලෝචනය | ආයතන | 4 | 0.50 | 2.00 |
| | සමාලෝචනය කරන ලද ආයතනවල පසුවිපරම් කටයුතු | ආයතන | 2 | 0.25 | 0.50 |
| 06 | ජාතික සම්මාන උළෙල | සම්මේලන | 1 | 10.00 | 10.00 |
| 07 | වාර්ෂික සංවාද වැඩමුළුව | වැඩමුළු | 1 | 0.80 | 0.80 |
| 08 | අන්තර් ආයතනික බහු-විනය පර්යේෂණ ප්‍රදාන යෝජනා ක්‍රමය - අරමුදල් | ව්‍යාපෘති | 15 | 1.33 | 20.00 |
| 09 | ශ්‍රී ලංකා ආහාර හා කෘෂිකර්ම සඟරාව | වෙළුම් | 2 | 0.30 | 0.60 |
| | ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ කෙටි පුවත් පත්‍රිකාව | වෙළුම් | 1 | 0.20 | 0.20 |
| | Agrinet සහ පුස්තකාලය | - | - | 2.00 | 2.00 |
| 10 | ජාතික හා ජාත්‍යාන්තර මට්ටමින් කෘෂිකාර්මික පර්යේෂණ ආයතන අතර සම්බන්ධතා ප්‍රවර්ධනය කිරීම (ආසියානු පැසිෆික් කෘෂිකාර්මික පර්යේෂණ ආයතන සංගමය / අවබෝධතා ගිවිසුම්) | පුහුණුවීම් සහ සහයෝගිතා ගිවිසුම් | 12 | 0.83 | 10.00 |
| 11 | කෘෂිකාර්මික පර්යේෂණවලට අදාළ ජාත්‍යාන්තර, ජාතික සහ අන්තර් ආයතනික ගැටලු පිළිබඳ සම්මන්ත්‍රණ සහ වැඩමුළු සංවිධානය කිරීම | වැඩමුළු | 3 | 3.33 | 10.00 |
| 12 | කෘෂිකාර්මික පර්යේෂණ කාර්ය මණ්ඩලයේ පශ්චාත් උපාධි පුහුණුව සහ විදේශයන්හි පිළිගත් පර්යේෂණ ආයතන සමඟ විද්‍යාඥයින් හුවමාරු කර ගැනීම සඳහා කටයුතු කිරීම | පුහුණුවීම් | 10 | 0.20 | 2.00 |
| 13 | කෘෂිකාර්මික පර්යේෂණ ව්‍යාපෘති, ආයතන සහ අංශවල කාර්ය සාධනය කලින් කලට සමාලෝචනය කිරීම. | ව්‍යාපෘති | 50 | 0.05 | 2.70 |

## 8.4. 2024.12.31 දිනට සංවර්ධන වැඩසටහන්වල මූල්‍ය ප්‍රගතිය

| විස්තරය | වෙන් කළ මුදල (රු. මි. ) | වියදම් කළ මුදල (රු. මි. ) |
|---|---|---|
| ප්‍රාග්ධනය | 30.00 | 16.32 |
| පර්යේෂණ සඳහා | 15.88 | 13.48 |
| පුනරාවර්තන | 103.38 | 59.32 |

## 8.5. 2024.12.31 දිනට සංවර්ධන වැඩසටහන්වල භෞතික ප්‍රගතිය

| ක්‍රියාකාරකම් | ඉලක්කය | භෞතික ප්‍රගතිය |
|---|---|---|
| 2024 සඳහා ජාතික කෘෂිකර්ම පර්යේෂණ පද්ධතිය (NARS) වන ආයතනවලින් පර්යේෂණ ක්‍රියාකාරී සැලසුම් එකතු කිරීම සහ කෙටි හා මධ්‍යකාලීන පර්යේෂණ ප්‍රමුඛතා මත පදනම්ව ක්‍රියාකාරී සැලසුම් විශ්ලේෂණය කිරීම | ආයතන 25 කින් පර්යේෂණ ක්‍රියාකාරී සැලසුම් එකතු කිරීම | ජාතික කෘෂිකර්ම පර්යේෂණ පද්ධතියේ (NARS) ආයතන 24 ක දත්ත එක් රැස් කර ඇත |

| ක්‍රියාකාරකම් | ඉලක්කය | භෞතික ප්‍රගතිය |
|---|---|---|
| ජාතික කෘෂිකර්ම පර්යේෂණ ව්‍යාපෘතිය (NARP) / අන්තර් ආයතනික පර්යේෂණ ව්‍යපෘති යෝජනා ක්‍රමය (IIMDRGS) යන සංකල්ප පත්‍රිකා ඇගයීම | සමලෝචනය කළ යුතු ව්‍යපෘති සංඛ්‍යාව- 50 | 2024 වසර සඳහා නව පර්යේෂණ සංකල්ප පත්‍රිකා 80 ක් ලැබී සමලෝචනය කර ඇත. |
| ජාතික කෘෂි පර්යේෂණ ප්‍රතිපත්ති සහ ප්‍රමුඛතා සැකසීම | ආහාර බෝග, වැවිලි භෝග, මල් වගා, වන වගා, ධීවර හා ජලජ සම්පත්, සත්ව යන අංශ ආවරණය කිරීම | මල් වගා, වන වගා, ධීවර හා ජලජ සම්පත්, සත්ව යන අංශ 04 සඳහා පර්යේෂණ ප්‍රමුඛතා සකස් කර ඇත. ආහාර බෝග, වැවිලි භෝග සඳහා වැඩමුළු පවත්වන ලදි |
| ජාතික කෘෂිකර්ම පර්යේෂණ ව්‍යාපෘතිය (NARP) / අන්තර් ආයතනික පර්යේෂණ ව්‍යාපෘති යෝජනා ක්‍රමයේ (IIMDRGS) යෝජනා ඇගයීම | 2024 වසර සඳහා පර්යේෂණ යෝජනා ගණන - 50 | 2024 වසර සඳහා නව පර්යේෂණ 34 සඳහා ආධාර සපයන ලදී. |
| පර්යේෂණ පරතරය විශ්ලේෂණය/පර්යේෂණ ප්‍රතිදාන සමීක්ෂණය (වැඩමුළු/සමීක්ෂණ) | නව සොයා ගැනීම් හඳුන්වා දීමේ වැඩමුළු පැවැත්වීම | කෘෂිකාර්මික පර්යේෂණ කාර්ය මණ්ඩලයේ පශ්චාත් උපාධි පුහුණුව ලද නිලධාරීන් ගේ නව සොයා ගැනීම් හඳුන්වා දීමේ වැඩමුළු 04 පවත්වන ලදි. |
| කෘෂිකාර්මික පර්යේෂණ කළමනාකරුවන් සඳහා තොරතුරු (INFORM) සඳහා වූ දත්ත සමුදාය කළමනාකරණය | තොරතුරු ලබා දිය යුතු ජාතික කෘෂිකර්ම පර්යේෂණ පද්ධතියේ (NARS) ආයතන සංඛ්‍යාව 30 | 2020, 2021 වසර සඳහා දත්ත පද්ධතිය සහ ප්‍රකාශන අවසන් කරන ලදි. 2022 සහ 2023 ආයතන 29 කින් දත්ත ලබා දී ඇත. |
| ආයතනවල බාහිර සමාලෝචනය | ආයතන 02 තෝරා ගන්නා ලදී. | තේ පර්යේෂණ ආයතන සහ අපනයන කෘෂිකාර්ම දෙපාර්තමේන්තුව බාහිර සමාලෝචනය කරන ලදී. |
| ජාතික සම්මාන උළෙල | 2021 වසරේ ජාතික සම්මාන උළෙල පැවැත්වීමට සැලසුම් කරන ලදී. | 2021 වසරේ ජාතික සම්මාන උළෙල 2024 වසරේ 09-12-2024 පවත්වන ලදී. |
| වාර්ෂික සංවාද වැඩමුළුව | වාර්ෂික සංවාද වැඩමුළුව පැවැත්වීමට සැලසුම් කරන ලදී | 2024 වසරේ වාර්ෂික සංවාද වැඩමුළුව 24-12-2024 පවත්වන ලදී. |
| අන්තර් ආයතනික පර්යේෂණ ප්‍රදාන යෝජනා ක්‍රමයේ (IIMDRGS)- අරමුදල් | අන්තර් ආයතනික බහු-විනය පර්යේෂණ සඳහා අරමුදල් ලබා දෙන ලදී | අන්තර් ආයතනික බහු-විනය පර්යේෂණ 05ක් සඳහා අරමුදල් ලබා දෙන ලදි. පවත්වා ගෙන යන පර්යේෂණ ව්‍යාපෘති වල ප්‍රගතිය ලබා ගන්නා ලදි, |

| ක්‍රියාකාරකම් | ඉලක්කය | භෞතික ප්‍රගතිය |
|---|---|---|
| ශ්‍රී ලංකා ආහාර සහ කෘෂිකර්ම සඟරාව (Sri Lanka Journal of Food and Agriculture) | නව පර්යේෂණ පත්‍රිකා කැඳවීම. | Vol 8 සහ 9 සඳහා නව පර්යේෂණ පත්‍රිකා කැඳවන ලදී. |
| SLCARP පුවත් පත්‍රිකාව (News Letter) | 2023 ප්‍රකාශනය කිරීම | 2023 වසරේ පුවත් පත්‍රිකාව අවසන් කරන ලදී. |
| ජාතික හා ජාත්‍යන්තර මට්ටමින් කෘෂිකාර්මික පර්යේෂණ ආයතන අතර සම්බන්ධතා ප්‍රවර්ධනය කිරීම. ආසියා පැසිෆික් කෘෂිකර්ම පර්යේෂණ ආයතන සංගමය සමග අවබෝධතා ගිවිසුම අත්සන් කිරීම | නිලධාරීන් 04 දෙනකු පුහුණු කිරීම | මැලේසියානු කෘෂිකාර්මික පර්යේෂණ සංවර්ධන ආයතනය සමග අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම.<br>KOICA ආයතනය විසින් නිලධාරීන් 20 දෙනකු පුහුණු කරන ලදි.<br>ආසියා පැසිෆික් කෘෂිකර්ම පර්යේෂණ ආයතන සංගමය පුහුණු අවස්ථා 03 ලබා දෙන ලදි. |
| කෘෂිකාර්මික පර්යේෂණවලට අදාළ ජාත්‍යන්තර, ජාතික සහ අන්තර් ආයතනික ගැටලු පිළිබඳ සම්මන්ත්‍රණ සහ සම්මන්ත්‍රණ සංවිධානය කිරීම | ජාතික සහ අන්තර් ආයතනික සම්මන්ත්‍රණ 01 ක් සංවිධානය කිරීම | උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව සමග එක්ව විසිතුරු මල් වගාව පර්යේෂණ පිළිබඳ සම්මන්ත්‍රණයක් 20240-12-06 පවත්වන ලදි. |
| කෘෂිකාර්මික පර්යේෂණ කාර්ය මණ්ඩලයේ පශ්චාත් උපාධි පුහුණුව සහ විදේශයන්හි පිළිගත් පර්යේෂණ ආයතන සමහ විද්‍යාඥයින් හුවමාරු කර ගැනීම සඳහා කටයුතු කිරීම | කෘෂිකාර්මික පර්යේෂණ කාර්ය මණ්ඩලයේ පශ්චාත් උපාධි පුහුණුව සඳහා නිලධාරීන් 05 දෙනකු තෝරා ගැනීම | කෘෂිකාර්මික පර්යේෂණ කාර්ය මණ්ඩලයේ පශ්චාත් උපාධි පුහුණුව සඳහා නව නිලධාරීන් 17 දෙනකු තෝරා ගන්නා ලදි. |
| කෘෂිකාර්මික පර්යේෂණ ව්‍යාපෘති, ආයතන සහ අංශවල කාර්ය සාධනය කලින් කලට සමාලෝචනය කිරීම. | පර්යේෂණ ව්‍යාපෘති 62 ක ප්‍රගතිය සමාලෝචනය කිරීම. | 2023 වසරේ පවත්වන ලද පර්යේෂණ ව්‍යාපෘති 62 ක ප්‍රගතිය සමාලෝචනය කරන ලදි. පර්යේෂණ ව්‍යාපෘති 15 ක ස්ථානීය ප්‍රගතිය සමාලෝචනය කරන ලදි. |

ඡායාරූප අංක 68 - 71

## 09. ගොවීන්ගේ භාරකාර අරමුදල (FTF)

### 9.1. ආරම්භය

1994 මාර්තු මස 09 වන දින රජය වෙනුවෙන් මුදල් අමාත්‍යාංශ ලේකම්වරයා හා අරමුදල වෙනුවෙන් එවකට කෘෂිකර්ම සංවර්ධන හා පර්යේෂණ අමාත්‍යාංශයේ ලේකම්, එම අමාත්‍යාංශයේ රාජ්‍ය ලේකම්, කෘෂිකර්ම නිෂ්පාදන හා අලෙවි කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්, ගොවිජන සේවා කොමසාරිස් හා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්ගෙන් සමන්විත මණ්ඩලයක් අත්සන් තැබූ භාරකාර ඔප්පුවක් මඟින් ස්ථාපනය කර ඇත.

### 9.2. මෙහෙවර

සුළු ගොවීන්ගේ කෘෂිකාර්මික සංවර්ධනය හා සුභ සාධනය සඳහා අවශ්‍ය පසුබිම සකස් කර සුළු ගොවීන්ගේ සක්‍රීය දායකත්වය තුළින් කෘෂිකාර්මික වශයෙන් ස්වයංපෝෂිත ශ්‍රී ලංකාවක් ගොඩ නැඟීම.

### 9.3. අරමුණු

1994 දී ස්ථාපිත භාරකාර ඔප්පුවේ සඳහන් වන ආකාරයට හා 2002 වර්ෂයේදි අමාත්‍ය මණ්ඩල සංදේශයක් මඟින් අරමුණු පුළුල් කිරීම මඟින් ගොවීන්ගේ භාරකාර අරමුදල පහත අරමුණු වෙනුවෙන් ක්‍රියාත්මක වේ.

i. ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික සංවර්ධනය හා ගොවි ජනතාවගේ සුබසාධනය වැඩි දියුණු කිරිම, දැනුවත් කිරිමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරිම.
ii. සුළු ගොවීන්ට කෙටිකාලීන කෘෂිකාර්මික ණය පහසුකම් සැලසීම, වෙළෙඳපල ණය පහසුකම් සැපයිම.
iii. සුළු ගොවීන්ට කෘෂිකාර්මික යෙදවුම් සම්පාදනය.
iv. බෝග හා සත්ව නිෂ්පාදන ක්‍රියාවලිය මෙන්ම නිෂ්පාදනය පිරිසැකසුම සඳහා සුළු ගොවීන්ට අවශ්‍ය වෙනත් අනුග්‍රහයන් ලබා දීම.
v. කෘෂිකාර්මික සංවර්ධනයට පහසුකම් සැලසිම සඳහා විශේෂ කෘෂිකාර්මික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

### 9.4. අරමුදලේ ප්‍රධාන ආදායම් ප්‍රභවය

අරමුදල සඳහා වන ප්‍රධාන ආදායම් ප්‍රභවය ගොවිසෙත ලොතරැයියේ විකුණුම් ආදායමෙන් යම් ප්‍රතිශතයක් (10%) හා අරමුදලේ අතිරික්ත අරමුදල් ආයෝජනයෙන් ලැබෙන පොළී ආදායම් වේ.

### 9.5. ප්‍රධාන,අත්තිකාරම් හා ණය වශයෙන් මෙම අරමුදලේ වැඩ සටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක වේ.

#### 9.5.1.ප්‍රදානයන් යටතේ ක්‍රියාත්මක කරන ව්‍යාපෘති

| අ/අ | ව්‍යාපෘතිය | අරමුණ | ඇස්තමේන්තුගත මුදල (රු.මි.) | සත්‍ය මුදල (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය |
|---|---|---|---|---|---|
| i. | මධ්‍ය පරිමාණ කුකුළු පාලන ඒකක පිහිටුවීමේ ව්‍යාපෘතිය. | බිත්තර ප්‍රශ්නයට විසඳුමක් ලෙස, දරුවන්ගේ මෙන්ම | 32.80 | 17.24 | 53 |

| අ/අ | ව්‍යාපෘතිය | අරමුණ | ඇස්තමේන්තුගත මුදල (රු.මි.) | සත්‍ය මුදල (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය |
|---|---|---|---|---|---|
| | (ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය) | ගර්භනී මවුවරුන්ගේ මන්දපෝෂණය තුරන් කිරීම හා ජනතාවගේ ජීවනෝපාය සංවර්ධනය | | | |
| | මසක් වයසැති කුකුළු පැටව් සත්ව පාලනයේ නියුතු පවුල් වලට ලබා දීම. (හදබිම අධිකාරිය) | | 10.00 | 4.36 | 44 |
| ii. | යල කන්නයේ කුඹුරු ඉඩම්වල උඳු වගාව ප්‍රවර්ධනය කිරීම. (දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - වව්නියාව) | කුඹුරු ඉඩම් අක්කර 882ක් වගා කිරීම සඳහා උඳු බීජ කිලෝ ග්‍රෑම් 8580ක් ගොවීන් වෙත ලබා දී ඇත | 13.35 | 10.64 | 80 |
| iii. | කාන්තා ගොවි සංවිධාන සම්බන්ධිකාරක නිලධාරින් හා කාන්තා ගොවි සංවිධාන සභාපතිනියන් සඳහා මූල්‍ය කළමනාකරණ සඳහා වන පාඨමාලා ශාස්තු ගෙවීම. | අදාළ ක්ෂේත්‍රය පිළිබඳ නිපුනතාවයෙන් යුතු සංචිතයක් දිවයින පුරා බිහි කිරීම සඳහා | 10.00 | 3.23 | 32 |
| iv. | හදිසි ගංවතුර තත්ත්වය මත සිදුවී ඇති ආපදා සඳහා සහන සැපයීම. | හානි සඳහා අලුත්වැඩියාව | 20.00 | 2.21 | 11 |
| v. | ජාතික අලුත් සහල් මංගල්‍යය - 2023 | සංස්කෘතික උත්සවයකි | 3.00 | | |

**9.5.2. අත්තිකාරම් යටතේ ක්‍රියාත්මක කරන වැඩසටහන්**

| අ/අ | ව්‍යාපෘතිය | ඇස්තමේන්තු ගත මුදල (රු.මි.) | සත්‍ය මුදල (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|---|
| i. | ජාතික බීජ නිෂ්පාදන වැඩසටහන (කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලැබේ) | 125.00 | 125.00 | 100 | මෙම වැඩසටහන මගින් බීජ වර්ග 15ක් (කි.ග්‍රෑ. 253,895) ගොවීන්ගෙන් මිලදීගෙන ඇත. |
| ii. | මී මැසි පෙට්ටි හා උපාංග නිෂ්පාදන ව්‍යාපෘතිය (කෘෂිකර්ම දෙපාර්තමේන්තුව - බිඳුණුවැව මී මැසි සංවර්ධන ඒකකය විසින් ක්‍රියාත්මක කරන ලදී) | 2.50 | 2.50 | 100 | මෙම ව්‍යාපෘතිය මගින් මී මැසි පෙට්ටි 500 ක්, දුම් විසිරුම් යන්ත්‍ර 500 ක් හා මී මැසි පෙට්ටි සඳහා ගේට්ටු තහඩු 5000 ක් නිෂ්පාදනය කර ඇත. එම උපාංග ගොවීන්ට අලෙවි කෙරේ. |

### 9.5.3. කෘෂිකාර්මික ණය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

| අ/අ | ව්‍යාපෘතිය | ඇස්තමේන්තු ගත මුදල (රු.මි.) | සත්‍ය මුදල (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|---|
| i. | වී මිලදී ගැනීම සඳහා ණය මුදල් ලබා දීම 2023/24 මහ. (වී අලෙවි මණ්ඩලය වෙත) | 100.00 | 100.00 | 100 | වී කි.ග්‍රෑම් 881,930 මිලට ගැනීම |
| ii. | කෘෂි ශක්ති ණය යෝජනා ක්‍රමය. (ප්‍රාදේශීය සංවර්ධන බැංකුව සමග සමග) | 200.00 | 125.10 | 62 | ගොවීන් 256 දෙනකු සඳහා ණය ලබා දීම |
| iii. | සුළු ගොවීන්ට කෙටිකාලීන කෘෂිකාර්මික ණය පහසුකම් සැපයීම. (ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව) | 235.00 | 175.00 | 74 | |

## 10. ජාතික පොහොර ලේකම් කාර්යාලය

### 10.1. හැඳින්වීම

1988 අංක 68 දරණ පොහොර විධිමත් කිරීමේ පනතේ නෛතික කටයුතු සහ ජාතික පොහොර ලේකම් කාර්යාලයේ දිස්ත්‍රික් සංවර්ධන කටයුතු සිදු කිරීම.

### 10.2. දැක්ම, මෙහෙවර හා කාර්යභාරය

ශ්‍රී ලංකාවේ වගා කරන සියලු බෝගවල නිෂ්පාදන ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා අකාබනික හා කාබනික පොහොර නියමිත ප්‍රමිතියෙන් යුක්තව සම්පාදනය හා භාවිතය තහවුරු කිරීම ආයතනයේ දැක්ම වන අතර පොහොර විධිමත් කිරීමේ පනතේ විධිවිධාන අනුව අදාළ සියලු පාර්ශවකරුවන් සම්බන්ධ කර ගනිමින් විද්‍යානුකූල නිර්දේශයන් මත පොහොර අවශ්‍යතාවය තක්සේරු කිරීම, පොහොර ආනයනය හා තොග පාලනය, නිසි ගුණත්වයෙන් යුතු පොහොර බෙදා හැරීම හා අලෙවිය තහවුරු කිරීම, කාබනික හා අකාබනික පොහොර භාවිතයේ දී පරිසර හිතකාමී ලෙස පොහොර භාවිතය වැඩිදියුණු කිරීම, ගොවි ප්‍රජාවගේ ආදායම ඉහළ නැංවීමේ අරමුණින් යුතුව පොහොර සහනාධාර යෝජනා ක්‍රමය මෙහෙයවීම හා පොහොර භාවිත ක්ෂේත්‍රයේ අක්‍රමිකතාවයන් වැළැක්වීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම මෙහෙවර වේ. 1988 අංක 68 දරණ පොහොර පනත විධිමත්ව ක්‍රියාත්මක කිරීම ආයතනයේ මූලික කාර්යභාරය වේ.

### 10.3. 2025 වර්ෂයේ මූල්‍ය ඉලක්ක

| අ/අ | ප්‍රධාන සංවර්ධන වැඩසටහන | ඇස්තමේන්තු මුදල (රු.මි.) |
|---|---|---|
| 1 | පුනරාවර්තන වියදම් | 72.39 |
| 2 | ප්‍රාග්ධන වියදම් | 29.16 |

*** මෙම ඇස්තමේන්තු ගත පිරිවැය පහත වගුවේ අනු අංක 01, අනු අංක 02 සහ අනු අංක 03 ට ඇතුළත් කර ඇත.**

### 10.5. 2025 වර්ෂයේ භෞතික ඉලක්ක ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් හා ව්‍යාපෘති

| අ/අ | වැඩසටහන | මිනුම් ඒකකය | ඉලක්කය | බලපත්‍රයක ගාස්තුව (රු.මි.) | මුළු ආදායම (රු.මි.) |
|---|---|---|---|---|---|
| 01 | (i) කාබනික පොහොර නව නිෂ්පාදකයින්ට බලපත්‍ර ලබා දීම | | 02 | 0.02 | 0.04 |
| | (ii) කාබනික පොහොර පැරණි නිෂ්පාදකයින්ගේ බලපත්‍ර අලුත් කිරීම | | 54 | 0.015 | 0.81 |
| | (iii) පොහොර ආනයන බලපත්‍ර නිකුත් කිරීම | | 02 | 0.15 | 0.30 |
| | (iv) පොහොර ආනයන බලපත්‍ර අලුත් කිරීම | | 176 | 0.10 | 17.60 |
| | (v) කාබනික නොවන පොහොර නිෂ්පාදන බලපත්‍ර නිකුත් කිරීම | | 00 | 00 | 00 |
| | (vi) ) කාබනික නොවන පොහොර නිෂ්පාදන බලපත්‍ර අලුත් කිරීම | | 08 | 0.10 | 0.80 |
| | (vii) පොහොර මිශ්‍රණ බලපත්‍ර නිකුත් කිරීම | | 00 | 00 | 00 |
| | (viii) පොහොර මිශ්‍රණ බලපත්‍ර අලුත් කිරීම | | 58 | 0.10 | 5.80 |
| | **එකතුව** | | **300** | | **25.35** |
| | | **මිනුම් ඒකකය** | **ඉලක්කය** | **ඒකක පිරිවැය** | **මුළු පිරිවැය** |
| | තොග සත්‍යාපනය හා ගබඩා පරික්ෂා කටයුතු | | | | මුළු පිරිවැය 2025 මුල්‍ය ඉලක්කවල ඇතුලත්කර ඇත. |
| | a. ගොවිජන සංවර්ධන මධ්‍යස්ථාන | | 935 | | |
| | b. ප්‍රාදේශීය ගබඩා | | 42 | | |
| | c. පෞද්ගලික අලෙවිසැල් සහ කාබනික පොහොර නිෂ්පාදනාගාර පරික්ෂාව | | 2,922 | | |
| 02 | පුහුණු වැඩසටහන් | | 97 | | |
| 03 | ගුණාත්මකභාවය තහවුරු කිරීම සඳහා පොහොර නියැදි ලබා ගැනීම | | | | |
| | 3.1 ගොවිජන සංවර්ධන මධ්‍යස්ථාන | | 108 | | මුළු පිරිවැය 2025 මුල්‍ය ඉලක්කවල ඇතුලත්කර ඇත. |
| | 3.2 ප්‍රාදේශීය ගබඩා | | 28 | | |
| | 3.3 පෞද්ගලික අලෙවිසැල් සහ පොහොර නිෂ්පාදනාගාර වල පොහොර නියැදි ගැනීම | | 545 | | |
| | 3.4 ක්ෂේත්‍ර නියැදි ලබාගැනීම | | 400 | | |
| 04 | ප්‍රගති සමාලෝචන රැස්වීම් පොහොර කමිටු රැස්වීම් හා සංග්‍රහ වියදම් | | 70 | | |
| **5.0** | **නිෂ්පාදන ප්‍රවර්ධන අංශය - ක්‍රියාත්මක සැලැස්ම 2025** | | | | |

| අ/අ | වැඩසටහන | මිනුම් ඒකකය | ඉලක්කය | බලපත්‍රයක ගාස්තුව (රු.මි.) | මුළු ආදායම (රු.මි.) |
|---|---|---|---|---|---|
| 5.1 | පුහුණු වැඩසටහන (උසස් තත්ත්වයේ Single Super Phosphate පොහොර නිෂ්පාදකයින් පිළිබඳ) | | 03 | | මුල්‍ය පිරිවැය අදාල ආයතන මඟින් ලබා ගැනීමට බලාපොරොත්තු වේ. |
| **6.0** | **තත්ත්ව පාලන අංශය - ක්‍රියාත්මක සැලැස්ම 2025** | | | | |
| 6.1 | පොහොර වල ගුණාත්මකභාවය තහවුරු කිරීම සඳහා නියැදි ගැනීම | | 1,900 | | |
| **7.0** | **ආනයන අංශය - ක්‍රියාත්මක සැලැස්ම 2025** | | | | |
| 7.1 | රසායනික පොහොර ආනයනයට අදාළ ලේඛන සහ වාර්තා පරීක්ෂා කිරීම සඳහා ලිපිගොනු සකස් කිරීම | | 1,200 | | මුල්‍ය පිරිවැය අවශ්‍ය නොවේ. |
| 7.2 | ආනයනයෙන් පසු රේගු නිෂ්කාශනය සඳහා නිර්දේශ සකස් කර ඉදිරිපත් කිරීම - Clearance | | 1,200 | | මුල්‍ය පිරිවැය අවශ්‍ය නොවේ. |
| 7.3 | අලෙවි ඇණවුම් සකස් කිරීම (Marketing Approval) | | 1,200 | | |
| **8.0** | **තොරතුරු හා කළමනාකරණ අංශය - ක්‍රියාත්මක සැලැස්ම 2025** | | | | |
| **පොහොර බෙදා හැරීමේ සැලැස්ම ක්‍රියාත්මක කිරීම.** | | | | | |
| 8.1 | වී වගාව සහ ධාන්‍ය සඳහා යල කන්නය | | 2025 මාර්තු - අගෝස්තු | | |
| 8.2 | වී වගාව සහ ධාන්‍ය සඳහා මහ කන්නය | | 2025 සැප්තැම්බර් - 2026 පෙබරවාරි | | |
| 8.3 | අනෙකුත් වගාවන් සඳහා | | 2025 ජනවාරි - දෙසැම්බර් | | |
| **9.0** | **ආයතන අංශය - ක්‍රියාත්මක සැලැස්ම 2025** | | | | |
| 9.1 | නිලධාරී පුහුණු වැඩසටහන් (දේශීය) | | 02 | | |
| **10.0** | **සැලසුම් අංශය - ක්‍රියාත්මක සැලැස්ම 2025** | | | | |
| 10.1 | වැඩසටහන් සැලසුම්කරණය | | 03 | | |
| 10.2 | ප්‍රගති සමාලෝචනය | | 01 | | |

### 10.6. 2024.12.31 දිනට ආයතනයේ වැඩසටහන් වල මූල්‍ය ප්‍රගතිය

| අ/අ | වැඩසටහන | 2024 වර්ෂය සඳහා වෙන්කළ මුදල (රු.මි.) | 2024.12.31 දක්වා වියදම් කළ මුදල (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස (%) |
|---|---|---|---|---|
| 2.1 | කාබනික පොහොර නව නිෂ්පාදකයින්ට බලපත්‍ර ලබා දීම, කාබනික පොහොර පැරණි නිෂ්පාදකයින්ගේ බලපත්‍ර අලුත් කිරීම, තොග සත්‍යාපනය හා ගබඩා පරික්ෂා කටයුතු, පුහුණු වැඩසටහන් හාපොහොර නියැදි ලබා ගැනීම, මුළු ඉන්ධන වියදම් | 2.09 | 1.50 | 72 |
| 2.2 | ප්‍රගති සමාලෝචන රැස්වීම් පොහොර කමිටු රැස්වීම් හා සංග්‍රහ වියදම් | 0.175 | 0.15 | 84 |
| 2.3 | දින වැටුප් | - | - | - |
| 2.4 | ගමන් වියදම් | - | - | - |
| 2.5 | ලිපි ද්‍රව්‍ය | 0.80 | 0.69 | 86 |
| **එකතුව** | | **3.065** | **2.33** | **76** |

| අ/අ | පුනරාවර්තන වියදම් | 2024.12.31 දක්වා | |
|---|---|---|---|
| | | වියදම් කළ මුදල (රු.මි.) | අතැති බිල්පත් (රු.මි.) |
| ප්‍රධාන කාර්යාලය | | 20.77 | 1.61 |

## 11. ස්ටේට් ෆර්ටිලයිසර් කම්පැනි ලිමිටඩ්

### 11.1. හැඳින්වීම

"ලක්පොහොර" හා "කොමර්ෂල් පොහොර" සන්නාමයන් පිළිබඳ ශ්‍රී ලාංකීය ගොවිජනතාව අතර කීර්ති නාමයක් ඇති බැවින්, කාබනික හා රසායනික පොහොර ඇතුළු අනෙකුත් කෘෂි යෙදවුම් හා සේවා සපයන ලාභදායී ව්‍යාපාරික ඒකක ලෙස පවත්වාගන යාම අරමුණු කර ගනිමින් 21/0118/323/005 දරණ හා 2021.02.01 දිනැති හා අංක CP/22/0706/514/001 සහ 2022/05/30 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ අනුව සීමාසහිත ලංකා පොහොර සමාගම සහ කොළඹ කොමර්ෂල් පොහොර සමාගම ඒකාබද්ධ කරමින් 2024.07.11 දින State Fertilizer Co.Ltd. ආයතනය පිහිටුවන ලදී.

### 11.2. 2025 වර්ෂයේ මූල්‍ය ඉලක්ක

| අ/අ | ප්‍රධාන සංවර්ධන වැඩසටහන | ඇස්තමේන්තු මුදල (රු.මි.) |
|---|---|---|
| 1 | ප්‍රාග්ධන වියදම් | 2025.03.31 දිනට පසු සැලසුම් කරනු ලැබේ |
| 2 | පුනරාවර්තන වියදම් | |

**11.3. 2025 වර්ෂයේ භෞතික ඉලක්ක (ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් හා ව්‍යාපෘති)**

| අ/අ | වැඩසටහන | මිනුම් ඒකකය | ඉලක්කය | ඒකක පිරිවැය (රු.මි.) | මුළු පිරිවැය (රු.මි.) |
|---|---|---|---|---|---|
| 1 | 2025 වර්ෂය. මිශ්‍රන පොහොර මෙ.ටො.22, 475ක් සහ සෘජු පොහොර මෙ.ටො.35,000ක් අලෙවි කිරීම. | මෙ.ටො. | 57,475 | 0.17 | 9,600.00 |
| 2 | ශ්‍රී ලංකා තේ මණ්ඩලය සමඟ ක්‍රියාත්මක කරනු ලබන තේ පොහොර බෙදාහැරීමේ ව්‍යාපෘතියට සමගාමීව ගිවිසුම්ගතවූ පොහොර මෙ.ටො. 30,000න් තවදුරටත් බෙදාහැරීමට නියමිතව ඇති ඉතිරි පොහොර ප්‍රමාණය අලෙවි කිරීම. | මෙ.ටො. | 15,388 | 0.15 | 2,308.00 |
| 3 | පොල් වගාකිරීමේ මණ්ඩලය සමඟ ඒකාබද්ධව සහනාධාර මිලට පොල් පොහොර අලෙවි කිරීම. | මෙ.ටො. | 42,525 | 0.57 | 2,412.00 |
| 4 | යන්ත්‍රානුසාරයෙන් පොහොර තොග මිශ්‍ර කිරීම, පැටවීම, ඇසුරුම් කිරීම, අට්ටි ගැසීම සඳහා අවශ්‍ය මිශ්‍රන පොහොර යන්ත්‍රයක් සහ මළු මුද්‍රණ යන්ත්‍රයක් මිල දී ගැනීම. | දිනකට මෙ.ටො. | 200 | - | 110.00 |
| 5 | සී/ස කොළඹ කොමර්ෂල් පොහොර සමාගමේ ප්‍රධාන කාර්යාල පරිශ්‍රය රාජ්‍ය ආයතනයකට බදු දීමට සැලසුම් කිරීම. | - | - | - | - |
| 6 | මානව සම්පත් කළමණාකරණය සහ ඇගයීම් සඳහා මෘදුකාංග පද්ධතියක් හඳුන්වාදීමට කටයුතු කිරීම. | - | - | - | 1.00 |
| 7 | එක් එක් ප්‍රදේශයන්ට නිර්දේශිත පොහොර වර්ග භාවිතය සම්බන්ධව ගොවීන් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. | - | - | - | 20.00 |
| 8 | **Hyosung ONB** ආයතනය ආයතනය හා එක්ව අපගේ සන්නාමය හරහා කාබනික පොහොර මෙ.ටො.500ක් අලෙවි කිරීම සහ වගාවන් සඳහා දෙමුහුම් පොහොර හඳුන්වා දීමට සැලසුම් කිරීම. | රු.මි. | 4.20 | - | 4.20 |
| 9 | පරාමිතීන් සියල්ල පරීක්ෂා කළ හැකි පරිදි ආයතනික රසායනාගාරය වැඩිදියුණු කිරීම සහ ලාභ ලබන ඒකකයක් බවට පත් කිරීමට සැලසුම් කිරීම. | රු.මි. | - | - | 20.00 |
| 10 | ආයතන පරිශ්‍රය තුල තෝරාගත් වහල මත සූර්ය පැනල සවිකිරීමට කටයුතු කිරීම. | මාසික ඒකක | 65,000 | - | 40.00 |

**11.4. 2024.12.31 දිනට ආයතනයේ වැඩසටහන්වල මූල්‍ය ප්‍රගතිය**

| අ/අ | වැඩසටහන | 2024 වර්ෂය සඳහා වෙන් කළ මුදල (රු.මි) | 2024.12.31 දක්වා වියදම් කළ මුදල (රු.මි) | මූල්‍ය ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| 1 | ප්‍රාග්ධන වියදම් | 214.38 | - | - |
| 2 | පුනරාවර්තන වියදම් | 399.13 | 201.73 | 51 |
| | | | | |
| | සංවර්ධන වැඩසටහන් | | | |
| 1 | ශ්‍රී ලංකා තේ මණ්ඩලය සමඟ ක්‍රියාත්මක කරනු ලබන තේ පොහොර බෙදාහැරීමේ ව්‍යාපෘතිය | 2,178.00 | 2,178.00 | 100 |
| 2 | මෙ.ටො.54930.68 ක් වන MOP පොහොර තොගය දින 18 ක් තුළ නිශ්කාශන කටයුතු අවසන් කිරිම. | 1,614.00 | 750.00 | |

## 12. ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය (ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය)

### 12.1. හැඳින්වීම

ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය හෙවත් ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය 1973 අංක 15 දරණ ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ පනත අනුව ස්ථාපිත කර ඇත.

### 12.2. දැක්ම හා මෙහෙවර

ගොවි ජනතාවගේ සහ අඩු වරප්‍රසාද ඇති ජනතාවගේ අභිමානය නැවතත් ඇති කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මගින් ආර්ථික ස්වාධීනත්වය සහ ස්ව විශ්වාසය ඇති කිරීම දැක්ම වන අතර ප්‍රතිලාභීන්ගේ ආර්ථික ස්වාධීනත්වය ඇති කිරීමටත් අනුන් මත යැපීමේ සංස්කෘතිය මග හැරවීම සඳහාත් කෘෂිකර්ම, පශු සම්පත් සහ වෙනත් ක්ෂේත්‍රවල නිපුණතා සංවර්ධනය සඳහාත් සහභාගීත්ව සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මෙහෙවර වේ.

### 12.3. අරමුණු

i. රජය විසින් සකස් කරන ලද සංවර්ධන වැඩපිළිවෙලට අනුකූලව සාමාජීය හා ආර්ථික සංවර්ධනය සඳහා විදේශීය, දේශීය නියෝජ්‍යත්ව වල ආධාර ලබා ගැනීම.
ii. මහජනෝපකාර, සාමාජීය හා ආර්ථික සංවර්ධන යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමේදී ආයතනවලට හා වෙනත් මණ්ඩලවලට සහාය වීම.
iii. කෘෂිකාර්මික හා කාර්මික සංවර්ධනය කෙරෙහි යොමු වූ නිශ්චිත යෝජනා ක්‍රමවලට ආධාර කිරීම, එම යෝජනා ක්‍රම දියුණු කිරීම සහ සම්බන්ධීකරණය කිරීම.

iv. කෘෂිකාර්මික හා කාර්මික නිෂ්පාදනය වැඩි කිරීම සඳහා වූ යෝජනා ක්‍රියාත්මක කිරීමෙහිලා ආණ්ඩුවේ නොවූ නියෝජ්‍යත්ව උනන්දු කිරීම.

v. ජාත්‍යන්තර සාගිනි නිවීමේ ව්‍යාපාරය සහ වෙනත් ඒ හා සමාන පිටරට ආයතන, සංගම් හෝ සමිති සමග සහයෝගී වීම.

## 12.4. 2025 වර්ෂයේ මූල්‍ය ඉලක්ක

| අ/අ | ප්‍රධාන සංවර්ධන වැඩසටහන | ඇස්තමේන්තු මුදල (රු. මි) |
|---|---|---|
| 1 | ප්‍රග්ධන වියදම් | 83.90 |
| 2 | පුනරාවර්තන වියදම් | 7,790.00 |

## 12.6. 2025 වර්ෂයේ භෞතික ඉලක්ක ( ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් ව්‍යාපෘති )

| අ /අ | වැඩසටහන | මිනුම් ඒකකය (රු .මි ) | ඉලක්ක | මුළු පිරිවැය (රු .මි ) |
|---|---|---|---|---|
| 1 | නාරාහේන්පිට පැල සහ කෘෂි යෙදවුම් අලෙවිසැල | 30.00 | වර්ෂයක් සඳහා ගුණාත්මයෙන් ඉහළ පැල 2,500 නිෂ්පාදනය | 24.87 |
| 2 | දෙහිවල ඇග්‍රෝ ෆ්‍රෙෂ් සුපර් අලෙවිසැල | 61.00 | - | 56.90 |
| 3 | දෙහිවල පැල සහ කෘෂි යෙදවුම් අලෙවිසැල | 14.00 | වර්ෂයක් සඳහා ගුණාත්මයෙන් ඉහළ පැල 2,000 නිෂ්පාදනය | 12.99 |
| 4 | තණමල්විල ගොවිපළ ව්‍යාපෘතිය | 3.00 | - | 2.88 |
| 5 | බුත්තල ගොවිපළ නඩත්තුව | 0.10 | - | 26.49 |
| 6 | සහල් සබලකරණ ව්‍යාපෘතිය | 1,400.00 | දිනකට ළමුන් 500,000 සඳහා දිස්ත්‍රික්ක ගණන = 12 | 1,544.50 |
| 7 | සත්ත්ව ආහාර සඳහා බඩඉරිඟු ආනයනය කිරීම | 150.00 | මෙට්‍රික්ටොන් 5,000 | 7,674.15 |
| 8 | දේශීය බඩඉරිඟු මිල දී ගැනීම | 2.00 | මෙට්‍රික්ටොන් 15,000 | 1.84 |
| 9 | පලතුරු සහ ඇට වර්ග පාසල් ළමුන් අතර ප්‍රචලිත කිරීම | – | සේවාවක් සැපයීම | 9.00 |
| 10 | ගන්නෝරුව ආහාර පර්යේෂණ ඒකකය තුළ NFPB අලෙවිසැලක් පිහිටුවීම | 2.00 | 1 | 1.13 |
| 11 | කෙසෙල් කොළ දවටන නිෂ්පාදන ව්‍යාපෘතිය | 1.00 | යන්ත්‍රයකින් දිනකට දවටන 25,000 | 11.00 |
| 12 | සබලකෘත සහල් මගින් බිස්කට් නිෂ්පාදන ව්‍යාපෘතිය | 10.00 | සතියකට බිස්කට් 100,000 නිෂ්පාදනය කිරීම | 12.00 |
| 13 | වතුකරයේ ජනතාව අතර තිරිඟු පිටි වෙනුවට සහල් පිටි ප්‍රචලිත කිරීමේ නියමු ව්‍යාපෘතිය | – | සේවාවක් සැපයීම | 13.00 |
| 14 | දෙහිවල හෙල්දි ෆුඩ් කෝනර් ස්ථාපිත කිරීම | 5.00 | 5 | 4.43 |

## 12.7. 2024.12.31 දිනට ආයතනයේ වැඩසටහන්වල මූල්‍ය ප්‍රගතිය

| අ/අ | වැඩසටහන | 2024 වර්ෂය සඳහා වෙන් කළ මුදල (රු. මි.) | 2024.12.31 දක්වා වියදම් කළ මුදල (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| 1 | ප්‍රග්ධන වියදම් | - | - | - |
| 2 | පුනරාවර්තන වියදම් | 40.00 | 63.75 (මෙම මුදලින් රු.මි. 23.75 ක් ආයතනයේ ස්ව-අරමුදල් මඟින් වියදම් කර ඇත.) | 100 |
| | සංවර්ධන වැඩසටහන් | | | |
| 1 | නාරාහේන්පිට පැල සහ කෘෂි යෙදවුම් අලෙවිසැල | 14.13 | 11.70 | 83 |
| 2 | දෙහිවල ඇග්‍රෝ ෆ්‍රෙෂ් සුපර් අලෙවිසැල | 52.00 | 51.72 | 99 |
| 3 | දෙහිවල පැල සහ කෘෂි යෙදවුම් අලෙවිසැල | 10.07 | 9.52 | 95 |
| 4 | රාජ්‍ය පුද්ගලික සහයෝගිතාව යටතේ සන්ෆ්‍රෝස්ට් පුද්ගලික සමාගම සමග අගය එකතු කරන ලද හාල් පිටි මිශ්‍ර ඉදිආප්ප පිටි නිෂ්පාදන ව්‍යාපෘතිය | 3.963 | 2.10 | 53 |
| 5 | තණමල්විල ගොවිපළ ව්‍යාපෘතිය | 2.46 | 1.58 | 64 |
| 6 | සත්ත්ව ආහාර සඳහා බඩඉරිඟු මෙට්‍රික් ටොන් 25,000 ආනයනය කිරීම | 1.15 | 0.02 | 2 |
| 7 | සහල් සබලකරණ ව්‍යාපෘතිය | 140.75 | 107.15 | 76 |
| 8 | දේශීය බඩඉරිඟු මිලදී ගැනීම | 8.40 | 1.49 | 18 |
| 9 | බුත්තල ගොවිපළ සහ කාබනික පොහොර නිෂ්පාදන ව්‍යාපෘතිය | 13.56 | 1.669 | 12 |

## 12.8. 2024.12.31 දිනට ආයතනයේ වැඩසටහන්වල භෞතික ප්‍රගතිය

### 1. පැල අලෙවිසැල සහ ගෙවත්ත - නාරාහේන්පිට

ග්‍රාමීය ජනතාවට මෙන්ම නාගරික වැසියන්ටද තම ගෙවත්තේ තමාට අවශ්‍ය දෑ හැකි අයුරින් වගා කර පරිභෝජනයට ගැනීමට පෙළඹීම මත ඒ සඳහා, ඒ සඳහා "වස විසෙන් තොර" ආහාර ප්‍රචලිත කිරීම අරමුණ වූ අප ආයතනය නාගරික වැසියන්ට ගෙවතු වගාව සඳහා අවශ්‍ය වන්නා වූ සියලූම වර්ගයේ එළවළු පැළ ඇතුළු සහනදායී මිලකට ලබාදීම පෙරදැරිව ආරම්භ කරන ලද ව්‍යාපෘතියක් ලෙස නාරහේන්පිට පැළ තවාන හඳුන්වාදිය හැක. ඖෂධීය පැල, මල් පැල හා පලතුරු පැල (විශේෂයෙන් ඌන භාවිත පලතුරු) හා පලතුරු හා එලවලු බීජ, එළවළු හා මල් පොහොර, කාබනික පොහොර, කෘමි විකර්ෂක, කෘෂි උපකරණ ආදිය මෙම ස්ථානයෙන් මිලට ගත හැකි අතර මෙම ස්ථානයෙන් බෝග වගා පිළිබඳ උපදෙස් ද නොමිලේ ලබා ගත හැක.

මෙම ව්‍යාපෘතියේ මෙහෙයුම් පිරිවැය රුපියල් මිලියන 14.13 ක් වූ අතර වසරේ ශුද්ධ ලාභය රු.මි. 3.30 කි.ඉහත සංඛ්‍යාත්මක දත්තවලට අනුව මෙම ව්‍යාපෘතිය පෙර වසරට වඩා ප්‍රගතියක් ලබා ඇත.

ඡායාරූප අංක 72

**2. පැල අලෙවිසැල - දෙහිවල**

නාරාහේන්පිට අලෙවි මධ්‍යස්ථානය මගින් සිදු කරනු ලබන සියලුම අලෙවි කාර්යයන් දෙහිවල මධ්‍යස්ථානය මගින් ද සිදු කෙරේ. මෙහෙයුම් ආදායම ලෙස රු. මි. 1.61 මුදලක් උපයා ඇති අතර සහ මේ වසරේ මෙහෙයුම් වියදම රු. මි. 10.07 කි.

ඡායාරූප අංක 73

**3. ගොවි නිෂ්පාදන හා ආහාර අලෙවි සැල - දෙහිවල**

ගොවි ජනතාවගේ නිෂ්පාදන, අගය එකතු කරන ලද දේශීය ව්‍යවසායකයන්ගේ නිෂ්පාදන, එමෙන්ම ආයතනය විසින් සකස් කරනු ලබන පාරම්පරික සහල් වර්ග (සුවදැල්, කළුහීනටි, පච්චපෙරුමාල් යනාදී සහල් ප්‍රභේද), මව්පෝෂ, සුවපෝෂ (පෝෂණීයආහාර), තෝසේ පිටි මිශ්‍රණය, විශේෂ සහල් පිටි මිශ්‍රණය යනාදී වස විසෙන් තොර ආහාර වර්ග ප්‍රචලිත කිරීමේ අරමුණින් මෙම ව්‍යාපෘතිය ආරම්භ කොට ක්‍රියාත්මක වෙමින් පවතී.

එසේම මෙයට අනුබද්ධිතව ක්‍රියාත්මක ආපනශාලාව මගින් උදෑසන හා දහවල්, පෝෂණීය හා ගුණාත්මක ආහාර වර්ග ජනතාවට සහන මිලට ලබා දීමට කටයුතු යොදා ඇත.

මෙම ව්‍යාපෘතියේ මෙම වසරේ මෙහෙයුම් පිරිවැය රු. මි. 52.00 ක් වූ අතර මෙහෙයුම් ආදායම රු. මි. 44.303 කි.

ඡායාරූප අංක 74

**4. බුත්තල ගොවිපල සංවර්ධනය - කාබනික පොහොර නිෂ්පාදනය**

බුත්තල සහ තණමල්විල ප්‍රදේශයේ ගොවිපල සංවර්ධන ව්‍යාපෘතිය 1986 වසරේ ආරම්භ කර මේ දක්වා ක්‍රියාත්මක වේ. 2017 වසරේ ආරම්භ කරන ලද ව්‍යාපෘතියක් ලෙස කාබනික පොහොර නිෂ්පාදන ව්‍යාපෘතිය මේ දක්වා අඛණ්ඩව ක්‍රියාත්මක වේ. මෙහි කොම්පෝස්ට් පොහොර, කොහුබත් හා බදුන් මිශ්‍රණ යනාදී පොහොර වර්ග නිෂ්පාදනය සාර්ථකව සිදු කරන අතර රසායනික පොහොර ආනයනය සීමා කිරීමත් සමග මෙම ව්‍යාපෘතියේ නිෂ්පාදන සඳහා ඉතා ඉහළ ඉල්ලුමක් ලැබිණ.

2024 වසරේදී කොම්පෝස්ට් ව්‍යාපෘතියේ මෙහෙයුම් ආදායම රු. මි. 0.39 ක් වූ අතර මෙහෙයුම් පිරිවැය රු. මි. 13.56 ක් විය.

**5. ගොවිපල සංවර්ධනය - තණමල්විල**

තණමල්විල ප්‍රදේශයේ කුසගින්නෙන් පෙළෙන පවුල්වල සහභාගිත්වයෙන් තණමල්විල ගොවිපළ ආදර්ශ ගොවිපළක් ලෙස පවත්වාගෙන යනු ලැබේ.

තණමල්විල ගොවිපළේ පොදු කාර්ය පිරිවැය රු. මි. 2.46 කි.

**6. අගය එකතු කළ ඉදි ආප්ප පිටි මිශ්‍රණය නිෂ්පාදනය කිරීමේ ව්‍යාපෘතිය**

වස විස නැති දේශීය ආහාර වෙළෙඳපොළට හඳුන්වාදීම සහ එම නිෂ්පාදන ප්‍රචලිත කිරීමෙන් නිරෝගී ජාතියක් නිර්මාණ කිරීම ව්‍යාපෘතියේ අරමුණයි. මෙය හේලිස් සමාගමේ අනුබද්ධිත ආයතනයක් වන සන්ෆ්රෝස්ට් පෞද්ගලික ආයතනය සමග සිදුකරන රාජ්‍ය-පෞද්ගලික හවුල් ව්‍යාපෘතියකි. මෙම ව්‍යාපෘතිය යටතේ අගය එකතු කරන ලද ඉදි ආප්ප පිටි මිශ්‍රණ නිෂ්පාදනය කෙරේ. අගය එකතු කිරීම සඳහා නිල්කටරොළු සහ මුරුංගා කුඩු භාවිතා වන අතර යහපත් ප්‍රතිඔක්සිකාරක අගයක් ඇත.

ගන්නෝරුව ආහාර පර්යේෂණ ඒකකයේ හි පවත්වාගෙන යනු ලබන ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලයේ කර්මාන්ත ශාලාව තුළ මෙම නිෂ්පාදනය සිදුකරයි .

2024 වසරේ මෙම ව්‍යාපෘතියේ මෙහෙයුම් ආදායම රු. මි. 4.623 ක් වූ අතර මෙහෙයුම් පිරිවැය රු. මි. 3.69 කි.

ඡායාරූප අංක 75

**7.බඩ ඉරිඟු ආනයනය**

කුකුළු පාලනය සඳහා ප්‍රධාන ආහාර ද්‍රව්‍යයක් ලෙස බඩ ඉරිගු භාවිතා කරන බැවින් ඒ සඳහා ශ්‍රී ලංකාවේ කුකුල් මස් සහ බිත්තර නිෂ්පාදකයින්ගේ ඉහළ ඉල්ලුමක් පවතී. කෙසේ වෙතත්, ශ්‍රී ලංකාවේ බඩ ඉරිඟු මෙට්‍රික් ටොන් 200,000 නිෂ්පාදනය කරනු ලැබේ.නමුත් වාර්ෂික අවශ්‍යතාවයෙන් 50% කට පමණක් එය ප්‍රමාණවත් වේ.

වර්තමානයේ , පෞද්ගලික සමාගම් විසින් බඩ ඉරිගු ආනයනය සිදු කරනු ලබන බැවින්, ඔවුන් ඒකාධිකාරයක් පවත්වාගෙන යයි. එමනිසා කුකුළු ආහාර මිල ඉහළ යාමක් සිදුවන අතර කුකුළු පාලන ගොවියන් සඳහා දැඩි දුෂ්කරතා ඇති කරයි. අනුව, පුද්ගලික අංශයේ සහය ඇතිව බඩඉරිඟු මෙට්‍රික් ටොන් 25,000 ක් ආනයනය කිරීමෙන් රු. මි. 84.40 ක මුදලක ආදායමක් උපයා ඇත.

**8. සහල් සබලකරණ ව්‍යාපෘතිය**

ප්‍රාථමික පාසල් ශිෂ්‍යයන් සඳහා දිවා ආහාර සැපයීමේ වැඩසටහන යටතේ 2024 වර්ෂයේ පාසල් සිසුන් 500,000 ක් සඳහා දිවා ආහාර සැපයීමට සබලකෘත සහල් සැකසීමේ කාර්යය කලන්කුට්ටිය කර්මාන්තශාලාවේ සිදුකෙරෙන අතර මේ සඳහා ලෝක ආහාර වැඩසටහන දායකත්වය ලබා දී ඇත. . මෙම ව්‍යාපෘතියේ මෙහෙයුම් වියදම රු. මි. 140.75 කි.

ඡායාරූප අංක 76

## 13. ශ්‍රී ලංකා හදබිම අධිකාරිය (ජාතික කෘෂිකාර්මික විවිධාංගීකරණය හා ජනාවාස අධිකාරිය)

### 13.1. දැක්ම

තිරසර ඉඩම් හා ස්වාභාවික සම්පත් කළමණාකරණය සඳහා වන සේවා විශිෂ්ඨත්වයක් තුළ හරිත වු පරිසරයක් සරු එල සපිරි රටක්.

### 13.2. මෙහෙවර

ඵලදාව ඉඩම් කළමනාකරණය, විධිමත් ජල සංරක්ෂණයක් හා උසස් මානව සම්පත් උපයෝජනය තුළින් පාරිසරික සම්පත් සංරක්ෂණය හා කෘෂි ආර්ථිකය සවිබල ගැන්වීම සඳහා අවශ්‍ය දායකත්වය ලබාදීම.

### 13.3. අරමුණ

1972 අංක 11 දරණ රාජ්‍ය කෘෂිකාර්මික නීතිගත සංස්ථා පනතේ අංක 2026/45 දිනැති ගැසට් නිවේදනය අනුව පනතේ පැවරී ඇති අරමුණු.

i.) කෘෂිකාර්මික විවිධාංගිකරණය, ජනාවාස සංවර්ධනය හා පූර්ණ සම්බන්ධිත දියබෙත්ම කළමණාකරනය සඳහා සැලසුම් සකස් කිරීම සහ සංස්ථාව විසින් හෝ රාජ්‍ය හෝ නොවන නියෝජිත ආයතන මගින් හෝ එම සැලසුම් සම්බන්ධීකරණය කිරීම හා ක්‍රියාවේ යෙදවීම.

ii.) කෘෂිකාර්මික නිෂ්පාදන සකස් කිරීම හා අලෙවිකරණය.

iii.) වාණිජ කෘෂිකාර්මික වගාව හෝ වෙනත් යම් කෘෂිකාර්මික ව්‍යාපාරයන්හි දේශීය සහ විදේශීය කෘෂිකර්මාන්ත ආයෝජන සඳහා දිරිමත් කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ සහය ලබාදීම.

### 13.4. 2025 වර්ෂයේ මූල්‍ය ඉලක්ක

| අ/අ | ප්‍රධාන සංවර්ධන ඉලක්ක | ඇස්තමේන්තු මුදල (රු.මි.) |
|---|---|---|
| 01 | ප්‍රාග්ධන | 541.00 |
| 02 | පුනරාවර්තන | 207.66 |

### 13.5. 2025 වර්ෂයේ භෞතික ඉලක්ක (ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් හා ව්‍යාපෘති)

| අ/අ | | වැඩසටහන | ඒකකය | ඉලක්කය | ඒකක පිරිවැය රු. | මුළු පිරිවැය (රු.මි) |
|---|---|---|---|---|---|---|
| 1 | 1.1 | පාංශු ඛාදනය හා හායනය අවම කිරීම උදෙසා කෘෂිකාර්මික ඉඩම් වල පාංශු සංරක්ෂණ ව්‍යුහ ස්ථාපිත කිරීම | හෙක්ටයාර | 1,000 | 35,000.00 | 35.00 |
| | 1.2 | කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය ප්‍රචලිත කිරීම | කෘෂි යෙදවුම් කට්ටල | 5,000 | 10,000.00 | 50.00 |
| | 1.3 | | රොක් පොස්පේට් (ERP) කි.ග්‍රෑ. | 200,000 | 30.00 | 6.00 |

| අ/අ | | වැඩසටහන | ඒකකය | ඉලක්කය | ඒකක පිරිවැය රු. | මුළු පිරිවැය (රු.මි) |
|---|---|---|---|---|---|---|
| | 1.4 | පාංශු සංරක්ෂණය සඳහා තාක්ෂණික උපකරණ භාවිතය ප්‍රචලිත කිරිම | තාක්ෂණික මෙවලම් කට්ටල ප්‍රමාණය | 10 | 500,000.00 | 5.00 |
| **2** | 2.1 | ජල මූලාශ්‍ර සංරක්ෂණය සහ ජල මූලාශ්‍රය ආශ්‍රිත පහසුකම් සැපයීම | ජල මූලාශ්‍ර සංරක්ෂණ ව්‍යුහ | 45 | 1,200,000.00 | 54.00 |
| | 2.2 | ජල පෝෂක ප්‍රදේශ සංරක්ෂක ක්‍රම භාවිතය | රෝපණය කරනු ලබන පැල සංඛ්‍යාව | 20,000 | 200.00 | 4.00 |
| | 2.3 | ප්‍රජා සහභාගීත්ව ජල මූලාශ්‍ර සංරක්ෂණ සහ පවිත්‍රතා වැඩසටහන | ප්‍රජා සහභාගීත්ව වැඩසටහන් සංඛ්‍යාව | 50 | 50,000.00 | 2.50 |
| **3** | 3.1 | ගෙවතු වගා ප්‍රවර්ධනය | කෘෂි යෙදවුම් කට්ටල සංඛ්‍යාව | 8,000 | 7,000.00 | 56.00 |
| | 3.2 | ආර්ථික බෝග වගා ප්‍රවර්ධනය | පැල සංඛ්‍යාව | 20,000 | 500.00 | 10.00 |
| | 3.3 | අතිරේක ආහාර බෝග ප්‍රවර්ධනය | හෙක්ටයාර | 500 | 30,000.00 | 15.00 |
| | 3.4 | වන සතුන්ගෙන් වගාවන් සඳහා සිදුවන හානිය අවම කිරීම (50% දායකත්වය මත) | විදුලි වැට | 500 | 40,000.00 | 20.00 |
| | | | ආරක්ෂිත දැල් වැට | 500 | 60,000.00 | 30.00 |
| | | | වායු රයිෆල් | 1,500 | 30,000.00 | 45.00 |
| **4** | 4.1 | වාණිජ මට්ටමේ මී මැසි පාලනය සඳහා දිරි ගැන්වීම (50% දායකත්වය මත) | මීමැසි පාලන ඒකක | 10 | 250,000.00 | 2.50 |
| | 4.2 | බිම්මල් නිෂ්පාදන ව්‍යවසායකයින් බිහි කිරිම. (50% දායකත්වය මත) | අස්වැන්න, ගොවීන් ගණන | 10 | 250,000.00 | 2.50 |
| | 4.3 | අගය එකතු කිරීමේ නිෂ්පාදන ව්‍යවසායකයින් බිහි කිරිම (50% දායකත්වය මත) | තාක්ෂණික දැනුම ලබාදුන් ගොවීන් ප්‍රමාණය | 10 | 500,000.00 | 5.00 |
| | 4.4 | ව්‍යවසායක මට්ටමින් පළතුරු ගම්මාන ප්‍රචලිත කිරීම | අස්වැන්න / වගා කළ භූමි ප්‍රමාණය | 50 | 1,000,000.00 | 50.00 |
| | 4.5 | අධි ඝනත්ව වගාව ප්‍රචලිත කරමින් ව්‍යවසායකයින් බිහි කිරීම (50% දායකත්වය මත) | අධි ඝනත්ව වගා ඒකක ගණන | 50 | 500,000.00 | 25.00 |
| | 4.6 | නිර්පාංශු වගාව ප්‍රචලිත කිරීම (50% දායකත්වය මත) | නිර්පාංශු වගා ඒකක ගණන | 10 | 500,000.00 | 5.00 |
| | 4.7 | සුළු පරිමාණ ව්‍යවසායකයින් සඳහා බිත්තර රක්කවන යන්ත්‍ර ලබා දීම.(50% දායකත්වය මත) | බිත්තර රක්කවන යන්ත්‍ර | 50 | 200,000.00 | 10.00 |

| අ/අ | | වැඩසටහන | ඒකකය | ඉලක්කය | ඒකක පිරිවැය රු. | මුළු පිරිවැය (රු.මි) |
|---|---|---|---|---|---|---|
| | 4.8 | සුළු පරිමාණ ව්‍යවසායකයින් සඳහා ආරක්ෂිත ගෘහ ලබා දීම. (50% දායකත්වය මත) | ආරක්ෂිත ගෘහ | 10 | 500,000.00 | 5.00 |
| 5 | 5.1 | පාසල් පාදක පාරිසරික වැඩසටහන් | වැඩසටහන් | 60 | 50,000.00 | 3.00 |
| | 5.2 | ප්‍රජා පාදක පාරිසරික වැඩසටහන සහ දැනුවත් කිරීමේ වැඩසටහන් | වැඩසටහන් | 60 | 50,000.00 | 3.00 |
| 6 | 6.1 | අර්ධ ගෘහාශ්‍රිත කුකුල් පාලනය | කුකුළු පැටවුන් | 75,000 | 850.00 | 63.75 |
| 7 | 7.1 | සමාජ සජීවීකරණය තුළින් සහභාගීත්ව සංවර්ධන ගැමි පිවිසුම් වැඩසටහන් (PRA) හරහා ගොවි ප්‍රජාවගේ දායකත්වය ලබා ගැනීම | සහභාගීත්ව සංවර්ධන ගැමි පිවිසුම් වැඩසටහන් (PRA) | 60 | 35,000.00 | 2.10 |
| | 7.2 | ගොවි ප්‍රජාව සඳහා තාක්ෂණික පුහුණු වැඩසටහන් හා සමාජ සජීවිකරණ වැඩසටහන් පවත්වා සවිබල ගැන්වීම හා ගොවිතැනට යොමු කිරීම. | පුහුණු වැඩසටහන් | 120 | 20,000.00 | 2.40 |
| | 7.3 | ව්‍යවසායකයින් සඳහා අවශ්‍ය පුහුණු වැඩසටහන් පැවැත්වීම | පුහුණු වැඩසටහන් | 10 | 100,000.00 | 1.00 |
| 7 | 7.4 | කෘෂිකර්මාන්තයේ දියුණුවෙන් ආර්ථිකය සංවර්ධනය වූ ගොවි ප්‍රජාව ඇගයීම | ප්‍රජා ඇගයීමේ වැඩසටහන | 1 | 2,000,000.00 | 2.00 |
| 8 | 8.1 | භෞතික සම්පත් සංවර්ධනය | භෞතික සම්පත් | - | 0.00 | 10.00 |
| | 8.2 | මානව සම්පත් සංවර්ධනය හා ධාරිතා සංවර්ධනය | පුහුණු වැඩසටහන් | 100 | 100,500.00 | 10.05 |
| | 8.3 | මාසික ප්‍රගති සමාලෝචනය | රැස්වීම් ගණන | 12 | 100,000.00 | 1.20 |
| | 8.4 | විද්‍යුත් හා මාධ්‍ය වැඩසටහන් | වැඩසටහන් සංඛ්‍යාව | 20 | 150,000.00 | 5.00 |
| එකතුව | | | | | | **541.00** |

## 13.6. 2024.12.31 දිනට ආයතනයේ වැඩසටහන්වල මූල්‍ය ප්‍රගතිය

| අ/අ | වැඩසටහන | 2024 වර්ෂය සඳහා වෙන් කළ මුදල (රු.මි.) | 2024.12.31 දක්වා වියදම් කළ මුදල (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| 01 | ප්‍රාග්ධන වියදම් | 220.00 | 210.74 | 96 |
| 02 | පුනරාවර්තන වියදම් | 139.00 | 133.39 | 96 |
| | සංවර්ධන වැඩසටහන් | | | |
| 01 | තරුණ කෘෂි ව්‍යවසායකත්ව ගම්මාන වැඩසටහන | 2.79 | 2.79 | 100 |

## 13.7. 2024.12.31 දිනට සංවර්ධන වැඩසටහන්වල භෞතික ප්‍රගතිය

**විෂය පථය: ඉඩම් ඵලදායිතාවය උපරිම මට්ටමකට ගෙන ඒම.**

### 1.1 පාංශු ඛාදනය හා හායනය අවම කිරීම උදෙසා බැවුම් සහිත කෘෂිකාර්මික ඉඩම් සංරක්ෂණය කිරීම

පාංශු ඛාදනය හා හායනය හේතුවෙන් මධ්‍යම කඳුකරය ආශ්‍රිත කෘෂිකාර්මික ඉඩම් බොහෝමයක් පරිහාණියට පත්ව ඇත. ඉඩම් පරිහරණ රටාවේ වෙනස්වීම්, වනාන්තර විනාශය සහ නාගරීකරණය හේතුවෙන් පාංශු ඛාදනය හා පසේ සාරවත් බව පහළ යාම අවම කිරීම උදෙසා මෙම සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී.

ඒ අනුව යාන්ත්‍රික, ජීව විද්‍යාත්මක සහ ශෂ්‍ය විද්‍යාත්මක ක්‍රම මඟින් ඉඩම් ඵලදායිතාව ඉහළ මට්ටමකට ගෙන ඒම සඳහා ගොවි ජනතාව සමඟ ඒකාබද්ධව මහනුවර, මාතලේ, කෑගල්ල, කොළඹ, ගම්පහ, බදුල්ල, කුරුණෑගල සහ ගාල්ල යන දිස්ත්‍රික්ක වල තෝරාගත් ප්‍රා.ලේ කොට්ඨාශ වල වැඩසටහන ක්‍රියාත්මක කර ඇත.

ඒ අනුව 2024 වර්ෂය සඳහා කෘෂිකාර්මික ඉඩම් හෙක්ටයාර 600ක් සංරක්ෂණය කිරීමට ඉලක්කගත කරන ලද අතර ඒ සඳහා රු.මි. 15.00ක් ගොවීන් සඳහා දිරිදීමනා ලෙස ලබාදීමට ඇස්තමේන්තුගත කරන ලදි. ඒ අනුව 2024.12.30 දින වන විට හෙක්ටයාර 600 සංරක්ෂණ කටයුතු අවසන් කර ඇති අතර ඒ සඳහා රු.මි. 15.00 වැය කොට ඇත.

ඡායාරූප අංක 77

### 1.2 කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය ප්‍රචලිත කිරීම

පාංශු සංරක්ෂණ සිදුකරන ලද කෘෂිකාර්මික ඉඩම් වල ඵලදායිතාව තවදුරටත් ඉහළ නැංවීම මඟින් සාරවත් පසක් නිර්මාණය කර ගැනීමේ අරමුණු සහිතව මෙම වැඩසටහන ක්‍රියාත්මක කෙරේ. මෙම වැඩසටහන මහනුවර, මාතලේ, නුවරඑළිය, කෑගල්ල, කොළඹ, ගම්පහ, අනුරාධපුරය, බදුල්ල, වව්නියාව, මුලතිව්, හම්බන්තොට සහ ගාල්ල සහ යන දිස්ත්‍රික්ක වල තෝරා ගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්ගේ ක්‍රියාත්මක කරන ලදී. එමෙන්ම, 2024 වර්ෂයේ දී කාබනික පොහොර මෙ.ටො. 3,200ක් නිෂ්පාදනය වෙනුවෙන් කෘෂි උපකරණ කට්ටල 3,200ක් ලබා දීමට ඉලක්ක ගත වූ අතර මේ සඳහා රු.මි 24.00ක ප්‍රතිපාදන වෙන් කරන ලදි. එමෙන්ම එම පොහොර නිෂ්පාදනයේ ගුණාත්මක බව තවදුරටත් ඉහළ නැංවීම සඳහා ලබාදෙන එප්පාවල රොක් පෝස්පේට් කි.ග්‍රෑ. 160,000 ලබාදීම සඳහා රු.මි. 4.00 වෙන් කර ඇත. ඒ අනුව 2024.12.31 වන දින වන විට කාබනික පොහොර ඒකක නිෂ්පාදන වෙනුවෙන් ලබාදෙන උපකරණ කට්ටල 3,200 ප්‍රතිලාභීන්ට ලබාදී ඇති අතර රොක් පොස්පේට් කි.ග්‍රෑ 160,000 ප්‍රතිලාභීන් වෙත ලබාදී ඇත. ඒ සඳහා කෘෂි උපකරණ කට්ටල සඳහා රු.මි. 21.84 ක් සහ රොක් පොස්පේට් සඳහා රු.මි. 3.47 ක් වැය කොට ඇත.

ඡායාරූප අංක 78

**විෂය පථය: සුරක්ෂිත ජල සම්පත**

**2.1 ජල මූලාශ්‍ර සංරක්ෂණය**

ජල මූලාශ්‍ර හා ඒ අවට පරිසර පද්ධතිය ආරක්ෂා කිරීම, එම ප්‍රදේශයේ ජනතාවගේ පානීය ජල අවශ්‍යතා සපුරා ගැනීම සහ ඔවුන්ට කෘෂිකාර්මික කටයුතු සඳහා අවශ්‍ය ජලය සැපයීම අරමුණු කොට ගනිමින් මෙම වැඩසටහන ක්‍රියාත්මක වේ. මහනුවර, මාතලේ , කෑගල්ල, හම්බන්තොට, මන්නාරම සහ ගාල්ල දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ.

2024 වර්ෂය සඳහා ජල මූලාශ්‍ර 25 ක් සංරක්ෂණය කිරීමට ඉලක්ක කරන ලදී. මෙම වැඩසටහන සඳහා රු.මි. 25.00 ක ප්‍රතිපාදන මුදලක් වෙන් කරන ලදී. ඒ අනුව 2024.12.31 වන දිනට ජල මූලාශ්‍ර 24 ක් සංරක්ෂණය කොට අවසන් කරන ලදී. ඒ සඳහා රු.මි. 23.95 ක් වැය කරන ලදී.

ජල පෝෂක ප්‍රදේශ අවට සංරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කරමින් ජල පෝෂක ප්‍රදේශ තිරසාරව භාවිත කිරීම උදෙසා මෙම වැඩසටහන ක්‍රියාත්මක කරනු ලැබේ. ඒ සඳහා ජලකාමී රුක් රෝපණය කිරීම සඳහා ජලකාමී පැල 20,000 ක් ලබාදීම සඳහා සැලසුම් කළ අතර ඒ සඳහා රු.මි. 2.00 ඇස්තමේන්තුගත කරන ලදි. ඒ අනුව 2024.12.31 වන විට රු.මි. 1.322 ජලකාමී පැල 10,460 ක් ලබා දී ඇත

ඡායාරූප අංක 79

**2.2. ප්‍රජා සහභාගීත්ව වැඩසටහන් පැවැත්වීම**

ජල මූලාශ්‍ර අවට සංරක්ෂණ කිරීම තුළින් පානීය ජල අවශ්‍යතාවය සඳහා පිරිසිදු ජලය ලබා ගැනීම, විවිධ මානව ක්‍රියාකාරකම් හේතුවෙන් පරිහානියට පත්ව ඇති ජල මූලාශ්‍ර අවට පරිසරය පවිත්‍ර කිරීම සහ පරිසරය ආරක්ෂා කිරීම සඳහා ප්‍රජා සහභාගීත්ව වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ මූලික අරමුණ විය. ඒ අනුව 2024 වර්ෂය සඳහා මෙම වැඩසටහන් 50 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති අතර ඒ සඳහා රු.මි. 1.00 ඇස්තමේන්තුගත කර ඇත. ඒ අනුව 2024.12.31 වන විට පවිත්‍රතා වැඩසටහන් 15 ක් ක්‍රියාත්මක කර ඇති අතර ඒ සඳහා රු. 547,795.00 වැය කොට ඇත.

ඡායාරූප අංක 80

**විෂය පථය: ආහාර සුලභතාවය සහ සුරක්ෂිතතාව තහවුරු වූ නිරෝගීමත් සමෘද්ධිමත් ප්‍රජාවක්**

**3.1 ගෙවතු වගා ප්‍රවර්ධනය**

වතු වගා ප්‍රවර්ධනය උදෙසා ගුණාත්මක බීජ හා රෝපණ ද්‍රව්‍ය සැපයීම තුලින් ආහාර සුරක්ෂිතතාවය ඉහළ නැංවීමට ගොවියා විසින් සකස් කරන ලද ගෙවතු සඳහා බීජ කට්ටල , කෘෂි උපකරණ, දියර පොහොර ලබාදීම සහ අවශ්‍ය තාක්ෂණික දැනුම ලබාදීම මෙම සංවර්ධන වැඩසටහන මඟින් සිදු කෙරේ. මෙම වැඩසටහන මහනුවර, මාතලේ, කෑගල්ල, කොළඹ, ගම්පහ, අනුරාධපුරය, බදුල්ල, හම්බන්තොට, වව්නියා, මුලතිව්, මන්නාරම සහ කුරුණෑගල දිස්ත්‍රික්කවල තෝරා ගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුළ ක්‍රියාත්මක විය.

ගෙවතු වගා ප්‍රවර්ධන වැඩසටහන යටතේ පැල කට්ටල 30,000ක් ලබාදීමට ඉලක්ක ගත විය. ඒමෙන්ම ගෙවතු වගා කෘෂි උපකරණ කට්ටල 6,000 ක් , කාබනික දියර පොහොර ලබාදීමේ ලීටර් 1 බැගින් ලීටර් 6000ක් ඉලක්ක ගත කරන ලද අතර ඒ සඳහා රු.මි 30.00 ක ප්‍රතිපාදන මුදලක් වෙන් කරන ලදී. ඒ අනුව 2024.12.31 දිනට සකස් කරන ලද තිරසර ගෙවතු 6000 සඳහා කෘෂි උපකරණ

කට්ටල, පැල කට්ටල සහ කාබනික දියර පොහොර ලබාදී අවසන් කර ඇති අතර ඒ සඳහා රු.මි.29.09ක් වැය කොට ඇත.

ඡායාරූප අංක 81

**3.2. වාණිජ මට්ටමේ ගෙවතු වගා ප්‍රවර්ධනය**

වාණිජ මට්ටමින් ගෙවතු වගාව සිදුකරනු ලබන ගොවීන් සඳහා ගෙවතු වගාව සඳහා අවශ්‍ය වන කෘෂි යෙදවුම් කට්ටල වන උදළු,මීටර් 50 වතුර බටයක්, උදළු මුල්ලුව,තාච්චිය,අලවංගුව,ස්ප්‍රේ යන්ත්‍රයක් එමෙන්ම වාණිජ ගෙවතු වගා වැඩසටහන යටතේ පැල බඳුන් 20ක් වාණිජ මට්ටමේ ගොවීන් 500ක් වෙත ලබාදීමට සැලසුම් කොට තිබූ අතර ගොවීන් 500 දෙනා සඳහා 2024.12.31 දිනට උපකරණ කට්ටල ලබාදී ඇති අතර රු.මි. 6.98 වැය කර ඇත.

**3.3. ආර්ථික බෝග වගා ප්‍රවර්ධනය**

මුරුංගා, පුවක්, පොල්,තැඹිලි, ගම්මිරිස්, වැනිලා, කුරුඳු, කෝපි සහ දෙහි යන ආර්ථික බෝග ලබාදීම මඟින් ආර්ථික බෝග වගා කරන ගොවීන්ට සහය ලබාදීම සඳහා මෙම වැඩසටහන ක්‍රියාත්මක කර ඇත. ඒ අනුව ආර්ථික බෝග පැල 20,000ක් ලබාදීමට අපේක්ෂා කරන ලද අතර ඒ සඳහා රු.මි. 5.00 ක ප්‍රතිපාදන වෙන් කර තිබූ අතර 2024.12.31 දිනට පැල 28,845ක් ලබාදී ඇත. ඒ සඳහා රු.මි. 5.00 වැය කොට ඇත.

**3.4. අතිරේක ආහාර බෝග ප්‍රවර්ධනය**

ආහාර සුරක්ෂිතතාවය ඉහළ නැංවීම උදෙසා සහ ගොවීන් වෙත අතිරේක ආදායම් මාර්ග උත්පාදනය අරමුණු කොට ගෙන අතිරේක ආහාර බෝග ප්‍රවර්ධන වැඩසටහනක් 2024 වර්ෂය සඳහා සැලසුම් කරන ලදී. එමඟින් හෙක්ටයාර 100ක අතිරේක ආහාර බෝග වගා කිරීම සඳහා කව්පි, මුං, රට කජු, කුරක්කන්, මිරිස් සහ උඳු බීජ ගොවීන් වෙත ලබාදීම සඳහා මෙම වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබයි. ඒ සඳහා රු.මි. 5.00ක් වෙන්කර අතර මහනුවර, මාතලේ, හම්බන්තොට, අනුරාධපුරය, බදුල්ල, වව්නියාව, මුලතිව් සහ කුරුණෑගල දිස්ත්‍රික්කවල තෝරාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල තෝරාගත් ගොවීන් සඳහා බීජ කි.ග්‍රෑ. 3,716 ක් බෙදාහැර ඇති අතර 2024.12.31 දිනට එම බීජ මඟින් හෙක්ටයාර 127 ක් වගා කොට ඇත. මේ සඳහා වෙන් කරන ලද මුදලින් රු.මි. 4.98 ක් වැය කරන ලදී.

**3.5. වගාවන් සඳහා වන සතුන්ගෙන් සිදුවන හානිය අවම කිරීම**

ශ්‍රී ලංකාවේ වන සතුන් නිසා සිදුවන වාර්ෂික වගා හානිය 40% බව පර්යේෂණ වාර්තා මඟින් සනාථ කොට ඇත. ඒ හේතුවෙන් වන සත්ව හානිය වලක්වා ගැනීම උදෙසා ගොවීන් වෙත යටිතල පහසුකම් සැපයීම මූලික අරමුණ කර ගනිමින් ගොවීන්ගේ වගා කටයුතු සඳහා සේවාවන් සැපයීම ශ්‍රී ලංකා හදබිම අධිකාරිය මඟින් සංවර්ධන වැඩසටහනක් ලෙස 2023 වර්ෂයේ ආරම්භ කරන ලද අතර පවතින දැඩි ඉල්ලීම මත 2024 වර්ෂය සඳහාද මෙම වැඩසටහන ක්‍රියාත්මක කරනු ලැබීය. ඒ අනුව ප්‍රතිලාභින්ගෙන් 50% ක දායකත්වයක් ලබාගෙන විදුලි වැට සහ වායු රයිෆල් ලබාදීමට සැලසුම් කර ඇත. ඒ සඳහා වායු රයිෆල් 700ක්, විදුලි වැට ඒකක 75 ක් ලබාදීම සඳහා රු.මි.20.00ක් වෙන් කරනු ලැබූ අතර වායු රයිෆල් 701ක් සහ විදුලි වැට ඒකක 75 ක් 2024.12.31 වන දිනට ප්‍රතිලාභීන්ට ලබාදී ඇත. ඒ සඳහා රු.මි. 19.97ක මුදලක් වැය කොට ඇත.

මෙම සංවර්ධන වැඩසටහන මහනුවර, මාතලේ, කෑගල්ල, හම්බන්තොට, කොළඹ, ගම්පහ, අනුරාධපුරය, බදුල්ල, ගාල්ල, වව්නියාව, කුරුණෑගල යන දිස්ත්‍රික්කවල තෝරාගත් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ වල ප්‍රාදේශිය ලේකම් විසින් නිර්දේශ කරන ලද අවශ්‍යතාව ඇති ගොවීන් සඳහා ක්‍රියාත්මක කරන ලදී.

ඡායාරූප අංක 82

**විෂය පථය: ප්‍රශස්ථ යටිතල පහසුකම් ප්‍රවර්ධිත දැනුමින් හ තාක්ෂණයෙන් සවිබල ගැන්වූ නව කෘෂි ව්‍යවසායකයින්**

### 4.1. වාණිජ මට්ටමින් මීමැසි පාලනය සඳහා දිරි ගැන්වීම

මීමැසි පාලනය සඳහා වාණිජ මට්ටමින් සිදු කරනු ලබන ගොවි ප්‍රජාව තවදුරටත් සවිබල ගැන්වීම සඳහා පහසුකම් සැපයීම අරමුණු කොට ගනිමින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබීය. ඒ අනුව ප්‍රතිලාභීන්ගේ ව්‍යාපෘති යෝජනා මත පදනම්ව ශක්‍යතාවයෙන් ඉහළ තිරසර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට සැලසුම් කොට ක්‍රියාත්මක කරන ලදී. මේ සඳහා රු.මි. 01.00ක ප්‍රතිපාදන වෙන්කරනු ලැබූ අතර යටියන්තොට, වරකාපොල, අරනායක, වැලිමඩ, අබන්පොල, වාරියපොල, රිදීමාලියද්ද, ඉමදූව සහ උඩුදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ප්‍රතිලාභීන් 13 දෙනෙකු 50% ප්‍රජා දායකත්වය යටතේ ප්‍රතිලාභ ලබාදී ඇති අතර ඒ සඳහා රු. 954,300 වැය කරන ලදී.

### 4.2. බිම්මල් නිෂ්පාදන ව්‍යවසායකයින් බිහි කිරීම

වාණිජ මට්ටමින් බිම්මල් නිෂ්පාදන සිදුකරනු ලබන ව්‍යවසායකයින් හඳුනා ගනිමින් තවදුරටත් ඔවුන් සවිබල ගැන්වීම මෙම ව්‍යාපෘතියේ අරමුණ විය. ඒ සඳහා 50% ප්‍රජා දායකත්වය යටතේ පහසුකම් සැපයීමට මෙම වැඩසටහන යටතේ අපේක්ෂා කරන ලදි . ඒ අනුව මෙම වැඩසටහන සඳහා රු.මි. 1.25ක ප්‍රතිපාදන වෙන් කරන ලදී. මීරිගම, වලස්මුල්ල, වීරකැටිය, යටිනුවර, රිදීමාලියද්ද, වැලිමඩ, මාවතගම සහ රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්හී ප්‍රතිලාභීන් 15 දෙනෙකු සඳහා ව්‍යාපෘති යෝජනා සලකා බැලීමෙන් අනතුරුව ප්‍රතිලාභ ලබාදීමට කටයුතු කරන ලදී. ඒ සඳහා රු.මි. 1.25 ක් වැය කරන ඇත.

### 4.3. කෘෂි නිෂ්පාදන අගය එකතු කිරීමේ ව්යවසායකයින් බිහි කිරීම

කෘෂි නිෂ්පාදන අගය එකතු කිරීමේ නිෂ්පාදන කටයුතු සිදුකරනු ලබන ව්‍යවසායකින් සඳහ 50% ප්‍රජා දායකත්වය යටතේ පහසුකම් සැපයීම මෙම වැඩසටහනේ අරමුණ විය. මේ සඳහා රු.මි.1.25ක් වෙන් කර ඇති අතර මහනුවර, කුරුණෑගල සහ අනුරාධපුර දිස්ත්‍රික්ක වලින් ඉල්ලීම් ලද ව්‍යාපෘති වාර්තා සලකා බැලීමෙන් අනතුරුව ප්‍රතිලාභීන් 22 සඳහා විජලන යන්ත්‍ර, කුළුබඩු ඇඹරුම් යන්ත්‍ර, විසුරුම් ජල පද්ධති, බිත්තර රක්කවන යන්ත්‍ර, ස්ටීමර් සහ වී වියලන අතුරන (Carpet) ලබාදී ඇත. ඒ සඳහා රු.මි. 1.23 ක මුදලක් වැය කොට ඇත.

### 4.4. වාණිජ මට්ටමින් පළතුරු ගම්මාන ප්‍රචලිත කිරීම

අපනයන වෙළඳපොල ජය ගැනීම උදෙසා ආදර්ශ පළතුරු ගම්මාන සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම මේ යටතේ සිදුකරනු ලැබිණි. ඒ අනුව, පළතුරු ගම්මාන 17 ක් සඳහා රු.මි. 30.00 ක් ඇස්තමේන්තුගත කොට තිබූ අතර එම මුදලින් රු.මි. 29.66ක මූල්‍ය ප්‍රගතියක් අත් කරගෙන ඇත. එම

ගම්මාන යටියන්තොට, අඹන්පොල, අරණායක, රඹුක්කන, ගල්නෑව,මුලතිව්, වව්නියාව, මීරිගම, මහර, දිවුලපිටිය, ඉමදූව, කරන්දෙණිය, වලස්මුල්ල, අම්බලන්තොට, තංගල්ල, අගුණුකොලපැලැස්ස, දෙහිඅත්තකණ්ඩිය සහ රිදීමාලියද්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල පිහිටුවා ඇත.

**විෂය පථය: සංරක්ෂණය වූ පරිසරයක්**

## 5.1 පාසල් පාදක පාරිසරික වැඩසටහන්

සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබන සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකම තෝරාගත් පාසල්වල සුහුරු ගෙවත්තක් නිර්මාණය කිරීම අරමුණු කර ගනිමින් මෙම වැඩසටහන් ආරම්භ කරන ලදී. ඒ අනුව වැඩසටහන් 60ක් ක්‍රියාත්මක කිරීමට ඉලක්ක කර තිබූ අතර රු.මි. 1.20 ක ප්‍රතිපාදන වෙන් කර ඇත. 2024.12.31 දින වනවිට වැඩසටහන් 15ක් සිදුකර ඇති අතර ඒ සඳහා රු.මි. 0.87 ක මුදලක් වැය කොට ඇත. මෙම වැඩසටහන මහනුවර, මාතලේ, කෑගල්ල, ගම්පහ, කොළඹ, බදුල්ල, අනුරාධපුරය සහ හම්බන්තොට යන දිස්ත්‍රික්කවල පාසල් ඉලක්ක කර ක්‍රියාත්මක විය.

## 5.2 ප්‍රජා පාදක පාරිසරික වැඩසටහන සහ දැනුවත් කිරීමේ වැඩසටහන්

සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ප්‍රජාව උදෙසා පාරිසරික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මෙම වැඩසටහනේ අරමුණ විය. ඒ අනුව මේ සඳහා රු.මි. 0.60 ක් වෙන්කර ඇති අතර වැඩසටහන් 20 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි. රු. මි. 0.57 ක් වැය කරමින් 2024.12.31 වන දින වන විට වැඩසටහන් 15 ක් වලස්මුල්ල, යටිනුවර, මහනුවර, තංගල්ල, කටුවන, අම්බලන්තොට, අඹගමුව, මීරිගම, මහර, කැළණිය, උඩුනුවර යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්හී ක්‍රියාත්මක කර ඇත.

**විෂය පථය: සෞඛ්‍ය සම්පන්න ප්‍රජාවක්**

## 6.1 ග්‍රාමීය ජනතාවගේ ප්‍රෝටීන අවශ්‍යතාවය සපුරාලීම සඳහා බිත්තර සහ කුකුළු මස් නිශ්පාදනය ඉහළ නැංවීම සඳහා ගොවීන් සවිබල ගැන්වීම.

ග්‍රාමීය ජනතාව අතර ප්‍රෝටීන ඌණතාවය උග්‍ර ගැටළුවක් බවට වර්තමානයේදී පත්ව ඇත. එම නිසා ග්‍රාමීය ප්‍රජාවගේ දෛනික සත්ව ප්‍රෝටීන් පරිභෝජනය ඉහළ නැංවීම, දේශීය වෙළඳපොලේ බිත්තර මිල උච්චාවනය අවම කිරීම මෙන්ම ගොවීන්ට අතිරේක ආදායම් මාර්ගයක් උත්පාදනය කිරිමේ අරමුණින් අර්ධ ගෘහාශ්‍රිත කුකුළු පාලන වැඩසටහන ක්‍රියාත්මක කරන ලදි.

මෙම සංවර්ධන වැඩසටහන මහනුවර, මාතලේ, කෑගල්ල, හම්බන්තොට, කොළඹ, ගම්පහ, අනුරාධපුරය, බදුල්ල, ගාල්ල, වව්නියාව,මන්නාරම,මුලතිව් සහ කුරුණෑගල යන දිස්ත්‍රික්ක වල ක්‍රියාත්මක කරන ලදී.

මේ සඳහා 2024 වර්ෂයේ කුකුළු පැටවුන් 45,000 ක් ලබාදීම සඳහා රු.මි. 31.50 ක් වෙන් කර තිබූ අතර 2024.12.31 දින වන විට රු.මි. 31.43 වැය කර කුකුළු පැටවුන් 45,000 ක් ප්‍රතිලාභි පවුල් වෙත නිකුත් කරන ලදී.

**6.2 කුඩා පරිමාණ ව්‍යවසායකයින්ට දිනක්/මාස 03ක් වයස කුකුල් පැටවුන් ලබාදීම.**

ග්‍රාමීය ජනතාව අතර ප්‍රෝටීන ඌණතාවය අවම කිරීම අරමුණු කර ගනිමින් 50% ප්‍රජා දායකත්වය යටතේ දිනක් වයසැති සිට මාස තුනක් වයසැති පිරිමි කුකුල් පැටවුන් මස් නිෂ්පාදනය පිණිස ලබාදීම මෙම වැඩසටහනේ අරමුණ විය. ඒ සඳහා රු.මි. 0.80ක් වෙන් කොට ඇති අතර වර්ෂය අවසානය වනවිට පැටවුන් 5000ක් ලබාදීමට අපේක්ෂා කලද 2024.12.31 දිනට කුකුළු පැටවුන් 500 ක් පමණක් කෑගල්ල දිස්ත්‍රික්කයට ලබාදී ඇති අතර ඒ සඳහා රු.36,750.00ක් වැය කර ඇත.

**විෂය පථය: ගොවි ජනතාව කෘෂි තාක්ෂණික දැනුමෙන් සවිබල ගැන්වීම**

**7.1 සමාජ සජීවීකරණය තුලින් සහභාගීත්ව සංවර්ධන ගැමි පිවිසුම් වැඩසටහන මගින් ගොවි ප්‍රජාවගේ දායකත්වය ලබා ගැනීම.**

මේ යටතේ සමාජ සජීවිකරණ වැඩසටහන් පවත්වා සවිබල ගැන්වීම හා ගොවිතැනට යොමු කිරීම, සමාජ සජීවීකරණය තුලින් සහභාගීත්ව සංවර්ධන ගැමි පිවිසුම් වැඩසටහන් (PRA) හරහා ගොවි ප්‍රජාවගේ දායකත්වය ලබා ගැනීම මඟින් සංවර්ධන වැඩසටහන් සැලසුම් කිරීම සිදු කිරීමට අපේක්ෂා කරන ලදි. ඒ අනුව 2024 වර්ෂය සඳහා වැඩසටහන් 60 ක් පැවැත්වීම සඳහා රු.මි.1.50 ක මුදලක් වෙන් කර ඇති අතර 2024.12.31 දිනට වැඩසටහන් 60 පවත්වා ඇති අතර ඒ සඳහා රු.මි. 1.37 ක මුදලක් වැය කොට ඇත. තවද මෙම වැඩසටහන් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරන ලද සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්හි ක්‍රියාත්මක කරන ලදී.

**7.2 ගොවි ප්‍රජාව සඳහා තාක්ෂණික පුහුණු වැඩසටහන් පවත්වා ගොවීන් සවිබල ගැන්වීම.**

මේ යටතේ ගොවි ප්‍රජාව සඳහා තාක්ෂණික පුහුණු වැඩසටහන් සංවර්ධන වැඩසටහන් වලට සමගාමීව පැවැත්වීම සිදුකරනු ලැබේ. ඒ සඳහා රු.මි. 1.20 ඇස්තමේන්තුගත කර ඇති අතර ගොවි පුහුණු වැඩසටහන් 120ක් පැවැත්වීමට අපේක්ෂා කරන ලදී. 2024.12.31 වන දිනට ගොවි පුහුණු වැඩසටහන් 120 පවත්වා ඇති අතර ඒ සඳහා රු.මි. 0.82ක් වැය කොට ඇත.

**විෂය පථය: සේවක අභිප්‍රේරණය තුලින් සේවා ඵලදායිතාවය ඉහල නැංවීම**

මෙම විෂය පථය යටතේ භෞතික සම්පත් සංවර්ධනය යටතේ භෞතික සම්පත් අත්පත් කර ගැනීම සඳහා රු.මි. 4.20 ක් වෙන් කර ඇති අතර 2024.12.31 දින වන විට ඉන් රු.මි.4.19 ක් වැය කොට ඇත.

2024 වර්ෂයේදී ක්‍රියාත්මක සංවර්ධන වැඩසටහනේ ප්‍රගතිය ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය හා ආයතනයේ නිලධාරීන්ගේ ප්‍රධානත්වයෙන් මාසිකව සමාලෝචනය කිරීමට සැලසුම් කළ අතර ප්‍රගති සමලෝචන රැස්වීම් 12 ක් පැවැත්වීමට නියමිතව තිබුනි. 2024.12.31 දිනට ප්‍රගති සමලෝචන රැස්වීම් 8ක් පවත්වා ඇත. ඒ සඳහා රු.මි.1.00 ක් වෙන්කර තිබූ අතර රු.මි.0.46 ක් ඒ සඳහා වැය කරන ලදී.

එමෙන්ම ආයතනයේ කාර්යය මණ්ඩලයේ සංකල්පීය, තාක්ෂණික සහ මානව හැකියාවන් ඉහළ නැංවීම සහ දැනුම යාවත්කාලීන කිරීම සඳහා මානව සම්පත් සංවර්ධනය සහ පුහුණු වැඩසටහන් සඳහා රු.මි.2.00 ක් වෙන්කරන ලදී. එම මුදලින් රු.මි. 1.66 ක් වැයකොට සංවර්ධන සහ පුහුණු වැඩසටහන් 19 ක් පවත්වන ලදී.

# පශු සම්පත් අංශය

## වැය ශීර්ෂ අංක 118 යටතේ සිදු කරන ලද ප්‍රධාන සංවර්ධන වැඩසටහන්වල මූල්‍ය සහ භෞතික ප්‍රගතිය

### 1. සත්ත්ව අභිජනන සහ ගොවිපොළ සංවර්ධනය - වැය ශීර්ෂ අංක 118-2-03-078-2507

2024 වර්ෂයේ පශු සම්පත් අංශයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව සත්ත්ව අභිජනනය හා ගොවිපොළ සංවර්ධන ව්‍යාපෘතිය සඳහා වෙන්වූ රු.මි.50.00 ක ප්‍රතිපාදනවලින් රු. මි. 4.65 ක ප්‍රමාණයක් 2023 වර්ෂයේ බැඳීම් සඳහා ගෙවීම් කර ඇති අතර, රු. මි. 45.35 ක් උතුරු මැද, වයඹ, දකුණු සහ බස්නාහිර යන පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවල සත්ත්ව අභිජනනය හා ගොවිපළ සංවර්ධනය සඳහා වෙන් කරන ලදි.

ඒ අනුව උතුරු මැද පළාතේ තිරප්පනේ සහිවාල් අභිජනන ඒකකයක් පිහිටුවීම සඳහා රු.මි. 10.00 ක් ද, කෘත්‍රිම සිංචනය ශක්තිමත් කිරීම සඳහා කෘත්‍රිම සිංචන උපකරණ මිලදී ගැනීමට රු.මි. 3.37 ක් ද වැය වී ඇත. බස්නාහිර පළාතේ කොටදෙණියාව සත්ත්ව පාලන පුහුණු පාසලේ අභිජනන ඒකකයේ වහලය අලුත්වැඩියා කිරීම සඳහා රු.මි. 6.45 වැයවූ අතර එම මුදල 2025 වසර සඳහා මූල්‍ය බැඳීමක් විය. වයඹ පළාත තුළ එළු අභිජනන ගොවිපළක් ස්ථාපනය සඳහා අනුමැතිය ලබා දුන්නද සංශෝධිත ඇස්තමේන්තුව හා නිවාස සැලැස්ම සකස් කිරීමේදී සිදුවූ ප්‍රමාදය හේතුවෙන් එම ව්‍යාපෘතිය සිදු කිරීමට නොහැකි බව දන්වා ඇත. දකුණු පළාතේ අනුමත වූ ව්‍යාපෘතිය වන කැකුණදූර ගොවිපළෙහි එළු අභිජනන ඒකකය පිහිටුවීම පළාත් ප්‍රතිපාදන යටතේ ඉටු කොට ඇත.

### 2. කුඩා හා මධ්‍ය පරිමාණ පශු සම්පත් සංවර්ධනය (යටිතල පහසුකම් සංවර්ධනය)

#### 2.1. මධ්‍යකාලීන පශු සම්පත් සංවර්ධන වැඩසටහන

පශු සම්පත් ක්ෂේත්‍රය දියුණු කිරීම සඳහා උතුරු පළාතෙහි පවතින විශාල විභවතාව තුළ පශු වෛද්‍ය කාර්යාල හා අනෙකුත් යටිතල පහසුකම් ස්ථාපනය කිරීම මඟින් පශු සම්පත් ක්ෂේත්‍රයේ සේවා සැපයුම වැඩිදියුණු කිරීම උදෙසා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරේ.

මෙම ව්‍යාපෘතිය යටතේ අර්ධ වශයෙන් ඉදිකළ පේදුරුතුඩුව පශු වෛද්‍ය කාර්යාලය ඉදිකිරීම සම්පූර්ණ කිරීම වෙනුවෙන් 2024 වසර සඳහා රු.මි. 60.00 ක ප්‍රතිපාදන වෙන් කර තිබූ අතර එම ප්‍රතිපාදනවලින් රු.මි. 10.74 ක් ආරම්භක අත්තිකාරම ලෙස කොන්ත්‍රාත්කරු වෙත ගෙවීමට කටයුතු කර ඇත.

#### 2.2. සූකර ගොවිපොළ සංවර්ධන වැඩසටහන

ක්ෂේත්‍රයේ සූකර ගොවීන් වෙත උසස් වර්ගයේ සූකර පැටවුන් නිකුත් කිරීමේ අරමුණින් උතුරු මැද පළාතේ තිරප්පනේ රජයේ ගොවිපොළ තුළ සූකර අභිජනන ඒකකයක් ඉදිකිරීම සඳහා 2024 වර්ෂයට වෙන් කරන ලද මුදල රු.මි. 5.00 කි.

සමාලෝචිත කාල සීමාව අවසන් වන විට නිසි අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම, සූකර නිවාසයක් පිහිටුවීම, සූකර පැටවුන් මිලදී ගැනීම, සතුන් සඳහා උපකරණ හා ඖෂධ මිලදී ගැනීම යන ක්‍රියාකාරකම් ඇතුළත්ව සූකර අභිජනන ඒකකයෙහි ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇත. ඒ වෙනුවෙන් මූල්‍ය බැඳීම් ලෙස 2025 දී රු.මි. 4.90 ක් ගෙවීමට නියමිතව ඇත.

## 2.3. කුකුළු ගොවිපොළ සංවර්ධන වැඩසටහන

අවම පිරිවැයකින් ගොවිපොළ කටයුතු පවත්වාගෙන යාමේ අරමුණින් උතුරු පළාතේ යාපනය අච්චුවේලි රජයේ ගොවිපොළෙහි සූර්ය පැනල ස්ථාපනය කිරිම සඳහා රු.මි 5.15 ක මුදලක් වෙන් වී ඇත. මෙම ව්‍යාපෘතිය උතුරු පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලැබේ.

ප්‍රසම්පාදන කටයුතුවලදී ඇති වූ අපහසුතා නිසා මෙම ව්‍යාපෘතිය සිදු කිරීමට නොහැකි බව 2024.12.20 දින අමාත්‍යාංශය වෙත දැනුම් දි ඇත.

## 2.4. කිරි ගව පාලන සංවර්ධන වැඩසටහන

පුනර්ජනනීය ශක්ති ප්‍රභව හඳුන්වාදීම මඟින් කිරි නිෂ්පාදන වියදම අඩු කිරීම සහ නිසි අභිජනන හා පෝෂණ කළමනාකරණය මඟින් ගොවිපොළ ඵලදායිතාව වැඩිදියුණු කිරීම මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණු වේ. සමාලෝචිත වර්ෂය සඳහා මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් රු.මි. 77.79ක ප්‍රතිපාදන වෙන්කර තිබූ අතර, මේ යටතේ ක්‍රියාත්මක කරන ලද ක්‍රියාකාරකම් පහත පරිදි වේ.

| පළාත | ව්‍යාපෘතිය | ප්‍රතිපාදන (රු.මි.) | 2024.12.31 වන විට වැය කළ මුදල (රු.මි.) |
|---|---|---|---|
| උතුරු පළාත | කිළිනොච්චි ප්‍රාදේශීය පුහුණු පාසලේ සූර්ය පැනල සවිකිරීම | 5.00 | 4.26 |
| ඌව පළාත | බදුල්ල බොරලන්ද ගොවිපොළෙහි සූර්ය පැනල සවිකිරීම | 9.00 | - |
| බස්නාහිර පළාත | කොටදෙණියාව සත්ත්ව පාලන පුහුණු මධ්‍යස්ථානයෙහි ගව ආහාර නිෂ්පාදනය වැඩිදියුණු කිරීම | 5.00 | 4.74 |
| උතුරු මැද පළාත | තිරප්පනේ සත්ත්ව අභිජනන පුහුණු මධ්‍යස්ථානය තුළ වගා ළිඳක් ඉදිකිරීම | 5.00 | 4.19 |
| වයඹ පළාත | වන්නිගම ගොවිපොළෙහි පැටවුන් සඳහා නිවාස පහසුකම් වැඩිදියුණු කිරීම හා පෝෂණ කළමනාකරණය | 3.00 | 3.00 |

මේ වන විට ඉහත ක්‍රියාකාරකම් සාර්ථකව අවසන් කර ඇති අතර, ඌව පළාත හැර ඉතිරි පළාත් හතරෙහි ගෙවීම් සිදුකර ඇත. ඌව පළාතෙහි රු. මි. 9.00 ක මූල්‍ය බැඳීම් 2025 වසරෙහි ගෙවීමට නියමිතව ඇත.

ඡායාරූප අංක 01 - 02

ඉහත ක්‍රියාකාරකම්වලට අමතරව මෙම ව්‍යාපෘතිය හරහා පශු සම්පත් ක්ෂේත්‍රය සම්බන්ධයෙන් දත්ත එකතු කිරීමේ පද්ධතියක් හඳුන්වාදීම සහ පළාත් මට්ටමින් කිරි ගව සංවර්ධන ඒකක ස්ථාපනය කිරීම සඳහා රු.මි. 48.52 ක් වෙන්කර තිබුණි. නමුත් මේ වන විට විදේශ ආධාර ව්‍යාපෘතියක් මඟින් සමස්ත කෘෂිකර්ම ක්ෂේත්‍රයට අයත් දත්ත එකතු කිරීමේ පද්ධතියක් ස්ථාපනය කිරීමේ කටයුතු ආරම්භ කර ඇති බැවින් මෙම ක්‍රියාකාරකම් සිදු නොකිරීමට තීරණය කර ඇති බැවින් එම ප්‍රතිපාදන නැවත පවරාගන්නා ලෙස ලිඛිතව දැනුම් දී ඇත.

### 2.5. ධාරිතා සංවර්ධන වැඩසටහන

2024 වර්ෂයේදී මෙම ව්‍යාපෘතිය සඳහා රු.මි. 2.06 ක ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන්වී තිබූ අතර, නිලධාරීන්, ගොවීන් සහ තරුණ ව්‍යවසායකයන්ගේ ධාරිතා සංවර්ධනය හා පශු සම්පත් ක්ෂේත්‍රයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය මෙහි ප්‍රධාන අරමුණු විය. ඒ අනුව මේ යටතේ පහත ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

- මහා පරිමාණ ගොවිපොළ පිහිටුවීමට පරිසර මාර්ගෝපදේශ සැකසීම සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ නිලධාරීන්ගෙන් සමන්විත උප කමිටුවක් මඟින් ක්ෂේත්‍ර නිරීක්ෂණ චාරිකා සංවිධානය කිරීම
- පසු ගිය වසර තුළදී පළාත් මට්ටමින් ක්‍රියාත්මක කරන ලද පශු සම්පත් සංවර්ධන ව්‍යාපෘතිවල පසු විපරම් කටයුතු සිදු කිරීම
- කිරි නිෂ්පාදවල ගුණාත්මකභාවය ඉහළ නැංවීමේ අරමුණින් තෝරා ගත් පළාත් කිහිපයක මී කිරි නිෂ්පාදකයින් සඳහා පුහුණු වැඩමුළු සංවිධානය කිරීම. ඒ සඳහා එක් පළාතක් වෙත රු. 200,000 බැගින් රු. මිලියනයක ප්‍රතිපාදන වෙන් කර තිබුණි. වයඹ පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මඟින් පමණක් මෙම පුහුණු වැඩසටහන සිදුකර ඇත.
- පශු සම්පත් ක්ෂේත්‍රයට අදාළ විවිධ උප අංශවල ප්‍රතිපත්ති යාවත්කාලීන කිරීම හා සාකච්ඡා කටයුතු සිදු කිරීම. මෙම ව්‍යාපෘතිය සඳහා මෙම වසර තුළදී රු. 527,867.00 ක් වැය වී ඇත.

## 3. කුඩා හා මධ්‍ය පරිමාණ පශු සම්පත් සංවර්ධනය (සංවර්ධන සහාය)

### 3.1. කිරි/මී ගව සංවර්ධන වැඩසටහන

මෙම ව්‍යාපෘතිය සඳහා රු.මි. 31.26 ක් වෙන්කර ඇති අතර, මේ හරහා ප්‍රධාන ක්‍රියාකාරකම් දෙකක් සිදු වේ.

#### 3.1.1. කිරි සහ කිරි නිෂ්පාදනවල ගුණාත්මකභාවය දියුණු කිරීම

ශ්‍රී ලංකාවේ මී ගව පාලනය ග්‍රාමීය ගොවීන්ගේ සාම්ප්‍රදායික ජීවනෝපාය මාර්ගයක් වන අතර, බොහෝ ගොවීන් තම ආදායම වැඩි කර ගැනීම සඳහා අගය එකතු කළ නිෂ්පාදනයක් වන මුදවන ලද කිරි නිෂ්පාදනය කරනු ලබයි. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය කිරි සඳහා ප්‍රමිතීන් ස්ථාපිත කර ඇති නමුත් බොහෝ කුඩා පරිමාණ කිරි නිෂ්පාදකයින් මේ සම්බන්ධයෙන් ඇති දැනුවත්භාවය අඩුකම හේතුවෙන් පරිභෝජනයට නුසුදුසු නිෂ්පාදන ක්‍රම භාවිතා කරයි. එබැවින් කිරිවල සෞඛ්‍යාරක්ෂිත තත්ත්වය ඉහළ නැංවීම සහ කිරි නිෂ්පාදනවල කල්තබා ගැනීමේ හැකියාව වැඩි කිරීම සඳහා කිරිවල ගුණාත්මකභාවය ඉහළ නැංවීම ඉතා වැදගත් වේ. ශ්‍රී ලාංකිකයන් අතර සෞඛ්‍ය සම්පන්න සහ පෝෂණ ගුණයෙන් යුත් කිරි හා කිරි නිෂ්පාදන සඳහා ඉහළ ඉල්ලුමක් පවතින බැවින් තිරසාර ව්‍යාපාරයක් සඳහා කිරි හා කිරි නිෂ්පාදනයන්ගේ පෝෂණ ගුණය හා ගුණාත්මකභාවය ඉහළ නැංවීම අනිවාර්ය වේ. ඒ අනුව තෝරාගත් ගොවිපොළවල කිරි සහ කිරි නිෂ්පාදනවල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය උපකරණ මිලදී ගැනීමට සහ ඒ සඳහා අවශ්‍ය වෙනත් යටිතල පහසුකම් දියුණු කිරීම සඳහා රු.මි. 15.35 ක මූල්‍ය ප්‍රතිපාදන වෙන්කර ඇත.

ඡායාරූප අංක 03

ඒ අනුව ගොවිපල ඒකක 25 කට අදාළ උපකරණ මිලදී ගැනීම, ගොවිපොළ හා ඒ ආශ්‍රිත වැඩිදියුණු කිරීම් සඳහා ආයෝජිත මුදල රු. මි. 7.33 කි. 2025 වර්ෂය සඳහා මුල්‍ය බැදීම් වශයෙන් රු.මි. 2.49 කි.

### 3.1.2. යහ සත්ත්ව පාලන ක්‍රමවේද සහ ආදර්ශ ගොවිපොළ ස්ථාපනය

යහ සත්ත්ව පාලන ක්‍රමවේද භාවිතය ප්‍රචලිත කිරීම, නිරෝගී සතුන් තෝරා මිලදී ගෙන ඇතිදැඩි කිරීම සහ ඔවුන්ගේ සුබසාධනයේ සිට ප්‍රශස්ත කිරි නිෂ්පාදනයක් ලබා ගැනීම දක්වා ගොවිපළේදී අනුගමනය කරනු ලබන සියලුම ක්‍රියාමාර්ග වැඩි දියුණු කිරීම තුළින් ගොවිපොළෙහි ඵලදායිතාව වැඩි කිරීමේ අරමුණින් මෙම ව්‍යාපෘතිය 2024 වර්ෂය තුළ ක්‍රියාත්මක කර ඇත. යහ සත්ත්ව පාලන ක්‍රමවේද භාවිතය යටතේ, නිවාස තත්ත්වය වැඩි දියුණු කිරීම, කිරිවල ගුණාත්මකභාවය සහ නිෂ්පාදන ධාරිතාවය වැඩි කිරීම, එමෙන්ම කිරි ගොවිපොළ ලාභය උපයන තත්වයට නගා සිටුවීම වෙනුවෙන් ගොවිපොළක් සංවර්ධනය කිරීම සඳහා රජයේ සහයෝගය ලෙස උපරිම වශයෙන් එක් ගොවිපොළකට රු.මි. 0.5 ක් ලබා දෙන අතර, ප්‍රතිලාභී දායකත්වය මුළු ව්‍යාපෘති පිරිවැයෙන් 50% ක් වේ. ඒ අනුව 2024 වර්ෂය තුළදී කිරි ගොවිපළවල් 30 ක් සංවර්ධනය කිරීම සඳහා රු.මි. 15.00 ක ප්‍රතිපාදන වෙන් කර ඇත.

2024 දෙසැම්බර් මස අවසන් වන විට ආදර්ශ ගොවිපොළවල් 29 ක වැඩ අවසන් කර ඇති අතර, ඒ සඳහා ආයෝජිත මුදල රු.මි. 14.62 කි. 2023 වර්ෂයේ බැදීම් සඳහා ගෙවීමට තිබූ රු.මි. 6.15 ක මුදලද මෙම වසර තුළදී ගෙවා ඇත.

ඡායාරූප අංක 04

### 3.2. කුඩා හා මධ්‍ය පරිමාණ කුකුළු ගොවිපොළ සංවර්ධන වැඩසටහන

දිවයින පුරා ක්‍රියාත්මක කරන ලද මෙම ව්‍යාපෘතිය මඟින් කුකුළු කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදනයන්ගෙන් රට ස්වයංපෝෂිත කිරීම තුළින් කුකුළු නිෂ්පාදන පරිභෝජනය ප්‍රචලිත කිරීමත්, කුකුළු ගොවිපොළ ස්ථාපනය කිරීම තුළින් කුකුළු පාලන ක්ෂේත්‍රයට නව ව්‍යවසායකයින් යොමු කිරීමත් බලාපොරොත්තුවේ. මේ සඳහා වෙන් කරන ලද මුදල රු.මි. 35.00 කි. මේ යටතේ ප්‍රධාන ක්‍රියාකාරකම් 2ක් ක්‍රියාත්මක විය.

- ප්‍රතිලාභියෙකු සඳහා මසක් වයසැති වාණිජ කිකිළි පැටවුන් 10 හෝ ලිංග නිර්ණය නොකරන ලද ගම් කිකිළි පැටවුන් 15ක් ලබා දීම

එක් එක් පළාතේ අවශ්‍යතාවය අනුව වාණිජ කිකිළි පැටවුන් හෝ ලිංග නිර්ණය නොකරන ලද ගම් කිකිළි පැටවුන් ලබා දුන් අතර මේ සඳහා රු.මි. 27.93ක් වැය කර ගොවිපොළවල් 2,521ක් ස්ථාපනය කර ඇත. ප්‍රතිලාභීන් විසින් කුකුළු නිවාසය සකස්කර ගැනීම හා සතුන් සඳහා අවශ්‍ය ආහාර ලබාදීමේ කටයුතු කරනු ලැබිණි.

- උතුරු මැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ දිවා ආහාරය ලබාදෙන පාසැල් අතුරින් තෝරාගත් දුෂ්කර පාසැල්වල දරුවන්ට දිවා ආහාරය සඳහා බිත්තරයක් බැගින් ලබාදීම අරමුණු කොටගෙන නියමු ව්‍යාපෘතියක් ලෙස තෝරාගත් දරුවන්ගේ දෙමාපියන් 166 ක් වෙත මසක් වයසැති කිකිළි පැටවුන් 10 බැගින් ලබාදීම සඳහා රු.මි. 1.99 ක් වැය කර ඇත.

ඡායාරූප අංක 05

### 3.3. සූකර කර්මාන්ත සංවර්ධන වැඩසටහන

පාරිසරික ගැටළු අවම කර සූකර කර්මාන්තය දියුණු කිරීම සඳහා අවශ්‍ය යෙදවුම් සැපයීමේ අරමුණින් මෙම ව්‍යාපෘතිය 2024 වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලද අතර, ඒ සඳහා රු.මි. 10.30 ක ප්‍රතිපාදන වෙන් කර ඇත.

නිසි අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම, සූකර නිවාස තත්ත්වය වැඩි දියුණු කිරීම සහ ජීව වායු ඒකක ස්ථාපනය කිරීම යන ක්‍රියාකාරකම් තුළින් පරිසර හිතකාමී ලෙස ගොවිපොළක් සංවර්ධනය කිරීම මෙමගින් සිදුවේ. 2024 දෙසැම්බර් මස අවසන් වන විට බස්නාහිර, වයඹ, උතුර, නැගෙනහිර, මධ්‍යම හා ඌව යන පළාත් සඳහා සූකර ගොවිපොළවල් 68ක ව්‍යාපෘති වාර්තා අනුමත කර ඇත. ඒ අනුව එම පළාත් විසින් පරිසර හිතකාමී සූකර ගොවිපොළවල් 55ක වැඩ අවසන් කර ඇති අතර, ඒ සඳහා රු.මි. 8.98 ක මුදලක් ගෙවා ඇත. 2023 වර්ෂයේ ක්‍රියාත්මක වූ සූකර කර්මාන්ත වැඩසටහන සඳහා ගෙවීමට තිබූ රු.මි. 1.84 ක මුදල මෙම වසරේදී ගෙවා ඇත.

ඡායාරූප අංක 06

### 3.4. එළු සංවර්ධන වැඩසටහන

2024 වසරේ ක්‍රියාකාරි සැලැස්මට අනුව පශු සම්පත් සංවර්ධන අංශය යටතේ ක්‍රියාත්මක කරන ලද මෙම ව්‍යාපෘතිය සඳහා නැගෙනහිර, දකුණ සහ උතුර යන පළාත්වලට එළු පොකුරු ගම්මාන පිහිටුවීමට රු.මි. 15.45 ක ප්‍රතිපාදන වෙන් කරන ලද අතර, නැගෙනහිර සහ උතුරු පළාත් තුළ එළු පොකුරු ගම්මාන 2 බැගින් ද, දකුණු පළාත තුළ එක් එළු පොකුරු ගම්මානයක් ද ඉදිකරන ලදි.

තෝරාගත් පළාත්වල එළු පාලනය සඳහා ඉහළ විභවතාවයක් ඇති පශු වෛද්‍ය කොට්ඨාශ එළු පොකුරු ගම්මාන සඳහා තෝරා ගන්නා අතර එම ගම්මානවල තෝරාගත් ප්‍රතිලාභීන්ට මෙම ව්‍යාපෘතිය යටතේ ප්‍රතිලාභ ලබා දෙන ලදි. උසස් තත්ත්වයේ එළුවන් මිලදී ගැනීම සඳහා හෝ එළු නිවාස ඉදිකිරීම සඳහා ප්‍රතිලාභියෙකුගේ 50% ක දායකත්වය යටතේ එක් ප්‍රතිලාභියෙකුට රු.200,000 ක මුදලක් ලබා දෙන ලදි. 2024 වර්ෂයේ එළු පොකුරු ගම්මාන ව්‍යාපෘතිය සඳහා පහත සඳහන් පරිදි මුදල් වෙන් කරනු ලැබීය.

| පළාත | දිස්ත්‍රික්කය | පශු වෛද්‍ය කොට්ඨාශය | වෙන් කර තිබූ මුදල (රු.මි.) |
|---|---|---|---|
| නැගෙනහිර | ත්‍රිකුණාමලය | කුච්චවේලි | 6.12 |
| | මඩකලපුව | වවුනතිව් | |
| උතුර | මන්නාරම | මුරුන්ගන් | 6.12 |
| | වවුනියාව | වවුනියා | |
| දකුණ | මාතර | වැලිගම | 3.06 |
| **එකතුව** | | | **15.30** |

දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ වැලිගම පශු වෛද්‍ය කොට්ඨාසය වෙනුවෙන් ප්‍රතිලාභීන් 15 දෙනෙකු වෙනුවෙන් රු.මි 3.06 ක ප්‍රතිපාදන වෙන් කරනු ලැබුවත් ප්‍රතිලාභීන් 9 දෙනෙකු පමණක් ව්‍යාපෘතියට දායකත්වය සැපයූ අතර, සමාලෝචිත කාල සීමාව අවසන් වන විට සියලුම පළාත් වෙත ප්‍රතිපාදන නිදහස් කර ව්‍යාපෘතියේ වැඩ අවසන් කරනු ලැබ ඇත. මේ සඳහා 2024 වර්ෂයේදී සිදුකරන ලද සමස්ත ආයෝජනය රු.මි. 14.08 කි.

ඡායාරූප අංක 07

## 2024 වර්ෂයේ විදේශ අරමුදල් මත ක්‍රියාත්මක කරනු ලැබූ ව්‍යාපෘතිවල ප්‍රගතිය

### 01. කුඩා පරිමාණ කිරි නිෂ්පාදකයින්ගේ සමූපකාර සමිති සංවර්ධනය කිරීම

ශ්‍රී ලංකාවේ කිරි කර්මාන්තය නඟාසිටුවීමේ අරමුණින් ක්‍රියාත්මක කරන ලද මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ වනුයේ අගය එකතු කරන ලද කිරි නිෂ්පාදන අදාළ ප්‍රදේශවලම නිෂ්පාදනය කර, කිරි පරිභෝජනය ප්‍රචලිත කිරීම මඟින් ප්‍රජාවේ පෝෂණ මට්ටම ඉහළ නැංවීමය. මේ යටතේ තෝරාගත් ප්‍රදේශවල කුඩා පරිමාණ කිරි සැකසුම් මධ්‍යස්ථාන 06 ක් ස්ථාපනය කර සංවර්ධනය කිරීම සඳහා ආයෝජනය කරන ලද මුදල යුරෝ මිලියන 13.90 කි. මෙම ව්‍යාපෘතිය 2020.01.01 සිට 2024.12.31 දක්වා ක්‍රියාත්මක කරන ලදී.

| අ/අ | කිරි සැකසුම් මධ්‍යස්ථානය | භෞතික ප්‍රගතිය (%) | නිෂ්පාදන කටයුතු ආරම්භ කරන ලද දිනය |
|---|---|---|---|
| 01. | කුඩා පරිමාණ කිරි පට්ටි සංවර්ධන පදනම , වාරියපොළ | 100 | 2023.07.04 |
| 02. | සක්සීඩ් ඉන්ටර්නැෂනල් (පුද්.) සමාගම, වෙන්නප්පුව | 100 | 2024.01.19 |
| 03. | සී/ස දිස්ත්‍රික් කිරි සැපයුම්කරුවන්ගේ සමූපකාර සමිතිය, පොළොන්නරුව | 100 | 2024.04.05 |
| 04. | සී/ස නාවලපිටිය විවිධ සේවා සමූපකාර සමිතිය | 100 | 2024.01.04 |
| 05. | හෙරිටේජ් හෙළ ගොවි සංවර්ධන සමිතිය, බණ්ඩාරගම | 100 | 2025 වසර තුළ නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීමට නියමිතව ඇත. |
| 06. | අත්තනගල්ල කිරි නිපදවන්නන්ගේ සමූපකාර සමිතිය | 100 | 2024.09.25 |

ව්‍යාපෘතියට අදාළ සැපයුම් කොන්ත්‍රාත් ගිවිසුම 2019.02.27 දින අත්සන් තබා ඇත. ඒ අනුව තෝරාගත් ප්‍රතිලාභී කිරි නිෂ්පාදන සමූපකාර සමිති 03ක් සහ පෞද්ගලික කිරි ගොවි සමිති 03 ක් වෙත දෛනික නිෂ්පාදන ධාරිතාවය ලීටර් 5,000ක් වන කුඩා පරිමාණ කිරි සැකසුම් මධ්‍යස්ථාන 06 ක් ස්ථාපනය කර ඇත. මේ වන විට මෙම කර්මාන්ත ශාලාවන්හි පූර්ව පරීක්ෂා කිරීම් කටයුතු (Commissioning) සියල්ල නිම කොට ඇත.

ව්‍යාපෘතියෙහි ගිවිසුම් ප්‍රකාරව රාජ්‍ය පාර්ශ්වයෙහි මැදිහත්වීමෙන් සම්පූර්ණ විය යුතු කාර්යයන් සියල්ල 2023.12.31 වන විට අවසන් කොට ඇත. 2024 වර්ෂය තුළදී මෙහි පසු විපරම් කටයුතු සිදු කරන ලද අතර ප්‍රගති සමාලෝචන රැස්වීම 02 ක් පවත්වා ඇත. මේ සඳහා වියදම් කරන ලද මුදල රු.මි. 0.60 කි. බණ්ඩාරගම, හෙරිටේජ් හෙළ ගොවි සංවර්ධන සමිතියට අයත් කර්මාන්තශාලාවෙහි නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීම සඳහා ප්‍රතිලාභී පාර්ශවය විසින් සම්පූර්ණ කළ යුතු කාර්යයන් මේ වන විට අවසන් අදියරෙහි පවතී. ව්‍යාපෘතියට අදාළ යන්ත්‍රෝපකරණ ආනයනය වෙනුවෙන් දරන ලද වියදම යූරෝ මිලියන 12.56 කි.

ඡායාරූප අංක 08-09

## පශු සම්පත් අංශය යටතේ ඇති ආයතන මගින් ක්‍රියාත්මක වන ප්‍රධාන සංවර්ධන වැඩසටහන්වල මූල්‍ය හා භෞතික ප්‍රගතිය

## 01. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### 1.1. හැඳින්වීම

1978 වර්ෂයේදී ස්ථාපිත කරනු ලැබූ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකාවේ පශු සම්පත් සංවර්ධනය පිළිබඳව වගකීම දරණ ප්‍රධාන රාජ්‍ය ආයතනයයි. එමෙන්ම මෙම දෙපාර්තමේන්තුව රට තුළ සත්ත්ව රෝග පැතිරීම වළක්වාලීම, මැඩපැවැත්වීම, පශු සම්පත් ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණ හා සංවර්ධන කටයුතු, තාක්ෂණික නායකත්වය සැපයීම සහ සත්ත්ව අභිජනන කටයුතු සඳහා විශේෂඥ උපදෙස් හා සහාය සේවාවන් සැපයීම සම්බන්ධව නීත්‍යානුකූල බලය පැවරී ඇති ජාතික ආයතනයද වේ. මුළු දිවයිනම ආවරණය වන පරිදි සිදුකරනු ලබන වෙනත් ප්‍රධාන කටයුතු අතර; සත්ත්ව පාලනය පිළිබඳ පුහුණුකරුවන් පුහුණු කිරීම, එම කර්මාන්තය නගාසිටුවීමට අදාළ ව්‍යාපෘති සැකසීම, ආර්ථික ඇගයීම් සහ විශේෂ සංවර්ධන වැඩසටහන්ද ඇතුළත්වේ. පශු සම්පත් ක්ෂේත්‍රයේ සංවර්ධනයට පහසුකම් සැලසීම සඳහා මෙම දෙපාර්තමේන්තුව විසින් අදාළ නීති සම්පාදනය කර ක්‍රියාත්මක කරනු ලැබේ. පළාත් සභා පිහිටුවීමත් සමඟ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර මට්ටමේ කටයුතු පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු නවය (09) වෙතට පැවරිණි.

ජාතික සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් තාක්ෂණ නායකත්වය, විශේෂඥ සේවා සහ සහාය සේවා, පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු වෙත ලබාදීමෙන් පශු සම්පත් කර්මාන්තය වෙනුවෙන් විශාල මෙහෙයක් ඉටුකරනු ලබයි. පශු වෛද්‍ය නිලධාරීන් විසින් මෙහෙයවනු ලබන ප්‍රාදේශීය පශු වෛද්‍ය කාර්යාල, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ක්‍රියාකාරී ඒකකයන්ය. පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු යටතේ ක්‍රියාත්මක වන දිවයිනේ සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකම පාහේ පිහිටුවා තිබෙන ප්‍රාදේශීය පශු වෛද්‍ය කාර්යාල 337 මගින් බිම් මට්ටමේ සිට සියළුම පශු සම්පත් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ.

### 1.2. 2025 වර්ෂයේ මූල්‍ය ඉලක්ක

| අ/අ | ප්‍රධාන සංවර්ධන වැඩසටහන | ඇස්තමේන්තු මුදල (රු.මි.) |
|---|---|---|
| 1 | ප්‍රාග්ධන වියදම් | 898.00 |
| 2 | පුනරාවර්තන වියදම් | 932.93 |

## 1.3. 2025 වර්ෂයේ භෞතික ඉලක්ක (ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් හා ව්‍යාපෘති)

| අ/අ | වැඩසටහන | මිනුම් ඒකකය | ඉලක්කය | මුළු පිරිවැය (රු.මි.) |
|---|---|---|---|---|
| 1 | සත්ත්ව අභිජනන ව්‍යාපෘතිය | | | 200.00 |
| | කෘතීම සිංචන මෙහෙයුම් වැඩසටහන | නිපදවන ලද ගව ශුක්‍ර වඩි ගණන | 230,000 | |
| | | එක් එක් පශු වෛද්‍ය කොට්ඨාසය තුළ සිදු කරන ලද කෘත්‍රිම සිංචන සංඛ්‍යාව | 260,000 | |
| | | පැටවු උපත් සංඛ්‍යාව | 100,000 | |
| | නිලධාරීන් සහ ගොවීන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම | පුහුණුව ලත් ගොවීන් ගණන | 180 | |
| | සත්ත්ව ආහාර සම්පත් සංවර්ධන වැඩසටහන | | | |
| | තෘණ සංවර්ධන ව්‍යවසායකයින් ලියාපදිංචි කිරීම | ලියාපදිංචි වී ඇති තෘණ සංවර්ධන ව්‍යවසායකයින් සංඛ්‍යාව | 50 | |
| | වැඩි දියුණු කළ තෘණ වර්ගවල රෝපණ ද්‍රව්‍ය නිකුත් කිරීම සඳහා පහසුකම් සැලසීම | නිකුත් කරන ලද රෝපණ ද්‍රව්‍ය සංඛ්‍යාව | ඉල්ලුම අනුව | |
| 2. | සතුන්ගේ බෝවන රෝග වැලැක්වීමේ වැඩසටහන | එන්නත්කරණයට ලක්වූ සතුන් සංඛ්‍යාව | | 46.00 |
| | | කුර හා මුඛ | 270,000 | |
| | | කාලගාත්‍රා | 100,000 | |
| | | ගව රක්තාශ්‍රව | 135,000 | |
| 3 | කුර හා මුඛ රෝග එන්නත දේශීයව නිෂ්පාදනය | නිෂ්පාදනය කරන ලද එන්නත් වඩි සංඛ්‍යාව | 300,000 | 45.00 |
| 4 | බුරුළු ප්‍රදාහ පාලන වැඩසටහන | නිෂ්පාදනය කරන ලද බුරුළු නික්ෂේපණ සංඛ්‍යාව | 30,000 | 20.00 |
| 5 | උසස් තත්වයේ පශු එන්නත්සාර දේශීයව නිෂ්පාදනය කිරීම | නිෂ්පාදනය කරන ලද එන්නත් වඩි සංඛ්‍යාව | | 30.00 |
| | | ගව රක්තාශ්‍රව (HS) | 250,000 | |
| | | කාලගාත්‍රා (BQ) | 130,000 | |
| | | රැනිකට් (ND) | මිලියන 4.5 | |
| | | Fowl Cholera | ඉල්ලුම අනුව | |
| | | Swine pasteurella | | |
| 6 | කුකුළු සෞඛ්‍ය කළමනාකරණය මගින් කුකුළු මස් සහ බිත්තර අපනයනයට පහසුකම් සැලසීම | කුරුළු උණ රෝගය ආවේක්ෂණය සඳහා පරීක්ෂා කරන ලද සාම්පල ගණන | 33,150 | 10.00 |
| | | සැල්මොනෙල්ලා රෝග පාලනය සඳහා පරීක්ෂා කරන ලද අභිජනන හා බීජ රක්කවනාගාර සංඛ්‍යාව | 290 | |
| 7 | පශු සම්පත් පර්යේෂණ වැඩසටහන | ක්‍රියාත්මක කරන ලද පර්යේෂණ ව්‍යාපෘති ගණන | 27 | 80.00 |
| | | රසායනාගාර සේවාවන් ලබා ගැනීම සඳහා ලියාපදිංචි වූ සේවාදායකයින් ගණන | 3,500 | |

| අ/අ | වැඩසටහන | මිනුම් ඒකකය | ඉලක්කය | මුළු පිරිවැය (රු.මි.) |
|---|---|---|---|---|
| 8 | පශු වෛද්‍ය කාර්යාලවල සේවා සැපයුම් පද්ධතිය වැඩිදියුණු කිරීම (සත්ත්ව නිරෝධායන මධ්‍යස්ථාන හා සම්බන්ධ ආනයන හා අපනයන පද්ධතිය ජාලගත කිරීම හා ඩිජිටල්කරණය) | සැලසුම් කරන ලද ක්‍රියාකාරකම් වලින් ප්‍රතිශතයක් ලෙස | 100% | 25.00 |
| 9 | සතුන් හඳුනාගැනීමේ වැඩසටහන | කන් සළකුණු කිරීම් සිදුකරන ලද සතුන් සංඛ්‍යාව | 100,000 | 20.00 |
| 10 | සත්ත්ව නිරෝධායන ඒකක පුළුල් කිරීම හා නවීකරණය | සැලසුම් කරන ලද ඉදිකිරීම් වලින් ප්‍රතිශතයක් ලෙස | 100% | 5.00 |
| 11 | වනජීවී රෝග ආවේක්ෂණ වැඩසටහන | ආවේක්ෂණය කරන ලද රෝග සංඛ්‍යාව | 05 | 2.00 |
| 12 | සත්ත්ව ආහාර හා පශු නිෂ්පාදනවල ගුණාත්මකභාවය සහතික කිරීම | විශ්ලේෂණය කරන ලද සත්ත්ව ආහාර සාම්පල ගණන | 5,000 | 40.00 |
| 13 | සත්ත්ව පාලන ඩිප්ලෝමාධාරීන් බිහි කිරීමේ හැකියාව ශක්තිමත් කිරීම | සත්ත්ව පාලන ඩිප්ලෝමාධාරී සිසුන් ගණන | 80 | 60.00 |
| 14 | පශු විමර්ශණ මධ්‍යස්ථානවල කුකුළු හා මත්ස්‍ය රෝග හඳුනාගැනීමේ හා ආවේක්ෂණ පහසුකම් වැඩි දියුණු කිරීම | අපනයනය පහසුකරණය සඳහා සහතික කරන ලද මත්ස්‍ය නිෂ්පාදන මධ්‍යස්ථාන ගණන | 125 | 5.00 |
| 15 | කුණ්ඩසාලේ කෘත්‍රිම සිංචන මධ්‍යස්ථානය වැඩි දියුණු කිරීම තුළින් තත්වයෙන් උසස් ගව ශුක්‍ර වඩි නිෂ්පාදනය හා බෙදා හැරීම ඉහළ නැංවීමේ ව්‍යාපෘතිය | ආනයනය කරන ලද ඉහළ නිෂ්පාදන හැකියාවක් සහිත. ආරයෙන් උසස් ගොනුන් සංඛ්‍යාව | 12 | 100.00 |
| 16.1 | තත්ත්ව ආරක්ෂණ වැඩසටහන | | | 25.00 |
| | සත්ත්ව ආහාරවල ගුණාත්මකභාවය සහ ප්‍රමිතීන් සහතික කිරීම | ලියාපදිංචි නිෂ්පාදන සංඛ්‍යාව | 3,600 | |
| | සත්ත්ව ආහාර සහ සත්ත්ව අහාරවල අඩංගු ද්‍රව්‍ය නියාමනය මගින් ජාත්‍යන්තර වෙළඳාමට පහසුකම් සැලසීම | පූර්ව නිෂ්කාශන අනුමත කිරීම් ගණන | 7,000 | |

| අ/අ | වැඩසටහන | මිනුම් ඒකකය | ඉලක්කය | මුළු පිරිවැය (රු.මි.) |
|---|---|---|---|---|
| | සම්මත ඇගයීම් ක්‍රියාවලීන් සමඟ පශු ඖෂධ නිෂ්පාදන සහ ජීව විද්‍යාත්මක නිෂ්පාදන නියාමනය සහ ලියාපදිංචි කිරීම/බලපත්‍ර ලබාදීම | ලියාපදිංචි කිරීම්/අලුත් කිරීම් ගණන | ඉල්ලුම අනුව | |
| | කුකුළු මුතුන් මිත්තන් සහ දෙමාපිය පරම්පරාවේ අභිජනන ගොවිපොළ ස්ථාපනය කිරීමට අදාළ මූලික කටයුතු කිරීම හා අපනයන ආයතන ආවේක්ෂණ ලියාපදිංචි කිරීම | ලියාපදිංචි කිරීම්/අලුත් කිරීම් ගණන | 200 | |
| 16.2 | සමාජ ආර්ථික සංවර්ධන වැඩසටහන | සිදුකළ අධ්‍යයනයන්/සමීක්ෂණ සංඛ්‍යාව | 04 | |
| | | එළි දක්වන ලද ප්‍රකාශන සංඛ්‍යාව | 10 | |
| 16.3 | පශු සම්පත ප්‍රචලිත කිරීමේ වැඩසටහන | නිෂ්පාදනය කරන ලද රූපවාහිනී/ගුවන්විදුලි වැඩසටහන් සංඛ්‍යාව | ගු.වි.වැ. -50 රූපවාහිනී සහ වීඩියෝ.වැ. - 20 | |
| | | පවත්වන ලද ප්‍රදර්ශන සංඛ්‍යාව | ඉල්ලුම අනුව | |
| 16.4 | පොත් හා ප්‍රකාශන වැඩසටහන | පුස්තකාලය සඳහා පොත් මිලදී ගැනීම | අවශ්‍යතාවය පරිදි | |

## 1.4. 2024.12.31 දිනට ආයතනයේ වැඩසටහන්වල මූල්‍ය ප්‍රගතිය

| අ/අ | වැඩසටහන | 2024 වර්ෂය සඳහා වෙන් කළ මුදල (රු.මි.) | 2024.12.31 දක්වා වියදම් කළ මුදල (රු.මි) | මූල්‍ය ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| 1 | ප්‍රාග්ධන වියදම් | 73.00 | 36.29 | 49.71 |
| 2 | පුනරාවර්තන වියදම් | 870.43 | 824.76 | 94.75 |
| | **සංවර්ධන වැඩසටහන්** | | | |
| 1 | සත්ත්ව සෞඛ්‍ය හා පශු පර්යේෂණ | 233.20 | 196.80 | 84.39 |
| 2 | පශු සම්පත් සංවර්ධන සහ පුහුණු | 358.80 | 233.51 | 65.08 |
| | **කෘෂිකර්ම නවීකරණ වැඩසටහන-අමාත්‍යාංශ ප්‍රතිපාදන** | | | |
| 1 | දේශීය කිරි නිෂ්පාදන ඵලදායීතාවය ඉහළ නැංවීම තුළින් කිරි ගොවියාගේ ආදායම ඉහළ නැංවීමේ කිරි ගොවි ව්‍යවසායකත්ව සංවර්ධන ව්‍යාපෘතිය | 35.00 | 27.13 | 77.51 |
| | **විදේශ ව්‍යාපෘති** | | | |
| 1 | FAO/TCP/SRI/3903 -ගුණාත්මක තෘණ හා රනිල ප්‍රභේද හඳුන්වාදීමෙන් හා ඒවායේ පෝෂණ තත්ත්වය කළමනාකරණය කිරීම තුළින් කුඩා පරිමාණ කිරි ගොවීන් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය | 16.00 | 8.1 | 50.62 |
| 2 | රසායනාගාර ජාලය ශක්තිමත් කිරීම | 1.44 | 0.43 | 29.86 |

## 1.5. 2024.12.31 වන විට සංවර්ධන වැඩසටහන්වල භෞතික ප්‍රගතිය

### 1. සත්ත්ව අභිජනන අංශය

#### 1.1. සත්ත්ව අභිජනන ව්‍යාපෘතිය

##### 1.1.1. කෘත්‍රිම සිංචන මෙහෙයුම් වැඩසටහන

කෘත්‍රිම සිංචන මෙහෙයුම් වැඩසටහන යටතේ 2024.12.31 වන විට කෘත්‍රිම සිංචන 202,082 ක්ද, ගැබ් පරීක්ෂා කිරීම් 67,111 ක්ද, පැටවු උපත් 61,189 ක්ද සිදුකර ඇත. කුණ්ඩසාලේ කෘත්‍රිම සිංචන මධ්‍යස්ථානයේ නිපදවන ලද ගව ශුක්‍ර වඩි ගණන 216,292 කි. කෘත්‍රිම සිංචන ශිල්පීන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම යටතේ කෘත්‍රිම සිංචන ශිල්පීන් 180 ක් පුහුණු කර ඇත.

##### 1.1.2. සත්ත්ව ආහාර සම්පත් ප්‍රවර්ධනය

මේ යටතේ තෘණ ව්‍යවසායකයින් 36 දෙනෙකු ලියාපදිංචි කර අදාළ සහතික නිකුත් කර ඇත. අභිජනන මධ්‍යස්ථානවල තෘණ සංවර්ධන වැඩසටහන යටතේ කුණ්ඩසාලේ කෘත්‍රිම සිංචන මධ්‍යස්ථානයේ වැඩිදියුණු කළ තෘණ වගාව සඳහා අදාළ ජල සැපයුම් පද්ධතිය ස්ථාපනය කර ඇත. එම මධ්‍යස්ථානවල තෘණ සංරක්ෂණ කටයුතු සඳහා අවශ්‍ය හේ බේලර් යන්ත්‍ර (Hay Bailer) 02 ක් මිලදී ගෙන එහි ආදර්ශන කටයුතු සම්පූර්ණ කර ඇත. තෘණ රෝපණ ද්‍රව්‍ය ලබාගැනීම සඳහා මේ දක්වා ඉල්ලුම් කර ඇති සියළු අවශ්‍යතාවයන් සම්පූර්ණ කර ඇත.

##### 1.1.3. එළුවන්ගේ ආරය උසස් කිරීම

එළු ගහනය වර්ධනය කිරීම යටතේ අභිජනනයට සුදුසු එළුවන් නිකුත් කිරීමට අදාළව එළුවන් 35 ක් (පිරිමි-06, ගැහැණු-29) ක්ෂේත්‍රයට නිකුත් කර ඇත. ඉඹුලන්දණ්ඩ එළු අභිජනන මධ්‍යස්ථානයේ Caprine Arthritis Encephalitis (CAE) රෝගය පැතිරීම හේතුවෙන් සතුන් නිකුත් කිරීම 2024 අප්‍රේල් මස සිට තාවකාලිකව අත්හිටුවා ඇත.

#### 1.2. කුණ්ඩසාලේ කෘත්‍රිම සිංචන මධ්‍යස්ථානය වැඩිදියුණු කිරීම තුළින් තත්ත්වයෙන් උසස් ගව ශුක්‍ර වඩි නිෂ්පාදනය හා බෙදා හැරීම ඉහළ නැංවීමේ ව්‍යාපෘතිය

| විස්තරය | 2024.12.31 දිනට ප්‍රගතිය |
|---|---|
| පුං ගවයින් ආනයනය කිරීම<br>නිලිරවි - 02<br>සහිවාල් - 05 | ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කරමින් පුං ගවයින් මිළදී ගැනීමට කටයුතු කළ අතර එය අසාර්ථක වීම හේතුවෙන් වර්තමානයේ Government to Government ක්‍රමවේදය යටතේ පුං ගවයින් මිලදී ගැනීමට කටයුතු සම්පාදනය වෙමින් පවතී. |
| ජෛව ආරක්ෂණ වැට ඉදිකිරීම | මේ වන විට ටෙන්ඩර් ප්‍රදානය කර ඇත. |
| උපකරණ ප්‍රසම්පාදනය | නව උපකරණ මිලදී ගෙන ඇති අතර, එමගින් කෘත්‍රිම සිංචනයට අවශ්‍ය ගව ශුක්‍ර නිෂ්පාදනය කාර්යක්ෂම කිරීමට කටයුතු සම්පාදනය කර ඇත. |

### 1.3. ගුණාත්මක තෘණ හා රනිල ප්‍රභේද හඳුන්වාදීමෙන් හා ඒවායේ පෝෂණ තත්ත්වය කළමනාකරණය කිරීම තුළින් කුඩා පරිමාණ කිරි ගොවීන් වැඩි දියුණු කිරීමේ විදේශ ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතියට අදාළව වැඩිදියුණු කළ තෘණ හා රනිල ප්‍රභේද 02 ක් (Stylosanthus guanensis var. guanensis සහ Napier hybrid CO-6) හඳුන්වා දී ඇත. එයට අදාළ මාතෘ තෘණ තවාන් 03 ක් ස්ථාපනය කර (පොලොන්නරුව කෘත්‍රිම සිංචන මධ්‍යස්ථානය /තෙලහැර එළු අභිජනන මධ්‍යස්ථානය/පශු පර්යේෂණ ආයතනයේ ගොවිපොළ) පවත්වා ගෙන යනු ලැබේ. පළාත් මට්ටමින් ආදර්ශ තෘණ තවාන් 42 ක් උතුර, ඌව, දකුණ, මධ්‍යම, උතුරුමැද, වයඹ හා නැගෙනහිර යන පළාත් තුළ පිහිටුවා ඇති අතර, මධ්‍යම පරිමාණයේ ව්‍යවසායකයින් 49 ක් හඳුන්වා දී ඇත. මෙම ව්‍යාපෘතියේ පුහුණු වැඩසටහන්වලට අදාළව පළාත් 07 ක් තුළ නිලධාරීන්, ප්‍රතිලාභී ගොවි මහතුන් හා ව්‍යවසායකයින් 371 ක් පුහුණු කර ඇත.

ඡායාරූප අංක 10 - 12

## 2. පශු අණපනත් හා නීති අංශය

### 2.1. සතුන් හඳුනාගැනීමේ වැඩසටහන

මෙම ව්‍යාපෘතිය යටතේ ක්ෂේත්‍ර ව්‍යාප්ති නිලධාරීන් විසින් ලියාපදිංචි කළ ගොවිපොළ නිරීක්ෂණය කරනු ලබන අතර, ඒවායේ සිටින සතුන්ගේ කන් සලකුණු කිරීම සිදුකරනු ලබයි. සමාලෝචිත කාල සීමාව අවසන් වන විට සතුන් 81, 720 දෙනෙකුගේ කන් සලකුණු (ear tags) සවිකර ඇති අතර මුද්‍රණය කළ හා බෙදාහරින ලද කන් සලකුණු ප්‍රමාණය 93,012 කි. මෙය සත්ත්ව ගහනය පිළිබඳ නිරවද්‍ය දත්ත පවත්වා ගැනීම, නීති විරෝධී සතුන් ප්‍රවාහනය සහ ඝාතනය වැලැක්වීම, අනාගත කිරි නිෂ්පාදනය පුරෝකථනය හා ඵලදායි නොවන සතුන් ඉවත් කිරීම යනාදියට උපකාර වේ.

### 2.2. සත්ත්ව නිරෝධායන ඒකක පුළුල් කිරීම හා නවීකරණය

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් 292-02-03-06-2507 වැය විෂය යටතේ 2024 වර්ෂය සඳහා රු.මි. 4.00 ක ප්‍රතිපාදන වෙන්විය. 2023 වසරේ මෙම වැය ශීර්ෂය යටතේම සිදුකළ ප්‍රධාන ක්‍රියාකාරකම් 02 ක් වන කොළඹ සත්ත්ව නිරෝධායන කාර්යාලයේ වහල සහ ගේට්ටුව අළුත්වැඩියාව හා කටුනායක සත්ත්ව නිරෝධායන කාර්යාලය සඳහා ලැප්ටොප් පරිගණක 03 ක් මිලදී ගැනීම සඳහා රු.මි. 3.03 ක මුදලක් ගෙවීම වෙනුවෙන් යෙදවීමට සිදුවිය.

එබැවින් 2024 වර්ෂයේ ඉතිරි රු. 962,000 ක මුදල 2024.10.29 දින සංශෝධනයට ලක් කරන ලද ප්‍රසම්පාදන සැලසුමට අනුව එහි ක්‍රියාකාරකම් සඳහා යොදවන ලදී. මෙම වසරේ සිව්වන කාර්තුවේදී මුද්‍රණ යන්ත්‍ර 04 ක් (රු.මි.0.3), ඡායා පිටපත් යන්ත්‍රයක් (රු.මි.0.36) සහ Micro Chip Readers 04 ක් (රු.මි.0.31) මිලදී ගැනීමට සැලසුම් කර තිබූ අතර එහිදී Micro Chip Readers 04 හැර අනෙකුත් යන්ත්‍ර මිලදී ගන්නා ලදී. අපේක්ෂිත මිල ගණන් වලට සාපේක්ෂව වෙළඳපොළ මිල ගණන් ඉහළ යාම හේතුවෙන් Micro Chip Readers 04 මිලදී ගැනීමට නොහැකි විය.

### 2.3. තත්ත්ව ආරක්ෂණ වැඩසටහන

"තත්ත්ව ආරක්ෂණ හා නිරෝධායන කටයුතු" වැඩසටහන යටතේ සිදුකරනු ලබන කාර්යයන් අතරින් 2024 වර්ෂය සඳහා හඳුනාගත් ඉලක්ක වන සත්ත්ව ආහාර සම්බන්ධ කටයුතු, පශු ඖෂධ අධිකාරියේ කටයුතු, සත්ත්ව හා සත්ත්ව නිෂ්පාදන ආනයන, අපනයන සඳහා පූර්ව නිෂ්කාශන නිකුත් කිරීම සහ නිරෝධායන කටයුතු ආවේක්ෂණය කිරීම යන කාර්යයන් සඳහා සමාලෝචිත කාල සීමාව තුළ සමස්ත වශයෙන් 76% ක පමණ ප්‍රගතියක් අත් කරගෙන ඇත.

## 3. සත්ත්ව සෞඛ්‍ය අංශය

### 3.1. සතුන්ගේ බෝවන රෝග වැළැක්වීමේ වැඩසටහන

මෙම වැඩසටහන යටතේ, දිවයින පුරා සත්ත්ව රෝග පාලනය කිරීම පිණිස සත්ත්ව රෝග ආවේක්ෂණ කටයුතු හා පශු විමර්ශන මධ්‍යස්ථානවල රෝග පරීක්ෂා කිරීම සිදුකරනු ලබයි. තවද වසංගත රෝග සඳහා එන්නත්කරණය ඇතුළු සත්ත්ව රෝග පාලනයට අදාළ සියළු කාර්යයන් මෙමගින් සිදුකෙරේ. මෙම ව්‍යාපෘතිය යටතේ කුර හා මුඛ රෝග එන්නත් වඩි 281,340 ක්, කාලගාත්‍ර එන්නත් වඩි 60,598 ක් හා රක්ත්‍රාශ්‍රව එන්නත් වඩි 148,620 ක් ක්ෂේත්‍රයට බෙදා දී ඇති අතර කුර හා මුඛ රෝග එන්නත් කිරීම් 254,174 ක් කාලගාත්‍රා එන්නත් කිරීම් 72,324 ක් හා ගව රක්තාශ්‍රව එන්නත් කිරීම් 92,650 ක් මේ වන විට ක්ෂේත්‍රය තුළ සිදුකර ඇත.

### 3.2. කුකුළු සෞඛ්‍ය කළමනාකරණය මඟින් කුකුළු මස් සහ බිත්තර අපනයනයට පහසුකම් සැලසීම

කුකුළු සෞඛ්‍ය කළමනාකරණය මඟින් කුකුළු මස් හා බිත්තර අපනයනය කිරීම ඉහළ නැංවීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වේ. ඒ සඳහා ආර්ථික වශයෙන් වැදගත් වන සැල්මොනෙල්ලා, රැනිකට් සහ කුරුළු උණ ආවේක්ෂණ වැඩසටහන් සිදුකරනු ලබයි.
සැල්මොනෙල්ලා රෝග පාලන වැඩසටහන යටතේ කුකුළු අභිජනන ගොවිපොළ නිරීක්ෂණ 89 ක්ද බීජ රක්කවනාගාර නිරීක්ෂණ 104 ක්ද සිදුකර ඇත. රැනිකට් රෝග පාලනය යටතේ එන්නත් 5,280,600 ක් බෙදා හැර ඇත. කුරුළු උණ ආවේක්ෂණ කටයුතු යටතේ රුධිර සාම්පල 3,207 ක් හා වසුරු සාම්පල සහ Cloacal swabs 19,146 ක් ද කුරුළු උණ රෝග පරීක්ෂාව සඳහා යොමුකර ඇත.

### 3.3. පශු විමර්ශන මධ්‍යස්ථානවල කුකුළු හා මත්ස්‍ය රෝග හඳුනාගැනීම හා ආවේක්ෂණ පහසුකම් වැඩිදියුණු කිරීම

මෙම ව්යාපෘතිය යටතේ අපනයනය පාදක කරගත් විසිතුරු මත්ස්‍ය ගොවිපොළ සඳහා ඉක්මන්, සාධාරණ හා වඩාත් ලාභදායී ක්‍රමයක් යටතේ අණුක ජීව විද්‍යාත්මක පරීක්ෂණ හරහා රෝග නිර්ණය කිරීමට අපේක්ෂිතය. එමඟින් එම රෝග පාලනය වෙනුවෙන් ක්ෂණික පියවර ගැනීමට අදාළ ගොවිපොළ හිමියනට අවස්ථාව ලැබේ. ඊට අමතරව 2023 වර්ෂයේ අවසන් කාර්තුව සිට මෙම ව්‍යාපෘතිය මගින් අපනයනය පාදක කරගත් විසිතුරු මත්ස්‍ය ගොවිපොළවල ජෛව ආරක්ෂණ පරීක්ෂාව සිදුකිරීම ආරම්භ විය.

දෙපාර්තමේන්තුව විසින් පත්කළ තාක්ෂණික කණ්ඩායම් 02 න් කුමන හෝ එක් කණ්ඩායමක් විසින් එම මත්ස්‍ය ගොවිපොළ වෙත ගොස් එහි ජෛව ආරක්ෂණය සඳහා අදාළ නිර්දේශ ලබාදීම සිදුකරනු ලබයි. ඊට සමගාමීව පශු විමර්ශන නිලධාරීන් විසින් එම ගොවිපොළවලින් වසරකට දෙවතාවක්

සාම්පල ලබාගැනීම සහ අවශ්‍ය පරීක්ෂාවන් සිදුකරනු ලබන අතර අවශ්‍යතාවය අනුව මධ්‍යම පශු විමර්ශන මධ්‍යස්ථානය වෙත යොමුකිරීම සිදුකෙරේ. මෙම අණුක ජීව විද්‍යාත්මක පරීක්ෂණ සඳහා අවශ්‍ය රසායන ද්‍රව්‍ය ඇතුළු පරීක්ෂණ කට්ටල මෙම ව්‍යාපෘතිය හරහා මධ්‍යම පශු විමර්ශන මධ්‍යස්ථානය වෙත ලබා දී ඇත. මූලික වශයෙන් වැඩිම අපනයනය පාදක කරගත් විසිතුරු මත්ස්‍ය ගොවිපොළ ගහණයක් සහිත බස්නාහිර සහ වයඹ පළාත් පාදක කරගනිමින් දිවයින පුරා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ.

### 3.4. වනජීවී රෝග ආවේක්ෂණ වැඩසටහන

මෙම වැඩසටහන අම්පාර, ත්‍රිකුණාමලය, අනුරාධපුරය, නුවරඑළිය, කුණ්ඩසාලේ, දඹුල්ල, හෝමාගම, පොළොන්නරුව හා රත්නපුර පශු විමර්ශන මධ්‍යස්ථාන යටතේ ක්‍රියාත්මක වේ. එමගින් වන ජීවීන්ගේ පවතින සත්ත්ව රෝග ගෘහාශ්‍රිත හා කෘෂිකාර්මික සතුන් වෙත බෝවීමේ අවදානම අවම කිරීම සඳහා ආවේක්ෂණ කටයුතු සිදුකරනු ලබයි. මේ වන විට වන ජීවී කලාප ආශ්‍රිත දිස්ත්‍රික් පශු විමර්ශන මධ්‍යස්ථාන මගින් වන ජීවී කලාප ආවරණය වන පරිදි, රෝග වලින් මිය ගිය සතුන්ගේ පශ්චාත් මරණ පරීක්ෂණ සිදුකර අදාළ සාම්පල රසායනාගාර වෙත යොමු කර පරීක්ෂා කරනු ලබයි. මීට අමතරව දිස්ත්‍රික් පශු විමර්ශන නිලධාරීන් හා වනජීවි නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් පවත්වමින් දැනුවත් කිරීම් කටයුතු සිදුකරමින් පවතී. මෙම වැඩසටහනේ රසායනාගාර පහසුකම් වැඩි දියුණු කිරීම් යටතේ ප්‍රගතිය 90% ක් පමණ වේ.

## 4. මානව සම්පත් සංවර්ධන අංශය

### 4.1. සත්ත්ව පාලන ඩිප්ලෝමාධාරීන් බිහි කිරීමේ හැකියාව ශක්තිමත් කිරීම

2024.12.31 වන විට කරඳගොල්ල සත්ත්ව පාලන විද්‍යාලයේ සිසුන් 50 දෙනෙකු NVQ 5/6 දෑ අවුරුදු සත්ත්ව පාලන ඩිප්ලෝමාව (2024/26 කණ්ඩායම) හදාරමින් සිටින අතර, 2024.10.15 දින සිට ආරම්භ කරන ලද සිසුන් 24 දෙනෙකුගෙන් සමන්විත සීප්පුකුලම සත්ත්ව පාලන විද්‍යාලයේ NVQ 4 සයමාසික සත්ත්ව පාලන ඩිප්ලෝමාව මේ වන විට සාර්ථකව පවත්වාගෙන යනු ලැබේ.

### 4.2. පශු සම්පත ප්‍රචලිත කිරීමේ වැඩසටහන

දැනට සත්ත්ව පාලන කටයුතුවල නිරතව සිටින්නාවූ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට, සත්ත්ව පාලන කටයුතුවල නිරතවීමට කැමති පාසල් සිසුන් සහ මහජනතාවට නව තාක්ෂණයන් සම්බන්ධ දැනුම හා තොරතුරු ලබාදීම සිදුකරන අතර 2024 .12.31 වන විට ප්‍රදර්ශන 03 ක් සඳහා දායකත්වය දැක්වීමට ද, රූපවාහිනී සහ වීඩියෝ වැඩසටහන් 18 ක් සහ ගුවන් විදුලි ප්‍රචාරක වැඩසටහන් 51 ක් ඉදිරිපත් කිරීමට ද හැකි වී ඇත.

### 4.3. පොත් හා ප්‍රකාශන

සීප්පුකුලම හා කරඳගොල්ල සත්ත්ව පාලන විද්‍යාල හා දෙපාර්තමේන්තු පුස්තකාලය සඳහා පොත් මිලදී ගැනීම සඳහා 2024 වර්ෂය වෙනුවෙන් රු.මි. 0.5 වෙන්කර ඇත. දෙපාර්තමේන්තුවේ පුස්තකාලයාධිපති තනතුර පුරප්පාඩුව පවතින බැවින් අවශ්‍යතාවය පරිදි පොත් මිලදී ගැනීම සංකීර්ණ ක්‍රියාවලියක්වීම නිසාවෙන් පොත් මිලදී ගැනීම මේ වන විට තාවකාලිකව අත්හිටුවා ඇත.

### 4.4. පුහුණු ධාරිතාවය ඉහළ නැංවීම

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ මානව සම්පත් සංවර්ධන අංශය යටතේ ක්‍රියාත්මක වන පශු වෛද්‍ය උපාධිධාරීන් සඳහා සීමාවාසික පුහුණුව ලබාදීම යටතේ නවක පශු වෛද්‍ය උපාධිධාරීන් 78 දෙනෙකු සඳහා සීමාවාසික පුහුණුව ලබා දී ඇති අතර, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයේ නිලධාරීන්ගේ පුහුණු අවශ්‍යතා සඳහා පුහුණු වැඩසටහන් 35 ක් සමාලෝචිත කාල සීමාව අවසන් වන විට පවත්වා ඇත. එමෙන්ම අවශ්‍යතාවය පරිදි ගොවීන් හා වෙනත් ව්‍යවසායකයන් සඳහා පුහුණු වැඩසටහන් 05 ක් සීප්පුකුලම සත්ත්ව පාලන විද්‍යාලය මගින් පවත්වා ඇත.

### 4.5. දේශීය කිරි නිෂ්පාදන ඵලදායීතාවය ඉහළ නැංවීම තුළින් කිරි ගොවියාගේ ආදායම ඉහළ නැංවීමේ කිරි ගොවි ව්‍යවසායකත්ව සංවර්ධන ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය ශ්‍රී ලංකාවේ පළාත් හයක් තුළ පශු වෛද්‍ය කොට්ඨාශ 22 ක් ආවරණය කරමින් ක්‍රියාත්මක වන අතර, දැනට යැපුම් මට්ටමේ පවතින නමුත්, ඉහළ නිෂ්පාදන විභවයක් ඇති ගොවිපොළවලට තාක්ෂණය හඳුන්වාදීම තුළින් සුළු පරිමාණ කිරි නිෂ්පාදන ව්‍යවසායකයින් බවට පරිවර්තනය කිරීමේ අරමුණින් පළාත් මට්ටමින් කිරි ගොවීන් 157 ක් (මධ්‍යම - 20, වයඹ - 63, ඌව - 27, උතුර -21, බස්නාහිර -12, දකුණ -14) තෝරාගෙන ඇත.

තෝරාගත් ගොවිපොළ සඳහා කිරි ගොවිපොළ ආර්ථික මොඩලයක් (Economic model) සහ යහපත් ගොවිපොළ පාලන ක්‍රම 12 ක් (Best Practices) ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රධාන පුහුණු වැඩසටහන් 18 ක් පවත්වා තෝරාගත් ගොවීන් සහ අදාළ නිලධාරීන් දැනුවත් කර ඇත. මෙම ව්‍යවසායකයින් සඳහා කිරි ගොවි ව්‍යවසායක අත්පොත සහ සටහන් පොත් සකසා මුද්‍රණය කර ලබා දී ඇත. පුහුණු වැඩසටහන් අවසන් වූ පසු සියළුම ගොවිපොළ සඳහා වෙන වෙනම ගොවිපොළ ක්‍රියාකාරී සැලසුම් 157 ක් සාදා නිම කර ඇත.

ඡායාරූප අංක 13 - 15

තෝරාගත් ව්‍යවසායකයින් සඳහා ආවරණ කබා (overalls) (150) සහ Boot Pairs (150), කිරි වරන ලද එළදෙනුන් සඳහා බුරුළු ප්‍රදාහයට අදාළ නික්ෂේපණ (Mastitis dry cow infusions) (2,000), මුල් අදින ලද CO5 තෘණ දඬු කැබලි (Rooted CO5 cuttings) (10*300) ලබා දී ඇත. ගොවිපොළ ක්‍රියාකාරී සැලසුම මගින් හඳුනාගන්නා ලද නිෂ්පාදන ඉලක්කය වෙත ළඟාවීම සඳහා යහපත් ගොවිපොළ පාලන ක්‍රම ක්‍රියාත්මක කිරීම සඳහා තාක්ෂණය හඳුන්වාදීම සඳහා අවශ්‍ය උපකරණ හා ද්‍රව්‍ය හඳුනා ගෙන ඇත. ඒ සඳහා මූල්‍යමය දායකත්වය ඉල්ලුම් කළ සියළුම පළාත් සඳහා ගෙවීම් කිරීම මේ වන විට අවසන් කර ඇත.

තෝරාගත් පළාත් 06 සඳහා ජංගම සායන පවත්වනු ලැබූ අතර, ඊට සමගාමීව ගොවිපොළ සතුන් සඳහා අවශ්‍ය ඛණිජ මිශ්‍රණ පැකට් 750 ක් (Mineral mixtures), පණු බෙහෙත් කි.ග්‍රෑ. 05 ක් (Deworming), කිනිතුල්ලන් ඉවත් කිරීම සඳහා භාවිතා කරන බෙහෙත් බෝතල් 450 ක් (Tickamits), bypass fat කි.ග්‍රෑ. 750, වසු පැටවුන් සඳහා කිරි බෝතල් (calf feeding bottle), බුරුළු ප්‍රදාහය සඳහා එන්නත් (Mastitis vaccine), බඩඉරිඟු බීජ (Sorghum seeds) ලබා දෙන ලදී.

## 5. පශු සම්පත් සැලසුම් හා ආර්ථික අංශය

### 5.1. සමාජ ආර්ථික සංවර්ධන වැඩසටහන

මේ යටතේ පශු සම්පත් ක්ෂේත්‍රයේ නිෂ්පාදන දත්ත, සත්ත්ව ගහණය, ගොවිපොළ සංඛ්‍යාව සහ පශු වෛද්‍ය කාර්යාලවල මානව හා භෞතික සම්පත්වල තොරතුරු එකතු කරනු ලැබේ. එම තොරතුරු ආශ්‍රිතව Livestock Statistical Bulletin, Livestock Outlook, වාර්ෂික වාර්තාව වැනි ප්‍රකාශන ප්‍රකාශයට පත්කරනු ලබයි. පශු සම්පත් ක්ෂේත්‍රයේ ව්‍යවසායකයින් සහ නිෂ්පාදකයින්ගෙන් ලබාගන්නා දත්ත පදනම් කරගෙන Poultry forecast, Poultry bulletin, Dairy bulletin ප්‍රකාශයට පත් කරයි.

මෙම වැඩසටහන තුළින් කිරිගව, කුකුළු හා එළු පාලන ක්ෂේත්‍ර යටතේ සමාජ ආර්ථික අධ්‍යයනයන් 04 ක් 2024 වසර තුළ ක්‍රියාත්මක විය. තවද ගොවිපොළ ලියාපදිංචි කිරීම යථාවත් කිරීමේ දත්ත පද්ධතිය ස්ථාපිත කර ඇති අතර එය කාර්යක්ෂමව හා විධිමත්ව පවත්වාගෙන යාමේ අරමුණින් සියළු පළාත්වල පශු වෛද්‍යවරුන් හා අනෙකුත් කාර්ය මණ්ඩල සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී. සමාලෝචිත කාල සීමාව අවසන් වන විට ලියාපදිංචි වී ඇති මුළු ගොවිපොළ සංඛ්‍යාව 83,262 කි.

### 5.2. පශු වෛද්‍ය කාර්යාලවල සේවා සැපයුම් පද්ධතිය වැඩිදියුණු කිරීම

මෙම ව්‍යාපෘතිය යටතේ 2024 වසර සඳහා පශු අණපනත් හා නීති අංශය හා සත්ත්ව නිරෝධායන මධ්‍යස්ථාන සම්බන්ධ කරමින් ඩිජිටල් ජාලකරණ පද්ධතිය සකස් කිරීම සඳහා කටයුතු යොදා ඇත. මේ වන විට එහි මෘදුකාංග කටයුතුවලට අදාළ ප්‍රසම්පාදන කටයුතු අවසන්ව ඇති අතර, තෝරාගත් ආයතනය විසින් එහි ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර වාර්තාව ලබා දී ඇත. පශු පර්යේෂණ ආයතනය, පශු අණපනත් හා නීති අංශය සහ සත්ත්ව නිරෝධායන මධ්‍යස්ථාන වෙනුවෙන් පරිගණක මිලදී ගැනීමට අදාල ප්‍රසම්පාදන වාර්තාව සඳහා අනුමැතිය ලැබීම ප්‍රමාදවීම හේතුවෙන්, එය 2025 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට නියමිතය. තවද මෙම ව්‍යාපෘතිය යටතේ සිදුකරන ලද දෙපාර්තමේන්තු නව වෙබ් පිටුව 2024 වසරේ අප්‍රේල් මස සම්පූර්ණ කර එළිදක්වන ලදී.

## 6. පශු පර්යේෂණ ආයතනය

### 6.1. උසස් තත්ත්වයේ පශු එන්නත්සාර දේශීයව නිෂ්පාදනය කිරීම

2018 වසරේදී ආරම්භ කළ මෙම ව්‍යාපෘතිය මගින් උසස් තත්ත්වයේ පශු එන්නත්සාර දේශීයව නිෂ්පාදනය තවදුරටත් පුළුල් කිරීම සිදුකෙරේ. දැනට නිෂ්පාදනය කරන එන්නත්වල තත්ත්වය වැඩිදියුණු කිරීමත්, නව එන්නත් අළුතෙන් නිෂ්පාදනය කිරීමත් අපේක්ෂා කෙරේ. ඒ අනුව මෙම ව්‍යාපෘතිය යටතේ 2024 වසරේදී ගව රක්තාශ්‍රව, කාලගාත්‍රා සහ රැනිකට් එන්නත් දේශීයව නිපදවීමට අවශ්‍ය පහසුකම් වැඩිදියුණු කර ඇත.

| එන්නත් වර්ගය | වාර්ෂික ඉලක්කය | **2024.12.31** වන විට නිෂ්පාදනය කරන ලද එන්නත් වඩි ප්‍රමාණය |
|---|---|---|
| ගව රක්තාශ්‍රව (Alum) | 40,000 | 40,020 |
| ගව රක්තාශ්‍රව (Oil adjuent) | 150,000 | 150,000 |
| කාලගාත්‍රා | 130,000 | 65,868 |
| රැනිකට් | 4,571,400 | 4,891,800 |
| පෞද්ගලික ආයතන සඳහා ඉල්ලුම අනුව එන්නත් නිෂ්පාදනය හා නිකුත් කිරීම | | |

| එන්නත් වර්ගය | වාර්ෂික ඉලක්කය | 2024.12.31 වන විට නිෂ්පාදනය කරන ලද එන්නත් වඩි ප්‍රමාණය |
|---|---|---|
| කුකුල් කොළරා | ඉල්ලුම පරිදි | 235,080 |
| සූකර රක්තාශ්‍රව | | 3,060 |
| රනිකට් | | 1,900,600 |

### 6.2. ආහාර ආරක්ෂණය හා අපනයන කටයුතු පහසුකරණය සඳහා සත්ත්ව ආහාර හා පශු නිෂ්පාදනවල ගුණාත්මකභාවය සහතික කිරීම

2018 වසරේදී ආරම්භ කළ මෙම ව්‍යාපෘතිය හරහා සත්ත්ව ආහාර හා පශු නිෂ්පාදනවල ගුණාත්මකභාවය සහතික කිරීම මගින් අපනයන පහසුකරණය සහ ආහාර ආරක්ෂණය තහවුරු කෙරේ. මෙම ව්‍යාපෘතිය යටතේ මෙම වසර තුළදී සත්ත්ව ආහාර හා සත්ත්ව නිෂ්පාදන සාම්පල 6,654 ක ගුණාත්මකභාවය විශ්ලේෂණය කර ඇත.

### 6.3. පශු සම්පත් පර්යේෂණ වැඩසටහන

මෙම ව්‍යාපෘතිය යටතේ පර්යේෂණ ව්‍යාපෘති 27 ක් දැනට ක්‍රියාත්මක වේ. ඉල්ලුම පරිදි සාම්පල පරීක්ෂාව සහ ජෛවීය නිෂ්පාදනයන් සිදුකිරීම මේ මගින් ඉටුකරනු ලබයි.

| ක්‍රියාකාරකම | වාර්ෂික ඉලක්කය | 2024.12.31 වන විට ප්‍රගතිය |
|---|---|---|
| *ජෛවීය නිෂ්පාදන* | ඉල්ලුම පරිදි | |
| බුරුළු ප්‍රදාහය හඳුනා ගැනීම සඳහා CMT ප්‍රතික්‍රියාකාරකය | | ලීටර් 164 |
| Pullorum ප්‍රතිදේහජනක මාත්‍රා | | 69,500 |
| MRT ප්‍රතිදේහජනක මාත්‍රා | | 10,000 |
| බුරුළු ගිල්වනු ලබන ද්‍රාවනය (Teat dip solution) | | ලීටර් 188 |

### 6.4. කුර හා මුඛ රෝග එන්නත දේශීයව නිෂ්පාදනය

මෙම ව්‍යාපෘතිය යටතේ දේශීයව කුර හා මුඛ රෝග එන්නත් සකස් කිරීම සිදුකරනු ලැබේ. 2024 වසර සඳහා එන්නත් වඩි 300,000 ක් නිෂ්පාදනයට සැලසුම් කර තිබූ අතර, 2024.12.31 වන විට එන්නත් වඩි 295,380 ක් නිෂ්පාදනය කර ඇත.

### 6.5. බුරුළු ප්‍රදාහ පාලන වැඩසටහන

මෙම ව්‍යාපෘතිය යටතේ බුරුළු ප්‍රදාහ ප්‍රතිකාරක 30,000 ක් සෑදීමට ඉලක්ක කර ඇත. සමාලෝචිත කාල සීමාව තුළ බුරුළු ප්‍රදාහ නික්ෂේපන 21,588 ක් නිෂ්පාදනය කර ඇත.

# 02. මිල්කෝ (ප්‍රයිවට්) ලිමිටඩ්

## 2.1. හැඳින්වීම

මිල්කෝ ආයතනය ප්‍රධාන ක්ෂේත්‍ර 03 ක් ඔස්සේ සිය මෙහෙයුම් ක්‍රියාවලිය දියත් කරනු ලබයි.

i.) දේශීය කිරි ගොවීන්ගේ කිරි අස්වනු එකතු කිරීම
ii.) කිරි ආශ්‍රිත නිෂ්පාදන සිදුකිරීම
iii.) එකී නිෂ්පාදන " හයිලන්ඩ්" වෙළෙඳ නාමය යටතේ දිවයින පුරා බෙදාහැරීම

## 2.2. 2025 වර්ෂයේ මූල්‍ය ඉලක්ක

| අ/අ | ප්‍රධාන සංවර්ධන වැඩසටහන | ඇස්තමේන්තු මුදල (රු.මි) |
|---|---|---|
| 1 | ප්‍රාග්ධන වියදම් | 1,239.00 |
| 2 | පුනරාවර්තන වියදම් | 18,353.00 |

## 2.3. 2025 වර්ෂයේ භෞතික ඉලක්ක (ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් හා ව්‍යාපෘති)

| අ/අ | වැඩසටහන | මිනුම් ඒකකය | ඉලක්කය | ඒකක පිරිවැය (රු.) | මුළු පිරිවැය හා අරමුදල් ප්‍රභවය (රු.මි.) |
|---|---|---|---|---|---|
| 1 | කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගිත්ව වැඩසටහන (SAPP) යටතේ කිරි ගොවීන් සංවර්ධනය කිරීම | ගොවීන් ගණන | 3,000 | - | (SAPP අරමුදල්) |
| 2 | තෘණ වගා ව්‍යාපෘතිය | අක්කර | 575 | - | (ගොවි අරමුදල්) |
| 3 | ජංගම පශු වෛද්‍ය සායන පැවැත්වීම | සායන ගණන | 1,819 | 6,500.00 | 11.80 |
| 4 | වැඩි කිරි අස්වැන්නක් සඳහා ගවයින්ට පානීය ජලය අඛණ්ඩව සැපයීම (ජල බඳුන් සැපයීම) | ජල බඳුන් ගණන | 800 | 6,000.00 | 4.80 |
| 5 | කිරිවල ගුණාත්මක තත්ත්වය ඉහළ නැංවීම සඳහා නව තාක්ෂණයෙන් යුත් උපකරණ හා මෙවලම් හඳුන්වාදීම (කිරි මිලදී ගැනීමේ කටයුතු ඩිජිටල්කරණය) | කිරි ශීත කිරීමේ මධ්‍යස්ථාන ගණන | 95 | - | (ලෝක බැංකු ආධාර) |
| 6 | සවස කිරි එකතු කිරීමේ කටයුතු විධිමත් කිරීම සහ කිරි ශීත කිරීමේ පහසුකම් සලසා දීම | වැඩිවන දෛනික කිරි එකතු කිරීම (ලීටර්) | 7,000 | - | (ලෝක බැංකු ආධාර) |
| 7 | ගොවීන්ගෙන් සෘජුව කිරි මිලදී ගැනීම ශක්තිමත් කිරීම | නව ස්වයංපාලිත කිරි ගොවි සමිති ගණන | 50 | - | (ලෝක බැංකු ආධාර) |
| | | නව කිරි ගොවීන් ගණන | 500 | - | (ලෝක බැංකු ආධාර) |
| 8 | කිරි ගොවීන් සඳහා එක් දින පුහුණු | වැඩමුළු ගණන | 446 | 20,000 | 8.90 |

| අ/අ | වැඩසටහන | මිනුම් ඒකකය | ඉලක්කය | ඒකක පිරිවැය (රු.) | මුළු පිරිවැය හා අරමුදල් ප්‍රභවය (රු.මි.) |
|---|---|---|---|---|---|
| | වැඩමුළු පැවැත්වීම | | | | |
| 9 | ස්වයංපාලිත කිරි ගොවි සමිතිවල ක්‍රියාත්මක ක්‍රමවේදය පිළිබඳව එම සමිතිවල නිළධාරීන් එක් දින වැඩමුළු මගින් පුහුණු කිරීම | වැඩමුළු ගණන | 190 | - | 5.60 |
| 10 | නව වරලත් අලෙවිසැල් ආරම්භ කිරීම | අලෙවිසැල් ගණන | 500 | - | (බාහිර අරමුදල්) |
| 11 | වෙළෙඳපොළ සමීක්ෂණයක් සිදුකිරීම හා ඒ තුළින් අලෙවිකරණය කාර්යක්ෂම කිරීම | මාසික අලෙවි ආදායම (රු.මි.) | 2,500 | - | 3.00 |
| 12 | බඩල්ගම කිරි කර්මාන්තශාලාවේ නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීම | - | - | - | 2,600.00 (රාජ්‍ය අනුග්‍රහය) |

## 2.4. 2024.12.31 දිනට ආයතනයේ වැඩසටහන්වල මූල්‍ය ප්‍රගතිය

| වැඩසටහන | 2024 වර්ෂය සඳහා වෙන් කළ මුදල (රු.මි.) | 2024.12.31 දක්වා වියදම් කළ මුදල (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|
| **ප්‍රාග්ධන වියදම්** | 687.00 | 65.00 | 9 |
| **පුනරාවර්තන වියදම්** | 17,993.00 | 15,613.00 | 87 |
| | | | |
| **සංවර්ධන වැඩසටහන්** | | | |
| කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගිත්ව වැඩසටහන (SAPP) | 18.00 | 0.20 (2024.09.30 දිනට) | 1 |
| හරිත තෘණ ව්‍යාපෘතිය | 17.50 | 0.00 (ප්‍රතිපාදන වෙන්කර තිබුණද, පසුව ගොවීන්ගේ මූල්‍ය දායකත්වයෙන් සිදුකිරීමට තීරණය විය.) | 0 |
| සත්ත්ව අභිජනනය කාර්යක්ෂම කිරීම (ජංගම පශු වෛද්‍ය සායන පැවැත්වීම) | 7.60 | 3.73 | 49 |
| වැඩි කිරි අස්වැන්නක් සඳහා ගවයින්ට පානීය ජලය අඛණ්ඩව සැපයීම (ජල බඳුන් සැපයීම) | 2.50 | 1.20 | 48 |
| කිරි ගොවි පුහුණු වැඩමුළු පැවැත්වීම | 3.20 | 3.02 | 94 |
| නව නිෂ්පාදන වෙළඳපොළට හඳුන්වාදීම | 0.20 | 0.02 | 10 |

### 2.5. 2024.12.31 දිනට සංවර්ධන වැඩසටහන්වල භෞතික ප්‍රගතිය

#### 1. දෛනික කිරි නිෂ්පාදනය ලීටර් 100 බැගින් වූ ගොවිපොළ සංවර්ධනය කිරීමේ වැඩසටහන

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ මූලිකත්වයෙන්, දෛනිකව කිරි ලීටර් 100ක් දක්වා නිෂ්පාදනය කළ හැකි කිරි ගොවිපොළ සංවර්ධනය කිරීමේ දීපව්‍යාප්ත වැඩසටහනක් ආරම්භ කරන ලදී. ඒ අනුව, නිෂ්පාදන ධාරිතාවය මත පදනම්ව, දෛනිකව කිරි ලීටර් 65,000ක් නිෂ්පාදනය කිරීමේ අරමුණ ඇතිව මිල්කො ආයතනය මගින් විභවතාවයක් ඇති කිරි ගොවිපොළ 650ක් තෝරා ගන්නා ලදී.

මෙම කිරි ගොවීන් සඳහා අවශ්‍ය න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම ලබාදීම මිල්කො ක්ෂේත්‍ර නිලධාරීන් හා 'වෙළෙඳපොළ අරමුණු කරගත් කිරි ගොවි සංවර්ධන ව්‍යාපෘතියේ (MOD)' නිලධාරීන් විසින් සිදුකරන ලද අතර, 2023 වර්ෂයේදී පුහුණු වැඩසටහන් මගින් දැනුම ලබාදීමත්, ප්‍රධාන කාර්යසාධන දර්ශක 10ක් යටතේ එක් එක් ගොවිපොළට වෙන් වෙන් වශයෙන් වූ ගොවිපොළ සැලැස්ම සෑදීමත් අවසන් කරන ලදී.

2024 සැප්තැම්බර් මස අවසන් වනවිට ගොවිපොළ සැලැස්ම 624ක් ක්‍රියාත්මක කර ඇති අතර, ඉන් ගොවිපොළ සැලැස්ම 510ක සංවර්ධන කටයුතු සාර්ථකව සිදු කෙරෙමින් පවතී. එහි එක් එක් ප්‍රධාන කාර්යසාධන දර්ශකවල ප්‍රගතිය තුන්වන කාර්තුව අවසන් වන විට පහත පරිදි වේ.

| අ/අ | කාර්යසාධන දර්ශකය | ප්‍රගතිය (%) |
|---|---|---|
| 01 | අඛණ්ඩව පානීය ජලය ලබාදීම | 88 |
| 02 | වසර පුරා ඉහළ ගුණාත්මක තත්ත්වයෙන් යුතු තෘණ ලබාදීම | 80 |
| 03 | කිරි දෙනුන් කළමනාකරණය | 77 |
| 04 | නැම්බියන් පාලනය | 55 |
| 05 | වැස්සී පැටවු පාලනය | 51 |
| 06 | සයිලේජ් සෑදීම හා පෝෂණය | 33 |
| 07 | සම්පූර්ණ මිශ්‍ර සලාක ගව ආහාර (TMR) සෑදීම හා පෝෂණය | 37 |
| 08 | පැටවා ඉපදී පැය 6න් පසුව මවගෙන් වෙන් කිරීම | 37 |
| 09 | ගව සංයුතිය කළමනාකරණය | 32 |

ඡායාරූප අංක 16 -17

#### 2. හරිත තෘණ ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය යටතේ 2024 වර්ෂය තුළ දිවයින පුරා අක්කර 2,000ක භූමි ප්‍රමාණයක තෘණ වගා කිරීමටත්, 100,000ක් පෝෂ්‍ය ශාක (fodder trees) වගා කිරීමට හා කළමනාකරණයටත් සැලසුම් කර ඇත. ඒ අනුව, 2024 වසර අවසන් වන විට මිල්කො ක්ෂේත්‍ර නිළධාරීන්ගේ මඟපෙන්වීම හා තාක්ෂණික සහාය මත අක්කර 575කට වැඩි භූමි ප්‍රමාණයක තෘණ වගා කර ඇති අතර, පෝෂ්‍ය ශාක 60,533ක් වගා කර ඇත. මේ සඳහා වූ වියදම අදාළ ගොවි මහතුන් විසින් දරනු ලබයි.

ඡායාරූප අංක 18

### 3. කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගිත්ව වැඩසටහන (SAPP)

කෘෂිකර්ම සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල (IFAD) මඟින් ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගිත්ව වැඩසටහන (SAPP), මිල්කෝ ආයතනය හා අනුබද්ධිතව කිරි ගොවීන් 3,000ගේ සංවර්ධනය අරමුණු කරගනිමින් ඌව, මධ්‍යම, වයඹ හා උතුරු මැද පළාත් ආවරණය වන පරිදි මෙම වැඩසටහන ක්‍රියාත්මක වේ.

මේ යටතේ 2024 වර්ෂයේ තුන්වන කාර්තුව අවසන් වන විට ගව ගාල් 1,078ක්, වගා ළිං 51ක්, ඇසොල්ලා පොකුණු 387ක් ඉදිකිරීමට කටයුතු සම්පාදනය කර ඇති අතර, තෘණ කැබලි කිරීමේ යන්ත්‍ර 20ක් ගොවීන් අතර බෙදා දී ඇත. තවද, කිරි ගොවීන් 191ක් වෙත ණය පහසුකම් ලබා දී ඇත.

ඡායාරූප අංක 19 - 20

### 4. සත්ත්ව අභිජනනය කාර්යක්ෂම කිරීම

ගොවිපොළ තුළදීම කිරි ගවයින්ගේ රෝග හඳුනා ගැනීම, ප්‍රතිකාර කිරීම, රෝග වළක්වා ගැනීමේ උපදෙස් ලබාදීම හා අනෙකුත් සෞඛ්‍ය ගැටලු කළමනාකරණය යන අරමුණු ඇතිව, ජංගම පශු වෛද්‍ය සායන සහ කෘත්‍රිම සිංචන කටයුතු නිරන්තරයෙන් මිල්කෝ ආයතනය විසින් සිදු කරනු ලබයි.

2024 වර්ෂය තුළ ජංගම පශු වෛද්‍ය සායන 1,140 ක් පැවැත්වීමටත්, කෘත්‍රිම සිංචන 5,000ක් සිදු කිරීමටත් සැලසුම් කර ඇත. ඒ අනුව, 2024 වසර අවසානය වන විට පශු වෛද්‍ය සායන 662ක් සහ කෘත්‍රිම සිංචන 5,961ක් සිදු කර ඇති අතර, ඒ වෙනුවෙන් මිල්කෝ සමාගම රු.මි. 4කට ආසන්න වියදමක් දරා ඇත.

### 5. කිරි ගවයින් සඳහා අඛණ්ඩව පානීය ජලය සැපයීම

වැඩි කිරි අස්වැන්නක් ලබා ගැනීම සඳහා කිරි ගවයින්හට අඛණ්ඩ පානීය ජල සැපයුමක් තිබීම අත්‍යවශ්‍ය වේ. එය පරිචයනය කිරීම සඳහා දිරි ගැන්වීමක් වශයෙන්, පිරිවැයෙන් අඩක් අයකර ගැනීමේ පදනම මත 2024 වර්ෂය තුළ ගොවීන් වෙත ජල බඳුන් 500ක් සැපයීමට සැලසුම් කර ඇත. ඒ අනුව, 2024 වසර අවසන් වනවිට මධ්‍යම, වයඹ, බස්නාහිර, උතුරු මැද, ඌව සහ සබරගමුව යන පළාත් ආවරණය වන පරිදි පානීය ජල බඳුන් 229ක් නිෂ්පාදනය කර ගොවීන් අතර බෙදා දී ඇත. මේ සඳහා මිල්කෝ සමාගම විසින් රුපියල් මිලියනයකට වැඩි මුදලක් වියදම් කර ඇත.

ඡායාරූප අංක 21

### 6. කිරිගොවි පුහුණු වැඩමුළු පැවැත්වීම

කිරි නිෂ්පාදනය කාර්යක්ෂමව, ඵලදායීව හා අඛණ්ඩව සිදු කිරීම තහවුරු කිරීම උදෙසා, මිල්කෝ ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය විසින් ප්‍රායෝගික හා න්‍යායාත්මක දැනුම බෙදාදෙමින්, කිරිගොවීන් පුහුණු කිරීමේ කටයුතු නිරන්තරයෙන් සිදු කරනු ලබයි.

ඒ අනුව, 2024 වර්ෂයේදී දිවයින පුරා කිරි ගොවීන් 5,425 දෙනෙකු පුහුණු කිරීමට සැලසුම් කර තිබූ අතර, 2024 වසර අවසන් වනවිට කිරි ගොවීන් 5,150 දෙනෙකු පුහුණු කර ඇත. මේ සඳහා මිල්කෝ සමාගම විසින් රු.මි. 3කට ආසන්න මුදලක් වැය කර ඇත.

ඡායාරූප අංක 22

## 03. ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය

### 3.1. හැඳින්වීම

1972 අංක 11 දරණ කෘෂිකාර්මික සංස්ථා පනත යටතේ ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය 1973 වර්ෂයේදි ස්ථාපිත කරන ලදි . එහි ක්ෂේත්‍ර කටයුතු 1974 දි ආරම්භ කරන ලදි. වර්ථමානයේ මණ්ඩලය සතුව ගොවිපල 32 පවතින අතර , මෙම ගොවිපල වල එළ ගව, මී ගව, එළු, බැටළු, සූකර, හා කුකුළු ව්‍යාපෘති පවත්වාගෙන යන අතර ගොවින් වෙත අභිජනනය සඳහා සතුන් නිකුත් කිරිම මණ්ඩලයේ ප්‍රධාන අරමුණ වේ. මීට අමතරව ගොවිපල නිෂ්පාදන වන කිරි, බිත්තර, මස් ආදිය තත්වයෙන් උසස් නිෂ්පාදන ලෙස පාරිභෝගික ජනතාව වෙත සැපයිම සිදුකෙරේ. තවද වාර්ෂිකව පශු සත්ත්ව පාලනය පිළිබඳ ගොවිජනතාව හා සිසුන් පුහුණු කිරිම මණ්ඩලයේ සියළු ගොවිපල වල සිදු කෙරේ. පසුගිය වසර 50 ක කාලසිමාව තුල රටතුල පශු සම්පත් අංශයේ සිදුකෙරෙණු සංවර්ධනයේ පුරෝගාමි කාර්යයභාරයක් ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය විසින් සිදුකර තිබේ.

### 3.2. 2025 වර්ෂයේ මූල්‍ය ඉලක්ක

| අ/අ | ප්‍රධාන සංවර්ධන වැඩසටහන | ඇස්තමේන්තු මුදල (රු.මි) |
|---|---|---|
| 1 | ප්‍රාග්ධන වියදම් | 630.00 |
| 2 | පුනරාවර්තන වියදම් | 6,710.00 |

### 3.3. 2025 වර්ෂයේ භෞතික ඉලක්ක (ක්‍රියාත්මක කිරිමට අපේක්ෂිත වැඩසටහන් හා ව්‍යාපෘති)

| වැඩසටහන | මිනුම් ඒකකය | ඉලක්කය | ඒකක පිරිවැය (රු.) | මුළු පිරිවැය (රු.මි.) |
|---|---|---|---|---|
| එළ කිරි නිෂ්පාදනය | මිලියන ලීටර් | 6.80 | 230.72 | 1,938.00 |
| මී ගව කිරි නිෂ්පාදනය | මිලියන ලීටර් | 0.93 | 402.42 | 398.40 |
| එළු කිරි නිෂ්පාදනය | ලීටර් | 25,914 | 648.85 | 10.97 |
| දිනක් වයසැති බ්‍රොයිලර් කුකුළු පැටවුන් | සංඛ්‍යාව මිලියන | 4.08 | 128.92 | 451.22 |
| දිනක් වයසැති බිත්තර දමන කුකුළු පැටවුන් | සංඛ්‍යාව මිලියන | 1.1 | 195.96 | 195.96 |
| බ්‍රොයිලර් කුකුල් මස් | කි.ග්‍රෑම් | 31,920 | 723.58 | 189.29 |
| බිත්තර නිෂ්පාදනය | සංඛ්‍යාව මිලියන | 6.5 | 36.84 | 291.04 |
| පොල් නිෂ්පාදනය | ගෙඩි මිලියන | 17.8 | 49.53 | 950.88 |
| **අභිජනනය සඳහා සතුන් නිකුත් කිරිම** | | | | |
| එළ ගව පිරිමි | සංඛ්‍යාව | 1,102 | | |
| එළ ගව ගැහැණු | | 79 | | |
| මි ගව පිරිමි | | 445 | | |
| මි ගව ගැහැණු | | 30 | | |
| එළුවන් | | 331 | | |
| බැටළුවන් | | 1,333 | | |
| ඌරන් | | 6,273 | | |
| **අගය එකතු කල නිෂ්පාදන** | | | | |
| UHT කිරි පැකට් | පැකට් | 931,500 | 339.36 | 316.11 |

| වැඩසටහන | මිනුම් ඒකකය | ඉලක්කය | ඒකක පිරිවැය (රු.) | මුළු පිරිවැය (රු.මි.) |
|---|---|---|---|---|
| යෝගට් කප් | මිලි ලීටර් 80 (සංඛ්‍යාව මිලියන) | 1.3 | 58.07 | 101.04 |
| කිරි ටොෆි | පැකට් | 610,504 | 230.76 | 157.49 |
| මුදවපු කිරි | ලීටර් | 856,591 | 531 | 445.79 |
| යෝගට් පානය | මිලි ලීටර් 180 (බෝතල්) | 210,000 | 131.48 | 27.61 |
| අයිස් ක්‍රීම් | ලීටර් | 25,561 | 454 | 13.38 |
| පොල් තෙල් | ලීටර් | 50,270 | 672 | 41.66 |
| ඌරු මස් | කි.ග්‍රෑම් | 50,336 | 1,638.84 | 136.02 |

### 3.4. 2024.10.31 දිනට ආයතනයේ වැඩසටහන්වල මූල්‍ය ප්‍රගතිය,

| අ/අ | වැඩසටහන් | 2024 වර්ෂය සඳහා වෙන් කළ මුදල (රු.මි.) | 2024.10.31 දක්වා වියදම් කළ මුදල (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| 1 | ප්‍රාග්ධන වියදම් | 576.00 | 192.55 | 33 |
| 2 | පුනරාවර්තන වියදම් | 6,826.00 | 3719.22 | 54 |
| | **සංවර්ධන වැඩසටහන්** | | | |
| 1. | සංවෘත කුකුල් නිවාසය ඉදිකිරිම | 60.00 | 53.63 | 89 |
| 2. | ගව ගාල ඉදිකිරිම | 5.00 | 4.80 | 96 |
| 3. | අක්කර 100 ක පොල් යටි වගාව | 2.20 | 3.93 | 179 |

### 3.5. 2024.11.30 දිනට සංවර්ධන වැඩසටහන්වල භෞතික ප්‍රගතිය

| ක්‍රියාකාරකම | ඒකකය | 2024/11/30 දිනට ඉලක්කය | 2024/11/30 දිනට සත්‍ය අගය | ළඟා කර ගත් ප්‍රතිශතය |
|---|---|---|---|---|
| එළකිරි නිෂ්පාදනය | ලීටර් | 6,444,501 | 3,843,210 | 60 |
